මතක තියා ගන්න, අපේ රටේ රසායනික පොහොර භාවිතය අවුරුදු තුනක් ඇතුළත සියයට 300කින් වැඩි කර තිබෙන බව. 2018 වර්ෂයේදී අප ආනයනය කළේ රසායනික පොහොර මෙට්‍රික්ටොන් ලක්ෂ 4යි. අපි 2012 වර්ෂයේදී රසායනික පොහොර මෙට්‍රික්ටොන් ලක්ෂ 12ක් ආනයනය කර තිබෙනවා. රසායනික පොහොර භාවිතය සියයට 300කින් වැඩි වෙලා. අද වන විට වකුගඩු රෝගීන් 150,000ක් ඉන්නවා; පිළිකා රෝගීන් බොහෝ දෙනෙක් ඉන්නවා. පසු ගිය දිනෙක මම පොළොන්නරුවට ගියා. පොළොන්නරුවේ පිළිකා රෝගීන් 7,800ක් ඉන්නවා. අනුරාධපුරයේ පිළිකා රෝගීන් 9,500ක් ඉන්නවා. මේ කියන්නේ, වාර්තා වන සංඛ්‍යාව පමණයි. අද ජාත්‍යන්තර පරීක්ෂණවලින් ඒ කරුණු ඔප්පු වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, අද වන විට ලෝකයේ රටවල් 14ක් අපේ මේ කාබනික පොහොර ව්‍යාපෘතියට ආධාර දෙන්න කථා කර තිබෙනවා. අද බොහෝ දෙනා මේ ව්‍යාපෘතියට පක්ෂව කථා කරනවා. මේ කාරණය දේශපාලනීකරණය කර ගන්න එපා. ප්‍රශ්නයක් තිබෙනවා නම් අපට කථා කරන්න.

කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා දවසක් මට කථා කළා. "ඇමතිතුමා මට පොහොර නැහැ" කියලා එතුමා කිව්වා. මම ඒ වෙලාවේම ඒ ගැන කථා කළා. මම ඒ වෙලාවේම එයට මැදිහත් වුණා. මම ඒ වෙලාවේම පොහොර ටික ගෙනැවිත් දුන්නා. ඔබතුමන්ලා ඕනෑම වෙලාවක මේ සම්බන්ධයෙන් අපට කථා කරන්න. අපි ඔබතුමන්ලා එක්ක ඉන්නවා. නමුත් මේ කාරණය දේශපාලනීකරණය කරගන්න එපා කියන ඉල්ලීම මම කරනවා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27 (7) යටතේ මෙසේ සඳහන් වෙනවා:

"අමාත්‍යාංශ නිවේදනයක් අග්‍රාමාත්‍යවරයා විසින් හෝ අදාළ විෂය පිළිබඳ අමාත්‍යාංශ වගකීම පැවරී ඇති අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු විසින් හෝ ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය. එසේ, එබඳු නිවේදනයක් ඉදිරිපත් කරනු ලැබීමට අදහස් කරන අමාත්‍යවරයකු අදාළ නිවේදනයේ පිටපතක් කලින් කථානායකවරයා වෙත ලබා දී ඒ සඳහා පළමුව අනුමැතිය ගනු ලැබිය යුත්තේ ය."

ඔබතුමා අපේ ස්ථාවර නියෝග අනුගමනය කරන්නේ නැහැ. මේ, කථා පවත්වන වෙලාවක් නොවෙයි. අමාත්‍යාංශ නිවේදනයක් නිකුත් කරනවා නම්, ඒක ගරු කථානායකතුමාට ලැබෙන්න ඕනෑ. ඒ සඳහා අනුමැතිය ලැබෙන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමා මගෙන් අවසර අරගෙන තමයි- [බාධා කිරීමක්]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, ඔබතුමාට ලැබුණු ඒ නිවේදනය තමයි එතුමා කියවන්න ඕනෑ. එහෙම නැත්නම්, අපි මේ ගැන විවාදයක් ඉල්ලමු. ඔබතුමා අපට කෘෂිකර්මය පිළිබඳව විවාදයක් ලබා දෙන්න. මේ විධියට කථා පවත්වන්න දෙන අවස්ථාවක් නොවෙයි මේක. මේ ගැන ඔබතුමාගේ අදහස කියන්න. මේ ස්ථාවර නියෝග අපට ඕනෑද, නැද්ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමා කලින් අවසර අරගෙනයි මේ ප්‍රකාශය කරන්නේ. [බාධා කිරීම්]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, මේ රටේම ගොවීන් පාරට බැහැලා සිටින වෙලාවක, ඒ අයගේ ඡන්දයෙන් පාර්ලිමේන්තුවට පත් වූ මහජන නියෝජිතයකු හැටියටත්, කෘෂිකර්මය විෂය භාර ඇමතිවරයා හැටියටත් මට මේ තිබෙන තත්ත්වය පැහැදිලි කරන්න අයිතියක් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ගරු කථානායකතුමාට මේ ප්‍රකාශය භාර දීලා, එතුමාගෙන් ඉල්ලීමක් කරලා තමයි මම මේ ප්‍රකාශය කරන්නේ. ඒ නිසා මේක නීති විරෝධී දෙයක් නොවෙයි. මම දන්නවා, පොහොර පිළිබඳ කාරණය කථා කරන කොට ඔබතුමන්ලාට රිදෙන බව. ගරු කථානායකතුමා නියෝජනය කරන්නේ, මාතර දිස්ත්‍රික්කය. එතුමා හිටපු කෘෂිකර්ම ඇමතිවරයෙක්. මම මේ අර්බුදය පිළිබඳ පැහැදිලි කිරීමක් පමණයි කළේ. [බාධා කිරීමක්]

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු කථානායකතුමනි, අපේ ගරු ඇමතිතුමා දැන් කිව්වා, පොළොන්නරුව දිස්ත්‍රික්කයට සියයට අනූ ගණනක ප්‍රමාණයක පොහොර ලැබුණා කියලා. එහෙම ලැබිලා නැහැ, ගරු කථානායකතුමනි. මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පොහොර නොලැබුණු ගොවීන් සිටිනවා.

සිවිල් ආරක්ෂක බලකාය විසින් දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අක්කර 400ක් අස්වැද්දුවා. එක පොහොර මිටියක් වත් ඔවුන්ට ලැබී නැහැ. පොහොර නොලැබුණු ඒ වාගේ ප්‍රදේශ තිබෙනවා, ගරු ඇමතිතුමනි. මේවායේ අඩු පාඩු ඇති. නමුත් අපි ඔබතුමාට කියන්නේ, මේ වාගේ වැරැදි ප්‍රකාශ කරන්න එපා කියලායි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ඒ කාරණය ගරු ඇමතිතුමාට වෙනම ඉදිරිපත් කරන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා එදා මට කථා කළා. ඔබතුමාගේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් මැදිහත් වෙලා අරලගංවිල උද්ඝෝෂණයක් කළා. ඕනෑ නම් මම ඒ මන්ත්‍රීවරුන් දෙදෙනාගේ නම් දෙක කියන්නම්. අරලගංවිල ප්‍රදේශයට සියයට සියයක් පොහොර ලබා දී අවසන්. මැදිරිගිරිය ප්‍රදේශයට සියයට 4ක පමණ පොහොර අඩුවක් තිබෙනවා. මම ඒක පිළිගන්නවා. මම ඔබතුමාට කිව්වා, සියයට 5ක, 6ක අඩුවක් තිබෙන බව. දැන් ඒ ප්‍රමාණය බෙදන්න කටයුතු කරනවා, ගරු මන්ත්‍රීතුමා. බකමූණ ප්‍රදේශයේ පොහොර හිඟයක් නැහැ. ඔබතුමා මට කථා කරලා පොහොර හිඟය ගැන කිව්වා. ඔබතුමා මහජන නියෝජිතයෙක්. මම ඒ වෙලාවේම මැදිහත් වෙලා පොහොර ටික ලබා දුන්නා. ඔබතුමාගේ Facebook එකේත් ඔබතුමා දැම්මා, කෘෂිකර්ම ඇමතිතුමා මැදිහත් වෙලා පොහොර ටික දුන්නා කියලා. අඩුපාඩුකම් තිබෙනවා නම් කියන්න, අපි උදවු කරන්නම්. හැබැයි, ඔබතුමාගේ මන්ත්‍රීවරුන් යොදාගෙන නිකම් වැඩකට නැති උද්ඝෝෂණ පවත්වන්න එපා කියන එකයි මම කියන්නේ.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු කථානායකතුමනි, මට පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, ඔබතුමාට දුරකථනයෙන් කථා කරලා - [බාධා කිරීමක්]

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා කියපු ආකාරයටම ගම්පහ දිස්ත්‍රික්කයේ අපේ ප්‍රදේශයේත් අන්නාසි, ඒ වාගේම මඤ්ඤොක්කා වැනි වගාවල ගොවිතැන් කටයුතුවලට වර්තමානයේ පොහොරවල ලොකු අඩුවක් තිබෙනවා, මේ ප්‍රශ්නය නිසා. පසුගිය ඉරිදාත් ගොවි ජනතාව එළියට ඇවිල්ලා විරෝධතාවක් දැක්වුවා; අපි ඒකට නායකත්වය දුන්නා. ගරු ඇමතිතුමා කියනවා, අපි එසේ නායකත්වය ලබා දෙන්නේ දේශපාලන හේතු මත කියලා. විපක්ෂයක් හැටියට අපේ වගකීමක් තමයි ජනතාව වෙනුවෙන් පෙනී සිටීම. [බාධා කිරීම්] ගරු ඇමතිතුමනි, ඒ වාගේම මේ වේලාවේ මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, මේ වෙනකොටත් ගොවි ජනතාවට ලොකු හානියක් සිදු වෙලා තිබෙන බව. [බාධා කිරීම්] ඔබතුමා කියනවා, රජයෙන් වන්දියක් ලබා දෙන්න කටයුතු කරනවා කියලා. [බාධා කිරීම්] ඇත්ත වශයෙන්ම එසේ වන්දි ලබා දීම ගැන [බාධා කිරීම්] ගොවි ජනතාවට විශ්වාසයක් නැහැ. ඒ නිසා එම වන්දි ලබා දීමේ කටයුතු ඉක්මනින් කරන්න. මොකද, මේ වෙනකොටත් ඒ සෑම භෝගයකටම විශාල වශයෙන් හානි සිදු වෙලා තිබෙනවා. තේ, පොල්, රබර් පමණක් නොවෙයි, - [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේක විවාදයක් කරගන්න එපා, ගරු මන්ත්‍රීතුමා. ඒකට වෙනම දිනයක් ගන්න. අදට ඔය ඇති. ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒකට ලිඛිත උත්තරයක් දුන්නා නම් හොඳයි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
හොඳයි.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, [බාධා කිරීමක්] ගරු ඇමතිතුමනි, ඔබතුමාට මේකටත් උත්තරයක් දෙන්න පුළුවන්. ගරු කථානායකතුමනි, මම ඇමතිතුමාට දුරකථනයෙන් කථා කරලාත් මේ ගැන කිව්වා. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ අපට පොහොර මෙට්‍රික්ටොන් 600ක් අඩුයි. මෙට්‍රික්ටොන් 250ක් ලැබුණා. ඉතුරු පොහොර ටික ලැබුණේ නැහැ නේ, ගරු ඇමතිතුමනි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, සමාවෙන්න. පොළොන්නරුව දිස්ත්‍රික්කයට හිඟ තිබුණේ මෙට්‍රික්ටොන් 330යි. දැන් ඔබතුමා - [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. දැන් ඔබතුමා නියෝජ්‍ය ගොවිජන සේවා කොමසාරිස්තුමාට කථා කරන්න. ඒ මෙට්‍රික්ටොන් 330ම යවා තිබෙනවා. අඩුවක් තිබෙනවා නම්, ඔබතුමා මට කියන්න. මෙට්‍රික්ටොන් 330යි, අඩු වෙලා තිබුණේ. [බාධා කිරීමක්] ඔබතුමා දැන් කියන්න එපා. නියෝජ්‍ය ගොවිජන සේවා කොමසාරිස්තුමාගෙන් අහලා මට කියන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඒ ගැන විවාදයකට යන්න ඕනෑ නැහැ. ඒ සඳහා වෙනම විවාදයක් ඉල්ලන්න.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු ඇමතිතුමා මෙතැන සිටින නිසායි මේ කථාව කියන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ සඳහා වෙනම විවාදයක් ඉල්ලන්න. [බාධා කිරීමක්] නැහැ, නැහැ. ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු කථානායකතුමනි, අපි ජනතාවගේ ප්‍රශ්න අහන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒකට වෙනම විවාදයක් ඉල්ලා ගන්න. [බාධා කිරීම්] තවත් ඒ සඳහා වේලාව දෙන්න බැහැ. දැන් ඇති වෙන්න වේලාව දුන්නා නේ.

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
# வினாக்களுக்கு வாய்மூல விடைகள்
# ORAL ANSWERS TO QUESTIONS

## ඇඹිලිපිටිය දැවි තෙල් විදුලි බලාගාරය: පරිසර හානිය
## எம்பிலிபிட்டிய உலை எண்ணெய் மின் உற்பத்தி நிலையம்: சுற்றாடல் பாதிப்பு
## FURNACE OIL POWER PLANT IN EMBILIPITIYA: ENVIRONMENTAL DAMAGE

90/2020

1. **ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ දැවි තෙල් ආශ්‍රිත විදුලි බලාගාරයක් ස්ථාපිත කර ඇති බවත්;

(ii) එම බලාගාරයේ ක්‍රියාකාරිත්වය හේතුවෙන් දැඩි පරිසර හානියක් සිදු වන බවත්;

(iii) එම බලාගාරය සඳහා පරිසර බලපත්‍ර ලබා දීමේදී, නිසි ක්‍රමවේදය අනුගමනය කර නොමැති බවත්;

එතුමා පිළිගන්නේද?

(ආ) (i) එම බලාගාරය අයත් සමාගමේ නම කවරේද;

(ii) එම සමාගම සමඟ ගිවිසුම්ගත කාල සීමාව කවරේද;

(iii) මෙම විදුලි බලාගාරය මඟින් සිදු වන පරිසර හානිය අවම කිරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) இரத்தினபுரி மாவட்டத்தின், எம்பிலிபிட்டிய பிரதேச செயலகப் பிரிவில் உலை எண்ணெய் சார்ந்த மின் உற்பத்தி நிலையமொன்று நிறுவப்பட்டுள்ளதென்பதையும்;

(ii) மேற்படி மின் உற்பத்தி நிலையத்தின் செயற்பாடு காரணமாக கடுமையான சுற்றாடல் பாதிப்பு ஏற்படுகின்றதென்பதையும்;

(iii) மேற்படி மின் உற்பத்தி நிலையத்துக்கு சுற்றாடல் பாதுகாப்பு உரிமம் வழங்கப்படும்போது உரிய முறையியல் பின்பற்றப்படவில்லை என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) (i) மேற்படி மின் உற்பத்தி நிலையத்தின் உரிமையைக் கொண்டுள்ள நிறுவனத்தின் பெயர் யாதென்பதையும்;

(ii) மேற்படி நிறுவனத்துடன் உடன்படிக்கை கைச்சாதிடப்பட்டுள்ள கால எல்லை யாதென்பதையும்;

(iii) மேற்படி மின் உற்பத்தி நிலையத்தின் மூலம் ஏற்படுகின்ற சுற்றாடல் சேதத்தினைக் குறைப்பதற்கு நடவடிக்கை மேற்கொள்ளப்படுமா என்பதையும்;

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he admit that -

(i) a furnace oil power plant has been established in the Embilipitiya Divisional Secretary's Division of the Ratnapura District;

(ii) a serious harm is caused to the environment due to the operations of the aforesaid power plant;

(iii) the proper procedure is not adopted in granting the Environment Protection Licence for aforesaid power plant?

(b) Will he inform this House -

(i) the name of the owner company of aforesaid power plant;

(ii) the period of agreement with aforesaid company;

(iii) whether measures will be taken to minimize the environmental damage caused by aforesaid power plant?

(c) If not, why?

**ගරු මහින්ද අමරවීර මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - சுற்றாடல் அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera - Minister of Environment)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඇඹිලිපිටිය මිද්දෙනිය පාර යන ලිපිනයේ ඒස් පවර් ඇඹිලිපිටිය (ප්‍රයිවට්) ලිමිටඩ් (ACE Power Embilipitiya (Pvt.) Limited) විසින් මෙගාවොට් 100ක ධාරිතාවකින් යුත් දැවිතෙල් (furnace oil) ආශ්‍රිත විදුලි බලාගාරයක් ස්ථාපිත කර ඇත.

(ii) බලාගාරය මඟින් විමෝචනය වන අපද්‍රව්‍ය, ජාතික පාරිසරික පනතේ ප්‍රතිපාදන අනුව ප්‍රකාශයට පත් කර ඇති ප්‍රමිති හා උපමාන අනුව මුදා හරින බව වාර්තා අනුව තහවුරු වන බැවින් හා 2020.08.25 දින ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණයේ නිරීක්ෂණ මත මෙම බලාගාරය සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මඟින් මධ්‍යම පරිසර අධිකාරියේ එකඟතාව සහිතව පරිසර ආරක්ෂණ බලපත්‍රය නිකුත් කර ඇති බවත්, දැනට බලාගාරය සඳහා නිකුත් කර ඇති පරිසර ආරක්ෂණ බලපත්‍රය 2020.08.26 සිට 2021.08.25 දක්වා වලංගුව පවතින බවත් මධ්‍යම පරිසර අධිකාරිය විසින් වාර්තා කර ඇත.

පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් නෛතික වශයෙන් නිකුත් කරනු ලබන්නේ එම ක්‍රියාකාරිත්වය මඟින් පිටකරනු ලබන විමෝචන ජාතික පාරිසරික පනත යටතේ ගැසට් කරන ලද ප්‍රමිති හා උපමානවලට අනුකූල නම් පමණක් වන බවත්, පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් සහිතව ක්‍රියාත්මක වන මෙම බලාගාරය මඟින් නිකුත් කරනු ලබන විමෝචන, ප්‍රමිති හා උපමානවලට අනුව නිකුත් කරනු ලබන බවත් මධ්‍යම පරිසර අධිකාරිය විසින් වාර්තා කර ඇත.

(iii) මෙම බලාගාරය ආයෝජන මණ්ඩලය යටතේ ලියා පදිංචි කර්මාන්තයක් වන අතර, බලාගාරය සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාදීම ආයෝජන මණ්ඩල පනතේ ප්‍රතිපාදන අනුව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් සිදු කරනු ලබයි. පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබා දීමට අවශ්‍ය එකඟතාව (concurrence) ලබා දීමේදී හා අලුත් කිරීමේදී මධ්‍යම පරිසර අධිකාරිය විසින් වාර්ෂිකව වායු විමෝචන තත්ත්ව වාර්තාවක් (Stack Emission Report) ශබ්ද මැනුම් වාර්තාවක් (Noise Measurement Report) අපජල විශ්ලේෂණ වාර්තාවක් (Waste Water Analytical Report) කම්පන තත්ත්ව වාර්තාවක් (Vibration Level Report) ලබා ගැනීම සිදු කර ඇත. මෙම වාර්තා මධ්‍යම පරිසර අධිකාරියේ ලියා පදිංචි ආයතන මඟින් (කාර්මික තාක්ෂණික ආයතනය, ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය) ලබාගෙන ඇත. එකී වාර්තා අනුව අදාළ පරාමිතීන් සම්මත ධාරණ සීමා තුළ පැවතීම සැලකිල්ලට ගෙන පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම සිදු කර ඇති බවත්, පාරිසරික ආරක්ෂණ බලපත්‍රය අලුත් කිරීමේදී බලාගාරයේ භාවිතයෙන් ඉවත් වන මඩිති තෙල් (sludge oil) බැහැරලීම සඳහා උපලේඛනගත අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍රයක් සහිත ආයතනයක් වෙත ලබාදීම සහ එහි වලංගුතාව සැලකිල්ලට ගෙන සිදු කරනු ලබන බවත් මධ්‍යම පරිසර අධිකාරියෙන් වාර්තා කර ඇත. එසේම, බලාගාරය සඳහා බලපත්‍ර ලබාදීමේදී තාක්ෂණික වාර්තාවල නිර්දේශ මත නිසි ක්‍රමවේද අනුගමනය කරමින් සිදු කර ඇති බවත්, මෙම බලාගාරය සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබා දීමේ නිසි ක්‍රමවේද අනුගමනය කර ඇති බවත් මධ්‍යම පරිසර අධිකාරිය විසින් වාර්තා කර ඇත.

(ආ) (i) ඒස් පවර් ඇඹිලිපිටිය පුද්ගලික සමාගම (ACE Power Embilipitiya (Pvt.) Limited)

(ii) ඒස් පවර් ඇඹිලිපිටිය (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ලංකා විදුලිබල මණ්ඩලය අතර විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම (Power Purchase Agreement) මුලින්ම වසර 10ක කාලයක් සඳහා 2003.05.09 දින අත්සන් කර ඇති අතර, එය 2005.04.05 දින සිට 2015.04.04 දක්වා බලපවත්වා ඇති බවත්, ඉන් අනතුරුව තෙවතාවකදී දෙපාර්ශ්වය විසින් ගිවිසුම දීර්ඝ කර ඇති බවත්, අවසන් වරට අත්සන් කළ බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම 2021.04.05 දින අවසන් වී ඇති බවත් විදුලිබල අමාත්‍යාංශය විසින් වාර්තා කර ඇත.

(iii) 2020.08.25 දිනැති ක්ෂේත්‍ර පරීක්ෂණයට අනුව, බලාගාරයේ ක්‍රියාකාරිත්වයෙන් ජනනය වන ශබ්දය, දුම් සහ කම්පනය අවම කිරීමට තාක්ෂණික ක්‍රමෝපායන් අනුගමනය කර ඇති බවත්, මීට අමතරව බලාගාරය වටා භූමි ප්‍රදේශය

[ගරු මහින්ද අමරවීර මහතා ]

තුළ හරිත වන ආවරණයක් නඩත්තු කිරීම අදාළ සමාගම විසින් සිදු කරනු ලබන බවත් මධ්‍යම පරිසර අධිකාරිය විසින් වාර්තා කර ඇත.

කෙසේ වුවද, දක්වා ඇති කරුණු මත මේ පිළිබඳව නැවත ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කිරීම සඳහා අදාළ දිස්ත්‍රික් කාර්යාලයට දැනුම් දී ඇති අතර, ඒ අනුව පරිසර දූෂණයක් සිදු වන බව නිරීක්ෂණය වේ නම්, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට දන්වා යැවීමට කටයුතු කරනු ලබන බවත්, එසේ පාලනය කිරීමට කටයුතු නොකරන්නේ නම් නීතිමය පියවර ගැනීමටද කටයුතු කරන බවත් මධ්‍යම පරිසර අධිකාරියෙන් වාර්තා කර ඇත.

(ඇ) පැන නොනඟී.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු කථානායකතුමනි, විස්තරාත්මක පිළිතුරක් ලබා දීම පිළිබඳව ගරු ඇමතිතුමාට මා ස්තුතිවන්ත වනවා. එතුමාගේ පිළිතුරෙන් කියැවුණා, 2021.04.05වන දායින් පසුව මෙම ගිවිසුමේ කාල සීමාව අවසන් බව. එහෙම නේද, ගරු ඇමතිතුමනි?

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ඔව්.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

මේ වනවිට මෙම ගිවිසුම අලුත් කරලාද, නැද්ද කියන කාරණය ගරු ඩලස් අලහප්පෙරුම ඇමතිතුමා තමයි දන්නවා ඇත්තේ. ගිවිසුම අලුත් කරලා නැත්නම් මේ වනකොට ගිවිසුමක් නැති ආයතනයක් විදුලිය ජනනය කරන්නේ කොහොමද කියන ප්‍රශ්නය මතු වනවා. ඒක තමයි පළමුවැනි කාරණය. එය, මම අහපු ප්‍රශ්නයට ඔබතුමා ලබා දුන් පිළිතුර හරහා පැන නැඟුණු ප්‍රශ්නයක්, ගරු ඇමතිතුමනි.

දෙවැනි කාරණය මෙයයි. ඔබතුමා ඔය කියන ආයතන බලපත්‍ර ලබා ගන්නේ නැතිව ඇව් තෙල් ආශ්‍රිත විදුලි බලාගාරයක් පවත්වාගෙන යන්න බැරි බව ඇත්ත. එම සියලු බලපත්‍ර ඔවුන් ලබා ගෙන තිබෙනවා. මේ තුළින් සිදු වන පරිසර හානිය ගැන අපි දිගින් දිගටම කථා කළා. එලෙස දිගින් දිගටම කථා කරන කොට ලබා දීපු පිළිතුර තමයි, "නැවත වතාවක් මෙම සමාගම සමඟ ගිවිසුම්ගතව ඉදිරියට යන්නේ නැහැ. මේ කටයුතු මෙතැනින් නතර කරනවා" කියන එක. නමුත් දැනට තිබෙන විදුලිබල අවශ්‍යතාවත් එක්ක මෙම ඇව් තෙල් විදුලි බලාගාරයේ කටයුතු ඉදිරියට කරගෙන යනවා, ගරු ඇමතිතුමනි. ඒ සම්බන්ධව නැවත ක්ෂේත්‍ර පරීක්ෂණයක් කරනවා කියා ඔබතුමා කිව්වා. ඒ කටයුතු විනිවිදභාවයකින් සිදු කරලා, මෙම විදුලි බලාගාරය නිසා හානි සිදු වූ ජනතාවට සහනයක් ලබා දිය යුතුයි. ගරු ඇමතිතුමනි, ඔය කියපු හැම කාරණයකින්ම එම ප්‍රදේශයේ ජනතාවට හානි සිදු වනවා. අඩුම ගණනේ රෙදි කැල්ලක් වැලක වනන්න බැහැ, ඒ රෙදි කළු පැහැයට පත් වනවා. ඒ තරමටම පරිසර දූෂණයක් සිදු වනවා, ගරු ඇමතිතුමනි. මෙම ඇව් තෙල් විදුලි බලාගාරය මෙවැනි ජනාකීර්ණ ප්‍රදේශයක ඉදිකිරීම පිළිබඳව ජනතාව විරෝධය පළ කරමින් අවුරුදු ගණනාවක් තිස්සේ උද්ඝෝෂණ පැවැත්වූවා. නමුත්, කාගෙන්වත් -අපේ ආණ්ඩුව පැවති කාලයේවත් -මේ ප්‍රශ්නයට පිළිතුරක් ලැබුණේ නැහැ.

ගරු ඇමතිතුමනි, මේ පිළිබඳව පරීක්ෂණයක් කරන්න කියලා මම ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලීමක් කරනවා. ඔබතුමාත් දන්නවා, රටේ ප්‍රධාන පෙළේ සමාගම් තමන්ට අවශ්‍ය විධියට බලපත්‍ර සහ අවශ්‍ය සහතික ලබා ගන්න වෙනත් ක්‍රම පාවිච්චි කරන කතන්දරය තවමත් මේ රටේ තිබෙන බව. අපි කියන්නේ නැහැ, මේ ආයතනය වසා දමන්න කියලා. ජනතාව ගැන සිතා මේ පිළිබඳව සැබෑ පරීක්ෂණයක් කර මේ ආයතනය වෙනත් තැනකට ගෙන යෑමට අවශ්‍ය කටයුතු කරන්න පුළුවන්ද කියන කාරණාව මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි. ඒ වාගේම, මේ පිළිබඳව විනිවිදභාවයෙන් යුතු හොඳ පරීක්ෂණයක් කරන්න. ඒ සඳහා අවශ්‍ය වටපිටාව හදන්න කියලාත් මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සඳහන් කළ කාරණය පිළිබඳව අපි විශේෂයෙන්ම අවධානය යොමු කරනවා. දිස්ත්‍රික් කාර්යාලයෙන් තමයි මේ පරීක්ෂණය සිදු කරන්නේ. මම ඊට අතිරේකව කොළඹ කාර්යාලයෙනුත් නිලධාරින් යොදවා මේ පරීක්ෂණ ස්වාධීනව කරන්න උපදෙස් ලබා දෙනවා. ඒ වාගේම, ජනතාවගේ අදහස් ද සැලකිල්ලට ගෙන, යම් පරිසර හානියක් සිද්ධ වනවා නම් ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග අනිවාර්යයෙන්ම ගන්නා බවත් මේ අවස්ථාවේදී මම ප්‍රකාශ කරනවා.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා අහනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය මම අහනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා විශේෂයෙන්ම ඍජුව උත්තර දෙන ඇමතිවරයකු හැටියටත්, වර්තමානයේ ඔබතුමාගේ පිලේ සිදුවන කනගාටුදායක සිදුවීම් සහ හිරිහැර මැද සිටින ඇමතිවරයකු හැටියටත් මේ ප්‍රශ්නයටත් ඍජුව උත්තර දෙයි කියලා මම බලාපොරොත්තු වනවා.

මේ කථා කළ ප්‍රශ්නයට සම්බන්ධ ආයතනය සම්බන්ධයෙන් වූ කාරණය ලිඛිතව නැහැ. හැබැයි, බුත්තල ප්‍රදේශයේ කෝන්කැටිය ග්‍රාම නිලධාරි වසමේ බුදුගල්ලෙන රක්ෂිතයේ මේ ජාවාරම සිද්ධවනවා. දැවැන්ත පරිසර හානියක් සමඟම විශාල ගඟක් හරස් කර ඒ ගඟ දෙපස තිබුණු වැලි කන්දරාවක් ගොඩ දමමින් දැවැන්ත වැඩ පිළිවෙළක් කරන බව ඊයේ රාත්‍රී 10.00ට "Sirasa News"වලදී ප්‍රචාරය වුණා, ගරු ඇමතිතුමනි. මේ සඳහා පරිසර අමාත්‍යාංශයේ අනුමැතිය නැහැ, ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය නැහැ, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය නැහැ. හැබැයි, මේ වාගේ දැවැන්ත වැඩ පිළිවෙළක්

ආරම්භ කළා කියලා ගම්මු කියනවා. ඊයේ අපි ඒක දැක්කා. පැහැදිලිවම ඒ බව ඊයේ "Sirasa News"වලදී ප්‍රචාරය වුණා. පරිසරය සම්බන්ධව කටයුතු කරන ගරු නලින් බණ්ඩාර මන්ත්‍රීතුමා ඇතුළු අපි මේ සිද්ධිය සියැසින් දැක්කා. වනජීවී නිලධාරින්ට අපි එන්න කිව්වා. නමුත්, එතැන වෙන්නේ මොකක්ද කියලා බලන්න ඒ නිලධාරින් ආවේ නැහැ. අපි දැක්කා, STF එකෙන් ඇවිල්ලා ඒ යන්ත්‍ර සූත්‍ර ටික අත්අඩංගුවට අරගෙන තිබෙන බව. හැබැයි, පරිසරයට වෙන්න ඕනෑ හානිය පරිසරයට වෙලා තිබෙනවා. අද අපි මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේදී කියන්නේ මේ වාගේ තවත් ව්‍යාපෘති පටන් ගෙන, මෙවැනි පරිසර හානි වෙන්න කලින් මේවා නවත්වන්න අවශ්‍ය වගබලාගැනීම සිද්ධ කරන්න ඕනෑ නිසායි. ගරු ඇමතිතුමනි, ඊයේ සමහර විට ඔබතුමා "Sirasa News" බලන්නත් ඇති, නැතිවත් ඇති. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට මම යෝජනා කරනවා, ඔබතුමා එතැනට යන්න කියලා. එතැන පරිසරය විනාශ කර තිබෙනවා. එම නිසා මේ කරන කර්මාන්තය මොකක්ද කියන ප්‍රශ්නය අපට තිබෙනවා. දැන් ඔබතුමා කිව්වා, විවිධ නිර්ණායක යටතේ තමයි මේ කර්මාන්ත සඳහා අවසර දෙන්නේ කියලා. මෙන්න මේ මේ ලියකියවිලි ආදිය ගන්න ඕනෑය කියලාත් ඔබතුමා කිව්වා. ගරු ඇමතිතුමනි, මේ ජාවාරමට ඒ කිසිවක් අරගෙන නැහැ. නමුත්, රක්ෂිතයක් ඇතුළේ මහා ජාවාරමක් සිදුවනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමනි, ප්‍රශ්නය අහන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
දැන් මම මේ පිළිබඳව අනාවරණය කරනවා. ඊයේ "Sirasa News"වලින් මේ ගැන අනාවරණය කළා. ගරු ඇමතිතුමනි, මේ සඳහා ගන්නා පියවර මොකක්ද?

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ඔබතුමා කියූ කාරණයත්, මාධ්‍යවල පළවන විස්තරත් සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත් වාර්තාවක් මම දැනටමත් ඉල්ලා තිබෙනවා. GSMB ආයතනයත්, මධ්‍යම පරිසර අධිකාරියත් ලබා දෙන තොරතුරු අනුව, එවැනි අකටයුත්තක් -නීති විරෝධි කාර්යයක්- සිදු වී තිබෙනවා නම් ඒ සඳහා නීත්‍යානුකූලව ගත හැකි සියලුම ක්‍රියාමාර්ගවලට අපි ප්‍රවේශ වනවා.

**ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා**
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W. H. M. Dharmasena)
ගරු කථානායකතුමනි, පැහැදිලි කරගැනීමකට මට අවස්ථාවක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අතුරු ප්‍රශ්න දෙක අහලා අවසානයි නේ, ගරු මන්ත්‍රීතුමා. මෙහෙම ගියොත් අපිට සභාවේ කටයුතු කරගෙන යන්න කාලය මදි වෙනවා. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා වෙනම ප්‍රශ්නයක් අහලා ගරු ඇමතිතුමාගෙන් පිළිතුරු ලබා ගන්න.

## ජාතික ක්‍රීඩා සභාවේ සාමාජිකයන්: විස්තර
### தேசிய விளையாட்டுச் சபை அங்கத்தவர்கள்: விபரம்
### MEMBERS OF THE NATIONAL SPORTS COUNCIL: DETAILS

194/2020

**2. ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ජාතික ක්‍රීඩා සභාව සඳහා පත් කරන ලද නව සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් සහ සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ක්‍රීඩාවේ සංවර්ධනය සඳහා ඔවුන්ගෙන් ලබා ගැනීමට අපේක්ෂිත සේවය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

இளைஞர் மற்றும் விளையாட்டுத்துறை அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) தேசிய விளையாட்டுச் சபைக்கு நியமிக்கப் பட்டுள்ள புதிய அங்கத்தவர்களின் எண்ணிக்கை யாது;

(ii) அவர்களது பெயர்கள் மற்றும் தகைமைகள் வெவ்வேறாக யாவை;

(iii) விளையாட்டுத்துறையின் மேம்பாட்டுக்காக அவர்களிடமிருந்து பெற்றுக்கொள்வதற்கு எதிர் பார் =க்கப்படும் சேவைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Youth and Sports:

(a) Will he inform this House of-

(i) the number of new members appointed to the National Sports Council;

(ii) their names and qualifications, separately; and

(iii) the service expected from them for the development of sports?

(b) If not, why?

**ගරු නාමල් රාජපක්ෂ මහතා (තරුණ හා ක්‍රීඩා අමාත්‍ය සහ ඩිජිටල් තාක්ෂණ හා ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ - இளைஞர் மற்றும் விளையாட்டுத்துறை அமைச்சரும் டிஜிட்டல் தொழில்நுட்பம் மற்றும் தொழில்முயற்சி அபிவிருத்தி இராஜாங்க அமைச்சரும்)
(The Hon. Namal Rajapaksa - Minister of Youth and Sports and State Minister of Digital Technology and Enterprise Development)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) වර්තමාන ජාතික ක්‍රීඩා සභාවේ සභාපති ඇතුළු සාමාජිකයන් සංඛ්‍යාව 15කි.

(ii) ජාතික ක්‍රීඩා සභාවේ සාමාජිකයන්ගේ නම් සහ ඔවුන්ගේ සුදුසුකම් වෙන් වෙන් වශයෙන් පහත සඳහන් පරිදි වේ.

[ගරු නාමල් රාජපක්ෂ මහතා ]

| | නම | තනතුර | සුදුසුකම් |
|---|---|---|---|
| 1. | මහේල ජයවර්ධන මහතා | සභාපති | • අන්තර්ජාතික ක්‍රිකට් ක්ෂේත්‍රයේ ඉහළ කීර්තිනාමයක් දිනූ ක්‍රීඩකයෙකු සහ නායකත්ව හැකියාවත්, උපායශීලීත්වය සඳහා ප්‍රචලිත වීම.<br>• 2007 වර්ෂයේ දී ICC ක්‍රිකට් ලෝක කුසලාන තරඟාවලියේ දී ඔහුගේ නායකත්වය යටතේ අවසන් මහා තරඟයට ශ්‍රී ලංකාවට පිවිසීමට හැකි වීම.<br>• වැඩිම ජයග්‍රහණ ප්‍රතිශතයක් සහිත ඉන්දියන් ප්‍රිමියර් ලීග් තරඟාවලියේ මුම්බයි ඉන්දියන්ස් කණ්ඩායමේ ප්‍රධාන පුහුණුකරු වීම. |
| 2. | තියුම් අබේසිංහ මිය | ලේකම් | • ඒකල හා යුගල ශූරතා දිනාගත් ශ්‍රී ලංකාවේ ලාබාලතම කාන්තා - ජාතික ටෙනිස් ශූරියන්ගෙන් කෙනෙකි.<br>• බොහෝ ටෙනිස් ජාත්‍යන්තර ඉසව් සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කිරීම.<br>• වෘත්තියෙන් හේලිස් සමාගමේ නීති නිලධාරිනියක් වන අතර ඇමරිකා එක්සත් ජනපදයේ ඉලිනොයිස් විශ්ව විද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව හා ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක් ද ලබා ඇත.<br>• දැනට ජාතික ක්‍රීඩා සභාවේ සාමාජිකත්වය ද දරයි. |
| 3. | ඒ.ජේ.එස්.එස්. එදිරිසූරිය මහතා | සාමාජික | • වෘත්තියෙන් නීතිඥයෙක් වන අතර ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් වර්තමානයේ සේවය කරනු ලබයි.<br>• රාජකීය විද්‍යාලයෙන් උසස් අධ්‍යාපනය හදාරන ලද ඔහු කැලණිය විශ්වවිද්‍යාලයෙන් උපාධිය ලබා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මඟින් ශාස්ත්‍රපති උපාධිය ද ලබා ගෙන ඇත.<br>• 2000 වර්ෂයේ දී ඔහු ශ්‍රී ලංකා පරිපාලන සේවයට ප්‍රවිශ්ට විය. |
| 4. | කුමාර් සංගක්කාර මහතා | සාමාජික | • කුමාර් සංගක්කාර මෙතෙක් සිටි ශ්‍රේෂ්ඨතම පිතිකරුවෙකු ලෙස සැලකේ.<br>• මොහු 2012 වසරේ දී ICC ක්‍රිකට් ක්‍රීඩකයා ලෙස සම්මාන දිනා ගත්තේය.<br>• wisden Cricketer's Almanack හි 2012 හා 2015 වර්ෂවල දී ඔහු ලොව ප්‍රමුඛ පෙළේ ක්‍රිකට් ක්‍රීඩකයෙකු ලෙස තේරී පත් විය.<br>• 1787 වර්ෂයේ දී ආරම්භ කරන ලද MaryLebone Cricket Club (MCC) හි බ්‍රිතාන්‍ය පුරවැසියෙකු නොවන පළමු සභාපතිවරයා ලෙස 2019 වසරේ දී පත්වීම. |

| | | | |
|---|---|---|---|
| 5. | ජූලියන් බෝලිං මහතා | සාමාජික | • ජූලියන් බෝලිං මහතා ජාත්‍යන්තර තරඟ ගණනාවකට ශ්‍රී ලංකාව නියෝජනය කළ පදක්කම්ලාභී පිහිනුම්කරුවෙකි.<br>• ඔහු 1984 සිට 1991 දක්වා කාලය තුළ දකුණු ආසියානු ක්‍රීඩා උළෙලේ දී ශ්‍රී ලංකාව වෙනුවෙන් රන් පදක්කම් 15 ක් දිනා ඇත.<br>• එසේම ශ්‍රී ලංකා නියෝජනය කරමින් තෙවරක් ඔලිම්පික් ක්‍රීඩා සඳහා සහභාගී විය.<br>• ජූලියන් බෝලිං මහතා මීට පෙර 2010 වර්ෂයේ දී ජාතික ක්‍රීඩා සභාව නියෝජනය කරන ලදී. |
| 6. | ඩිලන්ත මාලගමුව මහතා | සාමාජික | • බොහෝ ගෝලීය ධාවන ඉසව්වල ශ්‍රී ලංකාව නියෝජනය කරන කීර්තිමත් ධාවන ශූරයෙකි.<br>• ඔහු ලැම්බෝගිනි සුපිරි ට්‍රොෆියේ ලෝක අවසන් මහා තරඟයේ 2 වන තරඟයේ 3 වන ස්ථානයට පත් වූ අතර මෝටර් රථ ක්‍රීඩාවලින් ලෝක ශූරතාවක් දිනා ගත් පළමු හා දැනට සිටින එකම ශ්‍රී ලාංකිකයා ද වේ.<br>• ශ්‍රී ලංකාවේ මෝටර් රථ ධාවන තරඟ සඳහා දැක්වූ දායකත්වය නිසාම ඔහු ක්‍රීඩා ඛාණ්ඩයෙන් "වසරේ ශ්‍රී ලාංකිකයා" යන සම්මානයෙන් පිදුම් ලැබීය. |
| 7. | ලුතිනල් ජනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා | සාමාජික | • ආරක්ෂක බලකායේ වැඩබලන ප්‍රධානියා සහ ශ්‍රී ලංකා යුධ හමුදාවේ අණදෙන නිලධාරියා වේ.<br>• ශ්‍රී ලංකාවේ පැවති සිවිල් යුද්ධය අතරතුර ඔහු ප්‍රහු 58 අංශයේ අණදෙන නිලධාරියා ලෙස සේවය කරන ලදී.<br>• ඔහු ශ්‍රී ලංකාවේ තානාපති සහ එක්සත් ජාතීන්ගේ මූලස්ථානයේ නියෝජ්‍ය නිත්‍ය නියෝජිතයා ලෙසද සේවය කරන ලදී.<br>• ජාතික තේරීම් කමිටුව, ආරක්ෂක සේවා හොකී කමිටුව හා හමුදාවේ හොකී කමිටුවන් හි සභාපති ධුරය දරනු ලැබීය. |
| 8. | සංජීව වික්‍රමනායක මහතා | සාමාජික | • මොහු දශක 3 කට වැඩි කාලයක් තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ නියැලී සිටි අතර, තොරතුරු තාක්ෂණය බිම් මට්ටමට ගෙනයාමේ ඔහුගේ දැක්ම ශ්‍රී ලංකාවේ ප්‍රථම පරිගණක නිෂ්පාදන කම්හල ආරම්භ කිරීමට හේතු විය.<br>• ඔහු උද්යෝගීමත් ක්‍රීඩකයෙකු වන අතර E-WIS සමඟ පසුගිය දශක කිහිපය තුළ දේශීය ක්‍රීඩා කුසලතා සිය ගණනක් සවිබල ගැන්වීම හා පෝෂණය සිදු කරයි. |
| 9. | රුවන් කැරගල මහතා | සාමාජික | • මාස් ඉන්ටිමේට්ස්හි අධ්‍යක්ෂකවරයාය.<br>• හාවඩ් ව්‍යාපාරික පාසල, ඉන්සෙඩ් විශ්වවිද්‍යාලය සහ ඇඩම්ස් නායකත්ව වැඩසටහන් තුළින් ඔහු විධායක හා වෘත්තීය අධ්‍යයන සුදුසුකම් ලබා ඇත.<br>• AIBA සහතික කළ ජාත්‍යන්තර බොක්සිං පුහුණුකරුවෙකු වන මොහු ශ්‍රී ලංකා බොක්සිං සංගමයේ භාණ්ඩාගාරික ලෙස සේවය කර ඇත. |

[ගරු නාමල් රාජපක්ෂ මහතා ]

| | | | |
|---|---|---|---|
| 10. | කස්තුරි විල්සන් මහත්මිය | සාමාජික | • ව්‍යාපාරික කාන්තාවක් වන මැය ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ සමාගම් සමූහයක පළමු කාන්තා විධායක නිලධාරිනිය වේ.<br>• කස්තුරි විල්සන් මහත්මිය දක්ෂ ක්‍රීඩිකාවක් වන අතර ජාතික නෙට්බෝල් සහ පැසිපන්දු කණ්ඩායම්වල ක්‍රියාකාරී සාමාජිකාවක් වූ අතර 1989 දී ජාතික පැසිපන්දු කණ්ඩායමේ නායකත්වය ද දැරීය.<br>• ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සහ USAID විසින් කස්තුරි විල්සන් මහත්මිය රටේ ඉහළම වෙනස්වීම් සිදු කරන 12 දෙනා අතර හඳුනාගෙන ඇත. |
| 11. | රොහාන් ෆර්නැන්ඩෝ මහතා | සාමාජික | • ප්‍රවීණ තේ අපනයනකරුවෙකු මෙන්ම හෙළදිව තේ සන්නාමයේ නිර්මාතෘ රොහාන් ෆර්නැන්ඩෝ මහතා ශ්‍රී ලංකා ටෙලිකොම් හි නව සභාපතිවරයා වේ.<br>• වර්තමානයේ සාමාජිකයෙක් වන මොහු තේ අපනයනකරුවන්ගේ සංගමයේ හිටපු සභාපතිවරයාය.<br>• ශ්‍රී ලංකාවේ ඔරු පැදීමේ සංගමයේ සභාපතිවරයා ද වේ. |
| 12. | මේජර් ජනරාල් රාජිත අම්පෙමොහොට්ටි මහතා | සාමාජික | • 1990 දී පලාලි හි දී යුද්ධයේ දී තුවාල ලැබූ මේජර් ජනරාල් රාජිත මහතා ඔහුගේ ආබාධය නොසලකා වෙඩි තැබීම, මලල ක්‍රීඩා, බැඩ්මින්ටන්, මේස පන්දු, දුනු ශිල්ප, රෝද පුටු මැරතන් තරඟ ඇතුළු ක්‍රීඩා මාලාවක ඔහුගේ වර්ණ පෙන්නුම් කරමින් ශ්‍රී ලංකා හමුදාව නියෝජනය කරමින් බොහෝ පැරා ක්‍රීඩාවලට සහභාගී විය.<br>• මේ වන විට ඔහු ශ්‍රී ලංකා පැරා ඔලිම්පික් කමිටුවේ සභාපති ධුරයට පත්ව සිටී. |
| 13. | රොෂේනා සමරසිංහ මිය | සාමාජික | • පාපන්දු ඇතුළු මලල ක්‍රීඩා බහුතරයක සහ ඔලිම්පික් ක්‍රීඩා සඳහා දශක ගණනාවක සිට තම දායකත්වය සපයයි.<br>• ඉහළම නීති ආයතනයක සේවය කරන අතර මෝටර් ක්‍රීඩා පිළිබඳ පූර්ව අත්දැකීම් සහිතය.<br>• 2006 මාර්තු 1 දිනට එංගලන්තයේ හා වේල්සයේ ඉහළ උසාවිවල සොලිසිටර්වරයෙකු ලෙස පිළිගනු ලැබීය.<br>• ජාත්‍යන්තර ක්‍රීඩා කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධියක් ද හිමිය. |
| 14. | සුපුන් වීරසිංහ මහතා | සාමාජික | • ඩයලොග් ආසියාටා (Dialog Axiata) සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී ධුරය හා අධ්‍යක්ෂ ධුරය දරයි.<br>• ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සාමාජිකයෙක් ද වන මොහු ඩයලොග් මූල්‍ය සමාගමේ සහ SLINTEC පෞද්ගලික ආයතනයේ ද සේවය කරනු ලබයි.<br>• මොහුගේ නායකත්වය යටතේ දැනටමත් ඊ-ස්පෝර්ට්ස් පිළිබඳ අත්හදා බලමින් සිටී. |
| 15. | යස්වන්ත් මුත්තෙටුවේගම මහතා | සාමාජික | • අන්තර්ජාතික පැසිපන්දු සංගමයේ තාක්ෂණික නියෝජිතයා ලෙස පත් කරන ලද ලාබාලතම ආසියානු ජාතිකයා වන අතර ප්‍රසිද්ධ පැසිපන්දු ක්‍රීඩකයෙකි.<br>• 32 හැවිරිදි යස්වන්ත් ලෝක පැසිපන්දු පාලක මණ්ඩලය විසින් පත් කරන ලද ආසියානු තාක්ෂණික නියෝජිතයන් 20 දෙනා අතරින් ලාබාලතම පත්වීම්ලාභියා වේ. |

(iii) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතෙහි වගන්ති අංක 4 සිට 21 දක්වා ජාතික ක්‍රීඩා සභාව පිළිබඳව දක්වා ඇති විධිවිධාන සහ 1973 නොවැම්බර් 02 දිනැති අංක 84 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි සඳහන් නියෝග අනුව ජාතික ක්‍රීඩා සභාවේ සාමාජිකයන්ගෙන් ලබා ගැනීමට අපේක්ෂිත සේවය පහතින් දක්වා ඇත.

1. ක්‍රීඩා දියුණු කිරීම, ක්‍රීඩා නඟා සිටුවීම, ක්‍රීඩා සංවර්ධනය කිරීම හා ක්‍රීඩා පාලනය කිරීම යන කරුණු සම්බන්ධයෙන් ගරු අමාත්‍යවරයා වෙත උපදෙස් දීම. (ක්‍රීඩා පනත - අංක 4(1) වගන්තිය)

2. ජාතික ක්‍රීඩා සභාව වෙත අමාත්‍යවරයා විසින් යොමු කරනු ලබන කිසියම් කරුණක් පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් දීම. (ගැසට් පත්‍රය - අංක 2 නියෝගය)

3. පහත සඳහන් කරුණු පිළිබඳව සභාව විසින් සිය අවශ්‍යතාව මත අමාත්‍යවරයාට උපදෙස් දීම. (ගැසට් පත්‍රය - අංක 3 නියෝගය)

- ක්‍රීඩා පිටි, පිහිනුම් තටාක, ක්‍රීඩාංගණ, ගෘහස්ථ ක්‍රීඩා ශාලා ඉදිකිරීම සහ ක්‍රීඩා සම්බන්ධ වෙනත් පහසුකම් සැපයීම
- ක්‍රීඩා සංවර්ධනය සඳහා ජාතික සැලැස්මක්
- ක්‍රීඩා භාණ්ඩ ආනයනය කිරීම
- ක්‍රීඩා භාණ්ඩ නිෂ්පාදනය කිරීම
- ජාතික ක්‍රීඩා දින දර්ශනයක් පිළියෙල කිරීම
- ජාතික ක්‍රීඩා අරමුදල පිහිටුවීම සහ පරිපාලනය කිරීම
- ජාතික ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීම
- ජාතික යෝග්‍යතා වැඩ පිළිවෙළක්
- ක්‍රීඩකයන් සහ ක්‍රීඩිකාවන් සඳහා රැකියා පහසුකම්
- ක්‍රීඩා සංවර්ධනයෙහි ප්‍රමුඛතා

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමනි, ක්‍රීඩාව ප්‍රවර්ධනය කිරීම සහ දිගු කාලීන සැලැස්මක් නිර්මාණය කිරීම සඳහා ක්‍රීඩා අමාත්‍යවරයාට උපදෙස් ලබා දීමට තමයි ජාතික ක්‍රීඩා සභාව තෝරා පත් කර ගන්නේ.

ගරු කථානායකතුමනි, මෙතෙක් කල් සැලැස්මක් රහිතව, සංවිධානාත්මක නොවූ ස්වරූපයෙන් තැන් තැන්වල හුදෙකලාව සංවර්ධනය වුණු ක්‍රීඩාව ජාතික සැලැස්මක් -කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන සැලැස්මක් - ඔස්සේ ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය සැලසුම් නිර්මාණය කිරීම තමයි අපේ බලාපොරොත්තුව වන්නේ. ඒ වාගේම ග්‍රාම සේවා වසම් මට්ටමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් හඳුනා ගෙන, ඔවුන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමට, ඉන් පසුව දිස්ත්‍රික්ක මට්ටමට, දිස්ත්‍රික්ක මට්ටමින් පළාත් මට්ටමටත් ගෙනැත්, පසු කාලීනව ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ඔවුන්ගෙන් ජාතික සංචිතය ගොඩ නැඟීමටත් අපි කටයුතු කරනවා. ඒ වාගේම, පළමු වතාවට ක්‍රීඩා සංගම් ශක්තිමත් කිරීමත්, අධිතාක්ෂණ පුහුණුව, high performance සඳහා ක්‍රීඩා සංගම් ගිවිසුම්ගත කිරීමත් ක්‍රියාත්මක වෙමින් පවතිනවා. මේ වනකොටත් ක්‍රීඩා 10කට ආසන්න ප්‍රමාණයක් ක්‍රීඩා සභාවේ මැදිහත් වීම මත අපි ගිවිසුම්ගත කර තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම ලබන සතිය වනකොට තවත් ක්‍රීඩා 5ක් high performanceවලට ගිවිසුම්ගත කිරීමට අපි බලාපොරොත්තු වනවා. ඊට අමතරව, ක්‍රීඩා සංගම් හරහා හඳුනා ගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් ගිවිසුම්ගත කිරීමත් මේ වනවිට සිදු වෙනවා. මේ වනවිටත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 60දෙනෙක් high performance contracts යටතේ ගිවිසුම්ගත කර තිබෙනවා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, ජාතික ක්‍රීඩා සභාවේ විශේෂ රාජකාරිය තමයි, මා ඒ කියපු සියලු අංශ පිළිබඳව හොයා බලා අවශ්‍ය සැලසුම් හදලා, වෘත්තිමය ක්‍රීඩකයන් හදන්න අවශ්‍ය සැලසුමත් නිර්මාණය කිරීම. මෙහිදී විශේෂයෙන්ම අමාත්‍යාංශය විධියට අපි ජාතික ක්‍රීඩා සභාවට ප්‍රධාන කාරණා හතරක් හඳුන්වා දී තිබෙනවා. පළමු කාරණය තමයි, leisure sports. ඒ කියන්නේ, අපි එදිනෙදා ජීවිතය කාර්යක්ෂමව ගත කිරීම සඳහා ක්‍රියාත්මක වන්නා වූ ක්‍රීඩා. දෙවැනි කාරණය, international medals, ඒ කියන්නේ ලෝක කුසලාන වැනි ජාත්‍යන්තර තරගාවලියකින් පදක්කම් ජයග්‍රහණය කිරීම සඳහා කරන්නා වූ ක්‍රීඩා. තුන්වන කාරණය, sports economy එකක් ගොඩනැඟීම. ඒ කියන්නේ, ක්‍රීඩා ආර්ථිකය නිර්මාණය කිරීම සඳහා ගොඩනඟන්නා වූ ක්‍රීඩා. උදාහරණයක් විධියට කිව්වොත්, LPL තරගාවලිය වෙන්න පුළුවන්. එහෙම නැත්නම්, අනෙකුත් ජාතික සහ ජාත්‍යන්තර තරගාවලියක් වෙන්න පුළුවන්. ඒ හරහා ක්‍රීඩා භාණ්ඩ නිෂ්පාදනය සහ ක්‍රීඩා ඇඳුම් නිෂ්පාදනය කිරීම මඟින් ජාතික සහ ජාත්‍යන්තර වෙළෙඳ පොළ ආකර්ෂණය කිරීමේ වැඩ පිළිවෙළකුත් ක්‍රියාත්මක වනවා. අවසාන කාරණය තමයි, eSportsවලට අවශ්‍ය සැලසුම් නිර්මාණය කිරීම. New normal එකක් විධියට අද ලෝකයේ වේගයෙන්ම ක්‍රියාත්මක වන සහ ආර්ථිකමය වශයෙන් විශාල වටිනාකමක් තිබෙන ක්‍රීඩා ක්ෂේත්‍රයක් විධියට, eSports හඳුනාගෙන තිබෙනවා. එයට අවශ්‍ය සැලසුම් නිර්මාණය කරනවා. මේ pillars හතර යටතේ ජාතික ක්‍රීඩා සභාව තමන්ගේ කාලය වැය කරලා අවුරුදු තුනක කාල සීමාවක් තුළ ක්‍රීඩාව සංවර්ධනය කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ නිර්මාණය කරනවා. මහේල ජයවර්ධන මැතිතුමා එහි සභාපතිත්වය දරනවා. මේ වනකොටත් එම වැඩ පිළිවෙළ ඉතා සාර්ථකව නිර්මාණය කර තිබෙනවා. එහි ප්‍රතිඵල තිබෙනවා. මෙවර මලල ක්‍රීඩා සහ අනෙකුත් ක්‍රීඩාවලින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් පෙන්වා ඇති high performanceවලින් එහි ප්‍රතිඵල අපට දකින්න පුළුවන්. ඒ වාගේම තමයි, ක්‍රීඩා ආර්ථිකය. කොවිඩ් වසංගතයත් එක්කම දකුණු ආසියාවේම ක්‍රීඩා තරග නවත්වා තිබෙන කොට ගරු කථානායකතුමනි, ලංකාව තමයි පළමු වතාවට LPL තරගාවලිය හරහා ජාත්‍යන්තර තරග පවත්වන්න තීන්දු කරලා, ක්‍රියාත්මක වුණේ. ඒ වැඩ පිළිවෙළ අද ක්‍රියාත්මක වන බවත් මතක් කරන්න ඕනෑ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු ඇමතිතුමනි, පිළිතුර ලබා දීම ගැන ස්තුතියි. ඔබතුමා ප්‍රකාශ කළ අදහස්වල ගැබ් වෙලා තිබෙන සියලු කාරණා ඉෂ්ට සිද්ධ වෙන්න කියලා මුලින්ම සුබ පතන්න ඕනෑ. විශේෂයෙන්ම three-wheeler එක හැදෙනකොට spare wheel එකත් හොඳට තිබෙන්න ඕනෑ නේ, ගරු ඇමතිතුමනි. හදිසියේ රෝදයකට මොනවා හරි වුණොත් spare wheel එක හයි කර ගන්න වෙනවා නේ. හැබැයි, මේ කාරණා ප්‍රායෝගිකව සිද්ධ නොවන්න හේතුව අපි දිගින් දිගටම කිව්වා. මොකද, දේශපාලනීකරණ පත්වීම්වලින් තමයි ඒ තනතුරුවලට ඇවිත් තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, ඒ හරහා සිද්ධ වෙන්නේ ඔබතුමා මේ කියපු සහ ක්‍රීඩකයන් සහ රට

[ගරු චමින්ද විජේසිරි මහතා]

වෙනුවෙන් සිදු කිරීමට උත්සාහ දරන කාරණා ප්‍රායෝගිකව සිදු නොවීමයි. ක්‍රීඩා කළමනාකාරිත්වය තුළ සිටින නිලධාරින් කවුද කියලා අපි දන්නවා. ඒ වාගේම දන්නවා, අපේ තේරීම් කමිටුවේ ඉන්නේ විශේෂයෙන්ම ව්‍යාපාරවලට සම්බන්ධ සහ ව්‍යාපාරවලට වැඩි උනන්දුවක් තිබෙන කණ්ඩායම් බව.

ගරු ඇමතිතුමනි, ඔබතුමා සද්භාවයෙන් රටට හා ක්‍රීඩාවට කරන්න යන ප්‍රායෝගික වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙන්නේ නැහැ, ඒ ලබා දීපු තනතුරු දේශපාලනීකරණය වීම නිසා. පහළ සිට ඉහළටම ඒ තත්ත්වය තිබෙනවා. අපි හිතුවා, ගරු නාමල් රාජපක්ෂ තරුණ ක්‍රීඩා ඇමතිවරයාගෙන් ඒක වෙන එකක් නැහැ කියලා. මම ඔබතුමාට ඒ කාරණය අනතුරක් විධියට අඟවනවා. ඔබතුමාගේ ඒ බලාපොරොත්තුව සඵල කර ගන්න බැහැ, ඒවායේ ඉන්න නිලධාරින් නිසා. උදාහරණයක් විධියට කියනවා නම්, අද ක්‍රිකට් ක්‍රීඩාව විනාශ වෙලායි තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
පොඩ්ඩක් ඉන්න කෝ, ගරු කථානායකතුමනි. අතුරු ප්‍රශ්නය තමයි අහන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
තමුන්නාන්සේ වැල්වටාරම් නේ කියන්නේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
පොඩ්ඩක් ඉන්න, අතුරු ප්‍රශ්නය අහන්නම්. කලබල වෙන්න එපා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කාලය?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඔබතුමාත් ස්ථාවර නියෝග කඩන්න හදන්න එපා, ගරු කථානායකතුමනි. ප්‍රශ්නය අහනතුරු පොඩ්ඩක් ඉන්න. හැම වෙලාවේම ඔබතුමා කලබල වෙනවා. ඔබතුමා කලබල කරලා අපේ ප්‍රශ්නයත් පිට යවනවා. [බාධා කිරීමක්] ප්‍රශ්නය කොහේද තිබෙන්නේ කියලා මම දන්නවා.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් අහන්නේ මෙයයි. ඔබතුමා දැනුවත්ව හෝ නොදැනුවත්ව හෝ දීලා තිබෙන ඒ තනතුරු නිසා තමයි අද ක්‍රිකට් ක්‍රීඩාව වළ පල්ලට ගිහිල්ලා තිබෙන්නේ. ඒවා අයින් කර දමලා, ඒවා නිවැරදි කරලා ඔබතුමාගේ බලාපොරොත්තු ඉෂ්ට සිද්ධ කරන්න ඔබතුමාට ඒ තැනට යන්න පුළුවන්ද?

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු කථානායකතුමනි, එතුමා පොඩ්ඩක් පටලවා ගෙන. ක්‍රීඩා සභාවයි, ක්‍රිකට් ආයතනයයි කියන්නේ දෙකක්. ගරු මන්ත්‍රීතුමනි, ක්‍රීඩා සභාව ක්‍රියාත්මක වෙන්නේ ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ. ඒක අමාත්‍යවරයාට උපදෙස් දෙන්න අමාත්‍යවරයා විසින් පත් කරන කමිටුවක්. මේ වන විටත් ක්‍රීඩා සභාව ඉතාම සාර්ථකව ඒ වැඩ කටයුතු ක්‍රියාත්මක කරගෙන යනවා. ක්‍රීඩාවත් එක්ක එතරම් සම්බන්ධයක් නැති හින්දා එතුමාට ඒ පිළිබඳව අවබෝධයක් නැතුව ඇති, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, ක්‍රීඩාව කියන්නේ ටීවී එකේ දකින දේවත්, ෆේස්බුක් එකේ දකින දේවත් නොවෙයි. ගරු මන්ත්‍රීතුමනි, ක්‍රීඩාවක් කියන්නේ වැඩ පිළිවෙළක් එක්ක, දිගු කාලීන සැලැස්මක් එක්ක යන්න ඕනෑ දෙයක්. පුහුණුකරුවාගේ ඉඳලා, කළමනාකරුවාගේ ඉඳලා, ක්‍රීඩකයා දක්වා ඒ අවශ්‍ය පුහුණුවීම් කටයුතුවලට තමයි ප්‍රමුඛතාව දෙන්න ඕනෑ. ඔබතුමන්ලාට පුරුදු පිට්ටනි සහ ක්‍රීඩා මණ්ඩප දැකලා නේ. ගරු මන්ත්‍රීතුමනි, ක්‍රීඩා මණ්ඩප හැදුවාට ක්‍රීඩකයා හැදෙන්නේ නැහැ. ඒ සඳහා ක්‍රීඩකයා හදන්න ඕනෑ; පුහුණුකරුවා හදන්න ඕනෑ; කළමනාකරුවා හදන්න ඕනෑ. ඒවා හදන කොට ඒ දෙවල් තේරෙන්නේ නැති අයට ඒවා වැරදි විධියට පෙනෙනවා. ලොකු pavilion එකක් හැදුවාම ඒක තමයි ක්‍රීඩාව කියලා ඔවුන් හිතනවා. ක්‍රීඩා සංගමයේ වගකීම pavilions හදන එක නොවෙයි. ක්‍රීඩා සංගමයේ වගකීම ක්‍රීඩකයා හදන එකයි.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කළා ක්‍රිකට් ආයතනය ගැන. ක්‍රිකට් ආයතනය නාමල් රාජපක්ෂ පත් කරපු එකක් නොවෙයි. ක්‍රිකට් ආයතනයේ පාලක මණ්ඩලය කියන්නේ, ඡන්දයකින් තේරීපත් වෙච්ච කණ්ඩායමක්. ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ පත් වෙච්ච අයමයි තවම එහි ඉන්නේ. ඒ අය අපේ ආණ්ඩුවෙන් දාපු අය නොවෙයි. ඒ වාගේම එතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ ක්‍රිකට් ආයතනය අතුරු කමිටුවක් දැම්මා, ගරු කථානායකතුමනි. අතුරු කමිටුවක් දාලා අවසානයේ ක්‍රිකට් බෝඩ් එක අහෝසි වෙන්න ගියා. ඒ කමිටුව අයින් කරලා මැතිවරණය තිබ්බා. හිටපු පුහුණුකරුවා sack කළා. දැන් ඩොලර් මිලියනයක වන්දියක් ඉල්ලලා නඩුවක් දාලා තිබෙනවා. මේවා පිළිබඳව ගරු මන්ත්‍රීතුමනි, අපි වෙනම අවස්ථාවක කථා කරමු. හැබැයි, ගරු කථානායකතුමනි, අපි පැහැදිලිව වග කීමකින් මේ කාරණය කියනවා. මේ රටේ ක්‍රීඩකයා සහ ක්‍රීඩාව දියුණු කරන්න දිගුකාලීන සැලැස්මක් තිබෙනවා. කෙටි සහ මධ්‍ය කාලීන ප්‍රතිඵල අපට තිබෙනවා. ජාත්‍යන්තර ජයග්‍රහණවලට යන්න පුළුවන් ක්‍රීඩකයන් හදන සැලැස්ම දැනට ක්‍රියාත්මක වෙනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, දෙවන අතුරු ප්‍රශ්නය ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා අහනවා ඇති.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු ඇමතිතුමනි, ක්‍රීඩාව හා සම්බන්ධව ඔබතුමාගේ අදහස් එකතු කරන මේ වෙලාවේ ඇඹිලිපිටිය ප්‍රදේශයේ තිබෙන ප්‍රශ්නයක් ගැන කතා කරන්නට මම බලාපොරොත්තු වෙනවා. මෙක ප්‍රාදේශීය ලේකම්වරයාටත්, දිස්ත්‍රික් ලේකම්වරයාටත්, අතිගරු ජනාධිපතිතුමාගේ සිට සියලු අමාත්‍යවරුන්ටත් දැනුම් දීලා තිබෙන මහජන පැමිණිල්ලක්. මම හිතනවා, ඔබතුමා මේ ප්‍රශ්නයට උත්තරයක් ලබාදෙයි කියලා.

ඇඹිලිපිටිය ගම්උදාව ආශ්‍රිතව තිබෙන ක්‍රීඩාංගණය මේ වන විට කොටස් කර පුද්ගලයන් කිහිපදෙනෙකුට ලබාදීලා තිබෙනවා. ඒ සඳහා බලපත්‍රයක් නිකුත් කළා කියලාත් දැනගන්නට තිබෙනවා. පසුගිය දිනක මේ පිළිබඳව දේශපාලන භේදයකින් තොරව විශාල උද්ඝෝෂණයක් පැවැත්වුවා. ඒ ක්‍රීඩාංගණයේ අයිතිය එම ප්‍රදේශයේ ජනතාවට හිමි විය යුතුයි. මේ ප්‍රශ්නයට දේශපාලන භේදයක් නැහැ, ගරු ඇමතිතුමනි. මේ කාරණයට අදාළ සියලු ලිපි ලේඛන මා සතුව තිබෙනවා, එම ලේඛන ඔබතුමාගේ දැන ගැනීම සඳහා මම **සභාගත*** කරනවා.

මෙම වටිනා සම්පත එම ප්‍රදේශයේ ජනතාවට පාවිච්චි කරන්නට පුළුවන් විධියට, ඔබතුමා සංවර්ධනය කරගෙන යන ක්‍රීඩාංගණ ගොඩට ඇතුළත් කර ගන්නා ලෙසත්, මෙහි අයිතිය එම ප්‍රදේශයේ ජනතාවට තහවුරු වන විධියේ ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙසත් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)

ගරු කථානායකතුමනි, මෙය පාර්ලිමේන්තුවේදී ඇසිය යුතු ප්‍රශ්නයක් නොවෙයි. ඔබතුමා ඔය කාරණය ප්‍රාදේශීය සංවර්ධන කමිටුවට ඉදිරිපත් කරලා අනුමත කරලා එවන්න, මම ඒ කටයුත්ත කරලා දෙන්නම්.

## 2018/2019 පෙයාර්ස් නිෂ්පාදනය: විස්තර
## 2018/ 2019ஆம் ஆண்டுகளில் பெயார்ஸ் உற்பத்தி: விபரம்
## PRODUCTION OF PEARS IN 2018/2019: DETAILS

279/2020

3. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2018 හා 2019 වර්ෂවල ශ්‍රී ලංකාවේ පෙයාර්ස් නිෂ්පාදනය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;
(ii) පෙයාර්ස් නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබේද;
(iii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ ඇති පෙයාර්ස් ප්‍රභේද සංඛ්‍යාව කොපමණද;
(ii) පෙයාර්ස් වගාව සඳහා සුදුසු දේශගුණ තත්ත්වයක් ඇති ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්කවල නම් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) (i) ශ්‍රී ලංකාව පෙයාර්ස් ආනයනය කරන්නේද;
(ii) එසේ නම්, 2018 හා 2019 වර්ෂවලදී පෙයාර්ස් ආනයනය කිරීම සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;
(iii) ශ්‍රී ලංකාව පෙයාර්ස් අපනයනය කරන්නේද;
(iv) එසේ නම්, 2018 හා 2019 වර්ෂවලදී පෙයාර්ස් අපනයනය කිරීමෙන් ලැබූ ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) 2018 மற்றும் 2019 ஆம் ஆண்டுகளில் இலங்கையின் பெயார்ஸ் உற்பத்தி ஒவ்வொரு வருடத்திற்கமைய வெவ்வேறாக எவ்வளவென்பதையும்;
(ii) பெயார்ஸ் உற்பத்தியினை அதிகரிப்பதற்கு நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டுள்ளனவா என்பதையும்;
(iii) ஆமெனில், அந் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) இலங்கையிலுள்ள பெயார்ஸ் இனங்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;
(ii) இலங்கையில் பெயார்ஸ் செய்கைக்கு உகந்த காலநிலை காணப்படுகின்ற மாவட்டங்களின் பெயர்கள் யாவை என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(இ) (i) இலங்கை பெயார்ஸ் இறக்குமதி செய்கின்றதா என்பதையும்;
(ii) ஆமெனில், 2018 மற்றும் 2019 ஆம் ஆண்டுகளில் பெயார்ஸ் இறக்குமதி செய்வ தற்குச் செலவிடப்பட்ட தொகை ஒவ்வொரு வருடத்திற்கமைய வெவ்வேறாக எவ்வள வென்பதையும்;
(iii) இலங்கை பெயார்ஸ் ஏற்றுமதி செய்கின்றதா என்பதையும்;
(iv) ஆமெனில், 2018 மற்றும் 2019ஆம் ஆண்டுகளில் பெயார்ஸ் ஏற்றுமதியின்மூலம் பெறப்பட்ட வருமானம் ஒவ்வொரு வருடத்திற்கமைய வெவ்வேறாக எவ்வளவென்பதையும்;

அவர் மேலும் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture:

(a) Will he state -
(i) the pear production in Sri Lanka in 2018 and 2019, separately for each year; and
(ii) whether measures have been taken to increase the pear production;
(iii) if so, what those measures are?

(b) Will he also state-
(i) the number of pear varieties found in Sri Lanka; and
(ii) the names of the districts in Sri Lanka which have a suitable climatic condition for pear cultivation?

(c) Will he further state-
(i) whether Sri Lanka imports pears;
(ii) if so, the amount of money spent on importing pears to Sri Lanka in 2018 and 2019, separately in each year;
(iii) whether Sri Lanka exports pears; and
(iv) if so, the income received through the export of pears in 2018 and 2019, separately in each year?

(d) If not, why?

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)

| වර්ෂය | නිෂ්පාදනය (මෙ.ටො.) |
|---|---|
| 2018 | 1,600 |
| 2019 | 1,800 |

(තොරතුරු මූලාශ්‍රය - කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති අංශයෙහි දත්ත)

(ii) ඔව්.

(iii) (i) නව ප්‍රභේද හඳුන්වා දීම. ( 2019 වර්ෂයේ රහංගල ග්‍රීන් ප්‍රභේදය හඳුන්වා දීම)

(ii) විවිධ ව්‍යාපෘති යටතේ නොමිලේ සහ සියයට 50ක දායකත්වය යටතේ පැළ බෙදා දීම. (බදුල්ල සහ නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ)

(iii) පෙයාර්ස් වගාව සම්බන්ධව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. (කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ රාජ්‍ය නොවන සංවිධාන මඟින් සංවිධානය කර ඇත.)

(iv) පෙයාර්ස් වගා කිරීමට විභවයක් සහිත ප්‍රදේශ දේශගුණික තොරතුරු මත පදනම්ව හඳුනාගෙන එම ප්‍රදේශ තුළ පර්යේෂණ වගා ස්ථාපනය කිරීම. (මෙම වසරේ ආරම්භ කරන ලද අතර, දැනට ප්‍රදේශ 6ක පර්යේෂණ වගා ස්ථාපනය කර ඇත.)

(ආ) (i) 03කි.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශිත ප්‍රභේද දෙකකි.

(i) රහංගල පෙයාර්ස් ( 1996 දී හඳුන්වා දී ඇත.)

(ii) රහංගල ග්‍රීන් ( 2019 දී හඳුන්වා දී ඇත.)

(iii) මීට අමතරව රාගල පෙයාර්ස් ප්‍රභේදය වගා කරයි.

(ii) පෙයාර්ස් වගා කිරීමට සුදුසු දේශගුණික තත්ත්ව බදුල්ල සහ නුවරඑළිය දිස්ත්‍රික්ක තුළ පවතී.

(ඇ) (i) ඔව්.

(ii)

| වර්ෂය | ආනයන වියදම (රු.මිලියන) |
|---|---|
| 2018 | 50.8 |
| 2019 | 96.1 |

(තොරතුරු මූලාශ්‍රය - කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සමාජ ආර්ථික සැලසුම් අංශයේ AgStat 2020 දත්ත අනුව)

(iii) නැත.

(iv) අදාළ නොවේ.

(ඈ) (i) ශ්‍රී ලංකාවේ දැනට පවතින පෙයාර්ස් නිෂ්පාදනය අතිරික්ත මට්ටමක නොමැත.

(ii) පෙයාර්ස් සෞම්‍ය කලාපීය පලතුරු භෝගයක් වන අතර වගා කිරීමට සුදුසු දේශගුණික තත්ත්ව බදුල්ල සහ නුවරඑළිය දිස්ත්‍රික්ක තුළ ප්‍රධාන වශයෙන් පවතී. මෙම ප්‍රදේශවල බහුලව එළවලු වගාව සහ තේ වගාව සිදු කෙරෙන නිසා පෙයාර්ස් වගාව සඳහා යොදා ගත හැකි ඉඩම් ප්‍රමාණය සීමිතව ඇත.

(iii) එසේම අප රට තුළ පෙයාර්ස් වගාවෙන් අස්වැන්න ලබාගත හැක්කේ වසරේ එක් කාලසීමාවක් තුළ (ජුනි - අගෝස්තු මාස තුළ) පමණි. දේශීය පෙයාර්ස්වල පවතින නැවුම් රසය හා ඉහළ ගුණාත්මක තත්ත්වය නිසා මේ කාලය තුළ දේශීය පෙයාර්ස් සඳහා දැඩි ඉල්ලුමක් පවතින අතර, ඊට සාපේක්ෂව නිෂ්පාදනය වැඩි කිරීමට නව වගා පිහිටුවීමේදී භූමිය සීමාකාරී වී ඇත.

(iv) මෙම කරුණු පදනම් කරගෙන පෙයාර්ස් වගා කිරීමට විභවයක් සහිත නව ප්‍රදේශ හඳුනාගැනීමට පර්යේෂණ ආරම්භ කර ඇති අතර අවාරයේ අස්වනු ලබා ගැනීමට හැකියාවක් ඇති ප්‍රදේශ හඳුනාගැනීමට ද මේ තුළින් බලාපොරොත්තු වේ.

මේ පිළිබඳ පසුබිම් වාර්තාවක් සහ තවත් තොරතුරු තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඒවා ඔබතුමාට ලැබෙන්න සලස්වන්න පුළුවන්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, පලතුරු පිළිබඳව කථා කළත්, කුරුඳු පිළිබඳව කථා කළත්, කොරවු පිළිබඳව කථා කළත් පොහොර පිළිබඳ කාරණය තමයි මේ දවස්වල ඇති වෙන්නේ සහ මතු වන්නේ. කාබනික පොහොර හෙවත් කොම්පෝස්ට් පොහොර, NPK - Nitrogen, Phosphorus and Potassium - තිබෙන පොහොර සහ අනෙකුත් රසායනික පොහොර පිළිබඳ කාරණය තමයි මේ දවස්වල සාකච්ඡා වන්නේ. මේ දවස්වල ඔබතුමන්ලා මේ පිළිබඳව කරන එක එක ප්‍රකාශ තුළින් ඔබතුමන්ලාගේ ස්ථිර ප්‍රතිපත්තිය ගැන අපට පැහැදිලි වන්නේ නැහැ. ඔබතුමන්ලා මුලින්ම සමහර පොහොර වර්ග ලංකාවට ගෙන්වන එක තහනම් කළා. ඊට පස්සේ නැවතත් පොහොර ආනයනය කරනවා කියනවා. ඊයේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී තමුන්නාන්සේලාගේ සමහර නිලධාරින් අදහස් ප්‍රකාශ කර තිබෙනවා රසායනික පොහොර සහ ඛනිජ පොහොර යන දෙකම එක HS Code එකකින් ගේන්න. ඒත් එක්කම නැවතත් HS Codes දෙකකට යන්නත් කථා කරලා තිබෙනවා, කාබනික පොහොර හැරුණුකොට රසායනික පොහොර, කාබනික නොවන පොහොර වශයෙන්. මේ පිළිබඳව මුදල් අමාත්‍යාංශයත්, කෘෂිකර්ම අමාත්‍යාංශයත් අතර පරස්පරයක් තිබෙනවා. ඊයේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ තිබුණු තත්ත්වය අනුව මුදල් අමාත්‍යාංශය කියනවා, කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් අහලා ඒ ගොල්ලන්ගේ දැනුවත්භාවය මතයි මේ ඔක්කෝම ගත්තේ කියලා. නමුත් කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ආපු නිලධාරින් කියනවා, "නැහැ, නැහැ මුදල් අමාත්‍යාංශයේ නිලධාරින් අපට කථා කළේ නැහැ" කියලා. ඒ නිසා මම පළමු අතුරු ප්‍රශ්නය විධියට ඔබතුමාගෙන් අහන්නේ පෙයාර්ස් ඇතුළු සියලු භව භෝගවලට ඕනෑ පොහොර සම්බන්ධව ඔබතුමන්ලාගේ නිරවුල් ප්‍රතිපත්තිය මොකක්ද?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු මන්ත්‍රීතුමා, කාබනික කෘෂි කර්මාන්තය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නිර්දේශ නිකුත් කරලා තිබෙනවා. ඒ ඒ භෝග සඳහා වෙන වෙනම නිර්දේශ නිකුත් කර තිබෙනවා. උදාහරණයක් වශයෙන් අපේ රටේ වැඩිම නිෂ්පාදනය තිබෙන වී වගාව ගත්තොත්, හෙක්ටෙයාර එකක් සඳහා අපේ නිර්දේශය තිබෙන්නේ කොම්පෝස්ට් පොහොර කිලෝග්‍රෑම් 500ක්. එහි NPK ප්‍රමාණය මදි කියලා අපි පිළිගන්නවා. ඒ නිසා අපි nitrogen extract ආනයනය කරනවා. ඒ විතරක් නොවෙයි, අපි පොටෑසියම් කිලෝග්‍රෑම් 35ක් ලබා දෙනවා. ඒ වාගේම, හෙක්ටෙයාරයකට ජෛව පොහොර ලීටර 10ත්, 15ත් අතර ප්‍රමාණයක් ලබා දෙනවා. මේක තමයි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශය.

ගරු කථානායකතුමනි, කාබනික පොහොර නිෂ්පාදනය කිරීම සඳහා ගොවීන්ට හෙක්ටෙයාරයකට රජය විසින් රුපියල් 12,500ක් ගෙවනවා. ඒ අනුව සෑම ගොවියෙකුටම හෙක්ටෙයාරයකට රුපියල් 12,500ක් ලැබෙනවා. ඒ පිළිබඳ චක්‍රලේඛය දැන් නිකුත් වෙමින් තිබෙනවා. මේ වැඩ පිළිවෙළ තුළ මෙතෙක් කාලයක් විදේශ රටවලට ගිය මුදල මේ රටේ ගොවියාට ලැබෙනවා.

ඊළඟට, නයිට්‍රජන් සහ පොටෑසියම් කියන ඛනිජ ලවණ අපි ආනයනය කරනවා. ඒ වාගේම ජෛව පොහොර දේශීය මට්ටමෙන් නිෂ්පාදනය කරලා ගොවීන් අතරේ බෙදා දෙනවා. ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට උදාහරණයක් වශයෙන් කිව්වේ වී වගාව ගැනයි. ඒ ආකාරයට අනෙකුත් සියලු භෝග සඳහාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නිර්දේශ හදලා තිබෙනවා. ඒ නිර්දේශවලට අනුව ඊළඟ කන්නයේ පොහොර ලබා දෙන්න කටයුතු කරනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒ විධියට සඳහන් කළත්, ඒ ගැසට් පත්‍රය අද හෙට පාර්ලිමේන්තුවට එන්න නියමිතයි. එය, රසායනික පොහොරත්, NPKත් යන දෙකම ලංකාවට ගෙන ඒම නතර කරන ගැසට් පත්‍රයක්. මම අහන්නේ මේකයි. අපි විවාදයට ගන්නේ ඒ ගැසට් පත්‍රයට අදාළ කරුණුද? එහෙම නැත්නම්, ඒ ගැසට් පත්‍රය අවලංගු කරලා රසායනික පොහොරවලට අදාළව පමණක් ගැසට් පත්‍රයක් ගෙන එනවාද? ඒක තමයි ඊයේ මුදල් කමිටුවේදී අහපු පළමු ප්‍රශ්නය. මුදල් අමාත්‍යාංශය කියනවා, ඔබතුමන්ලාගේ නිර්දේශය මතයි NPK ගෙන්වීමත් නතර කරන්නේ කියලා. හැබැයි, ඔබතුමාගේ නිලධාරින් කියනවා, එහෙම එකක් නැහැ කියලා. මා ළඟ ඒ ගැසට් පත්‍රය තිබෙනවා. ඕනෑ නම් එහි අංකයත් කියන්නම්. ඒක තමයි, 2021.05.06 වන බ්‍රහස්පතින්දා නිකුත් කළ අංක 2226/48 දරන ආනයන අපනයන (පාලන) පනතට අදාළ ගැසට් පත්‍රය. ගරු ඇමතිතුමනි, මේ ගැසට් පත්‍රයේ පැහැදිලිව සඳහන් වෙලා තිබෙනවා, මේ පොහොර වර්ග දෙකම සම්බන්ධයෙන්. අනෙක, මේ පොහොර වර්ග දෙකම HS Code එකකට දාන්න යනවා. මේක විලම්බීත වැඩක්. මොකක්ද, මේ ඇති වෙලා තිබෙන තත්ත්වය?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

මම ඒකට උත්තරයක් දෙන්නම්. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන කාරණය හරි. ගැසට් කිරීමේදී HS Code එකේ ප්‍රශ්නයක් තිබුණා; අඩු පාඩුවක් වෙලා තිබුණා. ඒ නිසා අලුත් ගැසට් එකක් මඟින් අපි ඒක නිවැරැදි කරනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා, මම මූලාසනයට ගරු කරන බව. එම නිසා මට තව සුළු වෙලාවක් දෙන්න.

ගරු ඇමතිතුමනි, මෙවැනි ගැසට් නිවේදනයක් නිකුත් කළ පසු 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත අනුවත්, 1985- 1987 සංශෝධිත ගැසට් පත්‍ර අනුවත් එය මාසයක් ඇතුළත පාර්ලිමේන්තුවෙන් සම්මත කරගන්න ඕනෑ.

එහෙම නැත්නම් එය ක්‍රියාත්මක කරන්න බැහැ. දැන් ඒ මාසයක කාලසීමාව ඉක්ම යමින් තිබෙනවා. ඒ වාගේම, අලුත් ගැසට් පත්‍රය එනතුරු මෙය බලාත්මකයි. එක්කෝ පාර්ලිමේන්තුවෙන් ගැසට් පත්‍රයේ සඳහන් නීතිය සම්මත වෙන්න ඕනෑ. එහෙම නැත්නම්, මේ ඇති වෙලා තිබෙන ව්‍යාකූල තත්ත්වය නිවැරැදි කරන්න ඔබතුමන්ලා ක්‍රියා මාර්ගයක් ගන්න ඕනෑ. මේ සඳහා ගන්නා වූ ක්‍රියා මාර්ගය මොකක්ද, ගරු ඇමතිතුමනි?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු මන්ත්‍රීතුමනි, අපි ඊළඟ මහ කන්නය ආරම්භ කරන්නේ සැප්තැම්බර් මාසයේ අම්පාර දිස්ත්‍රික්කයෙන්. ලබන සැප්තැම්බර් මාසයේ සිට අපි පොහොර ලබා දිය යුතුයි. අපි ඒ ගැසට් පත්‍රය කඩිනමින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. මෙතැනදී නීතියෙන් පරිබාහිරව කිසිම දෙයක් කෙරෙන්නේ නැහැ. ඒ ගැන ප්‍රශ්නයක් ඇති කරගන්න එපා. ගැසට් එක නිකුත් කිරීමේදී යම් අඩු පාඩුවක් සිදු වුණා. ඒක නිවැරැදි කරලා අලුත් ගැසට් පත්‍රයක් අපි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා.

## බන්ධනාගාර නියාමක තනතුර: පුරප්පාඩු
### சிறைச்சாலைக் காவலர் பதவி: வெற்றிடங்கள்
### POST OF PRISON GUARD: VACANCIES

503/2020

**4. ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) බන්ධනාගාර නියාමක තනතුරට බඳවා ගැනීම සඳහා 2019.03.29 දිනැති රජයේ ගැසට් පත්‍රයේ දැන්වීමක් පළ කරන ලද බවත්;

(ii) එම දැන්වීමට අනුව, 2019 ජූනි මස බඳවා ගැනීමේ තරග විභාගයක්, පවත්වා එහි ප්‍රතිඵල මත, තෝරාගන්නා ලද අයදුම්කරුවන් සඳහා ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයක් 2019 නොවැම්බර් මස පවත්වා ඇති බවත්;

එතුමා දන්නේද;

(ආ) (i) ඉහත සඳහන් බඳවා ගැනීමේ ක්‍රියාවලිය මේ දක්වා සිදුකිරීම වෙනුවෙන් රජය විසින් දරා ඇති වියදම කොපමණද;

(ii) මේ වනවිට බන්ධනාගාර නියාමක තනතුරෙහි පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iii) බන්ධනාගාර නියාමක තනතුර සඳහා පවතින පුරප්පාඩු පිරවීමේදී, ඉහත සඳහන් බඳවා ගැනීමේ පටිපාටිය යටතේ තෝරාගත් අයදුම්කරුවන්ට අවස්ථාව ලබා දෙන්නේද;

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

(iv) එසේ නම්, එම අයදුම්කරුවන්ට පත්වීම ලබා දෙනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நீதி அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) 2019.03.29ஆம் திகதிய அரச வர்த்தமானப் பத்திரிகையில் சிறைச்சாலைக் காவலர் பதவிக்கு ஆட்சேர்ப்புச் செய்வதற்கான அறிவித்தல் பிரசுரிக்கப்பட்டிருந்தது என்பதையும்;

(ii) அந்த அறிவித்தலின்படி, 2019 யூன் மாதம் ஆட்சேர்ப்புக்கான போட்டிப் பரீட்சையை நடாத்தி அதன் பெறுபேறுகளின் அடிப்படையில் தெரிவு செய்யப்பட்ட விண்ணப்பதாரர்களுக்கு 2019 நவம்பர் மாதம் உடற் தகுதி பரிசோதனை நடத்தப்பட்டுள்ளது என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி ஆட்சேர்ப்புச் செயன்முறையை இது வரை முன்னெடுத்தமைக்காக அரசாங்கத்திற்கு உறப்பட்டுள்ள செலவு யாது என்பதையும்;

(ii) இன்றளவில் சிறைச்சாலைக் காவலர் பதவியில் காணப்படும் வெற்றிடங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) சிறைச்சாலைக் காவலர் பதவி வெற்றிடங்களை நிரப்பும்போது மேற்படி ஆட்சேர்ப்பு நடைமுறைக்கு உட்பட்டதாகத் தெரிவு செய்யப்பட்ட விண்ணப்பதாரர்களுக்கு வாய்ப்பு வழங்கப்படுமா என்பதையும்;

(iv) அவ்வாறாயின், இந்த விண்ணப்பதாரர்களுக்கு நியமனம் வழங்கப்படும் திகதி யாது என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Justice:

(a) Is he aware that -

(i) a notice was published in the Government Gazette dated 29.03.2019 in order to recruit persons to the post of Prison Guard;

(ii) as per that notice, a competitive examination for recruitment was held in June, 2019 and a physical fitness test was conducted in November, 2019 for the selected candidates based on the results of that examination?

(b) Will he inform this House-

(i) the cost incurred on the above-mentioned recruitment process by the Government so far;

(ii) the number of vacancies for the post of Prison Guard existing at present;

(iii) whether opportunities would be given to the candidates selected under the above-mentioned recruitment process in filling vacancies for the post of Prison Guard; and

(iv) if so, the date on which appointments would be given to those candidates?

(c) If not, why?

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(ආ) (i) ආසන්න වශයෙන් රු.5,000,000.00කි. වියදම් පිළිබඳ දළ ඇස්තමේන්තුව පහතින් දක්වා ඇත.

| විස්තරය | වියදම (රු.) |
|---|---|
| 1. ගැසට් නිවේදනය ඉංග්‍රීසි සහ දෙමළ භාෂා පරිවර්තනය සඳහා වියදම | 19,610.00 |
| 2. තරග විභාගය සඳහා මුළු වියදම | 4,558,531.00 |
| 3. ප්‍රවාහන වියදම් (දළ) | 80,000.00 |
| 4. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා මුළු වියදම | 324,037.00 |
| මුළු වියදම | 4,982,178.00 |

(ii) පවතින පුරප්පාඩු සංඛ්‍යාව 1,509කි.

(iii) ඔව්. 2019.03.29 දිනැති රජයේ ගැසට් පත්‍රයේ පළ කළ දැන්වීමට අනුව, අයදුම් කළ අයදුම්කරුවන් අතරින් බඳවා ගැනීමේ පටිපාටිය අනුව, ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් බඳවා ගැනීමට කටයුතු කරමින් පවතී.

(iv) රටේ පවතින කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් නිසි සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට යටත්ව සිදු කළ යුතුවීම සහ මෙම බඳවා ගැනීම සිදු කිරීමට අදාළව පොලිස් වාර්තා කැඳවීම් ඇතුළු මූලික කටයුතු සම්පූර්ණ වූ වහාම මෙම බඳවා ගැනීම් සිදු කිරීමට නියමිතය.

(ඇ) පැන නොනඟී.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, මගේ පළමු අතුරු ප්‍රශ්නය මෙයයි. මේ බඳවා ගැනීම් සිදු කරන දිනය කවදාද කියා ගරු ඇමතිතුමාගේ පිළිතුරෙහි සඳහන් වුණේ නැහැ. බන්ධනාගාර කොමසාරිස් චන්දන ඒකනායක මහතා 2021.01.18වන දින යවන ලද ලිපියේ තිබෙන්නේත් ඉක්මනින් බඳවා ගැනීම් සිදු කරනවා කියලායි. අපට ආරංචි වුණ විධියට, භාණ්ඩාගාරයේ මූල්‍ය තත්ත්වය හොඳ නැති වීමත් මෙයට බලපා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ සුදුසුකම් ලැබූ අය කොයි කාලයේ වාගේද බඳවා ගන්නේ කියලා ඔබතුමාට නිශ්චිතව කියන්න පුළුවන් ද?

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)

ගරු මන්ත්‍රීතුමනි, මම දැන් කියෙව්වේ ඔබතුමාගේ ප්‍රශ්නයට බන්ධනාගාර දෙපාර්තමේන්තුවෙන් ලබා දී තිබෙන පිළිතුරයි. ඔවුන් සඳහන් කර තිබෙනවා, බඳවා ගැනීම් සඳහා අවශ්‍ය කටයුතු කරමින් සිටින බව. නිලධාරින්ගේ අඩුවක් තිබෙන නිසා බන්ධනාගාරයේ කටයුතු නිසි පරිදි කළමනාකරණය කර ගැනීමට බාධාවක් මතු වී තිබෙනවා කියා මමත් පිළිගන්නවා. ඒ බඳවා ගැනීම් සඳහා හැකි ඉක්මනින් කටයුතු කරන්න කියා මම උපදෙස් දෙන්නම්.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ කාරණය සම්බන්ධව දිගින් දිගටම මාධ්‍යවලින් ද වාර්තා කළා. "ලංකාදීප" පුවත් පතේ ඒ දවස්වලම වාර්තා වුණා, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු 1,400ක් සඳහා බඳවා ගැනීමේ වැඩ කටයුතු කරන්නේ නැහැ කියලා. මේ පිළිබඳව බන්ධනාගාර මූලස්ථානයෙන් විටින් විට විවිධ ලිපි යවලාත් තිබෙනවා. ඔබතුමා කියන කාරණය මම පිළිගන්නවා. සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව තමයි අපිට හැම දෙයක්ම කරන්න වෙන්නේ. නමුත්, ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමා පාරවල් හැදීම ආරම්භ කරනකොට කිව්වා, කොවිඩ් තිබුණා කියා අපිට රටේ සංවර්ධනය නවත්වන්න බැහැ කියලා. ඒ කථාවත් ඇත්ත. මම පෞද්ගලිකව ඒක පිළිගන්නවා. හැබැයි, බන්ධනාගාරයේ පුරප්පාඩු ටික පුරවන එකත් ඒ වාගේම වැදගත් දෙයක්. කොවිඩ් වසංගතය ඇවිල්ලා දැන් අවුරුදු එකහමාරක් විතර වෙනවා. මම දන්නේ නැහැ, බන්ධනාගාරයේ නිලධාරින්ට මේ පුරප්පාඩු පුරවාගන්න චක්‍රලේඛයක් නැද්ද කියලා. මේ විභාගය පාස් වෙලා සිටින අය මා සමඟ පෞද්ගලිකව ඒ ගැන කථා කරලා තිබෙනවා. ඒ ගොල්ලන්ට අනාගතය ගැන තීරණයක් ගන්න නම් මේ තනතුරු තමන්ට හම්බ වෙනවාද, නැද්ද කියලා දැනගන්න ඕනෑ. ඔබතුමාට මේ සම්බන්ධයෙන් මැදිහත්වීමක් කරන්න පුළුවන්ද, ගරු ඇමතිතුමනි?

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)

ගරු මන්ත්‍රීතුමනි, බන්ධනාගාර දෙපාර්තමේන්තුව තිබෙන්නේ ගරු ලොහාන් රත්වත්තේ රාජ්‍ය ඇමතිතුමා යටතේයි. මම කැබිනට් අමාත්‍යවරයා හැටියටයි කටයුතු කරන්නේ. මම රාජ්‍ය ඇමතිතුමා සහ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධාරින් සමඟ මේ ගැන සාකච්ඡා කරන්නම්. ඉක්මනින් මේ ප්‍රශ්නය විසඳීමට අපි උත්සාහ කරනවා. [බාධා කිරීමක්]

**ගරු මනූෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමාගෙන් මටත් ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. ඒ සඳහා සුළු වෙලාවක් ලබා දෙන්න.

ගරු ඇමතිතුමනි, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේත්, පොලීසියේත් වැටුප් වැඩිවීම් සිද්ධ වෙන්නේ එකට. පසුගිය කාලයේ පොලිස් නිලධාරින්ගේ වැටුප් සියයට 70කින් පමණ වැඩි වුණා. නමුත්, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ වැටුප් ඒ ප්‍රමාණයට වර්ධනය වුණේ නැහැ. දැන් අවුරුදු එකහමාරක් පමණ ගතවී තිබෙනවා. ඔවුන්ට වැටුප් වැඩි වෙන්නේ කවදාද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)

ගරු මන්ත්‍රීතුමනි, ගරු රාජ්‍ය ඇමතිතුමාගේ ඉල්ලීම අනුව ඒ සම්බන්ධයෙන් අපි කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. එය කැබිනට් අනු කමිටුවකට ඉදිරිපත් කර තිබුණා. මේ සම්බන්ධයෙන් යම් යම් නිරීක්ෂණ ඉදිරිපත් කර තිබෙනවා. ඒ අනුව අපේ නිලධාරින් ගිහිල්ලා ඔවුන්ට ඒ සම්බන්ධයෙන් වැඩිදුර කරුණු දක්වන්න උත්සාහ කරනවා. වැටුප් වැඩි වීම පිළිබඳ නිශ්චිත දිනයක් කියන්න බැහැ. නමුත්, ඔබතුමා වාගේම අමාත්‍යාංශය හැටියට අපත්, ඒ වැටුප් වැඩිවීම ලබා දිය යුතුයි කියන ස්ථාවරයේ සිටිනවා.

## "වයඹ සංස්කෘතික චතුරශ්‍ර" ව්‍යාපෘතිය: බඳවා ගත්/ ඉවත් කළ සේවකයන්

## “வடமேல் கலாசார சதுக்கம்" கருத்திட்டம்: ஆட்சேர்ப்புச் செய்யப்பட்ட/ பணி நீக்கம் செய்யப்பட்ட ஊழியர்கள்

## “WAYAMBA CULTURAL SQUARE” PROJECT: EMPLOYEES RECRUITED/ REMOVED

826/2020

**5. ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

අග්‍රාමාත්‍ය සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) "වයඹ සංස්කෘතික චතුරශ්‍ර" ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇති බව එතුමා දන්නේද?

(ආ) (i) 2015 වර්ෂය වන විට ඉහත ව්‍යාපෘතියේ සේවය කරන ලද සේවකයන් සංඛ්‍යාව;

(ii) එම ව්‍යාපෘතියේ සේවය කරමින් සිටියදී 2015 වර්ෂයෙන් පසු ඉවත් කරන ලද සේවකයන් සංඛ්‍යාව;

(iii) එම සේවකයන් සේවයෙන් ඉවත් කරන ලද පදනම;

(iv) 2015 වර්ෂයෙන් පසුව බඳවා ගනු ලැබූ සේවකයන් සංඛ්‍යාව;

(v) එම සේවකයන් බඳවා ගනු ලැබූ පදනම;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) ඉහත ව්‍යාපෘතියේ සේවය කරන ලද සේවකයන් දේශපාලන හේතු මත සේවයෙන් ඉවත් කර ඇති බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම සේවකයන්ට සාධාරණය ඉටු කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்டவினா:

(அ) “வடமேல் கலாசார சதுக்கம்" கருத்திட்டம் நடைமுறைப்படுத்தப்பட்டுள்ளதென்பதை அவர் அறிவாரா?

(ஆ) (i) 2015 ஆம் ஆண்டளவில் மேற்குறிப்பிட்ட கருத்திட்டத்தில் பணியாற்றிய ஊழியர்களின் எண்ணிக்கை;

[ගරු ශාන්ත බණ්ඩාර මහතා]

(ii) மேற்குறிப்பிட்ட கருத்திட்டத்தில் பணியாற்றுகையில் 2015ஆம் ஆண்டுக்குப் பின்னர் பணி நீக்கம் செய்யப்பட்டுள்ள ஊழியர்களின் எண்ணிக்கை;

(iii) மேற்படி ஊழியர்கள் பணி நீக்கம் செய்யப்பட்டமைக்கான அடிப்படை;

(iv) 2015ஆம் ஆண்டுக்குப் பின்னர் ஆட்சேர்ப்புச் செய்யப்பட்ட ஊழியர்களின் எண்ணிக்கை;

(v) மேற்படி ஊழியர்கள் ஆட்சேர்ப்புச் செய்யப்பட்ட அடிப்படை;

யாதென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) மேற்படி கருத்திட்டத்தில் பணியாற்றிய ஊழியர்கள் அரசியல் காரணங்களுக்காக பணிநீக்கம் செய்யப்பட்டுள்ளார்கள் என்பதை ஏற்றுக்கொள்வாரா?

(ii) ஆமெனில், இந்த ஊழியர்களுக்கு நியாயத்தை நிலைநாட்ட நடவடிக்கைகளை மேற்கொள்வாரா?

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddhasasana, Religious and Cultural Affairs:

(a) Is he aware that a project titled "Wayamba Cultural Square" had been implemented?

(b) Will he inform this House -

(i) the number of persons who had been employed under the project in 2015;

(ii) the number of employees who had been removed from the project after the year 2015;

(iii) the basis on which they were removed;

(iv) the number of persons who were employed after the year 2015; and

(v) the basis on which they were employed?

(c) Will he also inform this House-

(i) whether he admits that persons who had been employed under the project had been removed due to political reasons?

(ii) if so, whether measures will be taken to serve justice to the aforesaid employees?

(d) If not, why?

**ගරු විදුර වික්‍රමනායක මහතා (ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க - தேசிய மரபுரிமைகள், அருங்கலைகள் மற்றும் கிராமியச் சிற்பக்கலைகள் மேம்பாட்டு அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Vidura Wickramanayaka - State Minister of National Heritage, Performing Arts and Rural Arts Promotion)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) මහින්ද චින්තන ප්‍රතිපත්තිය අනුව "අතීත අභිමන හෙටටත්" යන සංකල්පයට අනුකූල වන පරිදි 2010 අය වැය යෝජනාවට අනුව අමාත්‍ය මණ්ඩල සංදේශය සීඑච්/37/2009 (ඇමුණුම 1) හා 2009.10.21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි වයඹ සංස්කෘතික චතුරශ්‍ර ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි. (ඇමුණුම 2 හා ඇමුණුම 3)

(ආ) (i) මධ්‍යම සංස්කෘතික අරමුදල යටතේ වයඹ චතුරශ්‍ර ව්‍යාපෘතියේ ස්ථිර සේවකයන් 177ක් හා සීමාසහිත සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරීම් පෞද්ගලික සමාගම මගින් ශ්‍රම කොන්ත්‍රාත්තුව යටතේ සේවකයන් 346 දෙනෙකු ද සේවයේ යොදවා ඇත. (ඇමුණුම 4)

(ii) 2015.09.21වන දින 1933/13 දරන අති විශේෂ ගැසට් පත්‍රය (ඇමුණුම 5) මගින් මධ්‍යම සංස්කෘතික අරමුදල, අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය පථයට ගැනුණු අතර, සීමාසහිත සංස්කෘතික සංරක්ෂණ ඉදිකිරීම් පෞද්ගලික සමාගම සමඟ ඇති කරගත් ගිවිසුමේ ගිවිසුම් කාලය දීර්ඝ නොකළ බැවින් ශ්‍රම කොන්ත්‍රාත්තුව යටතේ සේවය ලබා ගත් සමාගමේ සේවකයන් 346 දෙනෙකුගේ සේවා කාලය දීර්ඝ නොකරන ලදී. (ඇමුණුම 4)

(iii) සීමාසහිත සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරීම් පෞද්ගලික සමාගම මගින් ශ්‍රම කොන්ත්‍රාත්තුවේ ගිවිසුම් කාලය දීර්ඝ නොකරනු ලැබූ බැවිනි.

(iv) 2015 වර්ෂයෙන් පසුව බඳවා ගන්නා ලද ස්ථිර කම්කරු සේවක සංඛ්‍යාව 716ක් වේ.

(v) මධ්‍යම සංස්කෘතික අරමුදල 2015.09.21වන දිනැති 1933/13 දරන අති විශේෂ ගැසට් පත්‍රය (ඇමුණුම 5) මගින් අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය පථයට ගැනුණු අතර, කම්කරු සේවක පිරිස එම අමාත්‍යාංශය මගින් බඳවා ගන්නා ලදී.

(ඇ) (i) තත්කාලීනව එවකට රේඛීය අමාත්‍යාංශය මගින් අදාළ සමාගම සමඟ ගිවිසුම්ගත කාලය දීර්ඝ නොකිරීමේ ප්‍රතිපත්තිමය තීරණ මිස දේශපාලන පළිගැනීමක් සම්බන්ධව එම ක්‍රියාවලිය තුළ අර්ථ ගම්‍යවීමක් නොමැත.

(ii) මෙම සේවකයන් මධ්‍යම සංස්කෘතික අරමුදලට බඳවා ගෙන නොමැත. සේවා අවශ්‍යතාව මත සීමාසහිත සංස්කෘතික සංරක්ෂණ ඉදිකිරීම් පෞද්ගලික සමාගම සමඟ ගිවිසුම්ගතව සේවා ලබා ගෙන ඇත.

(ඈ) මෙකී පිරිස මධ්‍යම සංස්කෘතික අරමුදලේ ස්ථිර, අනියම් හෝ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් පිරිසක් නොවේ.

ගරු කථානායකතුමනි, ඇමුණුම් 1, 2, 3, 4 සහ 5 මම **සභාගත*** කරනවා.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

ගරු කථානායකතුමනි, පිළිතුර ලබා දීම පිළිබඳව ගරු රාජ්‍ය ඇමතිතුමාට මා ස්තුතිවන්ත වෙනවා. මොකද, එම සේවකයන්ගෙන් නැඟුණු මැසිවිලි ගණනාවක් තිබුණා. විශේෂයෙන්ම පසුගිය 2010-2015 රජය කාලය තුළ බඳවා ගත් සේවකයන් විශාල ප්‍රමාණයකට සේවය අහිමි වුණු නිසා තමයි මම මේ ප්‍රශ්නය ඇසුවේ. ඒ කටයුත්ත නෛතික පදනමක් තුළ සිදු කර තිබෙනවා කියන කාරණය ගරු රාජ්‍ය ඇමතිතුමා මතක් කළා.

---

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. අපි කවුරුත් දන්නවා, වයඹ සංස්කෘතික චතුරශ්‍රය හා සම්බන්ධ වෙලා තිබෙන්නේ දඹදෙණිය, පඬුවස්නුවර, යාපහුව සහ කුරුණෑගල කියන රාජධානි හතර බව. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මෙම වයඹ සංස්කෘතික චතුරශ්‍රයේ සේවකයන් සහ එහි කළමනාකාරිත්වය යාබද රාජධානි ආශ්‍රිතව සංස්කෘතික වටිනාකමක් තිබෙන, පෞරාණික වැදගත්කමක් තිබෙන සිද්ධස්ථාන සංරක්ෂණය කිරීම සඳහා සහයෝගය ලබා දෙමින්, කුඩා කණ්ඩායම් යොදවා විශේෂයෙන්ම විහාරස්ථාන සහ සිද්ධස්ථානවල කටයුතු සිද්ධ කළා. නමුත් මේ වනවිට එම කටයුතු යම් ප්‍රමාණයකින් අඩපණ වෙලා තිබෙනවා. ඒ පිළිබඳ ඔබතුමාගේ අවධානය යොමු කරලා එම කාර්ය භාරය නැවත වතාවක් කාර්යක්ෂමව කරන්න පුළුවන්ද කියලා මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු විදුර වික්‍රමනායක මහතා**
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)

ගරු කථානායකතුමනි, එම කාර්යයන් කාර්යක්ෂම කිරීමේ වැඩ පිළිවෙළ මේ වන විට ආරම්භ කර තිබෙනවා. මීට දින තුනහතරකට පෙර අපි දඹදෙණියේ කැණීම් ආරම්භ කළා. ඒ වාගේම, යාපහුවේ කැණීම් කටයුතු මේ වන විට අවසන් කර තිබෙනවා. කුරුණෑගල කැණීම් කටයුතු සම්බන්ධයෙන් අපට ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. මුළු කුරුණෑගල නගරයම තිබෙන්නේ පුරාවස්තු මතයි. ඒ වාගේ බරපතළ ප්‍රශ්නයකටත් අපි මුහුණ දී තිබෙනවා. ඒ කෙසේ වෙතත්, ඒ උරුමයන් අනාගත පරම්පරාවලට දායාද කිරීමේ කටයුත්ත පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මේ වන විට ඉතා කාර්යක්ෂමව කරගෙන යනවා.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු රාජ්‍ය ඇමතිතුමනි. විශේෂයෙන්ම අපේ ගරු රාජ්‍ය ඇමතිතුමාත් දන්නවා, "දඹදෙණිය" කියන්නේ අපේ රටේ තුන්වැනි රාජධානිය වාගේම ශ්‍රී දළ දා වහන්සේට ආරක්ෂාව ලබා දුන් පුණ්‍ය භූමියක් වන බව. ඒ වාගේම, දඹදෙණිය රාජමහා විහාරස්ථානය ඉතාම වැදගත් ආගමික සිද්ධස්ථානයක් කියන එකත් අපි කවුරුත් පිළිගන්නවා. 1994 වර්ෂයේදී පත් වුණු පොදුජන එක්සත් පෙරමුණ ආණ්ඩුව කාලයේ ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ නායකත්වයෙන් දඹදෙණිය පූජා භූමියක් බවට පත් කළා. නමුත්, ඒ තත්ත්වය ඉදිරියට ගමන් කළේ නැහැ. චන්ද්‍රිකා බණ්ඩාරනායක හිටපු ජනාධිපතිතුමිය තමයි එදා ඒ අවස්ථාවට සම්බන්ධ වුණේ. එදා විශාල සංවර්ධන කාර්යභාරයක් කළා. නමුත් ඒ වැඩ පිළිවෙළ පසුගිය කාලවල ඇන හිට තිබෙනවා. ඒ නිසා මම අපේ ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගෙනුත් ඒ කාරණය සම්බන්ධයෙන් විශේෂ ඉල්ලීමක් කළා. ඒ සඳහා එතුමාගේත් සම්පූර්ණ ආශීර්වාදය ලැබෙනවා. මොකද, එතුමා කුරුණෑගලින් පත් වෙච්ච මහජන නියෝජිතයෙක් නිසා. ඒ වාගේම, මේ රටේ අග්‍රාමාත්‍යතුමා හැටියටත්, හිටපු ජනාධිපතිවරයා හැටියටත් එතුමා දඹදෙණියට විශාල අවධානයක් යොමු කර තිබෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ රාජ්‍ය අමාත්‍යාංශය ගරු අග්‍රාමාත්‍යතුමා සමඟ ඒකාබද්ධ වෙලා දඹදෙණිය රාජමහා විහාරස්ථානය නැවත නීත්‍යනුකූලව පූජා භූමියක් බවට පත් කරලා එහි ඉතිරි සංවර්ධන කටයුතු කර දෙන්න කියා ඒ ප්‍රදේශය වෙනුවෙන්, ඒ ප්‍රදේශයේ මහා සංඝ රත්නය වෙනුවෙන්, ඒ සියලු ජනතාව වෙනුවෙන් මා මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා. ඒ කාර්යය කරන්න පුළුවන් ද කියන ප්‍රශ්නය මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි, ගරු රාජ්‍ය අමාත්‍යතුමනි.

**ගරු විදුර වික්‍රමනායක මහතා**
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)

ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමා නියෝජනය කරන දිස්ත්‍රික්කය වන කුරුණෑගල දිස්ත්‍රික්කයේ අපි විශාල වැඩ කොටසක් ආරම්භ කර තිබෙනවා. ඒ පිළිබඳව ඉදිරි කාලයේදී ගරු මන්ත්‍රීතුමන්ලා සියලුදෙනා දැනුවත් කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා. යම් යම් අඩු පාඩුකම් ඇති. ඒ අඩු පාඩුකම් මඟ හරවාගෙන අපි ඉදිරියට යා යුතුයි. ඒ හින්දා ඔබතුමන්ලාගේත් යෝජනා හා අදහස් ලබාගෙන ඒ කටයුතු වඩාත් කාර්යක්ෂමව, ක්‍රමවත්ව හා විධිමත්ව කරන්නයි අප බලාපොරොත්තු වන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නයට දෙන්න තිබෙන සරල උත්තරය, "පුළුවන්" කියන එකයි.

## රජයේ ණය ආපසු ගෙවීම: විස්තර
அரசாங்கக் கடனை மீளச்செலுத்தல்: விபரம்
REPAYMENT OF GOVERNMENT DEBT: DETAILS

876/2020

**6. ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) නිදහස ලැබුණු දින සිට ණය ගෙවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව නොකැළැල් ඉතිහාසයක් පවත්වාගෙන යමින් සිටි බව ශ්‍රී ලංකා රජය විසින් නොකඩවා ප්‍රකාශ කරන ලද බවත්;

(ii) මූඩි ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතනය විසින් ශ්‍රී ලංකාවේ ණය ආපසු ගෙවීමේ හැකියාව B2 සිට Caa1 දක්වා මට්ටම් දෙකකින් පහත දමා ඇති බවත්;

එතුමා පිළිගන්නේද?

(ආ) (i) 2020, 2021 සහ 2022 වර්ෂ සඳහා ශ්‍රී ලංකාවේ පොලී සහ ක්‍රමක්ෂය ගෙවීම්වල මුළු වටිනාකම කවරේද ;

(ii) 2020, 2021 සහ 2022 වර්ෂ සඳහා පුරෝකථනය කරන ලද සමස්ත අය වැය හිඟය කවරේද ;

(iii) 2020 වර්ෂයේ පළමුවන, දෙවන හා තුන්වන කාර්තු සඳහා රජයේ ආදායම කවරේද;

(iv) 2020, 2021 සහ 2022 වර්ෂ සඳහා පුරෝකථනය කරන ලද සමස්ත ආදායම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) ණය ගෙවීම පැහැර හැරීම වැළැක්වීම සඳහා රජය විසින් ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

(ii) ශ්‍රී ලංකාව විසින් තම ණය ගෙවීම පැහැර හරිනු ලබන්නේ නම්, ශ්‍රී ලංකාවේ ආර්ථිකය වෙත ඇති වන බලපෑම කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சர் மற்றும் நிதி அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) இலங்கை அரசாங்கம் கடன் மீளச்செலுத்துதல் தொடர்பாக சுதந்திரம் அடைந்ததிலிருந்து கறைபடாத வரலாற்றை பேணி வந்ததாக மீண்டும் மீண்டும் கூறியதையும்;

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා ]

(ii) இலங்கையின் மீளச்செலுத்தும் இயலுமையை மூடீஸ் கடன் தரப்படுத்தும் முகவராண்மை B2 இலிருந்து Caa1 வரை இரு மட்டங்களால் தரவிறக்கம் செய்துள்ளமையையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) (i) இலங்கையின் 2020, 2021 மற்றும் 2022ஆம் ஆண்டுகளுக்கான வட்டி மற்றும் கடன் தீர்ப்புக் கொடுப்பனவுகளின் மொத்தப் பெறுமதியையும்;

(ii) 2020, 2021 மற்றும் 2022ஆம் ஆண்டுகளுக்கான எதிர்வுகூறப்பட்ட மொத்த வரவுசெலவுத்திட்டப் பற்றாக்குறையின் பெறுமதியையும்;

(iii) 2020ஆம் ஆண்டுக்கான முதலாம், இரண்டாம் மற்றும் மூன்றாம் காலாண்டுகளுக்கான அரசாங்கத்தின் வருமானத்தையும்;

(iv) 2020, 2021 மற்றும் 2022ஆம் ஆண்டுகளுக்கான எதிர்வுகூறப்பட்ட மொத்த வருமானத்தின் பெறுமதியையும்;

அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(இ) (i) தவணைத் தவறுகையை தவிர்ப்பதற்கு இலங்கை அரசாங்கத்தால் மேற்கொள்ளப்படும் நடவடிக்கைகளையும்;

(ii) அரசாங்கம் கடனை மீளச்செலுத்தத் தவறுமாயின் இலங்கையின் பொருளாதாரம் மீதான தாக்கத்தையும்;

அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Finance:

(a) Will he admit that -

(i) the Government of Sri Lanka has repeatedly stated that Sri Lanka has been maintaining an unblemished history since Independence with regard to repaying of debt; and

(ii) Moody's credit rating agency has downgraded the repayment ability of Sri Lanka by two levels from B2 to Caa1?

(b) Will he inform this House, relating to Sri Lanka, -

(i) the total value of interest and amortization payments for the years 2020, 2021 and 2022;

(ii) the total forecast budget deficit for the years 2020, 2021 and 2022;

(iii) the Government's revenue for the first, second and third quarters of the year 2020; and

(iv) the total forecast revenue for the years 2020, 2021 and 2022?

(c) Will he also inform this House -

(i) the measures to be taken by the Government of Sri Lanka to avoid default; and

(ii) the impact on the economy of Sri Lanka, if the Government defaults on its debt?

(d) If not why?

**ගරු අජිත් නිවාඞ් කබ්රාල් මහතා (මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳ පොළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் நிவாட் கப்ரால் - நிதி, மூலதனச் சந்தை மற்றும் அரச தொழில்முயற்சி மறுசீரமைப்பு இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith Nivard Cabraal - State Minister of Money and Capital Market and State Enterprise Reforms)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

වර්ෂ 2015 සිට 2019 දක්වා කාලය තුළ, එනම් B1 (stable) ශ්‍රේණිය 2016 වර්ෂයේදී B1 (negative) දක්වා අඩු වුණු බවත්, 2018 වර්ෂයේදී B2 (stable) දක්වා අදියර දෙකකින් අඩු වුණු බවත් ප්‍රකාශ කරනවා.

(ආ) (i)

| | 2020 | 2021 | 2022 |
|---|---|---|---|
| පොලිය | 866 | 860 | 960 |
| ණය වාරිකය | 988 | 1.257 | 1,257 |
| **එකතුව** | **1,854** | **2,117** | **2,217** |

(ii) 2021 අය වැයට සමගාමීව පුරෝකථනය කරන ලද අය වැය හිඟය

රුපියල් බිලියන

| | 2020 | 2021 | 2022 |
|---|---|---|---|
| අය වැය හිඟය | 1,266 | 1,565 | 1,242 |

(iii) රාජ්‍ය ආදායම:

රුපියල් බිලියන

| | 2020 Q1 | 2020 Q2 | 2020 Q3 |
|---|---|---|---|
| රාජ්‍ය ආදායම (ප්‍රදාන ද ඇතුළත්) | 407 | 258 | 366 |

(iv) පුරෝකථනය කරන ලද රාජ්‍ය ආදායම:

| | 2020 | 2021 | 2022 |
|---|---|---|---|
| රාජ්‍ය ආදායම (ප්‍රදාන ද ඇතුළත්) | 1,528 | 1,961 | 2,386 |

(ඇ) (i) ශ්‍රී ලංකාව ණය සේවාකරණ ගෙවීම පැහැර හැර නොමැති බැවින් මෙම ගැටලුව පැන නොනඟී.

(ii) පැන නොනඟී.

(ඈ) පැන නොනඟී.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

රජය පත් වෙලා මාස 11යි. මෙම ප්‍රශ්නවලට පිළිතුරක් ලබාදීම ගැන බොහොම ස්තුතියි, ගරු රාජ්‍ය ඇමතිතුමනි.

ගරු කථානායකතුමනි, 2020 වර්ෂයේ විදුලි බිල ගෙවලා නැහැ කියලා ඔබතුමාට විදුලි බල මණ්ඩලයෙන් බිල්පතක් ලැබුණොත්, ඔබතුමා ඒක 2021 වර්ෂයේ ගෙව්වොත්, එම ගෙවීම යන්නේ 2020 ගිණුමටද, 2021 ගිණුමටද? ලබා දුන් සංඛ්‍යා දත්ත අනුව, 2020 වර්ෂයේ වියදම අඩුයි කියලා මෙම රජය පෙන්වා තිබෙනවා. ඒ කියන්නේ, රුපියල් බිලියන 480ක් 2019 වර්ෂයේ ගිණුමට දමා තිබෙනවා. හැබැයි, ඒ මුදල ගෙවලා තිබෙන්නේ 2020 වර්ෂයේදී. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම අහන ප්‍රශ්නය තමයි, පිළිගත්, මෙපමණ කාලයක් ක්‍රියාත්මක කරපු ගිණුම් ප්‍රතිපත්තිය වෙනස් කළේ ඇයි කියන එක. මොකද, එහෙම වෙනස් කළාම ඒක හරියට ගිණුම් විජ්ජාවක් වාගේ වෙනවා.

**ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා**
(மாண்புமிகு அஜித் நிவாட் கப்ரால்)
(The Hon. Ajith Nivard Cabraal)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ගිණුම් විජ්ජාව ගැන හොඳට දන්නවා කියා මා හිතනවා. ඊනෑ නම් ඔබතුමන්ලා කර තිබෙන ගිණුම් විජ්ජා ගැන මම දවසක කථා කරන්නම්. මෙතැනදී කිව යුතු දේ තමයි, යම්කිසි වර්ෂයක් සඳහා යම් මුදලක් වැය වුණා නම් එම මුදල ගෙවා ගැනීමට බැරි වුණු නිසා අනෙක් අවුරුද්දට එකතු කරන්න අවශ්‍ය නැහැ. ඔබතුමන්ලා දන්නවා, accrual accounting කියන එක. Banker කෙනකු හැටියට ඔබතුමාත් ඒ subject එක හොඳට ඉගෙන ගෙන තිබෙනවා කියා මා හිතනවා. ඔබතුමා දන්නවා, accrual accounting කරද්දී, ඒ අවුරුද්දේ අවශ්‍යතා වෙනුවෙන් කළ යුතු දේවල් සඳහා දැවැන්ත මුදලක් අවශ්‍ය වන බව. එම මුදල ඒ අවුරුද්ද තුළදී වියදම් කරන්න අවශ්‍ය වුණත්, ඒ මුදල නොගෙවපු නිසා ඊළඟ අදියරයට යනවා නම්, අපි ඒ පිළිබඳ නිවැරදි ක්‍රමවේදයක් පාවිච්චි කරන්න අවශ්‍යයි. මම හිතන විධියට, එතැනදී එම ක්‍රමවේදය පාවිච්චි කරලා 2019 සඳහා වැය කරපු ඒ මුදල් 2019 ගිණුමේ හරි ආකාරයට පෙන්වා තිබෙනවා. ඒ නිසා නිවැරදි ක්‍රමයක් තමයි කරලා තිබෙන්නේ කියා මා හිතනවා. ඒක හොඳයි. අනෙක් කාරණාව මේකයි. කිසි විටෙක එතැන වැරැද්දක් සිදු වෙලා තිබෙනවා කියා විගණකාධිපතිතුමා කියලා නැහැ. මම හිතන විධියට ඔබතුමන්ලා 2019 වසරේදී තිබුණු අය වැය පරතරය අඩුයි කියලා පෙන්වන්න තමයි එහෙම නොගෙවා ඉඳලා තිබෙන්නේ, IMF එක සතුටු කරන්න. ඒ වුණාට ඒ මුදල් ගෙව්වා නම්, 2019 සඳහා ගෙවන්න තිබුණු මුදල් හරි ආකාරයට තමයි අපි පෙන්වා දීලා තිබෙන්නේ.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

හැම අවුරුද්දේම ගෙවන්න තිබෙන වියදම් තිබෙනවා. ඒවා දෙසැම්බර් මාසය පහු වුණාට පස්සේ ඊළඟට අවුරුද්දට යනවා. හැම තිස්සේම ඒක සිදුවෙලා තිබෙනවා. ඒක අලුත් දෙයක් නොවෙයි. නමුත් ජාතික ප්‍රතිපත්තිය accrual accounting නොවෙයි. Cash basis accounting system එකක් තමයි තිබිලා තිබෙන්නේ. මම අහන ප්‍රශ්නය තමයි, ඔබතුමා ඒක වෙන් කළේ ඇයි කියන එක. අය වැය පරතරය සියයට 11ක් කියලා ඔබතුමා පෙන්නුවා. ඇත්තටම අය වැය පරතරය සියයට 14යි. ඒකයි, මේක ගිණුම් විජ්ජාවක් කියලා මම කිව්වේ.

**ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා**
(மாண்புமிகு அஜித் நிவாட் கப்ரால்)
(The Hon. Ajith Nivard Cabraal)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නයට පිළිතුරු දෙන්න මා කැමැතියි. ඔබතුමන්ලා ඒ විධියට හිතනවා නම්, 2019 වර්ෂය සඳහා සියයට 6ක් කියා පෙන්වන්න හදනවා නම් ඇත්ත වශයෙන්ම සියයට 9යි වෙන්නේ. එහෙම නම් ඒක වැරදි බව ඔබතුමන්ලා පිළිගන්නට අවශ්‍යයි.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

නැහැ, එහෙම වෙන්නේ නැහැ. හැම දාම තිබිලා තිබෙන්නේ cash basis accounting system එකක්. [බාධා කිරීම්] දිගටම තිබිලා තිබෙන්නේ cash basis accounting system එකක්. මේ අවුරුද්දේ විතරයි ඒක වෙනස් කර තිබෙන්නේ.

මගේ ඊළඟ අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කිව්වා නේ, විජ්ජා ගැන පස්සේ කථා කරනවා කියලා. ඔබතුමාගෙන්ම විතරයි අපට මේක අහන්න පුළුවන්. ඔබතුමාට පිළිතුරු දෙන්න පුළුවන්ද කියන එක මම දන්නේ නැහැ. මම පුවත් පත්වලින් දැක්කා, "සුබේරි" කියා පුද්ගලයෙක් ඇමෙරිකානු ඩොලර් මිලියන 8කට වැඩි කොන්ත්‍රාත්තුවක් ලබාගත් එකක් ගැන. මේකත් මහ බැංකුවට අයිති කථාවක්. ඒකයි මම අහන්නේ. ඒකෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 5.6ක් ගිහිල්ලා තිබෙන්නේ ඒ පුද්ගලයාගේ පෞද්ගලික account එකට. ඒ පුද්ගලයා unregistered lobbyist කෙනෙක් කියලා ඇමෙරිකාවේ අධිකරණයෙන් අවුරුදු 12කට හිරේ යවලා තිබෙනවා. මම අහන්න කැමැතියි, ඒ lobbies ගත්ත එකේ අරමුණ මොකක්ද, ඒ තීරණය ගත්තේ කවුද, ඒක අනුමත කළේ කවුද, මුදල් මණ්ඩලය ඒක අනුමත කළාද, අය වැයෙන් ඒකට මුදල් වෙන් කළාද, පාර්ලිමේන්තුව ඒක අනුමත කළාද කියලා.

දැන් ඒක අධිකරණයෙන් තීරණය වෙලා තිබෙනවා. ඒ අනුව, එම පුද්ගලයා අවුරුදු 12කට හිරේ ගිහිල්ලා තිබෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔය සිද්ධිය වෙනකොට ඔබතුමා මහ බැංකුවේ අධිපති වශයෙන් සිටියේ. ඔබතුමාට මේකට පිළිතුරු දෙන්න පුළුවන්ද මම දන්නේ නැහැ. මොකද, මේක conflict of interest එකක් වෙන්න පුළුවන්. මට දැනගන්න ඕනෑ, රජය මේ සම්බන්ධයෙන් ගන්නා පිළිවෙත මොකක්ද කියන එකයි.

**ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා**
(மாண்புமிகு அஜித் நிவாட் கப்ரால்)
(The Hon. Ajith Nivard Cabraal)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා දැන් අහපු ප්‍රශ්නය වෙනස් ප්‍රශ්නයක්. එතුමාට ඒ ප්‍රශ්නය වෙනම අහන්න තිබුණා. ඒ වුණත් දැන් මම ඒකට උත්තරයක් දෙන්නම්. එතුමා සම්ප්‍රදාය සම්පූර්ණයෙන්ම කඩ කරමින්, එතුමා ඇසූ ප්‍රධාන ප්‍රශ්නයට කිසිම සම්බන්ධයක් නැති අතුරු ප්‍රශ්නයක් ඒ ඇහුවේ. එතුමාට ඒක වැරදිලා තිබෙනවා. ඒකයි වෙලා තිබෙන්නේ. [බාධා කිරීමක්] ඔබතුමා පොඩ්ඩක් අහගෙන ඉන්න. ඔබතුමා ප්‍රශ්නය අහනකොට මම ඒක අහගෙන සිටියා නේ. ගරු කථානායකතුමනි, මේ පිළිබඳව සොයා බලන්න එතුමාට අවුරුදු පහක් තිබුණා. එතුමා, ඒ කාලයේ සිටි මුදල් රාජ්‍ය ඇමතිවරයා. වැරැද්දක් තිබුණා නම්, එතුමාට ඒ අවුරුදු පහ තුළ ඒ ගැන කථා කරන්න තිබුණා. එතුමා ඒ කාලයේ ඒවා මොකුත් කථා නොකර ඉඳලා, දැන් අපට මඩ ගහන එක තමයි කරන්නේ. [බාධා කිරීමක්] ඔබතුමා පොඩ්ඩක් වාඩිවෙලා ඉන්න. මඩ ගැසීම මෙතුමන්ලාට සුපුරුදු දෙයක්, ගරු කථානායකතුමනි. එම නිසා තමයි මේ ප්‍රශ්නයට කිසිම සම්බන්ධයක් නැති කාරණයක් මෙතැනට ගෙනැල්ලා තිබෙන්නේ. - [බාධා කිරීමක්] Yes, that is their subject.

[ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා]

I want to tell the Hon. Member that all these have been done according to the procedures that had been laid down and that there has been absolutely nothing that they could show as being erratic, erroneous or illegal. Now, just because they want to sling some mud, which is their normal practice, they are doing it. - [*Interruption*.] So, I want to just tell the Hon. Member that we held him in esteem; we thought he is a banker and that he has certain norms which he used to follow. But, I am afraid that now, I cannot think of you the same way when you ask this kind of questions, Hon. Member. So, I would ask you, if you like, to raise it separately as a Question and we will give you a complete answer.

Thank you.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මම ඒ ප්‍රශ්නය ඇහුවේ, - [බාධා කිරීම්] ඔබතුමාට අදාළ - [බාධා කිරීම්]

**ගරු ලොහාන් රත්වත්තේ මහතා (මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය සහ බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා )**
(மாண்புமிகு லொஹான் ரத்வத்தே - இரத்தினக்கல், தங்க ஆபரணங்கள் சார்ந்த கைத்தொழில் இராஜாங்க அமைச்சரும் சிறைச்சாலைகள் முகாமைத்துவம் மற்றும் சிறைக்கைதிகள் புனர்வாழ்வளிப்பு அலுவல்கள் இராஜாங்க அமைச்சரும்)
(The Hon. Lohan Rathwaththe - State Minister of Gem and Jewellery Related Industries and State Minister of Prison Management and Prisoners' Rehabilitation)
මොනවාද මේ කියවන්නේ? [බාධා කිරීමක්]

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමාට වාඩිවෙන්න කියන්න. එතුමා නැඟිටලා නිකම් කථා කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රශ්නයට පිළිතුරු දීලා අවසානයි නේ. දැන් ඔබතුමා වාඩිවෙන්න.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ඔය ප්‍රශ්න වෙන කොහේ හරි ගිහිල්ලා විසඳා ගන්න. [බාධා කිරීමක්] නිකම් වැඩකට නැති දේවල් කියනවා. Sir, make him sit down, please.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ඒ සම්බන්ධයෙන් වෙනම ප්‍රශ්නයක් අහලා පිළිතුරු ලබා ගන්න.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
එතුමා Standing Orders දන්නේත් නැහැ, ගරු කථානායකතුමනි.

## වලුක්කියාරු-අරාලි-වේලනයි-පුංගුඩුතිව් හරහා කුරිකට්ටුවාන් දක්වා මාර්ගය: ප්‍රතිසංස්කරණය
වலுக்கியாறு - அராலி - வேலணை - புங்குடுதீவு ஊடாக குறிகட்டுவான் வரையான வீதி: புனரமைப்பு
ROAD LEADING TO KURIKATTUWAN VIA VALUKKIYARU-ARALI-VELANAI AND PUNGUDUTIVU: RENOVATION

947/2020

**7. ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) වලුක්කියාරු - අරාලි - වේලනයි - පුංගුඩුතිව් හරහා කුරිකට්ටුවාන් දක්වා දිවෙන මාර්ගය, යාපනය දිස්ත්‍රික්කයේ වේලනයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ප්‍රධාන මාර්ගය බව එතුමා දන්නේද?

(ආ) (i) එම මාර්ගයේ දිග කොපමණද;

(ii) එම මාර්ගය අවසන් වරට ප්‍රතිසංස්කරණය කරන ලද දිනය කවරේද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වැය වූ මුදල කොපමණද;

(iv) ඒ සඳහා අරමුදල් සපයා ගන්නා ලද ප්‍රභවය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) ප්‍රධාන ප්‍රවාහන මාර්ගයක් වන ඉහත මාර්ගය ප්‍රතිසංස්කරණය නොකිරීම හේතුවෙන් එම ප්‍රදේශවල ජනතාව දුෂ්කරතාවන්ට මුහුණ දෙන බවත් එතුමා දන්නේද?

(ඈ) (i) එම මාර්ගය දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රතිසංස්කරණය නොකිරීමට හේතු කවරේද;

(ii) එම මාර්ගය ප්‍රතිසංස්කරණය කරනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඉ) නොඑසේනම්, ඒ මන්ද?

நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்டவினா:

(அ) வலுக்கியாறு - அராலி - வேலணை - புங்குடுதீவு ஊடாக குறிகட்டுவான் வரை செல்லும் வீதியானது யாழ்ப்பாண மாவட்டத்தின் வேலணைப் பிரதேச செயலாளர் பிரிவுக்குரிய பிரதான வீதியாகும் என்பதை அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி வீதியின் நீளம் யாது;

(ii) மேற்படி வீதி இறுதியாகப் புனரமைக்கப்பட்ட திகதி யாது;

(iii) மேற்படி புனரமைப்புப் பணிகளுக்காகச் செலவிடப்பட்ட தொகை எவ்வளவு;

(iv) அதற்கான நிதி பெற்றுக்கொள்ளப்பட்ட மூலம் யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) பிரதான போக்குவரத்துப் பாதையொன்றாக அமைந்துள்ள மேற்படி வீதி புனரமைப்புச் செய்யப்படாமையின் காரணமாக அப்பிரதேச மக்கள் அசௌகரியங்களை எதிர்நோக்கியுள்ளனர் என்பதையும் அவர் அறிவாரா?

(ஈ) (i) மேற்படி வீதி நீண்டகாலமாகப் புனரமைக்கப் படாமைக்கான காரணங்கள் யாவை;

(ii) மேற்படி வீதி புனரமைப்புச் செய்யப்படும் திகதி யாது;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(உ) இன்றேல், ஏன்?

asked the Minister of Highways:

(a) Is he aware that the road leading to Kurikattuwan via Valukkiyaru-Arali-Velanai and Pungudutivu is the main road in the Velanai Divisional Secretary's Division in the Jaffna District?

(b) Will he inform this House -

(i) the length of the aforesaid road;

(ii) the date on which the aforesaid road was last renovated;

(iii) the amount of money that was spent on the aforesaid renovations; and

(iv) the funding source for such renovation?

(c) Is he also aware that people in the above-named areas are facing difficulties as the aforesaid road, which is a major transport route, has not been repaired?

(d) Will he also inform this House -

(i) the reasons for not renovating the aforesaid road for a long time; and

(ii) the date on which that road will be renovated?

(e) If not, why?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) ඔව්.

(ආ) (i) කිලෝමීටර් 24.5යි.

(ii) (iii) (iv) පසුගිය වසර 30ක කාලය තුළ මෙම මාර්ගය ප්‍රතිසංස්කරණය කර නොමැත. සාමාන්‍ය නඩත්තු කටයුතු සිදු කරනු ලබයි.

(ඇ) පටු මාර්ගයක් නිසා, වරකට වාහන දෙකක් ගමන් කිරීම දුෂ්කරය, ගොවීන්, ධීවරයන්, බැතිමතුන් සහ සංචාරකයන් මෙම මාර්ගය භාවිත කිරීමේදී දුෂ්කරතාවන්ට මුහුණ දෙන අතර, ඩෙල්ෆ්ට් සහ නයිනතිව් දූපත් යනු, රටේ ආර්ථික සංවර්ධනයට දායක වන ඉහළ සංචාරක ස්ථානයන් වේ.

(ඈ) (i) ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය හරහා ඉහළ ප්‍රමුඛතා ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කිරීමට 2016 දී ටෙන්ඩර් කර ඇගැයීමට ලක් කර ඇත. නමුත්, මූල්‍ය ප්‍රතිපාදන නොමැති වීම නිසා ටෙන්ඩරය ප්‍රදානය කර නොමැත.

(ii) අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව කිලෝමීටර් 100,000 මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ මෙම සම්පූර්ණ මාර්ගයම ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ඇස්තමේන්තුගත කර ඇත. පළමු අදියර වශයෙන් කෝස්වේහි කිලෝමීටර් එකක්ද ඇතුළුව මාර්ගයේ කිලෝමීටර් තුනක කොටසක් ප්‍රතිසංස්කරණය සඳහා වැඩ පැවරුම් නිකුත් කර ඇත. 2021 ජූලි මස වැඩ ආරම්භ කිරීමට නියමිතය.

(ඉ) පැනනොනඟී.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் சொல்வதுபோல வழுக்கியாறு, அராலி, வேலணை, புங்குடுதீவு, குறிகாட்டுவான் ஆகிய இடங்களினூடாகச் செல்கின்ற பாதையானது 30 ஆண்டுகளுக்கும் மேலாகப் புனரமைப்புச் செய்யப்படாத ஒரு வீதியாக இருக்கின்றது. இலங்கையினுடைய பிரதானமான தீவுகளான நெடுந்தீவு, அனலைதீவு, நயினாதீவு போன்ற தீவுகளுக்குப் பயணஞ்செய்கின்ற, பெருமளவான மக்கள் வாழ்கின்ற ஒரு பெரிய தீவுப் பகுதியினுடைய பாதை இன்றுவரை புனரமைப்புச் செய்யப்படவில்லை. 'சௌபாக்கியா' திட்டத்தினூடாக இந்தப் பாதை புனரமைக்கப்படவுள்ளதாக நீங்கள் குறிப்பிடுகின்றீர்கள். அப்படியானால், பாதையினுடைய எந்த இடத்திலிருந்து எந்த இடம்வரைக்கும் அந்த 3 கிலோமீற்றர் தூரம் அமையுமென்பதை இந்தச் சபையிலே உங்களால் சொல்ல முடியுமா?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු මන්ත්‍රීතුමා, එම මාර්ගයේ සම්පූර්ණ දිග ප්‍රමාණය කිලෝමීටර් 24.5යි. ඒකේ එක කොටසක් විතරයි දීලා තිබෙන්නේ. ඒ කිලෝමීටර් 24.5ම අපි හදනවා.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ அமைச்சர் அவர்களே, என்னுடைய முதலாவது கேள்வி என்னவென்றால், அந்த 3 கிலோமீற்றர் தூரம் எங்கிருந்து ஆரம்பித்து எங்கு முடியுமென்று சொல்ல முடியுமா? என்பதுதான்.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

කිලෝමීටර් තුනක කොටසක් ප්‍රතිසංස්කරණය කරනවා කිව්වාම, ඒ කොතැන ඉඳලා කොතැනටද කියලා දැන් මට හරියටම කියන්න බැහැ. මම ඒ සම්බන්ධයෙන් ඔබතුමා දැනුවත් කරන්නම්. හැබැයි, ඒ කිලෝමීටර් 24.5ම අපි හදනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் குறிப்பிடுவதுபோல 3 கிலோமீற்றர் நீளமான பாதை எதுவும் இத்திட்டத்தினூடாகத் தெரிவுசெய்யப்படவில்லை. நெடுந்

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

தீவிலே 3 கிலோமீற்றர் நீளமான பாதையொன்று கொங்கிறீற் பாதையாகச் செய்வதற்காகத் தெரிவு செய்யப்பட்டிருக்கின்றது. இலங்கையிலே வேலணை, நெடுந்தீவு ஆகிய இரண்டு பிரதேச செயலாளர் பிரிவுகளிலும் பெரும்பாலான மக்கள் வாழ்கின்றார்கள். அந்தப் பிரதேசத்துக்குரியதாக இந்தத் தீவகப் பாதை காணப்படுகின்றது. அதிலும், யாழ்ப்பாணத்தினுடைய வழுக்கியாறு, அராலி, வேலணை, புங்குடுதீவு ஆகிய இடங்களுக்குச் செல்கின்ற மக்களும் குறிகாட்டுவானிலிருந்து நயினாதீவு, நெடுந்தீவு, அனலைதீவு ஆகியவற்றுக்குச் செல்கின்ற பெரும்பகுதி மக்களும் பயணஞ்செய்கின்ற பாதை இது. ஆகவே, இந்தப் பாதையினுடைய புனரமைப்பு எந்த இடத்திலிருந்து எப்பொழுது நடக்கும் என்பதற்கு எந்தப் பதிலும் உங்களிடமிருந்து கிடைக்கவில்லை. குறிப்பாக, வேலணைத் துறையிலிருந்து புங்குடுதீவினுடைய மடத்துவெளி வரையான கிட்டத்தட்ட 3 கிலோமீற்றர் நீளமான பாலப்பகுதியுள்ளது. இது இலங்கையிலே மிக நீளமான ஒரு பாலப்பகுதியாகும். அந்தப் பாதையினூடாகப் பயணஞ்செய்ய முடியாத ஒரு நிலை ஏற்பட்டிருக்கின்றது. எப்பொழுது இதற்கு விமோசனம் கிடைக்கும்?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු මන්ත්‍රීතුමනි, ඒ කිලෝමීටර් තුනක කොටස කොතැන ඉඳලා කොතැනටද කියලා දැන් මට හරියටම කියන්න බැහැ. ඒ ගැන මම පසුව ඔබතුමා දැනුවත් කරන්නම්. හැබැයි, මේ කිලෝමීටර් 24.5ම අපි හදනවා. ජූලි මාසයේ එහි වැඩ ආරම්භ කරනවා. මේ මුළු පාරම හදන්න දැන් estimates සකස් කර අවසානයි.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ அமைச்சர் அவர்களே, யூலை மாதம் அதனைச் செய்யவிருப்பதாக நீங்கள் கூறினீர்கள். அதற்கு நான் நன்றி தெரிவித்துக் கொள்கின்றேன். அதேநேரம், எந்த நிதியீட்டத்தில், எவ்வளவு மில்லியன் ரூபாய் ஒதுக்கீடு செய்யப்பட்டுள்ளது? என்றாவது உங்களால் இந்தச் சபையிலே சொல்ல முடியுமா?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

මේක තිබෙන්නේ packagesවලින්. Total එක මා සතුව නැහැ. ඒ කාරණය සම්බන්ධයෙනුත් මම ඔබතුමා දැනුවත් කරන්නම්. හැබැයි, ඒ මාර්ගයේ කිලෝමීටර් 24.5ම ප්‍රතිසංස්කරණය කිරීමට ඇස්තමේන්තු සකස් කරලා තිබෙනවා. ඒ අනුව කිලෝමීටර් 24.5ම අපි සකස් කර දෙන්නම්, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමාට අවශ්‍ය නම්, ඒ සඳහා ඇස්තමේන්තුගත කර තිබෙන මුදල කීයද කියලා මම හෙට දවසේ ඔබතුමා දැනුවත් කරන්නම්.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ அமைச்சர் அவர்களே, நான் நாளைய தினம் உங்களைச் சந்தித்து அந்த விபரங்களைப் பெற்றுக்கொள்கிறேன்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Thank you.

ප්‍රශ්න අංක 8 -1020/2020- (2), ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

## තෙකලා විදුලි සම්බන්ධතා: තත්ත්ව පරීක්ෂණ වාර්තාව
## மூன்று படி நிறுவுகை மின் இணைப்பு: தர நிர்ணய அறிக்கை
## THREE-PHASE POWER CONNECTIONS: QUALITY ASSURANCE REPORTS

1081/2020

**9. ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

විදුලිබල අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ඇම්පියර් 30 සහ 60 තෙකලා විදුලි සම්බන්ධතා ලබා ගැනීම සඳහා අයදුම් කිරීමේදී මේ වනතෙක් වරලත් ඉංජිනේරු තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් ඉල්ලා නොසිටි බවත්;

(ii) එහෙත් ඒ සඳහා මෑතක සිට වරලත් ඉංජිනේරු තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් ඉල්ලා සිටින බවත්;

(iii) එම තත්ත්ව පරීක්ෂණ වාර්තාව ලබා ගැනීම සඳහා රු. 25,000කට වඩා වැඩි මුදලක් වැය කිරීමට සිදු වී ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) ඇම්පියර් 30 සහ 60 තෙකලා විදුලි සම්බන්ධතාවක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් කිරීමේදී, තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් ඉල්ලා සිටීමේ ක්‍රමවේදය ඉවත් කිරීමට හෝ ඒ සඳහා සහනයක් ලබා දීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

மின்சக்தி அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) 30 மற்றும் 60 அம்பியர் மூன்று படி நிறுவுகை மின் இணைப்பைப் பெறுவதற்கு விண்ணப் பிக்கும்போது, இதுவரையில் பட்டயப் பொறியியலாளர் வழங்கும் தர நிர்ணய சோதனை அறிக்கையொன்று கோரப் படவில்லை என்பதையும்;

(ii) எனினும், அண்மைக்காலமாக அதற்கெனப் பட்டயப் பொறியியலாளர் வழங்கும் தர நிர்ணய அறிக்கையொன்று கோரப்படுகின்றது என்பதையும்;

(iii) மேற்படி தர நிர்ணய அறிக்கையை பெற்றுக்கொள்வதற்காக ரூபா 25,000/-இற்கும் மேலதிகமாகச் செலவு செய்ய வேண்டியுள்ளது என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) 30 மற்றும் 60 அம்பியர் மூன்று படி நிறுவுகை மின் இணைப்பைப் பெறுவதற்காக விண்ணப்பிக்கும்போது தர நிர்ணய அறிக்கை கோரப்படுகின்ற முறையை அகற்றுவதற்கோ அல்லது அதற்கெனச் சலுகை வழங்குவதற்கோ நடவடிக்கை எடுக்கப்படுமா என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minster of Power:

(a) Is he aware that -

(i) Quality Assurance Reports of chartered engineers have not been asked for so far when submitting applications to get 30-ampere and 60-ampere three-phase power connections;

(ii) however, Quality Assurance Reports of chartered engineers are asked for it since recently; and

(iii) more than Rs. 25,000 have to be spent to obtain the aforesaid Quality Assurance Report?

(b) Will he inform this House whether steps will be taken to do away with the methodology of asking for a Quality Assurance Report when applying for a 30-ampere and 60-ampere three-phase power connection or provide some concession for it?

(c) If not why?

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා (විදුලිබල අමාත්‍යතුමා)**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும - மின்சக்தி அமைச்சர்)
(The Hon. Dullas Alahapperuma - Minister of Power)

ගරු කථානායකතුමනි, ඇම්පියර් 30 සහ 60 තෙකලා විදුලි සම්බන්ධතා ලබා ගැනීම සඳහා අයදුම් කිරීමේදී මෑතක සිට වරලත් ඉංජිනේරු තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් ඉල්ලා සිටින බව තමයි ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයෙන් අහලා තිබෙන්නේ. ඇත්ත වශයෙන්ම ඒ ප්‍රශ්නය නිවැරැදි වෙන්න ඕනෑ. උදාහරණයක් වශයෙන් කිව්වොත්, කොළඹ නගරය ගත්තොත් මෑතක සිට නොව අවුරුදු 20ක, 30ක සිට මෙය ක්‍රියාත්මක වෙනවා. නමුත් මෑතක සිට කොළඹින් පිට පළාත්වලටත් ඇම්පියර් 30 සහ ඇම්පියර් 60 තෙකලා සැපයුම් සඳහා මෙම සහතිකය ලබා දීම අවශ්‍ය බව තීරණය කර තිබෙනවා. මේ තීරණය 2020 අවුරුද්දේ චක්‍රලේඛයක් විධියටත් නිකුත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ ප්‍රශ්නය නිවැරදි වෙන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, ප්‍රශ්නයට දීර්ඝ පිළිතුරක් තිබෙන නිසා මා එම පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඇම්පියර් 30 සහ ඇම්පියර් 60 සැපයුම් සඳහා වරලත් ඉංජිනේරුවරයෙකුගේ තත්ත්ව සහතිකයක් ඉල්ලා සිටීම කොළඹ නගර සීමාව තුළ කලක සිට ක්‍රියාත්මක විය. මෙවැනි සහතිකයක් අවශ්‍ය වනුයේ පාරිභෝගික ජීවිත හා දේපළ ආරක්ෂාව වෙනුවෙන් අභ්‍යන්තර විදුලි පද්ධතිය නිසි ප්‍රමිතියකට අනුව නිම කර ඇති බව සනාථ කිරීම සඳහාය.

(ii) මෑතක සිට කොළඹින් පිට පළාත්වල ඇම්පියර් 30 සහ 60 තෙකලා විදුලි සැපයුම් සඳහා මෙම සහතිකය ලබා දීම අවශ්‍ය බව තීරණය කර ඇත. මෙවන් අවශ්‍යතාවක් පැන නැඟී ඇත්තේ මෑතකදී විදුලි අනතුරු වැඩිවීමේ ප්‍රවණතාවක් නිරීක්ෂණය වීම සහ එවන් අනතුරු බොහොමයක් අභ්‍යන්තර තතැදුම් පද්ධතියේ (වයරින්වල) නිසි ප්‍රමිතියක් නොවීමෙන් හටගත් දෝෂ නිසා ඇති වී තිබෙන බව අනාවරණය වීමත් සමඟයි. එසේම, මෑතකදී පටන් තෙකලා විදුලි සැපයුම් සඳහා කරන ඉල්ලීම් ද සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි වී තිබෙනවා. අත්දැකීම් සහ නිසි පුහුණුවක් නොමැති විදුලි කාර්මිකයන් - electricians - විසින් විදුලි වයරින් වැඩ කිරීම ඒවායේ නිසි ප්‍රමිතියක් නොමැති වීමට ප්‍රධානම හේතුව බව ද වාර්තා වී ඇත. නිවාස සහ අනෙකුත් ගොඩනැඟිලිවල අභ්‍යන්තර විදුලි පද්ධතිය නිසි ප්‍රමිතියකට (wiring standard) අනුව කර ඇති බව සනාථ කිරීම ලංකා විදුලිබල මණ්ඩලයේ වගකීමක් බැවින් ඉහත කී තීරණය ක්‍රියාත්මක කරන ලදී.

සටහන:-

(1) අභ්‍යන්තර විදුලි පද්ධතියක් (විශේෂයෙන්ම තෙකලා විදුලි සම්බන්ධතාවක්) පරීක්ෂා කර එය සහතික කිරීම සැලකිය යුතු කාලයක් සහ ශ්‍රමයක් වැය වන ක්‍රියාවකි. මෙම කාර්යය ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන් විසින් පමණක් කිරීමේදී අනවශ්‍ය කාලයක් ගත වීමෙන් පාරිභෝගිකයා අපහසුතාවට පත් විය හැකි බව ලංකා විදුලිබල මණ්ඩලයේ මතයයි. පාරිභෝගිකයන්ගේ පහසුව තකා ලංකා විදුලිබල මණ්ඩලයේ ලියාපදිංචි ස්වාධීන වරලත් විදුලි ඉංජිනේරුවරයෙකු - Chartered Electrical Engineer - මඟින් මෙම සහතිකය ලබා දීම දැනට සිදු කරයි.

(2) සාමාන්‍යයෙන් අඩු ආදායම්ලාභීන් වශයෙන් සැලකෙන විදුලි පාරිභෝගිකයන්ගේ නිවාසවලට ලබා දෙනුයේ ඇම්පියර් 30 එකලා විදුලි සැපයුමකි. කොළඹ නගර සීමාව තුළ හැර රටේ අනෙකුත් ප්‍රදේශවල ඇම්පියර් 30 එකලා විදුලි සැපයුමක් සඳහා දැනට වරලත් විදුලි ඉංජිනේරුවරයෙකුගේ සහතිකයක් ලබා දීම අවශ්‍ය නොවේ.

(iii) වරලත් විදුලි ඉංජිනේරුවරුන් විසින් අය කරනු ලබන ගාස්තුව, විදුලි පද්ධතියේ ප්‍රමාණය හා සංකීර්ණතාව මෙන්ම අදාළ ස්ථානයේ පිහිටීම අනුව වෙනස් විය හැක. එසේ අය කරනු ලබන මුදල සම්බන්ධයෙන් සීමා පැනවීමට හෝ නියාමය කිරීමට ලංකා විදුලිබල මණ්ඩලයට හැකියාවක් නොමැත. බොහෝ අවස්ථාවලදී මෙම මුදල රුපියල් 10,000ත්, රුපියල් 15,000ත් අතර බව නිරීක්ෂණය වේ.

මේ සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන ලංකා විදුලිබල මණ්ඩලයේ ලියාපදිංචි වී සිටින වරලත් ඉංජිනේරුවරුන්ගේ නම් ලැයිස්තුවක් ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලි පාරිභෝගිකයන්ට සපයනු ලබන අතර, ඔවුන් සමඟ මිල ගණන් එකඟ වී අදාළ වාර්තාව ලබා ගැනීමට පාරිභෝගිකයාට හැකියාව ඇත.

මෙම කාර්යය සඳහා වෘත්තිකයන් විසින් අය කරන ගාස්තු සම්බන්ධයෙන් කිසියම් නියාමනයක් කිරීමේ හැකියාව සලකා බලන ලෙස ඉල්ලීමක් මේ වනවිටත් විදුලිබල අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා ඉංජිනේරු කවුන්සලය - Engineering Council of Sri Lanka - වෙත යොමු කර තිබේ.

(ආ) විදුලි අනතුරු නිසා ජීවිත සහ දේපළවලට වන හානි වැළැක්වීමට ගොඩනැඟිලිවල අභ්‍යන්තර විදුලි පද්ධතිය නිසි ප්‍රමිතියකට අනුව නිම කර ඇති බව සනාථ කළ යුතුය. ඒ අනුව අභ්‍යන්තර විදුලි පද්ධතියේ ප්‍රමිතිය සම්බන්ධයෙන් සහතිකයක් ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් බැහැර වීමට හැකියාවක් නොමැත.

නිවාස සහ අනෙකුත් ගොඩනැඟිලිවල විදුලි කර්මාන්තයේ නියැළෙන විදුලි කාර්මිකයන් පුහුණු කිරීමේ සහ බලපත්‍ර ලබා දීමේ - licensing - ක්‍රියාවලියක් ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිසම සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය - Institution of Engineers, Sri Lanka - මඟින් මේ වනවිට ආරම්භ කර තිබේ. මහජන ආරක්ෂාව තහවුරු කරනු වස්, ඉදිරියේදී එවන් විදුලි කාර්මිකයන්ගෙන් පමණක් මෙම සේවය ලබා ගැනීම නිර්දේශ කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය අපේක්ෂා කෙරේ. අනාගතයේදී එවැනි රෙගුලාසියක් ක්‍රියාත්මක වුවහොත් වරලත් ඉංජිනේරු සහතිකය සම්බන්ධයෙන් ලිහිල් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමේ හැකියාව ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

ගරු ඇමතිතුමනි, මුළු රටේම -විශේෂයෙන්ම පොළොන්නරුව දිස්ත්‍රික්කයේ- සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් තිබෙනවා. වී මෝල් වැඩි සංඛ්‍යාවක් ට්‍රාන්ස්ෆෝමර් භාවිතා කරනවා. ඒගොල්ලන් ලංකා විදුලිබල මණ්ඩලයත් සමඟ agreement එකක් sign කරලා තමයි ට්‍රාන්ස්ෆෝමර් ලබා ගන්නේ. ගරු ඇමතිතුමනි, ඒ කාලයේ නම් කුඩා මෝල් හිමියන්ට හාල් නිෂ්පාදනය කරන්න ඇති වෙන්න වී තිබුණා. දැන් මේ කුඩා මෝල්වලට වී ලැබෙන්නේ නැහැ. ඒ නිසා සතියකට දින දෙකක්, තුනක් තමයි මේ වී මෝල් වැඩ කරන්නේ. නමුත් ට්‍රාන්ස්ෆෝමර් එක පාවිච්චි කරන නිසා මාසයටම අදාළ වන විධියට බිලක් හැදෙනවා.

[ගරු කිංස් නෙල්සන් මහතා]

ගරු ඇමතිතුමනි, ඔබතුමාගෙන් මම මේ ඉල්ලීමක් කරන්නේ. ඒ අය ට්‍රාන්ස්ෆෝමර්ස් පාවිච්චි කළත් මීටරයක් ලබා දුන්නා නම්, ඒ මෝල්වල වැඩ කෙරෙන ප්‍රමාණයට විතරයි විදුලි ගාස්තු ගෙවන්න සිදු වෙන්නේ. ගරු ඇමතිතුමනි, ඔවුන්ට තවත් ලොකු අසාධාරණයක් සිද්ධ වනවා. අද සුළු පරිමාණයෙන් කෙරෙන මෝල්වලට වී ලැබෙන්නෙත් නැහැ.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා කියන කාරණය මේ කාලයට අදාළව බලන කොට සම්පූර්ණයෙන් ඇත්තක්. අනුරාධපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන අපේ ගරු කේ.පී.එස්. කුමාරසිරි මන්ත්‍රීතුමා නොච්චියාගම ප්‍රදේශයේ තිබුණු මෙවැනිම ප්‍රශ්නයක් මා වෙත ඉදිරිපත් කරලා, මම ඒ ගැන පෞද්ගලිකව සොයා බැලුවා. අපි ඒ ප්‍රශ්නය නිවැරදි කළා. අපි කර්මාන්ත සඳහා විශේෂ දීමනාවක් ලෙස ලබා දෙන industrial tariff එක වෙනුවෙන් unit එකකට අය කරන්නේ රුපියල් 11.50යි.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන්නේ kVA charges ගැනයි. මේ දවස්වල වැඩ නොකළත්, එය තිබෙන අර්බුදයක්. මීට පෙර අපි විදුලි බිල්පත් ගෙවන්න සහන කාලයක් දුන්නා වාගේ, මෙවැනි අය සම්බන්ධයෙන් දෙසැම්බර් 31වන දා දක්වා විශේෂ සහන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වනවා.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ගෘහස්ථ විදුලි පරිභෝජනයේදී විදුලි ඒකක 60 දක්වා සහනයක් ලබා දෙනවා නේ. විශේෂයෙන්ම පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වැලිකන්ද, දිඹුලාගල, මැදිරිගිරිය ඇතුළු සමස්ත රටේම ජනතාවට අද මේ කොවිඩ් වසංගතය නිසා විදුලි බිල්පත් ගෙවා ගන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. ඒ නිසා විදුලි ඒකක 60 දක්වා දෙන සහනය, ඒකක 90 දක්වා ලබා දුන්නොත් හොඳයි කියා මම යෝජනා කරනවා.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා සද්භාවයෙන් තමයි මෙම යෝජනාව ඉදිරිපත් කරනවා ඇත්තේ. මම එතුමාගේ යෝජනාවට ගරු කරමිනුයි මේ කාරණය කියන්නේ. නිවාස සහ කර්මාන්ත විධියට ගත්තොත්, ලංකා විදුලිබල මණ්ඩලයට අයත් පාරිභෝගිකයන්ගේ සංඛ්‍යාව මිලියන 6.5යි. ඊට අමතරව LECO එකට අයත් පාරිභෝගිකයන් 585,000ක් ඉන්නවා.

ගරු මන්ත්‍රීතුමනි, විදුලි ඒකක 0 - 30 අතරේ විදුලිය පාවිච්චි කරන සංඛ්‍යාව ලක්ෂ 12යි. ඒ අය තමයි, අඩුම විදුලිය ප්‍රමාණයක් පරිභෝජනය කරන අහිංසක මිනිස්සු. ඊළඟට, විදුලි ඒකක 30 - 60 අතරේ පරිභෝජනය කරන පිරිස ලක්ෂ 15ක් ඉන්නවා. පාවිච්චි කළ විදුලි ඒකක ගණන 0 - 30 අතර නම්, ඒ ඒකකයට අය කරන්නේ රුපියල් 3.50යි. පාවිච්චි කළ විදුලි ඒකක ගණන 30 - 60 අතර නම් ඒකකයට අය කරන්නේ, රුපියල් 5.85යි. සාමාන්‍යයෙන් දැන් විදුලි ඒකකයක් ජනනය කරන්න යන වියදම රුපියල් 23.87යි. ඒකකයකට රුපියල් 23.87ක් වියදම් කර නිපදවන විදුලිය ගෙවල් ලක්ෂ 12කට දෙනවා, රුපියල් 3.50 ගණනේ. ඊළඟට, ගෙවල් ලක්ෂ 15කට රුපියල් 5.85 ගණනේ දෙනවා. ඒ කියන්නේ, ගෙවල් ලක්ෂ 27කට දෙන්නේ ඒකකයක් එක්කෝ රුපියල් 3.50ට, නැත්නම් රුපියල් 5.80ට. මේ නිවාස ලක්ෂ 27 වෙනුවෙන් ලංකා විදුලිබල මණ්ඩලය අවුරුද්දකට දරන වියදම රුපියල් බිලියන 20යක් පමණ වෙනවා. විදුලිබල මණ්ඩලය අලාභ ලබනවා, අලාභ ලබනවා කියන එක නේ ජනප්‍රිය මතය, ගරු කථානායකතුමනි. හැබැයි, විදුලිබල මණ්ඩලය රුපියල් 23.80ක් වැය කර හදන විදුලි ඒකකයක් දෙන්නේ රුපියල් 3.50ට සහ රුපියල් 5.80ට.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන කාරණය මා පිළිගන්නවා. මෙය, ආර්ථිකය එක්ක පොර බදන, විශේෂයෙන්ම දෛනික රැකියා කරපු අතිබහුතරයකගේ ආදායම් මාර්ග අහිමි වෙලා තිබෙන වෙලාවක්. ඒ නිසා අපි නිල වශයෙන් නිවේදනයක් නිකුත් නොකළත්, ඒ කිසිම තැනක විදුලිය විසන්ධි කරන්න එපා කියන ඉල්ලීම දැනටම කර තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 10 -1201/2020- (1), ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා.

**ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා**
(மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி)
(The Hon. K.P.S. Kumarasiri)
ගරු කථානායකතුමනි, මම මේ ප්‍රශ්නය පසුගිය පාර්ලිමේන්තු සභා වාරයේදී ඇහුවා. හැබැයි, මෙම පාර්ලිමේන්තුව ආරම්භ වූ ගිය අවුරුද්දේ ඉදිරිපත් කරපු මගේ ප්‍රශ්න තව තිබෙනවා. මේ ප්‍රශ්නය නම් මම පසුගිය සභා වාරයේදී ඇහුවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

## 2015-2019 දක්වා පැවති වෙළඳ, වාණිජ හා පාරිභෝගික කටයුතු අමාත්‍යාංශය: අක්‍රමිකතා

2015-2019ஆம் ஆண்டு வரை செயற்பட்ட வர்த்தக, வாணிப மற்றும் நுகர்வோர் அலுவல்கள் அமைச்சு: முறைகேடு

MINISTRY OF TRADE, COMMERCE AND CONSUMER AFFAIRS FUNCTIONED FROM 2015-2019: IRREGULARITIES

1020/2020

**8. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා වෙනුවට)**
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு பிரமித்த பண்டார தென்னகோன் சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Premitha Bandara Tennakoon)
වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා එවකට පැවති වෙළඳ, වාණිජ හා පාරිභෝගික කටයුතු අමාත්‍යාංශය භාරව කටයුතු කළ අමාත්‍යවරුන්ගේ නම් කවරේද;

(ii) එම අමාත්‍යාංශයට අයත්ව තිබූ ආයතනවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත අ (i)හි සඳහන් කාල සීමාව තුළ සමූපකාර තොග වෙළඳ සංස්ථාව, සීමාසහිත ලංකා සතොස සහ විවිධ සේවා සමූපකාර සමිති විසින් පවත්වා ගෙන යනු ලබන වෙළඳ ආයතන සඳහා අවශ්‍ය වන භාණ්ඩ තොග ආනයනය කිරීමේදී හෝ දේශීයව මිලදී ගැනීමේදී අනුගමනය කර ඇති ක්‍රියා මාර්ග කවරේද;

(ii) ඉහත ආයතන සඳහා භාණ්ඩ තොග ආනයනය කිරීමේදී හෝ දේශීයව මිලදී ගැනීමේදී විනිවිදභාවයකින් කටයුතු කර තිබේද;

(iii) නොඑසේ නම්, යම් අක්‍රමිකතාවක් සිදු වී තිබේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් පූර්ණ විගණනයක් සිදු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வர்த்தக அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) 2015ஆம் ஆண்டு தொடக்கம் 2019ஆம் ஆண்டு வரை செயற்பட்ட வர்த்தக, வாணிப மற்றும் நுகர்வோர் அலுவல்கள் அமைச்சுப் பொறுப்பை வகித்த அமைச்சர்களின் பெயர்கள் யாவை என்பதையும்;

(ii) மேற்படி அமைச்சின் கீழ்க் காணப்பட்ட நிறுவனங்களின் பெயர்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்குறிப்பிட்ட அ(1)இல் குறிப்பிடப்பட்டுள்ள காலப்பகுதியில் கூட்டுறவு மொத்த விற்பனைக் கூட்டுத்தாபனம், வரையறுக்கப்பட்ட லங்கா சதொச மற்றும் பலநோக்குக் கூட்டுறவுச் சங்கங்களினால் பேணிவரப்படுகின்ற வர்த்தக நிறுவனங்களுக்குத் தேவையான பொருட்களை இறக்குமதி செய்கையில் அல்லது உள்நாட்டு ரீதியில் கொள்வனவு செய்கையில் பின்பற்றப்பட்டுள்ள நடவடிக்கை முறைகள் யாவை என்பதையும்;

(ii) மேற்குறிப்பிட்ட நிறுவனங்களுக்குப் பொருட்களை இறக்குமதி செய்கையில் அல்லது உள்நாட்டு ரீதியில் கொள்வனவு செய்கையில் வெளிப்படைத்தன்மை பேணப்பட்டுள்ளதா என்பதையும்;

(iii) இன்றேல், ஏதேனும் முறைகேடு இடம்பெற் றுள்ளதா என்பதையும்;

(iv) ஆமெனில், அது தொடர்பாக முழுமையான கணக்காய்வு நடத்தப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Trade:

(a) Will he inform this House-

(i) the names of the Ministers in charge of the then Ministry of Trade, Commerce and Consumer Affairs from the years 2015-2019; and

(ii) the institutions that belonged to the said Ministry?

(b) Will he also inform this House -

(i) the methods adopted during the period referred to in (a) (i) above, in importing or purchasing locally the stocks of goods required for outlets run by the Co-operative Wholesale Establishment, Lanka Sathosa Limited and Co-operative Societies;

(ii) whether transparent procedures had been adopted in importing or purchasing locally the stocks of goods for the above institutions;

(iii) if not, whether any irregularities had taken place; and

(iv) if so, whether a comprehensive audit is conducted in that regard?

(c) If not, why?

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (වෙළෙඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - வர்த்தக அமைச்சர்)
(The Hon. (Dr.) Bandula Gunawardana - Minister of Trade)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2015 වර්ෂයේ සිට 2019 දක්වා එවකට පැවති වෙළඳ, වාණිජ හා පාරිභෝගික කටයුතු විෂය භාරව පහත දැක්වෙන පරිදි අමාත්‍යවරුන් කටයුතු කර ඇත.

1. 2015.01.18 සිට 2015.03.08 දක්වා ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමා
2. 2015.03.09 සිට 2018.11.08 දක්වා ගරු රිෂාඩ් බදියුදීන් මැතිතුමා
3. 2018.11.09 සිට 2018.12.27 දක්වා ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මැතිතුමා
4. 2018.12.28 සිට 2019.11.27 දක්වා ගරු රිෂාඩ් බදියුදීන් මැතිතුමා

(ii) එම අමාත්‍යාංශයට අයත්ව තිබූ ආයතනවල නම් **ඇමුණුම 01හි*** දක්වා ඇත.

(ආ) (i) ඉහත කාල සීමාව තුළ සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව, සීමාසහිත ලංකා සතොස සහ විවිධ සේවා සමූපකාර සමිති විසින් පවත්වාගෙන යනු ලබන වෙළෙඳ ආයතන සඳහා අවශ්‍ය වන භාණ්ඩ තොග ආනයනය කිරීමේදී හෝ දේශීයව මිලදී ගැනීමේදී අනුගමනය කර ඇති ක්‍රියා මාර්ග, **ඇමුණුම 02හි*** දක්වා ඇත.

(ii), (iii) මිලදී ගැනීම්වලදී අක්‍රමිකතා හා වංචා දූෂණ සම්බන්ධයෙන් වාර්තා වී ඇත.

(iv) **සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව**

අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි කර ඇති අතර ඒ සම්බන්ධයෙන් විමර්ශන සිදු වෙමින් පවතින අතර මීට අමතරව මවිසින් චෝහාරික විගණනයක් කිරීම සඳහා උපදෙස් ලබා දී ඇත. ඒ සඳහා ආයතනයක් තෝරාගෙන එම විගණන කටයුතු සිදු වෙමින් පවතී.

**සීමාසහිත ලංකා සතොස**

අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි කර ඇති අතර ඒ සම්බන්ධයෙන් විමර්ශන සිදු වෙමින් පවතින අතර මීට අමතරව මවිසින් චෝහාරික විගණනයක් කිරීම සඳහා උපදෙස් ලබා දී ඇති අතර ඒ සඳහා ආයතනයක් තෝරාගෙන ඇත.

---

***පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා ]

**සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව**

මෙම දෙපාර්තමේන්තුව සමුපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින අතර සමුපකාර ක්ෂේත්‍රයේ දූෂණ අක්‍රමිකතා සොයා බැලීමටත් සමුපකාර සතු වත්කම්, දේපළ අවභාවිතය පිළිබඳව සොයා බැලීමටත් සමුපකාර ව්‍යාපාරයේදී පොදු ජන යහපත වෙනුවෙන් යෙදවීමටත් අවශ්‍ය පූර්ණ ප්‍රතිසංවිධානයක් සඳහා අවශ්‍ය නිර්දේශ ලබා ගැනීමට විද්වත් කමිටුවක් පත් කිරීම සඳහා මවිසින් අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා 2020.09.02 දින අනුමැතිය ලැබී ඇත.

(ඇ) පැන නොනඟී.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
Sir, I rise to a point of Order.

මම මීට පෙර අවස්ථාවක අපේ මහාමාර්ග ඇමති ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මැතිතුමාගෙන් ප්‍රශ්නයක් ඇහුවා. එතුමා ඒ ප්‍රශ්නයට උත්තර දෙන එක අතර මැදදී නතර කරලා මට පසු දිනක උත්තරයක් දෙනවා කිව්වා. මම මහ ලේකම්තුමාගෙන් ඒ ගැන ඇහුවාම ඒක නැවත ප්‍රශ්නයක් විධියට එන්නේ නැහැ කිව්වා. මට තවම ඒ ප්‍රශ්නයට උත්තරයක් ලැබුණේ නැහැ, ගරු ඇමතිතුමනි. ඔබතුමාට පුළුවන් නම් මේ සතියේ එයට පිළිතුරක් ලබා දෙන්න.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
බදාදා උදේ පිළිතුරක් දෙන්නම්.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
බොහොම ස්තුතියි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නත් එක්කම මේ සභාවේ කථා නොවුණත්, ලිඛිත පිළිතුරු ලබාදෙන ප්‍රශ්නත් අපේ න්‍යාය පත්‍රයට එකතු වෙලා එනවා. ඒ දෙකේම ස්වරූපය එකයි. වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නයක උත්තරය ගෙනැල්ලා නැත්නම් ඒ වෙලාවේ සඳහන් කරනවා සති දෙකකින් හෝ පිළිතුරු දෙනවා කියලා. එතකොට සති දෙකකින් ඒ ප්‍රශ්නය අහන්න අවස්ථාව එනවා. මම ලිඛිත පිළිතුරු අපේක්ෂාවෙන් ප්‍රශ්න දෙකක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒකට පිළිතුරක් එවලා තිබෙනවා. ඒ පිළිතුරේ තිබෙන්නේ, "පිළිතුර මාස දෙකකින් දෙනවා" කියලා. හැබැයි, ඒක පිළිතුරක ස්වරූපයකින් එවපු නිසාම නැවත මාස දෙකකින් ඒ ප්‍රශ්නය න්‍යාය පත්‍රයට එන්නේ නැහැ. ඒ මම මුදල් අමාත්‍යාංශයෙන් අහපු ප්‍රශ්න දෙකක්. ඒ කාරණය මට නිවැරදි කරලා දෙන්න. "රට පුරා විශාල වශයෙන් තොරතුරු ලබා ගන්න තිබෙනවා. ඒ තොරතුරු ලබා ගන්න තෙක් මේ ප්‍රශ්නයට පිළිතුරක් දිය නොහැකිය" කියලා එක ප්‍රශ්නයක් ගැන කියන ගමන් ප්‍රශ්න දෙකකට පිළිතුරු දීලා. එහෙම වුණාම වෙන්නේ ප්‍රශ්න දෙකටම උත්තරයක් ලැබෙන්නේ නැති එකයි. ඒ නිසා කරුණාකර ඒ ප්‍රශ්න දෙකට පිළිතුරු ආවාම, ඒවා හැන්සාඩ් වාර්තාවට ඇතුළත් වෙන විධියට කටයුතු කරලා දෙන්න, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සතියක් ඇතුළතදී එය විසඳලා දෙන්නම්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
තවත් කාරණයක් තමයි මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව කැඳවන්නේ නැති එක. ගරු කථානායකතුමනි, අපි දන්නවා, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව කැඳවන්න බැරි වුණු ප්‍රායෝගික කාරණා. ඒ විතරක් නොවෙයි, උපදේශක කාරක සභාත් කැඳවන්න බැරි වුණු කාරණා අපි දන්නවා. ඒ වාගේම, ආංශික අධීක්ෂණ කාරක සභා පවත්වාගෙන යනවාද, නැද්ද කියලා තවම මූලාසනයෙන් ප්‍රකාශයක් කරලා නැහැ. ගරු රනිල් වික්‍රමසිංහ මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුවේ ඉන්නවා. එතුමාගේ කාලයේ තමයි ඒක පටන් ගත්තේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක නැවත ක්‍රියාත්මක වෙන්න තිබෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ආංශික අධීක්ෂණ කාරක සභා පවත්වා ගෙන යනවාද, නැද්ද කියලා අපට මූලාසනයෙන් පිළිතුරක් දෙන්න. ඒක තමයි, පළමුවැනි කාරණය.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ඒක දන්වන්නම්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
දෙවැනි කාරණාව මෙයයි. ගරු කථානායකතුමනි, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ පෙත්සම් විශාල සංඛ්‍යාවක් ගොඩගැහිලා තිබෙනවා. නිරෝධායන නීති - රීති තදින්ම අනුගමනය කරමින් හෝ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව යළි බලගන්වන්න කියලා මම ඉල්ලා සිටිනවා. ඒ පිළිබඳව මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa -Leader of the Opposition)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) ප්‍රශ්නයට පෙර ඔබතුමාගේ අවසරය ඇතුව මම මේ කාරණය මතක් කරනවා. මේ වන විට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙකුගේ ෆේස්බුක් ගිණුමක් හරහා තරිඳු ජයවර්ධන කියන මාධ්‍යවේදියා තර්ජනයකට

ලක් කරලා තිබෙනවා. මේ කාරණාව පිළිබඳව තරිඳු ජයවර්ධන මාධ්‍යවේදියා පොලිස්පතිතුමාට පැමිණිල්ලක් කරලා තිබෙනවා. ඒ වාගේම මාධ්‍ය සංවිධාන හයකුත් පැමිණිල්ලක් කරලා තිබෙනවා. ඒ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමා ප්‍රකාශ කරලා තිබෙනවා, "බොරු ලියන අයට ස්වභාව ධර්මය දඬුවම් දෙනවා. ඒ වාගේම ප්‍රභාකරන්ටත් සිදුවුණා සේම ඒ අයට සිදු වෙයි" කියලා. ඇත්ත වශයෙන්ම වක්‍රව ඒ මාධ්‍යවේදියාට තර්ජනයක් මේ කරන්නේ. මම මේ අවස්ථාවේ රාජ්‍ය පාර්ශ්වයේ අවධානයට මේ කාරණය ගෙන එනවා. තරිඳු ජයවර්ධන මහත්මයාට එල්ල කරපු තර්ජනය පිළිබඳ විභාග කරනවාද? ඒ විභාගයේ ප්‍රතිඵල මොනවාද? ආරක්ෂක ක්ෂේත්‍රයේ පුද්ගලයෙකුට නිදහස් මාධ්‍යවේදියෙකුට එහෙම තර්ජනය එල්ල කරන්න පුළුවන්ද? විශේෂයෙන්ම ඒ කාරණාව පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා අපි ඉල්ලීමක් කරනවා. තරිඳු ජයවර්ධන මහත්මයාට මොනවා හෝ හිංසාවක් සිදු වුණොත් ඒකට මේ රජය වග කියන්නත් ඕනෑය කියන කාරණය මම මේ අවස්ථාවේ මතක් කරනවා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### මාර්ගගත අධ්‍යාපනය සඳහා පහසුකම් සැලසීම
### இணையவழிக் கற்கை வசதிகளை ஏற்படுத்தல்
### FACILITATION FOR ONLINE EDUCATION

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ඉදිරිපත් කරන මේ ප්‍රශ්නය මාර්ගගත අධ්‍යාපනය පිළිබඳ වැදගත් කාලීන ප්‍රශ්නයක්. අපේ සුසිල් ප්‍රේමජයන්ත රාජ්‍ය ඇමතිතුමා මේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා කියලා ප්‍රකාශ කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, වසරකට අධික කාලයක් තිස්සේ පවතින කොවිඩ් වසංගතය හේතුවෙන් පාසල් අධ්‍යාපනයට ඇඩි බාධා එල්ලව පවතින නමුත් වසංගතය අවසන් වන තුරු බලා නොසිට මාර්ගගත ක්‍රමවේද සහ අනෙකුත් මාධ්‍ය ඔස්සේ හෝ දරුවන්ට අධ්‍යාපනය අඛණ්ඩව ලබා ගැනීමට පහසුකම් සැලසීම රජයක වගකීමකි.

නමුත් වත්මන් රජය එම වගකීම පැහැර හැර ඇත.

මෙය ජාතික වැදගත්කමකින් යුතු හදිසි ගැටලුවක් වන බැවින්, පහත ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු හා පැහැදිලි කිරීම් රජයෙන් බලාපොරොත්තු වෙනවා.

1. වසංගත තත්ත්වය තුළ පාසල් සිසුන්ට මාර්ගගත අධ්‍යාපනය ලබා දීම සඳහා විශේෂ අවධානය යොමු වී වසරකට අධික කාලයක් ගත වී තිබේ. රජය මේ වන විට මාර්ගගත අධ්‍යාපනය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කොට තිබේද? මාර්ගගත අධ්‍යාපනයේ නිර්ණායක, ඇගැයීම් ක්‍රමවේද සහ පාඨමාලා සකසා හෝ ආරම්භ කර තිබේද? ඒවා සහාගත කිරීමට රජය කටයුතු කරන්නේද?
2. මාර්ගගත අධ්‍යාපනය වෙත සිදු දරුවන්ගේ ප්‍රවේශය - accessibility for online education - පිළිබඳ අධ්‍යයනයක් අමාත්‍යාංශය විසින් කර තිබේ ද? එසේ නම් පාසල් සිසුන්ගෙන් කොපමණ ප්‍රතිශතයකට මාර්ගගත අධ්‍යාපනය සඳහා අද දවසේ බාධාවකින් තොර ප්‍රවේශයක් තිබේද? එය ග්‍රාමීය, නාගරික සහ වතු ආශ්‍රිත ලෙස කොපමණ ප්‍රතිශතයක්ද? කවදා වන විට සියලු සිසුන්හට ප්‍රවේශය තහවුරු කළ හැකිද?
3. පාසල් සිසුන් කොපමණ ප්‍රතිශතයකට මාර්ගගත අධ්‍යාපනය සඳහා දත්ත සහ උපකරණ ලබා දී තිබේද? ඒ කොපමණ ප්‍රමාණයක්ද? නොමිලේ ලබා නොදේ නම් කුමන සහනදායී ක්‍රමයන්ටද? අමාත්‍යාංශය විසින් ඒ සඳහා සකස් කර ඇති සැලසුම කුමක්ද ? දරනු ලබන වියදම කොපමණද?
4. පාසල් ගුරුවරුන් ස්වේච්ඡාවෙන් කරනු ලබන මාර්ගගත අධ්‍යාපනය සඳහා පහසුකම් සැපයීම, මාර්ගෝපදේශ සහ පුහුණුව සැපයීම රජයේ වගකීමකි. මේ වන විට කොපමණ පාසල් ගුරුවරුන් ප්‍රතිශතයක් අධ්‍යාපනය ලබා දීම සඳහා මාර්ගගත අධ්‍යාපන ක්‍රමවේද භාවිත කරන්නේද? කොපමණ ගුරුවරුන් ප්‍රතිශතයකට උපකරණ, දත්ත සහ online platforms සඳහා අවශ්‍ය පහසුකම් ලබා දී තිබේද? මාර්ගගත ක්‍රමය ඔස්සේ අධ්‍යාපනය ලබා දීමට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දීම සඳහා මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද?
5. අන්තර්ජාල ආවරණය වැඩි කිරීම සඳහා රජය මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද? මේ වන විට කොපමණ සිසුන් ප්‍රමාණයක් ආවරණය කිරීමට නොහැකි වී තිබේද?

ගරු කථානායකතුමනි, වෙලාව ගතවෙලා තිබෙන නිසා මම දීර්ඝව මෙම ප්‍රශ්නය ගැන කථා කරන්නේ නැහැ. නමුත් මම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා, කුණ්ඩසාලේ ඉඳලා, බදුල්ල, අම්පාර, හම්බන්තොට, මොනරාගල, කන්තලේ, බලංගොඩ, බදුරලිය, පොළොන්නරුව, කුරුණෑගල, මහනුවර, රිදීමාලියද්ද, දිඹුලාගල, අනුරාධපුර, නැගම්පහ, පස්සර වාගේ ප්‍රදේශ පිළිබඳව. ඒ ප්‍රදේශවල දරුවන්ට මාර්ගගත අධ්‍යාපනය ක්‍රියාත්මක කරන්නට හැකියාව ලැබිලා නැහැ. මම ගරු ඇමතිතුමාගෙන් අහනවා, මෙම ප්‍රශ්නගත කාල වකවානුව තුළ අඩුම තරමින් රජයේ රූපවාහිනී නාළිකාවලින් වැඩි ප්‍රමාණයක් අධ්‍යාපන කටයුතුවලට යොදවන්නට බැරි ඇයි කියලා. පෞද්ගලික රූපවාහිනී නාළිකා ඒ කාර්යය ආරම්භ කරලා තිබෙනවා. ඇයි, රජයේ නාළිකා භාවිත කරගෙන මේ කටයුත්ත ක්‍රියාත්මක කරන්නේ නැත්තේ?

6. මාර්ගගත ඉගැන්වීම් ඔස්සේ විෂය නිර්දේශ ආවරණය පිළිබඳ රජයේ තක්සේරුව කුමක්ද? මේ වන විට අපොස සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විෂය නිර්දේශ ආවරණය කිරීම පිළිබඳ සංඛ්‍යාලේඛන අමාත්‍යාංශය සතුද?

ගරු කථානායකතුමනි, ඔක්තෝබර් මාසයේ උසස් පෙළ විභාගය පවත්වන බව ප්‍රකාශ කරලා තිබෙනවා. හැබැයි syllabus එක cover කරලා නැහැ; විෂය නිර්දේශය ආවරණය කරලා නැහැ. විෂය නිර්දේශය ආවරණය කරන්නේ නැතිව, syllabus එක cover කරන්නේ නැතිව දූ දරුවන් කොහොමද A/L විභාගයට මුහුණ දෙන්නේ, කොහොමද අපොස සාමාන්‍ය පෙළ විභාගයට මුහුණ දෙන්නේ, කොහොමද ශිෂ්‍යත්ව විභාගයට මුහුණ දෙන්නේ?

මාර්ගගත අධ්‍යාපනය පන්ති කාමර අධ්‍යාපනය සඳහා සම්පූර්ණ විකල්පයක් ලෙස රජය අනුමත කරන්නේද? මාර්ගගත ක්‍රමයට ඉගැන්වීමේ කටයුතු සිදු කිරීමේදී අධ්‍යාපනයේ පවතින අසමානතා තවදුරටත් උග්‍ර වීමට හේතුවක් නොවන අයුරින් යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතු බව රජය පිළිගන්නේද? ඒ සඳහා නිශ්චිත වැඩ පිළිවෙළක් රජය සතු වේද? එසේ නම් ඒ කුමක්ද?

7. ජාතික විභාග පැවැත්වීම පිළිබඳ රජයේ සැලසුම කුමක් ද? මාර්ගගත අධ්‍යාපනයේ ගැටලු පැවතීමෙන් මෙම විභාග හරහා තව තවත් අසමානතාව වර්ධනය වීමට ඉඩ ඇති බවත්, ඒ සඳහා විසඳුම් කඩිනමින් ලබාදිය යුතු බවත් රජය පිළිගන්නේ ද?

[ගරු සජිත් ප්‍රේමදාස මහතා ]

8. 2020 ජුනි මස දී හදිසි තත්ත්වයන්ට මුහුණ දීමේ සැලැස්ම යටතේ වසංගතයෙන් බිඳ වැටුණු අධ්‍යාපනය යථාවත් කිරීම සඳහා ලෝක බැංකුව ලබා දුන් රුපියල් කෝටි 98කට අධික ආධාර මඟින් සිදුකරන ලද ව්‍යාපෘතිය කුමක් ද? පාසල් සිසුන්ගේ මාර්ගගත අධ්‍යාපනයට එම ව්‍යාපෘතියෙන් ලබා දී ඇත්තේ මොනවාද? නොඑසේ නම්, එම ණය ආධාරයට සිදු වූයේ කුමක්ද?

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ගිය අවුරුද්දේ රුපියල් කෝටි 98ක් වෙන් කළත්, ඊයේ පෙරේදා තමයි අමාත්‍යාංශය මාර්ගෝපදේශ යවන්නේ; චක්‍රලේඛ යවන්නේ. එතකොට අවුරුද්දක් මොනවාද කළේ? අවුරුද්දක් තුළ රුපියල් කෝටි 98කට මොකක්ද කළේ?

ගරු ඇමතිතුමාගෙන් මේ කාරණා ගැන දැන ගන්න මම කැමැතියි. මා ළඟ සියලු ලිපිලේඛන තිබෙනවා. මාර්ගගත අධ්‍යාපනයට 2020දී අනුමත වෙනවා, ලෝක බැංකු ණය ආධාර. නමුත් අධ්‍යාපන ඇමතිවරයා ප්‍රමුඛ, ඒ ලේකම්වරයා ප්‍රමුඛ නිලධාරීන් කණ්ඩායම අවශ්‍ය චක්‍රලේඛය යවා තිබෙන්නේ 2021 මැයි මාසයේ. ඒ අවුරුද්ද තුළ ලෝක බැංකු ආධාර පාවිච්චි කරලා ගස්වල, පර්වතවල, ගල්වල නැගලා අධ්‍යාපනය ලබන අපේ පාසල් දූ දරුවන්ට සහන ලබා දෙන්න තිබුණා නේද? ගරු රාජ්‍ය ඇමතිතුමනි, temporary lamp post coverage තිබෙනවා. විදුලි කණුවලින් තාවකාලික coverage එක දෙන්න පුළුවන්. නමුත්, ඒවා ක්‍රියාත්මක කරලාත් නැහැ. මද වියත් ආණ්ඩුව? මේකද දූ දරුවන් රකින ආණ්ඩුව? ගරු අමාත්‍යතුමනි, කරුණාකර මේවාට උත්තර දෙන්න.

**ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා - (අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுசில் பிரேமஜயந்த - கல்விச் சீர்திருத்தங்கள், திறந்த பல்கலைக்கழகங்கள் மற்றும் தொலைக்கல்வி மேம்பாட்டு இராஜாங்க அமைச்சர்)
(The Hon. Susil Premajayantha - State Minister of Education Reforms, Open Universities and Distance Learning Promotion)
ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා මුළු සමාජයටම සංවේදී වන කාරණයක් පිළිබඳවයි ස්ථාවර නියෝග 27.(2) යටතේ මේ ප්‍රශ්න මාලාව තුළින් අසා තිබෙන්නේ. ඒ එක් එක් ප්‍රශ්නයට කෙටියෙන් පිළිතුරු දෙන ගමන් එය පැහැදිලි කිරීමටත් මම අපේක්ෂා කරනවා.

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා ඉතාම ගැඹුරින් සඳහන් කළා, රූපවාහිනී නාළිකා උපයෝගී කරගෙන අධ්‍යාපනය ලබාදීමේ වැදගත්කම පිළිබඳව. මම පළමුවෙන්ම ඔබතුමාට කියන්න ඕනෑ, මේ රාජ්‍ය අමාත්‍යාංශය මට පැවරුණේ, 2020 සැප්තැම්බර් මාසයේ බව. මම සති දෙකක් ඇතුළත ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ශ්‍රවණාගාරයට සියලු පෞද්ගලික විද්‍යුත් නාළිකා, මුද්‍රිත මාධ්‍යවල අය කැඳෙව්වා. රැස්වීම් දෙකක් තිබුණා. රූපවාහිනී සංස්ථාව විතරයි ඔවුන්ගේ "Channel Eye" සහ "නේත්‍රා" නාළිකාව තුළින් -එක වැඩසටහනකට රුපියල් 7,500ක නාමික ගාස්තුවක් ගෙවීමේ පදනම මත- ඒ වැඩසටහන් විකාශනය කිරීම සඳහා එකඟ වුණේ. පෞද්ගලික රූපවාහිනී නාළිකා කිහිපයකටත් කථා කරලා අපි සහයෝගය ඉල්ලුවා. මම ඒවා නම් කරන්නේ නැහැ. ඒවායෙහි ඉහළම බලධාරීන් කවුද කියලා මම හඳුනන්නේ නැහැ. හැබැයි, ජනමාධ්‍ය අමාත්‍යාංශය හරහා ඒවායෙහි ඊළඟ මට්ටමේ කළමනාකාරිත්වය contact කරලා, "ජාතික නාළිකාවට ගෙවන මට්ටමින් මුදල් ගෙවීමට අපි සූදානම්, අපට සහයෝගය දෙන්න" කියලා කිව්වා. එක් පෞද්ගලික නාළිකාවක් අපොස (සාමාන්‍ය පෙළ) විභාගයට ප්‍රථම, විභාගයේ පුනරීක්ෂණ පාඨමාලා සඳහා පමණක් දවල්ට පැයක කාලයක් ලබා දුන්නා. ගිය සතියේ තවත් පෞද්ගලික නාළිකාවක් ඉදිරි දින පහේදී -7, 8, 9, 10, 11 දිනවල- සවස 5 සිට 6 දක්වා කාලය ගණිතය විෂයය සඳහා ලබා දෙන්න එකඟ වුණා. ඒ වාගේම, ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම් කටයුතු කිරීම සඳහා පෙරවරු 8 සිට පස්වරු 1.00 දක්වා යම් ප්‍රමාණයක් -ඒ ගොල්ලන්ගේ coverage එක අඩුයි- නොමිලේ ලබා දෙන්නත් එකඟ වුණා.

හැබැයි, අපි එතැනින් නතර වුණේ නැහැ. අපි ගුරුවරු විශාල පිරිසක් සම්බන්ධ කරගෙන ශබ්දාගාර හයක් භාවිත කරලා මේ කටයුතු ආරම්භ කළා. ජාතික අධ්‍යාපන ආයතනයේ ශබ්දාගාර දෙකක්, SLIIT එකේ ශබ්දාගාරයක්, Open University of Sri Lankaහි ශබ්දාගාරයක් සහ තවත් පෞද්ගලික ශබ්දාගාරයක් අපි භාවිත කළා. ඒ වාගේම දමිළ මාධ්‍ය සියලු පාඩම් මාලා සම්පාදනය කළේ යාපනයේ. මේ විධියට අපි 3 සිට 13 ශ්‍රේණි දක්වා මේ කටයුතු ආරම්භ කළා. 3, 4, 5 පන්තිවලට තිබෙන්නේ විෂයයන් හතරයි.

6 සිට 11 දක්වා හර විෂයයන් 06ත්, අපොස (උසස් පෙළ) විෂය ධාරා හතරේ විෂයයන් 16කුත් අරගෙන පාඩම් 6000ක් සම්පාදනය කළා. මේ පාඩම් 6000 සම්පාදනය කළේ අපේ පාසල්වල ප්‍රවීණ ගුරුවරු විසින්. අපට දුර ප්‍රදේශවලින් ගුරුවරු ගෙනෙන්න බැහැ. කොවිඩ්-19 වසංගතයේ අවදානමට මුහුණ දෙමින්, අපේ ශබ්දාගාරවල වායු සමීකරණ යන්ත්‍ර පවා සමහර වෙලාවට අක්‍රිය කරමින් ඉතා දුෂ්කර ක්‍රියාවක් අපි කරන්නේ. ගුරුවරුන් ඇතුළු අපේ ඒ කාර්ය මණ්ඩලවලට කොවිඩ් මර්දන එන්නත් ලබා දීලාත් නැහැ. හැබැයි, ඒ සියලු බාධක මැද්දේ මේ වන විට "Channel Eye" සහ "නේත්‍රා" නාළිකාවත් එකතුවෙන් පාඩම් 5,200ක් විකාශනය කරලා තිබෙනවා.

මේ නාළිකා දෙකට අමතරව අපට තව frequency එකක් ලබා දී තිබෙනවා. හැබැයි, ඒ frequency එක තවත් channel එකක් සමඟ overlap වෙනවා. එහි තාක්ෂණික ගැටලු විසඳා ගැනීමට දැන් උත්සාහ කරනවා. එය ජාතික අධ්‍යාපන ආයතනයට තනිකර dedicate කරපු channel එකක්.

මේ තත්ත්වය තුළ අද වෙනකොට අපි 3 වසරේ සිට 13 වසර දක්වා විෂය නිර්දේශයට අනුගතව වර්ෂයක පාඩම් මාලා අවසන් කර තිබෙනවා. මේ වන විට වෛකල්පික විෂයයන් සඳහාත් මේ වැඩසටහන ක්‍රියාත්මක වෙනවා. දැන් වේලාව දොළහට දහයයි. ඔබතුමා දැන් නිල කාමරයට ගිහිල්ලා රූපවාහිනියේ "Channel Eye" එක දැම්මොත් බලාගන්න පුළුවන්. රූපවාහිනියේ "Channel Eye" එකේ මේ වෙලාවේ පැයක කාලයක් 11 ශ්‍රේණියේ විෂයයක් උගන්වනවා. අද උගන්වන්නේ දමිළ මාධ්‍යයෙන්.

ඊළඟට, මධ්‍යාහ්න 12.00 වෙනකොට තවත් ශ්‍රේණියකට ඉගැන්වීම ආරම්භ කරනවා. ඉන්පස්සේ, පස්වරු 3.00 සිට නැවත ඉගැන්වීම් කටයුතු පටන් ගන්නවා. පස්වරු 3.00ට තුන වසරට, පස්වරු 4.00ට හතර වසරට, පස්වරු 5.00ට පහ වසරට, පස්වරු 6.00ට හය වසරට ආදී වශයෙන් මේ වැඩසටහන් දාලා තිබෙන්නේ වඩාත් පහසු වෙන්නයි. ඒ ආකාරයට මේ වැඩසටහන් ටික ක්‍රියාත්මක වෙනවා. විශාල අලාභයක් ලබමින් ජාතික රූපවාහිනී නාළිකාව හරහා අපි මේ කටයුත්ත කරන්නේ ජාතික වගකීමක් හැටියට සලකායි.

ඊට අමතරව, මේ වන විට ජාතික අධ්‍යාපන ආයතනය විසින් කොළඹ දිස්ත්‍රික්කයේ සියලු ප්‍රධාන පාසල්වල විදුහල්පතිවරු කැඳවා channels 16ක් සකස් කරගෙන යනවා. කොවිඩ් රෝගය

මැද්දේ වුවත්, දුරස්ථභාවය අනුගමනය කරමින් අපි ඒ කටයුතු කරනවා. අපි එක ශ්‍රේණියකට channel එක ගණනේ satellite ක්‍රමයට ඩිජිටල් තාක්ෂණය ඔස්සේ පටිගත කරලා සෑම පාඩමක්ම පෙරවරු 7.30 සිට පෙරවරු 1.30 දක්වා පන්ති කාමරයක් තුළ ඉගැන්වෙන ආකාරයටම විකාශනය කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු අරඹා තිබෙනවා. මේක අපට අත්‍යවශ්‍ය කාරණයක්. මේ කොවිඩ් -19 රෝගය තව මාසයකින් ඉවර වෙයිද, මාස දෙකකින් ඉවර වෙයිද නැද්ද කියන්න අපි දන්නේ නැහැ.

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා ඉතා ගැඹුරින් අදහස් ප්‍රකාශ කළා, රූපවාහිනී නාළිකා උපයෝගී කරගෙන අධ්‍යාපනය ලබාදීමේ වැදගත්කම පිළිබඳව. මේ දවස්වල ජාතික රූපවාහිනී නාළිකාව හැරුණාම, වෙනත් සමහර නාළිකාවල පරණ teledramas repeat කරනවා. එහෙම නැත්නම්, සිංහල හෝ දමිළ පරණ චිත්‍රපටියක් repeat කරනවා. මම ඒ නාළිකාවලට ආරාධනා කරනවා, අඩුම ගණනේ උදේට පැය භාගයක්වත් PT අධ්‍යාපනය ලබා දෙන වැඩසටහන් විකාශනය කරන්න කියලා. පාඩම් වැඩසටහන් කරන නාළිකා කිහිපයකුත් ඒ අතර තිබෙනවා. අද ළමයින් නිවෙස්වලට වෙලායි ඉන්නේ. Television එකේ පැය භාගයක් PT අධ්‍යාපනය ලබා දෙන්න පුළුවන්නම් එය ඉතාම වැදගත් වනවා. ඒකට ගුරුවරු අවශ්‍ය නැහැ. සමහර ඉංග්‍රීසි channelsවලත් ඉගෙන ගන්න පුළුවන් වැඩසටහන් තිබෙනවා. ලංකාවේ නොවෙයි, වෙන රටවල ඒවායෙහි තිබෙනවා. "Disney Junior" එක ගත්තොත් එහි විකාශනය වන සමහර වැඩසටහන්වලින් දරුවන්ට ඉංග්‍රීසි ඉගෙන ගන්න පුළුවන්. "Sesame Street" වාගේ ඒවාත් තිබෙනවා. අඩුම ගණනේ එවැනි දේවල් ටිකක්වත් ප්‍රචාරය කරන්න ඒ අයට පුළුවන් නම් ඒ තුළින් අපට ලොකු සහායක් ලැබෙනවා. මම සියලු විද්‍යුත් නාළිකාවලට ආරාධනා කරනවා, මෙය ජාතික කර්තව්‍යයක් හැටියට සලකා කටයුතු කරන්න කියලා. මේ වෙනකොට ජාතික රූපවාහිනිය channels දෙකකින් වැඩසටහන් ක්‍රියාත්මක කරනවා. එක දවසක් සම්පූර්ණයෙන්ම -පෙරවරු 4.00 ඉඳලා රාත්‍රී 11.00 වනතෙක්- සිංහල භාෂාවෙන් ඉගැන්වීම් කරනවා. තව දවසක් සම්පූර්ණයෙන්ම -පෙරවරු 4.00 ඉඳලා රාත්‍රී 11.00 වෙනකන් දමිළ මාධ්‍යයෙන් ඉගැන්වීම් කෙරෙනවා. ඊයේ මම බැලුවා. රාත්‍රී 11ට අවසන් වුණා, 12 ශ්‍රේණියට -අපොස (උසස් පෙළ)- අදාළ තාක්ෂණ විෂයය ඉගැන්වීම් කටයුතු. ඊයේ සිංහල මාධ්‍යයෙන් කළ නිසා අද දවසේම ඉගැන්වීම් කටයුතු කෙරෙන්නේ දමිළ මාධ්‍යයෙන්. ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගණිතය, විද්‍යාව වැනි ප්‍රධාන විෂයන් විකාශනය කරනවා. ඉදිරියේදී අපි මේ වැඩසටහන පුළුල් කරන්නත් බලාපොරොත්තු වෙනවා.

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා අහලා තිබෙන ප්‍රශ්නවලට මුලින් කෙටියෙන් පිළිතුරු දීලා ඉන්පසු මා පැහැදිලි කරන්නම්.

ඔබතුමාගේ ප්‍රශ්නවලට පිළිතුරු මෙසේයි.

1. ජාතික වැඩසටහන් සකස් කර ඇත.

මාර්ගගත අධ්‍යාපනය කියන්නේ දුරස්ථ අධ්‍යාපනයේ කොටසක් විතරයි; it is one component only. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 21 වන ව්‍යවස්ථාව අනුව දමිළ හා සිංහල භාෂාවෙන් විතරයි අධ්‍යාපනය දෙන්න පුළුවන්. මාර්ගගත අධ්‍යාපනය කියන්නේ, blended system එකක්; සම්මිශ්‍රණයක්. කිසිදු රටක මාර්ගගත අධ්‍යාපනයෙන් විතරක් සාමාන්‍ය අධ්‍යාපනය ලබා දෙන්නේ නැහැ. මාර්ගගත අධ්‍යාපනය කියන්නේ, පන්ති කාමරයේ අධ්‍යාපනයත් එක්ක එකතු කරන ලද - blended - එකක්.

මම අධ්‍යාපන ඇමති හැටියට සිටින විට, 2008 වසරේ අධ්‍යාපන ඇමතිවරුන්ගේ සමුළුවට සහභාගි වෙන්න ලන්ඩන් නුවරට ගියා. එහිදී Bett exhibition එකට මම ගියා. එහිදී මට කථා කරලා, නොමිලේ ලබා දුන් smart boards 10 ලංකාවට ගෙනැල්ලා රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය මුළුමනින් තාක්ෂණ පීඨයක් කළා. ලංකාවේ ප්‍රථම වතාවටයි එවැන්නක් කළේ. පරිගණක 120ක්, smart boards එක්ක තාක්ෂණික දැනුම ලබා දීමේ කටයුත්ත එතැන පටන් ගත්තා. ගරු විපක්ෂ නායකතුමනි, නමුත් අවාසනාවකට ඒ වැඩ පිළිවෙළ දිගටම ක්‍රියාත්මක වුණේ නැහැ. මොකද, මගේ ඉලක්කය වෙලා තිබුණේ පළමුව ගුරුවරුන් -විශේෂයෙන්ම 6 ශ්‍රේණියෙන් ඉහළ ගුරුවරුන්- තාක්ෂණ දැනුමින් සන්නද්ධ කිරීමයි. Online උගන්වන්න කියලා එක පාරටම ගුරුවරයාට කිව්වාට වැඩක් නැහැ. මොකද, හැම ගුරුවරයාටම ඒ තාක්ෂණික දැනුම නැහැ. ඒ නිසා තමයි, මම එදා CR centres 82ක් පටන් ගත්තේ. ඒ CR centres 82 පමණයි අද වනතුරුත් තිබෙන්නේ. මම දැන් සැලසුම් කර තිබෙනවා, එම සංඛ්‍යාව 102ක් කරන්න. අපි ඒ CR centres - Computer Resource Centres - ආරම්භ කළේ, ගුරුවරුන් තාක්ෂණික දැනුමින් සන්නද්ධ කරන්නයි. අපි 21වන සියවසටයි පැමිණ තිබෙන්නේ. දැන් ඇති වෙලා තිබෙන තත්ත්වය බලන්න. කොවිඩ් - 19 වසංගතය අපට බල කරනවා, තාක්ෂණයත් එක්ක යන්න කියලා. එය අධ්‍යාපනයට විතරක් නොව, අපගේ වෘත්තිය, වෛද්‍ය වෘත්තිය ඇතුළු ඕනෑම වෘත්තියකට අද අදාළ වී තිබෙනවා.

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාගේ පළමු ප්‍රශ්නයට මගේ පිළිතුර, ජාතික වැඩසටහනක් සම්පාදනය කර තිබෙනවා කියන එකයි. නමුත්, "මාර්ගගත අධ්‍යාපනය" කියලා ජාතික ප්‍රතිපත්තියක් වෙනම හඳුන්න බැහැ. එවැන්නක් හඳුන්න බැරි හේතුව, මාර්ගගත අධ්‍යාපන ක්‍රමය ජාතික ප්‍රතිපත්තියක් නොවීමයි. මාර්ගගත අධ්‍යාපනය කියන්නේ, blended teaching methodology එකක්. ඒක මිශ්‍ර ක්‍රමයක්. ඒ ප්‍රශ්නයට මම ඉතාම ගෞරවයෙන් ඔබතුමාට ඒ කෙටි පිළිතුර දෙනවා. පළමුවන ප්‍රශ්නයේම කොටසක් වන, මාර්ගගත අධ්‍යාපනයේ නිර්ණායක, ඇගයීම් ක්‍රමවේද සහ පාඨමාලා සකසා තිබේද යන්නට කෙටි පිළිතුර, "ඔව්" කියන එකයි. ඒ ගැන මම පැහැදිලි කරන්නම්. ඒවා සහාගත කිරීමට කටයුතු කරන්නේද, කියන ප්‍රශ්නයට පිළිතුර "ඔව්" කියන එකයි.

ගරු විපක්ෂ නායකතුමනි, පළමුවන ප්‍රශ්නයට අදාළ දිගු පිළිතුර මේකයි. e-තක්සලාව වැඩසටහන ආරම්භ කරලා දැනට වසර කිහිපයක් වෙනවා. එය update කරලා තිබෙනවා. e-තක්සලාවේ අන්තර්ගතයන් 60,000කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා. දවසකට පරිශීලකයන් 180,000ක් මෙයට ප්‍රවේශය ලබා ගන්නවා. ඒ ස්ථිර සංඛ්‍යාව. ඊට අමතරව, ලක්ෂ 50ක් පමණ අවස්ථා ගණනාවකදී මේකට hit කරනවා. 1 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා ශ්‍රේණිවල සියලු විෂය ධාරාවලට අදාළව සියලු අන්තර්ගතයන් - contents - e-තක්සලාවේ තිබෙනවා. ඒ වාගේම, content development අනිවාර්යයෙන් සිද්ධ වෙනවා. e-තක්සලාවට ප්‍රවේශ වන ඕනෑම කෙනෙකුට data free. Dataවලට අය කරන්නේ නැහැ.

පෙරේදා මම දැක්කා අවුරුදු 15ක දැරිය අපයෝජනය කිරීමේ ප්‍රශ්නය උසාවියට ආ වෙලාවේ කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණයේ ගරු මහෙස්ත්‍රාත්තුමිය පොලීසියට දැනුම් දුන් කාරණය. එතුමිය දැනුම් දී තිබෙනවා, smartphone භාවිත කිරීම කියන කාරණය දැඩි සැලකිල්ලට ලක් කරන්න කියලා. ඇයි ඒ? Smartphone එකෙන් ඉගෙන ගන්න බැහැ. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා කොළඹ රාජකීය විද්‍යාලයට ගියේ; මම නුගේගොඩ ශාන්ත ජෝන් විද්‍යාලයට ගියේ. අපි උසස් පෙළ දක්වා පාසල් ගියා. ඒ කාලයේ අපට smartphones තිබුණේ නැහැ. එදා එහෙම තිබුණත්

[ගරු සජිත් ප්‍රේමදාස මහතා ]

විශ්වාස කරනවාද, පන්ති කාමරයක දරුවන් 40 දෙනෙකු තියලා blackboard එක හෝ smart board එක පාවිච්චි කරලා ගුරුවරයෙකු දරුවන් සමඟ සහසම්බන්ධ වෙමින් කරන ඉගැන්වීමේ ක්‍රියාවලිය smartphone එකකින් කරන්න පුළුවන් කියලා? ඉගැන්වීම් අවස්ථා සජීවී ලෙස පටිගත කරලා ඒවා laptop එකකින්, නැත්නම් විද්‍යුත් මාධ්‍යයකින් virtual classroom එකක් හැටියට සමීප කරවන්න අපට යම්තාක් දුරකට පුළුවන්. හැබැයි, එමඟින් ඉගැන්වීමේ ක්‍රියාවලිය සියයට සියයක් සාර්ථක කරන්න බැහැ. අපි ඒක දන්නවා. අපි මෙහිදී ක්‍රමවේද කිහිපයක් භාවිත කර තිබෙනවා. මාර්ගගත අධ්‍යාපනය අනිවාර්යය නැහැ. මාර්ගගත අධ්‍යාපනය එක් කොටසක් විතරයි. තව ක්‍රම ගණනාවක් තිබෙනවා. අපි රජරට, ඌව, රුහුණ ආදි වශයෙන් තිබෙන ප්‍රාදේශීය ගුවන් විදුලි සේවා අධ්‍යාපනය ලබා දීම සඳහා භාවිත කර තිබෙනවා. රූපවාහිනියක් නැති, සිග්නල් පහසුකම් නැති දරුවෙකුට රේඩියෝව මාර්ගයෙන් ඉගෙන ගන්න කටයුතු සලස්වා තිබෙනවා. - ඉස්සර තිබුණේ Radio Ceylon එකනේ. දැන් තිබෙන්නේ SLBC. ප්‍රාදේශීය ගුවන්විදුලි සේවාවලින් පවා අධ්‍යාපනය ලබා දෙන තරම් දුරට අපි ඇවිත් තිබෙනවා.

මේ අනපේක්ෂිත කොවිඩ් - 19 උවදුරත් එක්ක අපේ එදිනෙදා කටයුතු, අධ්‍යාපනය, ඕනෑම වෘත්තියක් ගළපා ගන්න අපට සිදු වනවා. බලන්න, දැන් උසාවි ඔක්කොම වහලා. මම මෙහේ එන්නේ නැතිව උසාවි ගියා නම්, කාර්යාලයට වෙලා තමයි ඉන්න වෙන්නේ. මොකද, උසාවි පවත්වන්නේ නැහැ, ගරු විපක්ෂ නායකතුමනි. මේක තමයි ස්වභාවය. 2019 වන කොට අපේ රටේ සාක්ෂරතාව -ලිවීමේ, කියවීමේ, තේරුම් ගැනීමේ හැකියාව- සියයට 96යි; තොරතුරු තාක්ෂණ සාක්ෂරතාව සියයට 40යි. අපේ රටේ කුටුම්භ ලක්ෂ 50ත් 60ත් අතර සංඛ්‍යාවක් තිබෙනවා. 2019 වසරේ, Department of Census and Statistics වාර්තා අනුව අපේ රටේ කුටුම්භවලින් laptop එකක් හෝ desktop එකක් හෝ ගෙදර තිබෙන ප්‍රමාණය සියයට 22.8 යි.

එයිනුත් ඒවා නාගරිකව පරිශීලනය කරන්නේ සියයට 38යි; අර්ධ නාගරිකව සියයට 22යි; වතුකරයේ සියයට 4.6යි. ඔබතුමා වතුකරය ගැනත් ප්‍රශ්නයෙන් අහලා තිබුණා. මේක තමයි තිබුණු තත්ත්වය. මේ තත්ත්වය දැන් යම් ප්‍රමාණයකින් වර්ධනය වෙලා ඇති, මේ පවතින වාතාවරණය හමුවේ දෙමව්පියන්, සමාජය, අධ්‍යාපන අමාත්‍යාංශය -මේ සියලුදෙනා- එකතු වෙලා කටයුතු කළ නිසා. හැබැයි, ඒක ප්‍රමාණවත් නැහැ. හිටපු අධ්‍යාපන ඇමතිවරයකු හැටියට සහ දුරස්ථ අධ්‍යාපන විෂය භාර රාජ්‍ය ඇමතිවරයා හැටියට මම කිසිසේත් පිළිගන්නේ නැහැ, මාර්ගගත අධ්‍යාපනය එකම අධ්‍යාපන ක්‍රමවේදයයි කියලා. එය එහෙම වෙන්න බැහැ. එහෙම කළොත්, ඔබතුමා කිව්වා වාගේ විශාල gap එකක් ඇති වනවා. අපේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ කොහොමටත් gap එකක් තිබුණා. ඒක අඩු වෙමින් ආවා. නමුත්, UNESCO සංවිධානය කියා තිබෙන්නේ මොකක්ද? SDGs -Sustainable Development Goals - අතරින් පළමුවැනි එක, දුප්පත්කම තුරන් කිරීම; දෙවන එක ආහාර සුරක්ෂිතතාව; තුන්වන එක සෞඛ්‍ය සම්පන්න බව; හතරවන එක ගුණාත්මක අධ්‍යාපනය. අපේ රාජිත සේනාරත්න මැතිතුමා දැන් මේ ගරු සභාවේ ඉන්නවා. එතුමා මේ ගැන දන්නවා. ලංකාවේ පමණක් නොවෙයි, මුළු ලෝකයේම කොවිඩ්-19 නිසා දැඩි බලපෑමට ලක් වන්නේ ඉහත කාරණා අතරින් පළමුවන සහ හතරවන කාරණයයි. දුප්පත් රටවල දුප්පත්කම තව තවත් වැඩි වෙනවා. ගුණාත්මක අධ්‍යාපනය තවදුරටත් කඩා වැටෙනවා. මේ ඔක්කොම කොවිඩ් වසංගතයත් එක්ක එකට බැඳී තිබෙනවා. පාසලේ පන්ති කාමරයේ ගුරුවරයා උගන්වන කොට ප්‍රශ්න නඟමින් උගන්වනවා. පාඩම අවසන් වුණාම, කාලච්ඡේදය අවසන් වන කොට ගුරුවරයා පාඩම summarize කරලා අහනවා, "තේරුණේ නැති තැන් තිබෙනවාද?" කියලා. දරුවෝ අත ඔසවලා, නැඟිටලා ප්‍රශ්න අහනවා. මේ මාර්ගගත අධ්‍යාපන ක්‍රමයට ඒක කරන්න පුළුවන්ද? බැහැ.

මෙම අධ්‍යාපන ක්‍රමය නිසා දරුවන්ගේ ළමා කාලය අහිමි වෙලා තිබෙනවා; ගුරුවරුන්ගේ දැනුම යාවත්කාලීන වීම අහිමි වෙලා තිබෙනවා. දෙමව්පියන් සියලුදෙනා පාහේ නොඉවසන මානසික තත්ත්වයක් ඇති පිරිසක් බවට පත්ව තිබෙනවා. මොකද, දරුවන් තුන්දෙනෙකු ඉන්නවා නම්, ඒ තුන්දෙනාටම smartphone එකක් හෝ දෙන්න ඕනෑ. මේ වාගේ ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා. කවුරු බලයේ සිටියත් මේක ලෝක ස්වභාවයක් බවට පත් වෙලා තිබෙනවා. හැබැයි, ඒක නිදහසට කාරණයක් හැටියට අපි සලකන්නේ නැහැ.

මම දැන් වැඩි දුරටත් කරුණු පැහැදිලි කර දෙන්නම්. e-තක්සලාව පරිශීලනයට අදාළ උපදෙස් ලබා දෙමින් 18/2020 කියන චක්‍රලේඛය නිකුත් කළා. ඒ මඟින් ඒ පිළිබඳ අවශ්‍ය සියලු උපදෙස් ලබා දී තිබෙනවා. මේ වන විට e-තක්සලාවේ pilot project එක අපි දුෂ්කර ප්‍රදේශවල පාසල් 20ක් සම්බන්ධ කරගෙන අවසන් කර තිබෙනවා. ඊළඟට ජූලි 21වන දා වන කොට තවත් 200ක් අවසන් කරනවා, e-තක්සලාව හරහා. එහි data free.

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා ඊළඟට අසා තිබෙන ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙමින් මා ඉදිරියට යන්නම්. "ගුරුගෙදර" අධ්‍යාපනික රූපවාහිනී වැඩසටහන මඟින් සමස්ත ජනගහනයෙන් සියයට 80ත්, 90ත් අතර ප්‍රමාණයක් ආවරණය වෙනවා. විශේෂයෙන් ජාතික රූපවාහිනිය මඟින්. ඒ නිසා තමයි අපි එය වැඩි වශයෙන් යොදාගෙන තිබෙන්නේ. 2020 සැප්තැම්බර් මාසයේ ඉඳලා මේ කටයුත්ත කරගෙන යනවා. ගරු විපක්ෂ නායකතුමනි, වාර තුනෙන් එක වාරයකට එක විෂයයකට units 15 නම්, මේ වන කොට අපි ඒ units 15ටම අදාළ පටිගත කිරීම් අවසන්. දෙවැනි වාරයේ units 17ක් වෙන්න පුළුවන්. අපේ ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය මේ වෙලාවේ සභාවේ ඉන්නවා. එතුමිය මේ කාරණය දන්නවා. ගුරු සේවයේ ඕනෑම subject එකකට අදාළව එක term එකකට units ගණනක් තිබෙනවා. ඒ units ගණන අනුව තමයි වාර විභාග papers set කිරීම ආදී ඔක්කොම කරන්නේ. සාමාන්‍යයෙන් වර්ෂය අවසානයේදී හැම විෂයයකට අදාළව units 47ක් අවසන් වෙන්න ඕනෑ. එහෙම නේද, ගරු මන්ත්‍රීතුමියනි? එතුමිය ඒ ගැන දන්නවා. හැම විෂයයන් සම්බන්ධයෙන් අපි ඒ කටයුත්ත දැන් අවසන් කර තිබෙනවා. මේ ප්‍රශ්නයට පිළිතුර දෙන්න මට ටික වෙලාවක් යනවා, ගරු කථානායකතුමනි. මොකද, ඉතාම වැදගත් ප්‍රශ්නයක් තමයි ගරු විපක්ෂ නායකතුමා අසා තිබෙන්නේ.

ඊළඟට, "Nenasa" කියන satellite නාළිකා දෙකක් ඔස්සේ පාඩම් repeat වෙනවා. NIE එකේ තිබෙන "Nenasa" කියන satellite නාළිකා දෙක ඔස්සේ ඒ රූපවාහිනී වැඩසටහන් miss වෙච්ච අයට නැවත අරගෙන බලන්න පුළුවන්. මම මීට පෙරත් කිව්වා වාගේ ඉදිරියේදී අපි මේ වැඩසටහන තවදුරටත් ශක්තිමත් කරනවා.

2. මාර්ගගත අධ්‍යාපනය වෙත සිසු දරුවන්ගේ ප්‍රවේශය පිළිබඳ අධ්‍යයනයක් අමාත්‍යාංශය විසින් කර තිබෙනවාද කියන ප්‍රශ්නයට කෙටි පිළිතුර "ඔව්" යන්නයි.

"එසේ නම් පාසල් සිසුන්ගෙන් කොපමණ ප්‍රතිශතයකට මාර්ගගත අධ්‍යාපනය සඳහා බාධාවකින් තොර ප්‍රවේශයක් තිබේද?" යන ප්‍රශ්නයේ පිළිතුරට අදාළ සටහන මම තව මොහොතකින් ඉදිරිපත් කරනවා.

"එය ග්‍රාමීය, නාගරික සහ වතු ආශ්‍රිත ලෙස කොපමණ ප්‍රතිශතයක්ද?" යන්නට අදාළ පිළිතුර මම කලාප මට්ටමින් ඉදිරිපත් කරනවා. දැනට කලාප මට්ටමින් විස්තර දීලා තිබෙන්නේ. අදාළ විස්තර ඇතුළත් සියලු ලිපි ලේඛන මා ළඟ තිබෙනවා. මම ඒවා ඔබතුමාට දෙන්නම්, පරිශීලනය කරන්න. දිවයිනේ අධ්‍යාපන කලාප 94ක් තිබෙනවා. පළාතෙන් පළාතට, කලාපයෙන් කලාපයට, කලාපයේ තිබෙන පාසල්වලට අදාළ විස්තර එහි සඳහන් වෙනවා. අපි උදාහරණයක් වශයෙන් සබරගමුව පළාත ගනිමු. සබරගමුව පළාතේ කලාප 7යි. රත්නපුර දිස්ත්‍රික්කයේ 4යි; කෑගල්ල දිස්ත්‍රික්කයේ 3යි. එකතුව, 7යි. මුළු සබරගමුව පළාතේම පාසල් 1,120ක් තිබෙනවා.

කලාපයකට තිබෙන පාසල් ගණනත් තිබෙනවා. අපි ඊයේ ඉගෙනුම් මධ්‍යස්ථාන 2,096ක් පටන් ගත්තා. මම සිකුරාදා කුරුවිට යනවා. ඊට පසුව මම මහියංගනයට යනවා. මොකද, මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙනවාද කියලා අපි ගිහින් බලන්න ඕනෑ. පළාත් නවයේම තොරතුරු මා සතුව තිබෙනවා. ඒවා පරිශීලනය කරන්න ඔබතුමාටත් ලබා දෙන්න මට පුළුවන්, ගරු විපක්ෂ නායකතුමනි.

ඊළඟට, එහි දීර්ඝ පිළිතුර යටතේ පළාතෙන් පළාතට විස්තර මා ළඟ තිබෙනවා. මම ඒවා කෙටියෙන් සඳහන් කරන්නම්. බස්නාහිර පළාතේ ශිෂ්‍ය සංඛ්‍යාව 356,110යි. මාර්ගගත අධ්‍යාපනයට සම්බන්ධ වීමේ ප්‍රතිශතය ගත්තොත්, 1-5 දක්වා ශ්‍රේණි සියයට 50යි; 6-9 දක්වා ශ්‍රේණි සියයට 40-60 අතර; 10-11 ශ්‍රේණි සියයට 45-65 අතර; 12-13 ශ්‍රේණි සියයට 50-75 අතර ආදී වශයෙන් තමයි තිබෙන්නේ. මම ඔබතුමාට මෙම විස්තර ලබා දෙන්නම්. පළාත් නවයේම තොරතුරු කියවන්න වෙලාව නැහැ. මෙම තොරතුරුවලට අනුව සමස්ත සංඛ්‍යාව ආසන්න වශයෙන් ලක්ෂ 35ක් වෙනවා. දරුවන් ලක්ෂ 43ක් ඉන්නවා, ආසන්න වශයෙන්. ඒ කියන්නේ, දරුවන් ලක්ෂ අටකට මේ තිබෙන කණ්ඩායමේ ප්‍රවේශය ලැබෙන්නේ නැහැ. ඒ නිසා තමයි අපි ඊයේ සිට ඉගෙනුම් මධ්‍යස්ථාන 2,096ක් ආරම්භ කළේ. සංවර්ධන කමිටුවල සභාපතිවරුන් ද එයට විශාල දායකත්වයක් ලබා දුන්නා. ගරු නාමල් රාජපක්ෂ ඇමතිතුමා ඩිජිටල් තාක්ෂණය පිළිබඳ රාජ්‍ය ඇමතිතුමා වශයෙන් පත් වුණාට පසුව මාසයක් ඇතුළත සාකච්ඡා වාර හයක් පවත්වා TRC එක, Telecom එක වැනි ආයතන සම්බන්ධ කරගෙන මේ වැඩ පිළිවෙළ කරන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. ඒ අනුව, අර ප්‍රවේශය අහිමි දරුවන්ට ගස්, ගල් උඩ නැඟලා මේ මාර්ගගත අධ්‍යාපනයට යොමු වෙන්න උත්සාහ දරනවා වෙනුවට පාසලට එන්න පුළුවන්. ඔවුන්ට ප්‍රවාහන පහසුකම් නැත්නම් SLTB බස් එකක් පවා නොමිලයේ දෙනවා, උදේ 7.30ට පාසලට එන්න. සවස 3.30 දක්වා පාසලේ ඉන්න තිබෙනවා. මගේ යෝජනාවක් තිබෙනවා, පුළුවන් නම් ඒ මධ්‍යස්ථානවලදී මේ දරුවන්ට දිවා ආහාරයත් දෙන්න කියලා. එම වැඩ පිළිවෙළට අවශ්‍ය උපදේශය ලබා දෙන්නත් මම සූදානම්. මම මේ සටහන ගරු විපක්ෂ නායකතුමාට පරිශීලනය කරන්න දෙන්නම්. වෙලාව ගත වෙන නිසා මම එය දැන් කියවන්නේ නැහැ.

ඇත්ත වශයෙන්ම අපේ ගුරුවරුන් විශාල කාර්ය භාරයක් කරනවා. ගුරුවරුන් නිකම් ගෙදර සිටින එකත් ප්‍රශ්නයක්, ගරු විපක්ෂ නායකතුමනි. ඔබතුමන්ලාට, අපට ගෙවල්වල නිකම් ඉන්න බැහැ නේ, කොවිඩ්-19 තිබුණාය කියලා, නේද? ඒ වාගේ තමයි, ගුරුවරුන්ගේ දැනුමත් යාවත්කාලීන වෙන්න ඕනෑ. Teaching practice කියන එක classroom එකේ තිබෙන්න ඕනෑ. එහෙම නැත්නම්, ගුරුවරයා ගෙදර හිටියත් පරිශීලනය තුළින් ගුරුවරයාගේ දැනුම වැඩි කරගන්න පුළුවන්; contents හොඳට develop කරන්න පුළුවන්. ගුරුවරයා හා දරුවා අතර තිබෙන සම්බන්ධතාව දෙමව්පියන් හා දරුවා අතර තිබෙන සම්බන්ධතාව වාගේ ඉතාම සමීපයි, පාසලේ පන්ති කාමරයේදී. විශේෂයෙන්ම ප්‍රාථමික අංශයේ. එක සහ දෙක ශ්‍රේණි තමයි සාක්ෂරතාවයේ පදනම. Literacy and numeracy කියන දෙය එක සහ දෙක ශ්‍රේණිවලදී ගන්න බැරි වුණොත්, තුන්වන ශ්‍රේණියේ සිට අපි කරන්නේ මොකක්ද? සංඛ්‍යා තුනක් එකතු කරන්න, අඩු කරන්න, බෙදන්න, වැඩි කරන්න පුළුවන්කම තිබෙන්න ඕනෑ, දෙක ශ්‍රේණිය අවසන් වෙනකොට. ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය මේ වෙලාවේ සභාවේ ඉන්නවා. එතුමිය ඒ ගැන කියයි. දරුවන්ට අකුරු තුනේ වචන ලියන්න පුළුවන්කම තිබෙන්න ඕනෑ. එය ඇති කරන්නේ විශේෂයෙන්ම එක සහ දෙක ශ්‍රේණිවලදී, ඒ වාගේම පෙර පාසලේදී. ඒ නිසා දැන් අපි පෙර පාසලට, එක සහ දෙක ශ්‍රේණිවලට වැඩසටහන් හදා තිබෙනවා. ඊළඟට, තුන, හතර සහ පහ ශ්‍රේණිවලට. ඊළඟට, හය-නවය junior secondary stage එකට. ඊළඟට, 10-11 සහ 12-13 ශ්‍රේණිවලට විධියට තමයි අපි යන්නේ. මේ වෙනකොටත් ප්‍රමුඛ පාසල්වල විදුහල්පතිවරුන්, විෂය අධ්‍යක්ෂවරු, ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂවරු ඊළඟ වැඩසටහනට සූදානම් වෙනවා, මේ තිබෙන ඒවාට අමතරව. මම ඒ ගැන තව මොහොතකින් පැහැදිලි කරන්නම්. මෙන්න මේ ආකාරයෙන් තමයි මේ වැඩසටහන් ක්‍රියාත්මක වෙන්නේ. ගරු විපක්ෂ නායකතුමනි, එහි දීර්ඝ පැහැදිලි කිරීමක් කරනවා නම්, අන්තර්ජාල පහසුකම් සහිත පාසල් සංඛ්‍යාව 3,781ක් වෙනවා. TRC එකත් එක්ක සාකච්ඡා කරලා, තවත් පාසල් 651කට අධිවේගී අන්තර්ජාල පහසුකම් ලබා දීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරගෙන යනවා.

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශයට towers ගහන්න පුළුවන්කමක් නැති බව අපි සියලු දෙනාම දන්නවා. Towers ගහන්නේ Telecom එකෙන්. හැබැයි, tower එකක් ගහන්න දවස් කීයක් ගත වෙනවාද? ඔබතුමන්ලාට මතක ඇති නේ, Google balloon එකක් උඩට යැව්වා. අපි විශාල බලාපොරොත්තුවකින් සිටියා, ඒ කාලයේ එම balloon එක හරහා cloud system එකට ගිහිල්ලා මුළු රටම Wi-Fi වෙයි කියලා. හැබැයි, යම් යම් තාක්ෂණික හේතු සහ තවත් විවිධ හේතු නිසා ඒක සාර්ථක වුණේ නැහැ. හැබැයි, ඒකේ අගය දැනෙන්නේ දැන්. ඒවා එදා සිදුවෙලා තිබුණා නම්, අද මේක ප්‍රශ්නයක් නොවෙයි. මම ආරම්භ කරපු, ගුරුවරුන්ට තාක්ෂණය ලබා දීමේ වැඩ පිළිවෙළ තුළ එදා සිටියේ ගුරුවරුන් 187,000යි. අද ඒකට ගුරුවරුන් 247,000ක් සිටිනවා. ඒක කළා නම් මේ වනකොට ගුරුවරුන්ට online ගැන අලුතින් කියා දෙන්න දෙයක් නැහැ. හැබැයි, අපේ ගුරුවරුන්ගෙන් විශාල පිරිසක් අද උපාධිධාරින්; diplomatesලා. විද්‍යාපීඨවල නම් තොරතුරු තාක්ෂණය කියන්නේ අනිවාර්ය විෂයයක්. ඒ නිසා අපේ ගුරුවරුන්ගෙන් - විශේෂයෙන්ම හය ශ්‍රේණියෙන් ඉහළ ගුරුවරුන්ගෙන්- අති බහුතරයක් තොරතුරු තාක්ෂණ ප්‍රවේශය ගන්න පුළුවන් ගුරුවරුන්. අපි ඒ ගැන සතුටු වෙනවා.

ගරු විපක්ෂ නායකතුමා ඉදිරිපත් කර තිබෙන ඊළඟ ප්‍රශ්නයෙන් අසා තිබෙන්නේ පාසල් ගුරුවරුන් ස්වේච්ඡාවෙන් කරනු ලබන මාර්ගගත අධ්‍යාපනය පිළිබඳවයි. මම මුලින් සඳහන් කළ ආකාරයට, පාසල් ගුරුවරුන් ස්වේච්ඡාවෙන් මාර්ගගත අධ්‍යාපන කටයුතු සිදු කරනවා.

හැබැයි, ඒ අයට දැනට අතිරේක වශයෙන් එවැනි දීමනාවක් ගෙවන්නේ නැහැ. අපි ඇත්ත කියන්න ඕනෑ. ගුරුවරු 247,000ක් ඉන්නවා. හැම ගුරුවරයෙකුටම අවශ්‍ය මෙවලම්, උපකරණ දෙන්න අපට පුළුවන්කමක් නැහැ. ගරු විපක්ෂ නායකතුමනි, ඒක ඔබතුමා දන්නවා. හැබැයි, එදා හිටපු අධ්‍යාපන ඇමතිතුමා ආරම්භ කරපු වැඩ පිළිවෙළ අපි මේ අවුරුද්දේත් ක්‍රියාත්මක කරනවා. අපි ටැබ් 95,000ක් දුන්නේ ශිෂ්‍යයන්ට නොවෙයි. පාසල් 1,400කට ටැබ් 95,000ක් බෙදලා දුන්නා. බන්දුල

[ගරු සජිත් ප්‍රේමදාස මහතා ]

ගුණවර්ධන මැතිතුමා අධ්‍යාපන ඇමතිතුමා හැටියට කටයුතු කළ කාලයේ මහින්දෝදය විද්‍යාගාර 1,000ක් හදනකොට, එම විද්‍යාගාර දහසට desktops 60,000ක් දුන්නා. එක විද්‍යාගාරයකට desktops 60 ගණනේ විද්‍යාගාර දහසේ desktops 60,000ක් තිබෙනවා. අපි දැන් මේ පිහිටවපු මධ්‍යස්ථාන 2,096න්ම ප්‍රමුඛතාව දුන්නේ මහින්දෝදය විද්‍යාගාරවලට. ඊළඟට, පරිගණක තාක්ෂණ විද්‍යාගාර තිබෙන ඒවාට. සමහර තැන් තිබෙනවා connectivity ගන්න බැහැ, ආසන්නම පාසලට. හැබැයි, විහාරස්ථානයට ගන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, අපට තිබෙන කාලය ගැන සැලකිලිමත් වෙලා, කෙටියෙන් පිළිතුර අවසන් කරන්න.

**ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சுசில் பிரேமஜயந்த)
(The Hon. Susil Premajayantha)

මම ගරු විපක්ෂ නායකතුමාට පැහැදිලි කර දීමක් කළේ, ගරු කථානායකතුමනි. අපි ඒ සියලු ක්‍රියා මාර්ග අරගෙන තිබෙනවා. අපි සියයට 95ක් පාසල් යොදාගෙන තිබෙනවා. අපේ ගුරුවරු, අපේ විදුහල්පතිවරු ස්වේච්ඡාවෙන් මේ වැඩවලට එන්නේ. අපි ඒ අයට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. අපි ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරගෙන යනවා. ගුරුවරුන්ට එන්නත් ලබාදීම ඊළඟ සති දෙක තුළ කරන්න, ගරු ජී.එල්. පීරිස් ඇමතිතුමා දැනට වැඩ පිළිවෙළ සකස් කරගෙන යනවා. අද සහ හෙට දෙදින තුළ ජාතික අධ්‍යාපන ආයතනයේ 412කට එන්නත් ලබාදීම අද පටන් ගත්තා. ගුරුවරුන්ට එන්නත් ටික ලබාදීලා අපි මේ කොවිඩ්-19 පාලනය කර ගත්තා නම්, අපට මේ ආකාරයෙන් ප්‍රශ්න එන්නේ නැහැ. කොවිඩ්-19 පාලනයට යටත්ව තමයි මේ සියලු ප්‍රශ්න අපට අභියෝග බවට පත් වෙලා තිබෙන්නේ.

ඊළඟ ප්‍රශ්නය තමයි, "අන්තර්ජාල ආවරණ වැඩි කිරීම සඳහා රජය මේ වන විට ක්‍රියා මාර්ගයක් ගෙන ඇද්ද" කියන එක. ඊකට පිළිතුර, ඔව්. මේ සම්බන්ධයෙන් දැනට TRC එකත් එක්ක සාකච්ඡා කරනවා. මේ අවුරුද්ද තුළදී පාසල් 1,400කට fibre optic connectivity දෙන්න; පාසලේ ගේට්ටුව ගාවටම දෙන්න ඒ අය පොරොන්දු වෙලා තිබෙනවා. 2023 වන විට ද්විතීයික පාසල් 3,000ක්, ඒ කියන්නේ 6න් ඉහළ පාසල් බවට එම පාසල් පරිවර්තනය වෙනවා. ඒ ද්විතීයික පාසල් 3,000ට fibre optic connectivity අපි දෙනවා. එතකොට අධිවේගයෙන් යනවා, data ගන්න ගියාම අපේ දරුවෝ හිර වෙන්නේ නැහැ. ඔබතුමා දන්නවා, access ගත්තාට පහසුකම වැඩ කරන්නේ නැහැ කියලා. එක ගුරුවරයෙක් දරුවෝ 100කට විතර එක ශ්‍රේණියක උගන්වනවා නම්, access ගන්න ගියාම ප්‍රශ්න තිබෙනවා. ඒක මඟ හරින්න නම් අපි ඒ fibre optic connectivity දෙන්න ඕනෑ.

ඊළඟ කාරණය තමයි මාර්ගගත ඉගැන්වීම. මම දීර්ඝ වශයෙන් ඒ පිළිබඳව විස්තර කරන්න යන්නේ නැහැ. මොකද, කාලවේලාව පිළිබඳව ගරු කථානායකතුමාත් ඉඟි කරන නිසා. නිවෙස් පාදක ඉගෙනුම් ප්‍රවේශය - home-based learning - පිළිබඳවත් අපි කටයුතු කරගෙන යනවා. දැන් අපි අලුත් වැඩසටහනක් පටන් ගන්නවා. ඒක තමයි home-based learning. අපි කවුරුත් දන්නවා, අපි පාසල් යන කාලයේත් homework කළා. ඒ කාලයේ නම් homework වැඩිය දුන්නේ නැහැ. හැබැයි දැන් international schools ගත්තත්, ඕනෑම පාසලක් ගත්තත්, වැඩිපුරම දෙන්නේ homework. එහෙම නේද? විශේෂයෙන්ම ප්‍රාථමික අංශයට. වර්තමානයේ අපේ රටේ දෙමවුපියන්ගෙන් සියයට 90කට වැඩි පිරිසක් අඩුම තරමින් සාමාන්‍ය පෙළවත් සමත් අය තමයි සිටින්නේ. පළමු වසර, දෙවැනි වසර දරුවන්ට හැඩතල හුරු කිරීම, "අ" ලියන එක, dots ටික තිබ්බාම යා කරන එක, අංකය යා කරලා ලියන එක ප්‍රශ්නයක් නොවෙයි. ඒ සඳහා අපි පළාත් මට්ටමින් මේ වැඩ පොත් සකස් කරලා, ඒ වැඩ පොත් පාසල් හරහා දරුවන්ගේ ගෙවල්වලට යැවීමේ වැඩ පිළිවෙළ දැනටත් ආරම්භ කරලා තිබෙනවා. පළාත් මට්ටමින් එවැනි විවිධ වැඩසටහන් ක්‍රියාත්මක වෙනවා. මාර්ගගත අධ්‍යාපනයටත්, ගුවන් විදුලියටත්, විද්‍යුත් මාධ්‍යයටත් විතරක් මේ කටයුතු කරන්න සීමාකරලා නැහැ. මේ home-based වැඩ පිළිවෙළට ගියාම, ක්‍රියාකාරකම් පදනම් කරගෙන එක විෂයයකට එක සතියකදී එක ක්‍රියාකාරකමක් ගෙදර ඉඳගෙන කරන්න ඕනෑ කියලා අපි දරුවන්ට දෙනවා. එතකොට ඉහළ පන්තිවලට විෂයන් 6 නම්, එක ගානේ ක්‍රියාකාරකම් 6ක් කරන්න ඕනෑ. එතකොට දරුවන්ට අනිවාර්යෙන්ම සිද්ධ වෙනවා, දවසට පැය දෙක තුනක් වැය කරලා ඒ assignment එක කරන්න. අද මේ වන විට London O/L, London A/L කියන exams දෙකම අපේ රටේ international schoolsවල කරනවා. ඒ Exams දෙකම කල් දැම්මා. හැබැයි, මොකක්ද කරන්නේ? ඒ ගොල්ලන්ගේ ක්‍රමයේ assignments තිබෙනවා. ගරු විපක්ෂ නායකතුමනි, නමුත් අපේ රටේ තවම තිබෙන්නේ විභාග කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයක්. මේක වෙනස් කරන්න තමයි "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව අධ්‍යාපන ප්‍රතිසංස්කරණය තිබෙන්නේ. දරුවාට මඟ පෙන්වලා ඉගැනීමට සලස්වනවා. එතකොට තමයි නිර්මාණකරුවන් බිහි වෙන්නේ. එතකොට තමයි innovatorsලා බිහි වෙන්නේ. මේ අධ්‍යාපන ක්‍රමයේ මූලික වෙනස වෙන්නේ එතැනයි. හැබැයි, අපි තවම එතැනට ගිහිල්ලා නැහැ. දැන් අපේ university level එකේ නම් වැඩි හරියක් තිබෙන්නේ assignments නේ. හරිනි අමරසූරිය මන්ත්‍රීතුමිය ඒ බව හොඳට දන්නවා ඇති. එතුමිය විශ්වවිද්‍යාලයේ ආචාර්යතුමියක් නේ. හැබැයි, ඒ මට්ටමට අපට මේ දරුවන් එක්ක යන්න බැහැ. හැබැයි, ගුරුවරු නිර්මාණාත්මකයි. ගුරුවරු හදලා තිබෙනවා මේ assignments ගෙදර ඉඳන් කරන්න පුළුවන් මට්ටමට. ඒවා evaluate කරනවා. සතියකට වතාවක් කරපු assignments ටික, නැත්නම් ක්‍රියාකාරකම් ටික පාසලට එවනවා. අභ්‍යාස පොත් ගෙදර නිකම් තිබෙන්නේ. Textbooks ටික තිබෙනවා. ඒ ටික පාසලට එව්වාම පාසලේ විදුහල්පති ඒවා collect කරනවා. අදාළ ශ්‍රේණිවල ගුරුවරුන්ට අපි එන්නත ලබා දුන්නාට පසුව සතිපතා පාසලට ඒ අය ගෙන්වලා ඒවා දෙනවා. ඒගොල්ලන් correct කරලා, "A" "B" "C" "D" වශයෙන් grades ලබා දෙනවා. ඒවාට අවශ්‍ය උපදේශ ටික යවනවා. එතකොට අපට යම්කිසි තක්සේරුවක් තිබෙනවා, මේ දරුවා මේ විෂයය නිර්දේශය කොයිතරම් දුරට ධාරණය කර ගත්තාද කියන කාරණය පිළිබඳව. ඒක තමයි අපි ඊළඟට ක්‍රියාත්මක කරන වැඩසටහන.

ජාතික විභාග පැවැත්වීම පිළිබඳව ගරු විපක්ෂ නායකතුමා අහලා තිබුණා. අපි පසුගිය අවුරුද්දේ ජාතික විභාග තුනම පැවැත්වුවා. එම විභාග පැවැත්වීමේදී යම් ප්‍රමාදයක් ඇති වුණා. මොකද, අනපේක්ෂිත ලෙස ඇති වූ කොවිඩ්-19 වසංගත තත්ත්වය නිසා syllabus cover වුණේ නැහැනේ. හැබැයි, දැන් අපි ඇත්ත කථා කරන්න ඕනෑ. 2019දී Grade 10 ඉගෙන ගත් දරුවාට Grade 11වලදී ටිකක් disturb වුණා. එම නිසා ඒ විදියට paper settersලා papers හැදුවා. Grade 5 Scholarship Examination එකට මුහුණු දුන්නු දරුවා 2019 කොවිඩ්-19 වසංගත තත්ත්වය නැතිව Grade 4වල ඉගෙන ගත්තා. Grade 5වල කොටසයි ඒ දරුවන්ට ඉගෙන ගන්න ලැබුණේ. ඒ වුණාට ඒ දරුවන් හොඳට ලකුණු ලබා ගත්තා. දරුවන් දහදෙනෙක් ලකුණු 193ක් ලබා ගත්තා. GCE A/Lවලදීත් එහෙමයි. හැබැයි, මේ අවුරුද්දේ 11 ශ්‍රේණියේ ඉන්න දරුවාට 10 ශ්‍රේණියේ අධ්‍යාපන කටයුතු හදාරන්නත් අවස්ථාව නැතිව ගියා. 10 ශ්‍රේණියේ කොටසයි ඔවුන්ට ඉගෙන ගන්න පුළුවන් වුණේ.

විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා GCE A/L Exam එකට මුහුණ දෙන දරුවාටත් 12, 13 ශ්‍රේණිවල ඉගැන්වීම් කලින් තිබුණු මට්ටමටම හදාරන්න ලැබුණාද කියන ප්‍රශ්නය තිබෙනවා. 5 ශ්‍රේණියේ දරුවාටත් එහෙමයි නේ. එම නිසා මාර්ගගත ක්‍රමයට විභාග පවත්වන්න අපට කිසිදු අදහසක් නැහැ. අපේ රටේ සාමාන්‍ය අධ්‍යාපන ක්‍රමය තුළ මාර්ගගත ක්‍රමයට විභාගයක් පවත්වන්න බැහැ. ඒ සඳහා කොයි තරම් කාලයක් ගත වේවිද කියන්න මම දන්නේ නැහැ. පහළ පන්තිවල නම් කොහොමත් කරන්න බැහැ. හැබැයි, විශ්වවිද්‍යාලවල දැනට මාර්ගගත ක්‍රමයට ඉගැන්වීම් කටයුතු සිදු කෙරෙනවා. ගුරුවරුන්ට එන්නත් ලබා දීමේ වැඩසටහන හැකි ඉක්මනින් අවසන් කර, පාසල් ටික විවෘත කරලා, එම දරුවන්ට ප්‍රමාණවත් කාලයක් ලබා දීලා -අතිරේක කාලයක් හෝ මේ දරුවන්ට උගන්වලා- පසුගිය අවුරුද්දේ කළා වාගේ, විභාග ඒ ක්‍රමයටම පවත්වන්න අපි බලාපොරොත්තු වෙනවා. එතකොට ඔබතුමා මතු කර තිබෙන අසමානතාව පිළිබඳ ප්‍රශ්නය හැකිතාක් දුරට අවම කරලා, දරුවන්ට සාධාරණයක් ඉටු කරන්න අපට පුළුවන් වනවා.

ගරු විපක්ෂ නායකතුමාගේ අවසාන ප්‍රශ්නයට අදාළ තොරතුරු හා සියලු සටහන් පිළිතුර තුළ අඩංගු වෙලා තිබෙනවා. මම ලබා දුන් පිළිතුරේ බොහෝ කරුණු මට කවුරුවත් හදලා දුන්නු පිළිතුරුම නොවෙයි. ගරු විපක්ෂ නායකතුමනි, නිලධාරින් පිළිතුරු හදලා දෙනකොට ඒ පිළිතුරු හදන්නේ කොහොමද කියලා ඔබතුමා දන්නවා නේ. හැබැයි, ඔබතුමන්ලා අපේක්ෂා කරන පිළිතුර තමයි අපි මේ ගරු සභාවේදී ලබා දෙන්න ඕනෑ. එම නිසා මම නිර්මාණාත්මකව ඔබතුමාට මෙම පිළිතුරු ටික ලබා දුන්නා. මෙම පිළිතුරු සම්පූර්ණයෙන්ම එම නිලධාරින් තමයි හදලා දුන්නේ.

ඔබතුමා අහපු අටවැනි ප්‍රශ්නයට එම නිලධාරින් ලබා දී තිබෙන පිළිතුර මෙසේයි. දැනට ශ්‍රී ලංකාවේ අමාත්‍යාංශ කිහිපයක පවත්නා ලෝක බැංකු ණය ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති කිහිපයකින් එම ව්‍යාපෘතිවල ඇතුළත් "හදිසි තත්ත්වයන්ට මුහුණ දීම සඳහා වූ සංරචකය" යටතේ හඳුනා ගත් ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කර හදිසි තත්ත්වයන්ට මුහුණ දීම සඳහා වූ සැලැස්ම" ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන සංචිතයක් - pool of funding - මුදල් අමාත්‍යාංශයේ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ ඇති කරන ලදී.

මේ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලෝක බැංකු ණය ආධාර යටතේ ක්‍රියාත්මක සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය - General Education Modernization Project, GEM Project - යටතේ ඇමෙරිකානු ඩොලර් මිලියන 15ක ප්‍රතිපාදන වෙන් කරන ලදී. ඒ අනුව හදිසි අවස්ථා ප්‍රතිචාර දැක්වීම සම්බන්ධයෙන් එක් එක් අමාත්‍යාංශවලින් ලද සැලසුම් සලකා බලා අධ්‍යාපන අමාත්‍යාංශය වෙත මෙම සංචිතය තුළින් ඇමෙරිකානු ඩොලර් මිලියන 20.2ක -ඔබතුමා සඳහන් කළා වාගේ රුපියල් මිලියන 3,800ක්. දළ වශයෙන් රුපියල් කෝටි 380ක්- මුදලක් වෙන් කිරීමට ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව ලෝක බැංකුව සමඟ එකඟ වී තිබෙනවා. මෙන්න මේ සැලැස්ම යටතේ තිබෙන උපසංරචක කිහිපයක් පිළිබඳව මම සඳහන් කරන්නම්. එම උපසංරචක යටතේ ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. කොවිඩ්-19 සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද ප්‍රවර්ධනය කිරීම යටතේ සනීපාරක්ෂක පහසුකම් නැති පාසල් 881කට සනීපාරක්ෂක පහසුකම් ලබා දෙන්න මුදල් වෙන් කර තිබෙනවා. කොවිඩ්-19 වසංගත තත්ත්වය තුළ ඩිජිටල් ඉගෙනුම්/සම්මිශ්‍රණ ඉගෙනුම් ක්‍රමවේද ප්‍රවර්ධනය කිරීම - ඒක තමයි දැන් අපි කථා කරන්නේ.- ප්‍රාථමික හා ද්විතීයික සිසුන්ගේ අධ්‍යාපනය අඛණ්ඩව පවත්වා ගෙන යෑම සඳහා ටෙලි අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ඩිජිටල් ඉගෙනුම් ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම, (යටිතල පහසුකම් හා ගුරු පුහුණු වැඩසටහන්) ග්‍රාමීය පාසල් සඳහා රූපවාහිනි පහසුකම්, සුහුරු පන්ති කාමර සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම යන කාර්යයන් උපසංරචක දෙක යටතේ සඳහන් කර තිබෙනවා. ඒ අනුව රූපවාහිනී 5,000ක් මිලදී ගැනීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කර තිබෙනවා. පාසලේ සිටින ශිෂ්‍ය සංඛ්‍යාව අනුව විශේෂයෙන්ම දරුවන් 100ට අඩු සහ 500ට අඩු පාසල්වලට රූපවාහිනී යන්ත්‍ර ලබා දීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වනවා. හැබැයි, මේ තිබෙන තත්ත්වයත් එක්ක ඒ ප්‍රසම්පාදන ක්‍රියාවලිය තමයි දැනට ක්‍රියාත්මක වෙන්නේ.

ලෝක බැංකු ආධාර යටතේ ලැබුණු මුදල් මෙන්ම ඒ සඳහා අය වැයෙන් ද මුදල් වෙන් කර තිබුණා. මෙම ප්‍රධාන සංරචක සමඟ, තෝරා ගත් පාසල් 267කට පානීය ජල පහසුකම් ලබා දීම, පාසල් 881කට සනීපාරක්ෂක පහසුකම් ලබා දීම, ටෙලි අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ඩිජිටල් ඉගෙනුම් ප්‍රවර්ධනය සහ ජාතික පාසල් සඳහා පාසල් පාදක ඉගෙනුම් ප්‍රදාන ලබා දීමට තමයි මේ මුදල වෙන් කර තිබෙන්නේ. ඉදිරි දිනකදී මේ එක් එක් සංරචක යටතේ ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද, වෙන් කළ මුදල් ප්‍රමාණය කොපමණද කියන සංඛ්‍යා දත්ත ලබා දෙන්න මම බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, මම මීට වඩා දීර්ඝව කථා කරන්නේ නැහැ. ඉතා සංවේදී ප්‍රශ්නයක් යොමු කිරීම ගැන ගරු විපක්ෂ නායකතුමාට මම ස්තුතිවන්ත වනවා. අභියෝග මැද්දේ වුණත්, අධ්‍යාපන අමාත්‍යාංශයත්, රාජ්‍ය අමාත්‍යාංශයත් එකතුවෙලා මේ කටයුත්ත කර තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මම මේක විවාදයක් කර ගන්නේ නැහැ. හැබැයි, පසුගිය දිනක ස්ථාවර නියෝග 27(2) යටතේ මා ඇසූ ප්‍රශ්නයක් විවාදයක් බවට පත් වුණා. මේක නම් එහෙම වෙන්නේ නැහැ. නමුත්, ගරු රාජ්‍ය ඇමතිතුමාට මට කරුණු කිහිපයක් කියන්න තිබෙනවා.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඇත්ත වශයෙන්ම ඔබතුමා වාගේ පළපුරුද්ද තිබෙන පුද්ගලයකුට අධ්‍යාපනය කියන විෂයය සම්බන්ධයෙන් කටයුතු කරන්න දුන්නා නම් හොඳයි. අපට බොහොම පැහැදිලියි, ඔබතුමාට නිවැරදිව රාජකාරිය කරන්න නොදී ඔබතුමාගේ කකුලෙන් අදින බව. මම ඔබතුමාගෙන් ප්‍රශ්නයක් අහන්න කැමැතියි. දැන් ඔබතුමා කිව්වා, ළඟදීම ගුරුවරු එන්නත් කරන්න පටන් ගන්නවා කියලා. එහෙම නේද, ගරු රාජ්‍ය ඇමතිතුමනි? ඒක කොච්චර ලජ්ජාවක්ද? මේ රටේ එන්නත් protocol එකක් තිබෙනවා නම්, හතළිස්තුන් ලක්ෂයක් වන දූ දරුවන්ට උගන්වන ගුරුවරුන්ට මේ එන්නත්කරණයේදී ප්‍රමුඛතාව දෙන්න තිබුණා නේද, ප්‍රභූවරුන්ට එන්නත ලබා දෙන්න ඉස්සර වෙලා? [බාධා කිරීම්] මම අහන ප්‍රශ්නයට උත්තර දෙන්න. හතළිස්තුන් ලක්ෂයක් වන දූ දරුවන් අනතුරේ දමා ඉස්සෙල්ලා ටික දෙනෙකු vaccinate කළා. ඒක මොන ලජ්ජාවක්ද? ඔබතුමන්ලාට ගුරුවරුන්ට ප්‍රමුඛතාව දෙන්න තිබුණා.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා රූපවාහිනී නාළිකා ගැන ලොකුවට කථා කළා. ජනමාධ්‍ය අමාත්‍ය ගරු කෙහෙළිය රඹුක්වැල්ල මැතිතුමා මේ වෙලාවේ සභාවේ ඉන්නවා. ඔබතුමන්ලාට අරක්කු licence එක, bar licence එක දෙන්න යන්නේ තත්පර ගණනයි. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. දැන් ඒවා ආපස්සට ගත්තා කියලා කියනවා. ඒ ගැන අපි සතුටු වනවා. ඇයි, මේ ජනමාධ්‍ය අමාත්‍යතුමාත් එක්ක කථා කරලා,- [බාධා කිරීමක්] කොහේද, සහාය ලබා දෙන්නේ? ඔබතුමාගේ පිළිතුරේ ඔක්කෝම තිබුණේ සහයෝගය ලබා නොදීම ගැන නේ.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේ කරුණු ටික කියන්න මට අවස්ථාව දෙන්න. මම තවම අවසන් කළේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔය කාරණය විවාදයකට හරවා ගන්න එපා, ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, online ක්‍රමයට විභාග පවත්වන්නේ නැහැ කියලා දැන් ඔබතුමාම කියනවා. මම ඇහුවේ online විභාග ගැන නොවෙයි. මම ඇහුවේ විෂය නිර්දේශය -syllabus එක- සම්පූර්ණයෙන් cover කරන්නේ නැතිව ඔක්තෝබර් මාසයේදී GCE A/L විභාගය පවත්වන්නේ කොහොමද කියලායි. [බාධා කිරීමක්] මගේ කරුණු දැක්වීම අවසාන කළාට පසු ඔබතුමා උත්තර දෙන්න.

ගරු කථානායකතුමනි, මම අවසාන වශයෙන් කියන්නේ මෙච්චරයි. ගරු රාජ්‍ය ඇමතිතුමාම කියනවා, ඔක්කෝටම මෙවලම් ලබා දීමේ හැකියාවක් නැහැයි කියලා. මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, යහ පාලන රජය සමයේ දරුවන්ට ටැබ් පරිගණක දෙන්න කිව්වාම ඔබතුමන්ලාගේ පාර්ශ්වයේ කී දෙනෙකු විරුද්ධ වුණාද කියලා. ඒ සම්බන්ධයෙන් කී දෙනෙකු press conferences පැවැත්වූවාද, කී දෙනෙකු voice cuts දුන්නාද? සමහරු කිව්වා, වඳ වෙනවා කියලා. ඒකට උත්තරය මොකක්ද? ඔබතුමාගෙන් මම ප්‍රශ්නය ඇහුවේ නිලධාරින් ලියා දෙන උත්තරය කියවන්න නම් නොවෙයි. [බාධා කිරීමක්] ඔබතුමා බොහොම උගත් රාජ්‍ය ඇමතිවරයෙක්. හැබැයි, ලෝක බැංකුව ගැන අහපු ප්‍රශ්නයට නිලධාරින් වැල්වටාරම් උත්තරයක් දීලා තිබෙනවා. ගරු කථානායකතුමනි, 2020 දී අපිට රුපියල් කෝටි 98ක් හම්බ වුණා. මේවා ලැබෙන්නේ නිකම් නොවෙයි. මේ ණය ආධාර. හැබැයි, ඒ රුපියල් කෝටි 98ක මුදල අවුරුද්දක් යන තෙක් පාවිච්චි කළේ නැහැ. ඔන්න ඇත්ත කථාව. ඔබතුමා ඇත්ත කථාව කියන්න. ඔබතුමා ඒ කාරණය පිළිගන්න. ඒක ඔබතුමාගේ වරදක් නොවෙයි. ඕවා කරන්න ඔබතුමාට බලයක් නැහැ. ඔබතුමා තමයි, අධ්‍යාපන ඇමතිතුමා වෙන්න ඕනෑ. ඔබතුමාට විෂයානුබද්ධ දැනුමක් තිබෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, හොඳට ටයි කෝට් ඇඳගෙන කැටි වලාකුළුවල ඉන්න ඇත්තන්ට මහ පොළොවේ යථාර්ථය තේරෙන්නේ නැහැ නේ? [බාධා කිරීමක්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (විදේශ අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - வெளிநாட்டு அலுவல்கள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Foreign and the Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, විපක්ෂ නායකතුමා අහපු ප්‍රශ්නයට පිළිතුර ලබා දීලා අවසානයි නේ. [බාධා කිරීම්]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඇහෙන දේවල් අමිහිරි වුණාම mike එක off කරන්න හදන්න එපා. මම මේ ඇත්ත කථාව කියන්නේ. හතළිස්තුන් ලක්ෂයෙන් තිස්පන් ලක්ෂයකට කිසිම ප්‍රශ්නයක් නැහැ කියලා ඇමතිතුමා සංඛ්‍යාලේඛන සහිතව කිව්වා. ඒක හරිද? ඔබතුමා වගකීමෙන්ද කියන්නේ? අද හතළිස්තුන් ලක්ෂයකින් තිස්පන් ලක්ෂයක් කිසිම ප්‍රශ්නයක් නැතිව online අධ්‍යාපනය ලබනවා කියන එක සම්පූර්ණ අසත්‍යයක් කියලා මම කියනවා. රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මේ විෂය දන්නා පුද්ගලයකු හැටියට දරුවන් ගල් පර්වතවල නැඟගෙන, ගස්වල නැඟගෙන අධ්‍යාපන කටයුතු කරන එකේ දුක තේරෙන්නේ නැද්ද? අපේ ඇමතිතුමාට මේවා තේරෙන්නේ නැහැ. ලෝක බැංකුවෙන් ලැබුණු කෝටි 98 පාවිච්චි කරන්නේ නැතිව අවුරුද්දක් යනතුරු මොනවාද කළේ? ඔබතුමා නිලධාරින් දුන්න පිළිතුර තමයි දැන් කියෙව්වේ. කරුණාකර රටට බොරු කරන්න එපා. අඩු ගණනේ අද ඉඳලාවත් ගුරුවරුන් සියලුදෙනා එන්නත් කරන්න. ප්‍රභූවරුන්ට එන්නත දෙන්න කලින් ගුරුවරුන්ට එන්නත දෙන්න තිබුණා. ගුරුවරු තමයි අනාගතය භාර ගැනීමට සිටින හතළිස්තුන් ලක්ෂයක් දූ දරුවන් රැක ගන්නේ. නමුත් ඒක කරන්න මොළය තිබුණේ නැහැ. හැමෝටම ඕනෑකම තිබුණේ මුලින් ගිහින් එන්නත ගහගන්නයි. මේ අය වේදිකාවේ කියන්නේ මොකක්ද? ජනතාවට පළමුවැනි තැන, රටට පළමුවැනි තැන කියලායි කියන්නේ. නමුත් පළමුවෙන් ගිහින් එන්නත ගහගත්තා. ගුරුවරුන්ට එන්නත දුන්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විපක්ෂ නායකතුමනි, දැන් ප්‍රශ්නය මතුකර අවසන්.

**ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சுசில் பிரேமஜயந்த)
(The Hon. Susil Premajayantha)
ගරු කථානායකතුමනි, පැහැදිලි කිරීමක් කරන්න මට මිනිත්තුවක් දෙන්න. [බාධා කිරීම්]

එන්නත්කරණය පිළිබඳ ප්‍රමුඛතාව තීන්දු කරන්නේ අධ්‍යාපන අමාත්‍යාංශය. අපි අපේ ඉල්ලීම කරලා තිබෙනවා. ඒක තීන්දු කරන්නේ සෞඛ්‍ය බලධාරින් ඇතුළු කාර්ය සාධක බලකායක් විසින්. අපට ඒකට මැදිහත් වෙන්න බැහැ. හැබැයි, මේ වන විට ගුරුවරුන්ටත් එන්නත ලබා දීමේ වැඩ පිළිවෙළ ආරම්භ කිරීමට අවශ්‍ය පසුබිම සකස් කර තිබීම ගැන අපි සතුටු වෙනවා. අද ජාතික අධ්‍යාපන ආයතනය එම කටයුත්ත ආරම්භ කර තිබෙනවා.

දෙවැනි කාරණය, ලෝක බැංකුවෙන් ආධාර ලැබෙන අවස්ථාව වෙනකොට මම මේ තනතුරු දැරුවේ නැහැ, විපක්ෂ නායකතුමනි. ඒ නිසා තමයි අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරින්ගෙන් ඒ පිළිබඳ තොරතුරු ටික ගත්තේ. හැබැයි, මම ඔබතුමාගේ පළමුවැනි ප්‍රශ්න හතටම පිළිතුරු දුන්නේ මගේ දැනුම් පරාසය තුළයි. ඔබතුමා ඒ බව හොඳට නිරීක්ෂණය කරන්න ඇති. අපේ හිටපු අගමැතිතුමා -රනිල් වික්‍රමසිංහ මැතිතුමා- මෙතැන ඉන්නවා. එතුමා හැම දාම ටයි කෝට් තමයි අඳින්නේ; අපි නම් ඉඳලා හිටලා අඳිනවා; උසාවි යන දවස්වලට අඳිනවා. අලි සබ්රි ඇමතිතුමනි, ඔබතුමා දකිනවා නේ. හැබැයි, මම අධ්‍යාපන ක්ෂේත්‍රය ගැන කාරණයක් කියන්න ඕනෑ. [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්න, කියන්නම්. 1985දී ජයිකා ආධාර යටතේ ජාතික අධ්‍යාපන ආයතනය විශ්වවිද්‍යාල මට්ටමට පිහිටුවීමට එතුමා කටයුතු කළා. ඒක තමයි අපි ඉදිරියට ගෙනැවිත් තිබෙන්නේ. අපි ඒක විශ්වවිද්‍යාලයක් කරන්න කටයුතු කරනවා, ගරු හිටපු අගමැතිතුමනි. අද විද්‍යා පීඨ 19ක් තිබෙනවා. එදා National Colleges of Education ඇති කරලා ප්‍රවීණ ගුරුවරු, වෘත්තීය ගුරුවරු බිහි කරන්නට එතුමා කටයුතු කළා. අපි අද ඒක විශ්වවිද්‍යාලයක් බවට පත් කරනවා. රටට, සමාජයට, ක්ෂේත්‍රයට කවුරුන් හෝ කරපු දෙයක් තිබෙනවා නම්, ඒක ප්‍රවර්ධනය කරගෙන යෑම අපේ යුතුකමක් වෙනවා. අපි මේ අවුරුද්දේත් Tabs 95,000ක් දුන්නා; නැවැත්තුවේ නැහැ. හැබැයි, දරුවන්ට නොවෙයි, පාසල්වලටයි දුන්නේ. එතකොට සමූහයක් හැටියට ඒවා පාවිච්චි කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! අද දින දිවා ආහාර විවේකයෙන් තොරව රැස්වීම් පවත්වාගෙන යෑමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

## නොපැමිණීමේ අවසරය: ගරු මහින්ද සමරසිංහ මහතා
## வராதிருக்க அனுமதி: மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ
## LEAVE OF ABSENCE: HON. MAHINDA SAMARASINGHE

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 66(ඊ) ව්‍යවස්ථාව යටතේ, කළුතර මැතිවරණ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මහින්ද සමරසිංහ මහතාට 2021 ජුනි 23 දින සිට මාස තුනක කාලයක් තුළ පාර්ලිමේන්තුවේ රැස්වීම්වලට නොපැමිණීමට අවසර දිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
## தனி உறுப்பினர் சட்டமூலங்கள்
## PRIVATE MEMBERS' BILLS

### ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### இலங்கை மருந்தியல் சங்கம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
### PHARMACEUTICAL SOCIETY OF SRI LANKA (INCORPORATION) BILL

**ගරු මධුර විතානගේ මහතා**
(மாண்புமிகு மதுர விதானகே)
(The Hon. Madhura Withanage)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා:

"ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය"

**ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය**
(மாண்புமிகு (திருமதி) முதிதா பிரிஷாந்தி)
(The Hon. (Mrs.) Muditha Prishanthi)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***
***වාර්තා කිරීම සඳහා 52 (6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත සෞඛ්‍ය අමාත්‍යතුමිය වෙත පවරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் நிலைக்கட்டளை இல. 52(6)இன்படி சுகாதார அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*
*The Bill stood referred, under Standing Order No. 52(6), to the Minister of Health for report.*

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremasinghe)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හිටපු අගමැති, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremasinghe)
ගරු කථානායකතුමනි, මට සභානායකතුමාගෙන් ඉල්ලීමක් කරන්න තිබෙනවා. යම් සමාගමකට කොළඹ නගරයේ ඉඩම් විශාල ප්‍රමාණයක් ලබා දෙන බව කියනවා. මම හරියට ඒ කරුණු දන්නේ නැහැ. ඒ නිසා අගමැතිතුමා හෝ රාජ්‍ය ඇමතිතුමා ඒ සම්බන්ධව ගරු සභාවට විස්තරයක් කරන්න කියා මා ඉල්ලීමක් කරනවා. ඉන් පසුව පැන නඟින ප්‍රශ්න අපට මතු කරන්න පුළුවන්. ඒ ගැන විස්තර කරනවා නම්, රටටත් දැනුම් දෙන්න අපට පුළුවන්.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා, ඔබතුමාගේ රීති ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, මීට ටික දවසකට කලින් වාගේම ඊයේත් මාධ්‍ය මඟින් අපි දැක්කා, W.M. Mendis & Company Limited එකට අරක්කු නිෂ්පාදනය සඳහා බලපත්‍රයක් ලබා දීලා පසුව cancel කළා කියලා. ගැටලුව ඒක නොවෙයි. ඒ සමාගම සුරා බදු දෙපාර්තමේන්තුවට බිලියන 1.1ක්, VAT එක වශයෙන් බිලියන 3.55ක් සහ ආදායම් බදු වශයෙන් බිලියන 2.63ක් ගෙවන්න තිබෙනවා. ආණ්ඩුව කිව්වේ, එම ආයතනයට නිෂ්පාදන කටයුතු පටන් ගන්න දුන්නාම එම සල්ලි ටික ගන්න පුළුවන් කියලා. හැබැයි, ලබා දුන් බලපත්‍රය පසුව cancel කරලා තිබෙනවා. මහ බැංකු බැඳුම්කරයට සෘජුව චෝදනා ලබපු ඒ අය අල්ලනවා වෙනුවට, මේ බලපත්‍රය දීලා නැවත cancel කරලා තිබෙනවා. එතකොට මේ පාඩුව අය කර ගන්න ආණ්ඩුවට වැඩ පිළිවෙළක් තිබෙනවාද? ඊට අමතරව මහජන බැංකුවට බිලියන 5කුත්, ලංකා බැංකුවට බිලියන 4කුත්, People's Leasing & Finance එකට මිලියන 800කුත් වශයෙන් ආණ්ඩුවට බිලියන 17ක් ගෙවන්න තිබෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, සුරාබදු ආඥා පනතේ 27වන වගන්තියට මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. W.M. Mendis & Company Limited එකෙන් ලැබෙන්න තිබෙන මුදල අය කර ගන්නේ නැතුව ඒ කාරණය යට ගහන්න කරන උප්පරවැට්ටියක් තමයි මේ. ඒකට ඉඩ දෙන්න එපා. මේ හදන්නේ ඒ උප්පරවැට්ටිය කරන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය ඇමතිතුමා දැන් ගරු සභාවේ ඉන්නවා. එතුමා උත්තර දීපු ප්‍රශ්නයක් සම්බන්ධවයි මා අහන්නේ.

ගරු කථානායකතුමනි, 2020 මාර්තු 29වැනි දා ජනාධිපතිතුමා විසින් විශේෂයෙන්ම කොවිඩ් වසංගතයට විසඳුමක් හොයන්න අධ්‍යාපනය පිළිබඳව ජනාධිපති කාර්ය සාධක බලකාය පත් කළා. එතකොට ඩලස් අලහප්පෙරුම මැතිතුමා තමයි අධ්‍යාපන ඇමතිවරයා ලෙස සිටියේ. ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් මම අහනවා, ජනාධිපතිතුමා පත් කරපු ඒ අධ්‍යාපනය පිළිබඳව ජනාධිපති කාර්ය සාධක බලකාය ගත්තා වූ තීන්දු හා ඒකට මොකද වුණේ කියලා. ඔබතුමා ඒ ගැන පොඩි පැහැදිලි කිරීමක් කළොත් හොඳයි.

**ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சுசில் பிரேமஜயந்த)
(The Hon. Susil Premajayantha)
ගරු කථානායකතුමනි, ඒ ගැන මට කියන්න තිබෙන්නේ මෙයයි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේ ජනාධිපති කාර්ය සාධක බලකායක් පත් කර තිබෙනවා. ඒ කාර්ය සාධක බලකායේත් යම් යම් උපදෙස් අනුව තමයි අධ්‍යාපන අමාත්‍යාංශය තීරණ අරගෙන තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 4 දක්වා ඉදිරිපත් කිරීමට, අධිකරණ අමාත්‍ය ගරු අලි සබ්රි මැතිතුමා.

## අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත
## குற்றவியல் நடவடிக்கைமுறை சட்டக்கோவை (திருத்தம்) சட்டமூலம்
## CODE OF CRIMINAL PROCEDURE (AMENDMENT) BILL

*දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

[අ.භා.12.31]

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා (අධිකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி - நீதி அமைச்சர்)
(The Hon. M.U.M. Ali Sabry - Minister of Justice)
ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

එසේම අද න්‍යාය පත්‍රයේ දිනට නියමිත කටයුතුවලට අදාළ විෂය අංක 2, 3 සහ 4 මම ඉදිරිපත් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු රංජිත් සියඹලාපිටිය මහතා] මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிட்டிய] தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. RANJITH SIYAMBALAPITIYA] took the Chair.*

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පතින් අපි බලාපොරොත්තු වෙන්නේ, පොලීසිය භාරයේ සිරකරුවන් රඳවා ගෙන සිටින ස්ථානවලට යෑම සහ එම කටයුතු යම්කිසි ආකාරයකින් පරිපාලනය කරගෙන යෑම සඳහා අවශ්‍ය කටයුතු සලසන්නයි. 1991 අංක 8 දරන බන්ධනාගාර සිරකරුවන් නිදහස් කිරීමේ පනතේ 5 වන වගන්තියට අනුව සෑම මහෙස්ත්‍රාත්වරයෙක්ම තමා පත් කර සිටින අධිකරණ කොට්ඨාසය තුළ පිහිටා ඇති බන්ධනාගාර වෙත අවම වශයෙන් සෑම මසකට වරක්වත් ගමන් කළ යුතු බව අපි දන්නවා. එම බන්ධනාගාර වෙත ඇවිල්ලා ඒ අවශ්‍ය තොරතුරු ලබා ගන්නට ඕනෑ. මෙයින් බලාපොරොත්තු වන්නේ, සිර මැදිරියට පමණක් ඒක සීමා කරන්නේ නැතිව, ඒ සැකකරුවන් රඳවා තිබෙන ස්ථානවලට ගිහිල්ලා, ඒ ස්ථානවල තත්ත්වය පරීක්ෂා කරලා, යම් යම් අඩු පාඩු තිබෙනවා නම් මහෙස්ත්‍රාත්තුමාට අවශ්‍ය නිරීක්ෂණ - observations - සටහන් කරලා, අවශ්‍ය නම් ඒ සම්බන්ධයෙන් යම් කිසි පුද්ගලයෙකුගෙන් ප්‍රකාශ සටහන් කරගෙන සුදුසු පියවර ගැනීමයි.

අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11වන ව්‍යවස්ථාව අනුව, කිසිම තැනැත්තකු වධ හිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුතුයි. ඒ වාගේම 13වන ව්‍යවස්ථාවේ 5 වන අනුව්‍යවස්ථාවට අනුව, සැකකරුවන් සියලුදෙනාම නිර්දෝෂීත්වයේ පූර්ව නිගමනයට භාජන වෙනවා. අධිකරණයකින් නඩු විසඳලා යම්කිසි පුද්ගලයෙකු වරදකරුවකු කරනතුරු ඔහු නිර්දෝෂී පුද්ගලයෙකුය යන පූර්ව නිගමනය තමයි නීතියෙන් සලසා දී තිබෙන්නේ. ඒ නිර්දෝෂීභාවයේ පූර්ව නිගමනයට භාජන වන සැකකරුවන්ට මානුෂිකව කටයුතු කිරීමේ වැදගත්කම අපි දැනට හඳුනාගෙන තිබෙනවා. එහි එක් පියවරක් හැටියටයි අපි මේ නීතිය සංශෝධනය කරලා, ඒ පහසුකම් සලසා දීමට උත්සාහ කරන්නේ. අපි ඒක මෙතැනින් නවත්වන්න උත්සාහ කරන්නේ නැහැ.

කොවිඩ්වලට පෙර අපේ බන්ධනාගාර පද්ධතිය තුළ සිරකරුවන් සහ සැකකරුවන් 28,000ත්, 30,000ත් අතර ප්‍රමාණයක් සිටියා. නමුත් අපට තිබෙන ධාරිතාව අනුව පුද්ගලයන් 10,000කට පමණයි එහි ඉඩකඩ සීමා වන්නේ. මේ පවතින කොවිඩ් තත්ත්වය නිසා ගරු අග්‍ර විනිශ්චයකාරතුමාට, නීතිපතිතුමාට, පොලීසියට අපි කියලා තිබෙනවා, සාකච්ඡා කරලා අත්‍යවශ්‍යම නොවන අවස්ථාවලදී සිරගත කරනවා වෙනුවට, රිමාන්ඩ් කරනවා වෙනුවට ඔවුන් ඇප පිට මුදා හැරීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දෙන්න කියලා. එසේ ඉල්ලීමක් කළාට පස්සේ සිරකරුවන් 27,000ක්ව සිටි ප්‍රමාණය 18,000කට විතර අඩු කරගෙන තිබෙනවා. නැත්නම් මේක විශාල ප්‍රශ්නයක්

වෙන්න ඉඩ තිබුණා. ඒක, කෙටි කාලීනව කරපු විසඳුම. නමුත් අපි ඒ සම්බන්ධයෙන් දීර්ඝ කාලීනව විසඳුමක් දෙන්නත් දැනටම කටයුතු ආරම්භ කර තිබෙනවා. කොළඹ තිබෙන මැගසින් බන්ධනාගාරය, වැලිකඩ බන්ධනාගාරය, රිමාන්ඩ් බන්ධනාගාරය ඇතුළු සියලු බන්ධනාගාර හොරණ මිල්ලනිය ප්‍රදේශය වෙත ගෙන යෑමට අපි කටයුතු කරමින් සිටිනවා. එහිදී අක්කර 200ක භූමි භාගයක් තුළ මැන්ඩෙලා ජාත්‍යන්තර නිර්දේශවලට අනුව ඉතාම හොඳ, ජාත්‍යන්තර මට්ටමේ සිර කඳවුරු රාශියක් නිර්මාණය කිරීමට බලාපොරොත්තු වෙනවා. ඒ අනුව, අපි දැනට තිබෙන ධාරිතාව දහ ගුණයකින් වැඩි කරන්න බලාපොරොත්තු වෙනවා. කාන්තාවන්ට සහ විශේෂයෙන් කුඩා දරුවන්ට මෙන්ම විවිධ තරාතිරමේ අපරාධකරුවන්ට හා රිමාන්ඩ් භාරයේ ඉන්න අයට වෙන වෙනම ස්ථාන ලැබෙන ආකාරයට ඒ කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා.

ඒ විතරක් නොවෙයි, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ පහළ ස්තරයේ අය ගැනත් අපි සලකා බලනවා. ඒ කියන්නේ, මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් - drug traffickersලා - නොවෙයි, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන්. මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වුණු අය අපි දකින්නේ වින්දිතයන් හැටියටයි. ඔවුන් සිරගත කරනවා වෙනුවට, රිමාන්ඩ් කරනවා වෙනුවට පුනරුත්ථාපනය කිරීම සඳහා වැඩ පිළිවෙළක් අපි දැන් සකස් කරගෙන යනවා. පුනරුත්ථාපනය කිරීම සඳහා දැනට තිබෙන ධාරිතාව වන්නේ පුද්ගලයන් 500 සිට 1,000 දක්වා පමණයි. අපි පුද්ගලයන් 10,000ක් පුනරුත්ථාපනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසන්න කටයුතු කරමින් සිටිනවා. අලුතින් ඉදිකරන විශාල සිර කඳවුරේ සහ සංකීර්ණයේ අවම වශයෙන් 2,000කට පමණ ඒ අවස්ථාව සලසා දීමට කටයුතු කරගෙන යනවා. ඒ සියලු කටයුතු වෙනුවෙන් තමයි අපි මෙම පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නේ. ජාතික ආරක්ෂාවේ අඩු පාඩුවක් නොවන අවස්ථාවේදී වුවද, එය සනාථ කරන ආකාරයට, මේ රටේ පුරවැසියන්ගේ නිදහස, ආරක්ෂාව, මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ යුතුකමක් අපට තිබෙනවා. මේ දෙක අතර සමබරතාවක් හදාගෙන යන්නට ඕනෑ. ජාතික ආරක්ෂාව කිසිසේත් පාවා නොදෙන ආකාරයට, කිසිම අපරාධකාරයෙකුට ඉඩ නොදෙන ආකාරයට කටයුතු කළ යුතු වනවා වාගේම, මා කලින් සඳහන් කළ පරිදි, නිර්දෝෂීභාවයේ පූර්ව නිගමනයට අනුව සියලු සැකකරුවන්ට සදාචාරාත්මක ලෙස සැලකීමේ යුතුකමක් රජයක් හැටියට අපට තිබෙනවා. එය ඉටු කිරීමේ එක් පියවරක් වශයෙන් තමයි අද අපි මේ පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ විවාදය සඳහා ඉදිරිපත් කර තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට වධදීමට සහ අනිකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැළකීමට හෝ දඬුවම්වලට එරෙහිව වූ සම්මුතිය (සංශෝධන) පනත් කෙටුම්පතත් දෙවන වර කියවීමේ විවාදය සඳහා ඉදිරිපත් කර තිබෙනවා. ඒකත් ඉතාම වැදගත් පනත් කෙටුම්පතක්. Hon. Deputy Speaker, for a considerable period of time, it has been acknowledged that the fines pertaining to the violation of the provisions in certain Acts and Ordinances are totally inadequate to deter such violation. Therefore, one of my predecessors, in fact, had appointed a committee in the past to study it. So, it is appropriate to make recommendations to increase the fines imposed on penalties in certain Acts and Ordinances.

Sir, what is important is, Article 11 of the Constitution of Sri Lanka provides that "No person shall be subjected to torture or to cruel, inhuman or degrading treatment or punishment". Act No. 22 of 1994 was enacted by Parliament, by this House, to give effect to the Convention against Torture and Other Cruel, Inhuman or Degrading Treatment or Punishment, which is an international Treaty. Sri Lanka follows zero tolerance in respect of torture and other cruel, inhuman or degrading treatment or punishment. Therefore, increasing the fines provided for offences under the Act to a realistic level would ensure Sri Lanka's commitment against torture and other cruel, inhuman or degrading treatment or punishment and would also be a guarantee for basic human rights. It is important that we understand that 99 per cent or more than that of the law enforcement authorities including the officers of the police and others are doing a great job. They respect the rule of law and human dignity. But, there are a few elements which have created a very bad image for the country and a very bad name for us, as a result of which we have been asked to respond to all these things at various international and local fora.

Everyone's life matters; everyone's dignity matters; everyone should be treated equally, and therefore, it is important that no one should be allowed to treat any other human being, as a citizen of this country or otherwise, in a degrading manner. So, in order to deter that practice, we are proposing to increase the fine from Rs. 50,000 to Rs. 200,000 so that it would work as a deterrent to people who are willing or attempting to violate the law and act against the Constitution of this country.

Then, Sir, there is another important Order I want to present today.

2013 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7(2) වගන්තිය යටතේ මා විසින් 2020 දෙසැම්බර් මස 23 දිනැති අංක 2207/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය අනුමත කිරීම සඳහා අද දින මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා. අත්අඩංගුවට ගන්නා ඕනෑම පුද්ගලයකු පොලිසිය විසින් වහාම මහේස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කරන්නට ඕනෑ. නමුත් අපි දන්නවා ඇතැම් අවස්ථාවල ඔවුන් තවදුරටත් රඳවාගෙන ප්‍රශ්න කිරීමට අවශ්‍ය වන බව. ඒ නිසා තමයි මා මුලින් සඳහන් කළේ, සමතුලිතතාවක් ඇති කර ගැනීමේ වැදගත්කමක් තිබෙන බව. ඒ කියන්නේ මේකයි. මේ රටේ ජාතික ආරක්ෂාව තහවුරු කරන්න ඕනෑ. අපරාධකරුවන්ට මේ රටේ නීතියෙන් රිංගා යන්න ඉඩ දෙන්න බැහැ. ඔවුන්ට විරුද්ධව නීතිය ක්‍රියාත්මක වෙන්න ඕනෑ. ඔවුන්ට විරුද්ධව විමර්ශන කඩිනම්ව සිදු වෙන්න ඕනෑ. සමහර අවස්ථාවල, පවතින සාමාන්‍ය නීතියෙන් ඔබ්බට ගිහිල්ලා ඒ වෙනුවෙන් කටයුතු කරන්න සිද්ධ වෙනවා. නමුත්, එය සාමාන්‍ය නීතියක් නොවී රීතියක් බවට පත් වෙන්නට ඕනෑ. කෙසේ වෙතත්, 2013 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7 (2) වගන්තිය යටතේ ඒ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා කාලය වරින් වර දීර්ඝ කර තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please!

මේ අවස්ථාවේ කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු සංජීව එදිරිමාන්න මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා (වැවිලි අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண - பெருந்தோட்ட அமைச்சர்)
(The Hon. (Dr.) Ramesh Pathirana - Minister of Plantation)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු සංජීව එදිරිමාන්න මහතා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව එදිරිමාන්න මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ எதிரிமான்ன அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. SANJEEVA EDIRIMANNA *took the Chair.*

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2013 වර්ෂයේ සිට වරින් වර දීර්ඝ කරන ලද මෙම නියම තවත් වසර දෙකක් දක්වා දීර්ඝ කිරීම සඳහා අපි 2020 දෙසැම්බර් මාසයේ 23වන දා ගැසට් පත්‍රයක් නිකුත් කළා. එහි සඳහන් නියමය මම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා, ඒ පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් වැදගත් යෝජනාවක් අද දිනට නියමිතව තිබෙනවා. ඒ තමයි, 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනතට අනුව, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සාමාජිකයන්ගේ වැටුප් හා දීමනා ප්‍රතිශෝධනය කිරීම.

Hon. Presiding Member, it is important to mention that there were a number of decisions taken by us during the last few months in order to activate the reconciliation process and to speed it up. In order to do so, we need to empower various institutions and several bodies. There are three main institutions. One is, ONUR - the Officer for National Unity and Reconciliation. We have empowered that institution though it was brought about by the previous Government. Contrary to their expectations - they thought that we would do away with it - we have empowered it. We will continue to empower it so that we can build national unity and reconciliation.

The second institution is the Office for Reparations. As we all know, it is an institution which succeeded the entity called REPPIA. The REPPIA was established after the 1983 riots to pay compensations for the people who were affected by it. So, the Office for Reparations continues to perform a great service in that regard and has been paying certain amounts to the affected. Not only that, they continue to pay financial reperations and we have empowered them. We have retained the same office-bearers who have been there until their period is over. They are doing a good job. We want to continue with that so that whoever who have been affected by various conflicts in various parts of the country would immediately be paid their reparations and whatever dues they ought to be paid.

In a similar way, the Government and the Cabinet of Ministers took a policy decision that the Office on Missing Persons should also be strengthened and empowered to do their job because we cannot allow people to go on missing forever. We understand that there are parties who are interested in naming and shaming our country, coming out with totally fabricated or fake figures to say that thousands of Sri Lankans - different numbers like 20,000 or 30,000 are being given - have gone missing. So, what we are interested in is to show how many people have actually gone missing from 2009, to trace them, to reduce their numbers and to bring a finality to that. If somebody had actually gone missing, then we have to issue a death certificate for him or recommend his family to be paid compensation. We have to come out with a realistic number. Accordingly, it is important that we empower these institutions.

It is in line with that that we have appointed a new team of office-bearers to man the Office on Missing Persons. The Chairman of that Office resigned and the other office-bearers concluded their term. Thereafter, a new team of office-bearers has been appointed. In terms of the Act, their remunerations, facilities and benefits should be approved by Parliament. We have produced those to the Judicial Oversight Committee and they have gone through and approved those. I will be producing those to the House, bringing those on par with the payments made to the Members of the Office for Reparations.

I invite all the Members of this august Assembly to also look at the Bills taken up today - the Code of Criminal Procedure (Amendment) Bill and the Convention Against Torture and other Cruel, Inhuman or Degrading Treatment or Punishment (Amendment) Bill - and give their concurrence to get them passed along with the Order under the Code of Criminal Procedure (Special Provisions) Act and the Revision of Salaries and Allowances accorded to the Members of the Office on Missing Persons. We are in the process of rolling out several amendments and implementing a reform process to strengthen several institutions coming under the justice sector. So, all these are part of that process.

May I know how many minutes more I have, Hon. Presiding Member?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
You have 11 minutes more.

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකාවේ අධිකරණ ක්ෂේත්‍රයේ සම්පූර්ණ වෙනසක් කිරීම සඳහා අපි කටයුතු කරගෙන යනවා. එහි තිබෙන බාධක විසඳා ගෙන, ඉක්මනට නඩු අහලා එම ක්ෂේත්‍රය ඉදිරියට ගෙන යෑම සඳහා ලබා දිය හැකි සියලු පහසුකම් ලබා දීමට අපි කටයුතු කරගෙන යනවා. එහිදී අධිකරණයේ ස්වාධීනත්වය රැකෙන පරිදි, අධිකරණයේ ගෞරවය රැකෙන පරිදි, අධිකරණ සේවා කොමිෂන් සභාවට තිබෙන ස්වාධීන

අයිතිය තහවුරු වන පරිදි කටයුතු කිරීමට අවශ්‍ය සියලු යටිතල පහසුකම් ලබාදීමේ ක්‍රමවේදයක් අපි හඳුන්වා දී තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අනුව තමයි අපි ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් සංඛ්‍යාව වැඩි කළේ. ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් සංඛ්‍යාව වැඩි කරන බව පසු ගිය අවුරුද්දේ කියන කොට, "ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් පත් කළාට ඔවුන්ට පහසුකම් දෙන්න පුළුවන්ද" කියා මෙතැනදී මගෙන් ප්‍රශ්න කළා මට මතකයි. ඊට පස්සේ මගෙන් ප්‍රශ්න කළා, "අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන් සංඛ්‍යාව දෙගුණයක් කළාට අවශ්‍ය පහසුකම් දෙන්න පුළුවන්ද" කියලා. නමුත් අපි දැඩි අධිෂ්ඨානයකින් යුතුව ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයන් සංඛ්‍යාව 6කින් වැඩි කළා. අභියාචනාධිකරණ විනිශ්චයකාරවරයන් සංඛ්‍යාව 8කින් වැඩි කළා. ඒ හේතුකොටගෙන අද අලුතින් උසාවි 7ක් පමණ නිර්මාණය වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ඒ සියලුදෙනාට කාර්ය මණ්ඩලය සහ chambers ලබාදීලා තිබෙනවා. ඒ කොච්චර දුරටද කිව්වොත්, ඔවුන් ජනවාරි මාසයේ වැඩ පටන් ගන්න කොට විශාල මුදලක් දරා අවශ්‍ය සියලු පහසුකම් ලබාදීම සඳහා අපි කටයුතු කළා.

අපි ඒ ප්‍රදේශය තවදුරටත් විශාල වශයෙන් දියුණු කරගෙන යනවා. "House of Justice" කියන project එක පොතකට පමණක් සීමා වෙච්ච දෙයක් විධියටයි තිබුණේ. අක්කර හයහමාරක භූමි භාගයක් හඳුනාගෙන ඒ සම්පූර්ණ projects හතරම ඉදිරියට කරගෙන යෑමේ කටයුත්ත අපි දැන් පටන් ගෙන තිබෙනවා. පළමුවෙනි towers දෙකේම ඉදිකිරීම් කටයුතු දැන් ආරම්භ කර තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, 2023 වර්ෂය වන කොට අලුතින් උසාවි 50කට වැඩි ප්‍රමාණයක් අලුත්කඩේ උසාවි සංකීර්ණය වෙත ලබාදීමට. එතකොට, අලුත්කඩේ උසාවි සංකීර්ණය සම්පූර්ණයෙන් වෙනසකට ලක් වෙනවා. ඒ හැරුණාම, මේ අභියෝගාත්මක කාලය තුළ තාක්ෂණය උපයෝගී කරගෙන නඩු ඇසීම සඳහා අවස්ථාව සලසා දීමට අවශ්‍ය කටයුතු අපි අපේ පැත්තෙන් කර දුන්නා. අපි විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා, අධිකරණ සේවා කොමිෂන් සභාවට සහ ඇපැල් උසාවියට. මොකද, පසුගිය සති දෙකතුන තිස්සේ අනික් රටවල් හා සමානව තාක්ෂණය උපයෝගී කරගෙන online hearingsවලට යන්නට ඔවුන් කටයුතු කරමින් සිටිනවා. ඒ ඇරුණාම, සම්පූර්ණ අධිකරණ පද්ධතිය ඩිජිටල්කරණය සඳහා අපි වැඩ පිළිවෙළක් ආරම්භ කර තිබෙනවා. අපි ඒ වැඩ පිළිවෙළ ආරම්භ කරලා පවත්වාගෙන යනවා. අපේ බලාපොරොත්තුව, වර්ෂ 2021 දෙසැම්බර් මාසය වන කොට ලංකාව පුරා තෝරාගත් උසාවි 42කින් පළමුවෙනි අදියර ආරම්භ කරලා, අදියර හතරකින් වසර තුනක කාලයක් තුළ ලංකාව පුරා තිබෙන සියලු අධිකරණ ඩිජිටල්කරණයට ලක් කිරීමයි. Online hearing, online filing, e-hearing, video-conferencing, audio recording වැනි සියලු පහසුකම් ලබාදීලා අනිකුත් රටවල් හා සමානවම තාක්ෂණය උපයෝගී කරගෙන, law's delays කියා හැම දාම කියන, නීතියේ ප්‍රමාදයට විසඳුමක් ලබා දීම සඳහා අපි කටයුතු කරමින් සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒත් එක්කම අපි කියන්න ඕනෑ, අධිකරණ අමාත්‍යාංශය තුළ, නීති ප්‍රතිසංස්කරණ කටයුතු කිරීම වෙනුවෙන් පූර්ණ කාලීනව අපට උදවු කිරීම සඳහා වෙනම කමිටු තුනක් අප මේ වන කොට පත් කර තිබෙන බව. එකක්, අපරාධ නීතිය විමර්ශනය කිරීම සඳහා. දෙවැන්න, වාණිජ නීතිය review කිරීම සඳහා. තුන්වැන්න, සිවිල් නීතිය සම්පූර්ණයෙන් නැවත පරිශීලනය කිරීම සඳහා. ඔවුන් විසින් හඳුනා ගන්නා ලද විවිධ ක්ෂේත්‍රවල specialist sectors මේ වන කොට හඳුනාගෙන තිබෙනවා. අපි විශේෂඥ කමිටු 25ක් පමණ තෝරාගෙන තිබෙනවා. ඔවුන් විවිධ නීති පිළිබඳ අධ්‍යයනය කරමින්, ඔවුන්ගේ වාර්තා අපට ලබාදීලා තිබෙනවා. මා උදාහරණ කීපයක් කියන්නම්. කුඩා හිමිකම් අධිකරණය කියන එක සම්බන්ධයෙන් වන සම්පූර්ණ වාර්තාව මට ලැබී තිබෙනවා. මුස්ලිම් නීතිය සංශෝධනය කිරීමේ කටයුත්ත පැවරූ කමිටුවේ සම්පූර්ණ වාර්තාව මට ලැබී තිබෙනවා. ඒත් එක්කම, සාමාන්‍ය විවාහ හා දික්කසාද නීතිය සංශෝධනය කිරීම සඳහා වන වාර්තා අපට ලැබී තිබෙනවා. ඒ වාගේ කමිටු 25ක, 28ක ප්‍රමාණයක් පූර්ණ කාලීනව වැඩ කරගෙන යනවා. ඒවායේ සිටින සියලුදෙනා වාගේ වැඩ කරන්නේ ස්වේච්ඡාවෙන්. මේ රටේ කීර්තිමත් නීතිඥයන් හා නීති විශාරදයන් 250කට අධික පිරිසක් අපිත් එක්ක පූර්ණ කාලීනව සම්බන්ධ වෙලා, විවිධ කමිටුවල වාඩි වෙලා, විශාල කාලයක් වැය කරලා අදාළ කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කරලා අපට උපදෙස් ලබාදීම සිදු කරනවා. ඔවුන්ගේ කමිටු වාර්තා දැන් ලැබෙමින් තිබෙනවා.

ඒවායේ ප්‍රතිඵල ඊළඟ මාස හය වෙනකොට ලැබෙයි කියා මම විශ්වාස කරනවා. නීති විශාල ප්‍රමාණයක් ප්‍රතිසංස්කරණය කරලා, මේ රටේ යල් පැන ගිය නීති සියල්ල වෙනස් කිරීමට අපි නොපැකිළව කටයුතු කරනවා. උදාහරණයක් හැටියට ලංකාවේ බදුදීමට අදාළ නීතිය, ඉඩම් නීතිය, බෙදුම් - partition - නීතිය, විවාහ නීතිය, සිවිල් නඩු විධාන සංග්‍රහ පිළිබඳ නීතිය සහ අපරාධ නඩු විධාන සංග්‍රහය පිළිබඳ නීතිය ඉදිරියේදී එකින් එක වෙනස් වෙයි කියා අපි බලාපොරොත්තු වෙනවා. ඒ හැරුණාම, අධිකරණයේ ප්‍රමාණය වැඩි කිරීමටත් අපි බලාපොරොත්තු වෙනවා. ඒ පිළිබඳව අපි අධිකරණ සේවා කොමිෂන් සභාවට වාර්තාවක් ලබා දීලා තිබෙනවා. ඊළඟ මාස නවය ඇතුළත අවම වශයෙන් අලුතින් උසාවි 50ක් ආරම්භ කරලා, තවත් judgesලා 76දෙනෙකු වැඩි කරන්න බලාපොරොත්තු වෙනවා. මම මීට පෙරත් පාර්ලිමේන්තුවේ කියා තිබෙන ආකාරයට ඕනෑම විනිශ්චයකාරතුමෙකුට දරා ගන්න පුළුවන් ධාරිතාවක් තිබෙනවා. ඊට වඩා වැඩි නඩු ප්‍රමාණයකට ගියොත් ඔහු කඩා වැටෙනවා. අපේ මුළු රටේම තිබෙන නඩු ටික අහන්න විනිශ්චයකාරවරුන් 340 දෙනෙක් පමණයි සිටින්නේ. ජනගහනයෙන් මිලියනයක් ගත්තොත්, විනිශ්චයකාරවරුන් 15දෙනායි සිටින්නේ. නමුත් මේ පිළිබඳව ජාත්‍යන්තරව පිළිගත් නිර්ණායක තිබෙනවා. තායිලන්තය ගත්තොත්, ජනගහනය මිලියනයකට විනිශ්චයකාරවරුන් 60 දෙනෙක් ඉන්නවා. ඉන්දියාව වාගේ අතිවිශාල රටක් ගත්තොත්, ඔවුන්ට මිලියනයකට විනිශ්චයකාරවරුන් 22ක්ඉන්නවා. ඔවුන්ගේ නීතියත් අපගේ හා සමානයි. යල් පැන ගිය, ඉතාම කල් යන නීති පද්ධතියක් තමයි ඔවුන්ටත් තිබෙන්නේ. ජර්මනිය වාගේ දියුණු රටවල් ගත්තොත්, ජනගහනයෙන් මිලියනයකට විනිශ්චයකාරවරුන් 100ක්, 150ක් විතර ඉන්නවා. ඒ අනුව බලනකොට අපි සිටින්නේ ඉතාම පහළ මට්ටමක. ඒ නිසා විනිශ්චයකාරවරුන්ගේ ධාරිතාව හා අධිකරණ පද්ධතියේ ධාරිතාව පුළුවන් තරම් වැඩි කරන්න අපි බලාපොරොත්තු වනවා. අපේ කාලය තුළ ඒ ප්‍රමාණය දැන් ඉන්නවා වාගේ දෙගුණයක් කරන්න මම බලාපොරොත්තු වනවා. එහි ප්‍රථම අදියර හැටියට තමයි අපි ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරු සංඛ්‍යාව වැඩි කළේ. ඉන්පසු අභියාචනාධිකරණයේත් වැඩි කළා. දැන් අපි අධිකරණ සේවා කොමිෂන් සභාවට වාර්තාව ලබා දීලා තිබෙනවා. ඒ අනුව අවශ්‍ය recruitments කිරීම සඳහා අපි ඉල්ලා තිබෙනවා. අපි හිතනවා, ඒක කර ගන්න පුළුවන් වෙයි කියලා. මක් නිසාද යත්, බොහෝ අවස්ථාවලදී අපි රටක යටිතල පහසුකම් කියලා දකින්නේ පාරවල් හැදෙන ඒවා වාගේ කාරණා විතරයි. පාරවල් හැදෙන්න ඕනෑ; ගෙවල් හැදෙන්න ඕනෑ; ගොඩනැඟිලි හැදෙන්න ඕනෑ; වරායන් හැදෙන්න ඕනෑ. ඒවා ඉතා හොඳයි. ඒක හරියට computer එකක hardware එක වාගෙයි. නමුත් නීතියත් යාවත්කාලීන කිරීම ඉතාම වැදගත්. ඒක හරියට software එකක් වාගෙයි. නීතිය නැතුව කිසිම රටකට ඉස්සරහට යන්න බැහැ. ඒ නිසා තමයි අපි මේ උත්සාහ කරන්නේ. නීතිය යාවත්කාලීන කිරීම කියන්නේ එක නඩුවක් හෝ නඩු දෙකක් පිළිබඳව නඩු තීන්දු දෙන එක නොවෙයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
මම කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒකෙන් අදහස් කරන්නේ ඕනෑම පුද්ගලයෙකු සම්බන්ධයෙන් තරාතිරම නොබලා ඉක්මනින් ඔහුගේ නඩුව විසඳා ගැනීමේ ක්‍රමවේදයක් සකස් කර දීමයි. එය ඉතා වැදගත්. ලෝකයේ "Doing Business Index" කියලා එකක් තිබෙනවා. අපි තවම ඉන්නේ එහි 99වන ස්ථානයේ. ඒ කියන්නේ, කවුරුහරි අපිත් එක්ක business කරන්නට එනවා නම්, තවත් රටවල් 98ක් පසු කරලා තමයි අප ළඟට එන්න ඕනෑ. ඒකට බලපාන විශාල කාර්යයක් තමයි අධිකරණ ක්‍රියාපටිපාටිය. එය වෙනස් කිරීම සහ නඩු සඳහා ගතවන කාලය වෙනස් කිරීමට අපි උත්සාහ කරමින් සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ හැරුණාම ලෝකයේ තවත් එක yardstick එකක් තිබෙනවා, time required to enforce a contract කියලා. ඒ කියන්නේ ගිවිසුමක් මත නඩුවක් තිබෙනවා නම්, ඒක විසඳන්න කොච්චර කල් යනවාද කියන කාරණය. ඒ කාරණයේදී රටවල් 189කින් අපේ රට 165වන ස්ථානයේ සිටින්නේ. අපි ඒකෙනුත් ඉදිරියට යන්න ඕනෑ. ඒ සියල්ලෙන්ම ඉදිරියට යන්න නම් අපි කියපු විධියට ඉලක්කගත සංවර්ධනයකට අපි යන්නට ඕනෑ. ඒකෙන් කිසිසේත්ම අදහස් කරන්නේ නැහැ, අපි අධිකරණයේ ස්වාධීනත්වයට හා ඔවුන්ගේ ක්‍රියාපටිපාටියට මැදිහත් වෙන්න බලාපොරොත්තු වෙනවා කියලා. ඊට ඔබ්බට ගිය accountability එකක් තිබෙන්න ඕනෑ, performance සම්බන්ධයෙන්.

නඩු කීයක් අහනවාද, නඩු කටයුතු සිදු වී තිබෙන්නේ කොහොමද, නඩු කල් යන්නේ ඇයි, අහපු නඩුවල තීන්දු දෙන්න කල් යන්නේ ඇයි කියන කාරණා පිළිබඳ යම් accountability එකකට යා යුතු තැනකට අපි ඇවිල්ලා ඉන්නවා. ඒ සඳහා සුදුසු fully-fledged solution එකක් ලබා දෙන්නට අපි කටයුතු කරගෙන යනවා. ඒ තමයි නීති වෙනස් කරලා අලුත් නීති හඳුන්වා දීම, procedural laws වෙනස් කිරීම, තාක්ෂණය උපයෝගි කර ගැනීම, උසාවි ධාරිතාව වැඩි කිරීම, යටිතල පහසුකම් ලබා දීම සහ ඊට අනුබද්ධ ආයතන හඳුනා ගෙන ඒවා ශක්තිමත් කිරීම අපි කරගෙන යනවා. ඒ ආයතන තමයි රස පරීක්ෂක කාර්යාලය, නීතිපතිතුමාගේ කාර්යාලය, නීති සම්පාදකවරයාගේ කාර්යාලය. ඒ වාගේ ආයතන රාශියක් තිබෙනවා. ඒ සියලු ආයතන ශක්තිමත් කිරීම සඳහාත්, ඔවුන්ගේ ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහාත් අපි කටයුතු කරගෙන යනවා. ඒ ක්‍රමවේදයට අනුව ඉතාම ශක්තිමත්, නිර්භීත, ස්වාධීන සහ කාර්යක්ෂම අධිකරණ පද්ධතියක් මේ රටට දායාද කරන්න අපි බලාපොරොත්තු වනවා. එහෙම වුණොත්, එය අපේ රජය ලබා ගත් සුවිශේෂ ජයග්‍රහණයක් බවට පත් වෙයි කියලා මම හිතනවා.

බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
ගරු කථානායකතුමනි, මට පොඩි අවස්ථාවක් දෙන්න.

අද සාකච්ඡා කරනු ලබන පනත් කෙටුම්පත් පිළිබඳ අධිකරණ ඇමතිතුමා දීර්ඝ විග්‍රහයක් කළා. මට සුළු කාරණාවක් පිළිබඳ අලුත් ප්‍රහේළිකාවක් මතු වෙලා තිබෙනවා. අපි ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරතුමන්ලාට කවදත් ගරු කරනවා. එතුමන්ලා නඩුවකින් බැහැරවීම පිළිබඳව හේතු තිබෙන්නට පුළුවන්. නමුත්, දැන් විනිශ්චයකාරවරුන් හතර දෙනෙක් පෝළිමට යම් නඩුවකින් බැහැර වෙලා තිබෙනවා. මේ පිළිබඳව යම් නිශ්චිත ක්‍රමවේදයක් අවශ්‍යයි. අඩුම වශයෙන් මේ ගැන අපේ ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාරතුමා හෝ දැනුවත් විය යුතුයි.

Before he nominates a Bench, at least he must mention it and then see to it that this sort of thing does not happen in a habitual fashion. Now, four Judges of the Supreme Court have recused themselves from the case relating to the Hon. Rishad Bathiudeen. The Hon. Bathiudeen has been under detention for 73 days. His FR case has been postponed on several occasions on this basis alone. So, it is a serious injustice to him. Therefore, the Hon. Chief Justice must be made aware that before nominating a Bench, at least he must find out whether there is any reason for the said judges to recuse themselves from the case. This should not happen because it is unnecessarily creating suspicions. As you said, none of us are alleging that there was some interference, but there is an assumption arising out of it. Because of the nature of the case, since he is a senior politician, this has to be avoided. Therefore, the Chief Justice had better be advised, at least before nominating judges, to make sure that they would not recuse themselves in this fashion, one after the other continuously, finally resulting in serious injustice to the detainee.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Minister, would you like to reply?

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
Hon. Member, I also read about that only in the newspapers. I can only convey the concerns expressed by this House. Other than that, I have no power to interfere with it and give directions. But, certainly, there is a concern, I agree with you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.03]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අධිකරණ ඇමතිතුමා ඉදිරිපත් කරන සංශෝධන ගැන අපට ප්‍රශ්නයක් නැහැ. නමුත් මේවා සිල්ලර සංශෝධන. මට පෙනෙන විධියට මේවා ඇස්බැන්දුම්. මොකද, අධිකරණයට කරන්න තිබෙන හානිය ආණ්ඩුව කරලා අවසානයි. මේ ආණ්ඩුව බලයට ඇවිල්ලා මාස කිහිපයක් යනකොට විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරලා, අධිකරණය පමණක් නොවෙයි, මේ රටේ තිබෙන සියලු ආයතනවල බලය විධායක ජනාධිපතිවරයාගේ අතට ගත්තා. දැන් ඔබතුමන්ලා අධිකරණයේ ස්වාධීනත්වය ගැන කථා කරන්නේ කොහොමද? Hon. Minister, I want you to pay attention.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ආපසු මුල ඉඳලා කථා කරන්න පටන් ගන්නම්. මට වෙලාව දෙන්න. ගරු අධිකරණ ඇමතිතුමා ඉදිරිපත් කරන සංශෝධන ගැන අපිට ප්‍රශ්නයක් නැහැ. නමුත් මේවා සිල්ලර සංශෝධන. රටේ ජනතාව වාගේම ජාත්‍යන්තරය බලාපොරොත්තු වන්නේත් මේ වාගේ දේවල් නොවෙයි. අලුතින් ඉදිකරන්න යන ගොඩනැඟිලි ගැන ගරු ඇමතිතුමා කිව්වා. ඊළඟට, අධිකරණයේ ස්වාධීනත්වය ගැන කිව්වා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ අපි විධායක බලතල විමධ්‍යගත කළා. අපි අධිකරණය ස්වාධීන කළා; රාජ්‍ය ආයතන ස්වාධීන කළා; ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් ඇති කළා. නමුත් ඔබතුමන්ලා විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා, ඒ ස්වාධීනත්වය නැති කරලා, බලය එක පුද්ගලයෙකුගේ අතට අරගත්තා. දැන් අධිකරණයේ ගුණාත්මකභාවය, ප්‍රජාතන්ත්‍රවාදයේ නිදහස ගැන ඔබතුමා කථා කරන්නේ කොහොමද, ගරු ඇමතිතුමනි? විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නිසා අපි දේශීය වශයෙන් පමණක් නොව ජාත්‍යන්තර වශයෙන් ද විශාල අපකීර්තියකට පත් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කාරණය ගැනත් කියන්න ඕනෑ. මොකද, ගරු අලි සබ්රි ඇමතිතුමා මේක දන්නේ නැහැ. මේ "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව" කියන සංකල්පය ඉස්සෙල්ලාම ගෙනාවේ ගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියයි. එතුමිය තමයි දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් ඇති කරලා, මේ ආයතන ස්වාධීන කරන්න කටයුතු කළේ. ඊට පස්සේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවත් ඒවා පිළිගත්තා. මහින්ද රාජපක්ෂ මැතිතුමා ඒවා ආපස්සට හැරෙව්වා. යහ පාලන ආණ්ඩුව දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් නැවතත් එය ගෙනාවා. මේ ආණ්ඩුව නැවත වරක් එය ඉවත් කළා. මේ ආණ්ඩුව බලයට පත් වෙලා අවුරුදු එකහමාරක් ගත වනකොට ජාත්‍යන්තර සංවිධාන දෙකක් අපට විරුද්ධව යෝජනා සම්මත කළා. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලය අපේ රටට විරුද්ධව යෝජනාවක් ඉදිරිපත් කළා. ඒ යෝජනාව සම්මත වුණා. දැන් ඇමෙරිකානු කොංග්‍රස් මණ්ඩලයට යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ යෝජනාව මොකක්ද කියලා ඔබතුමා දන්නවාද? පාර්ලිමේන්තුවේ සිටින කිසි කෙනෙක් දන්නේ නැහැ, ඒ යෝජනාව මොකක්ද කියලා. උතුරු - නැගෙනහිර පළාත් ද්‍රවිඩ ජනතාවගේ නිජභූමිය හැටියට පිළිගන්න ඕනෑ කියලා ඇමෙරිකානු කොංග්‍රස් මණ්ඩලයට යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඊශ්‍රායලය කියන රටත් බිහි වුණේ මෙහෙමයි. ලෝකයේ සුපිරි බලවතෙකු වන Lord Balfour එක්දහස් නවසිය තිස් ගණන්වල ලියුමක් ලිව්වා, 'යුදෙව්වන්ට රටක් තිබෙන්න ඕනෑ' කියලා. ඒ ප්‍රකාශය නිකුත් කරලා අවුරුදු 30ක් ගත වනකොට ඊශ්‍රායලය කියන රට බිහි වුණා. ඒ නිසා මෙය සෙල්ලමකට ගන්න එපා. මේ, ආරම්භය විතරයි.

අද අපේ රට විශාල ආර්ථික අර්බුදයකට මුහුණ පා තිබෙනවා. ගරු අධිකරණ ඇමතිතුමා සංශෝධන ගණනාවක් ගැන කිව්වා. හැබැයි, එතුමාගෙන් මම අහනවා, යුරෝපා සංගමය ඉල්ලන සංශෝධන අද අපි ගෙනාවාද කියලා. යුරෝපා සංගමය අපෙන් සංශෝධන කිහිපයක් බලාපොරොත්තු වෙනවා. මොනවාද, ඒ සංශෝධන? ඒවා රටේ සාමාන්‍ය ජනතාවට බලපාන සංශෝධන. පළමුවන එක තමයි, රැඳවුම් නියෝග - DO - Detention Orders. අද මාස 18ක් ඕනෑම කෙනෙකු රඳවා ගෙන ඉන්න පුළුවන්, මහෙස්ත්‍රාත්වරයෙකුට ඉදිරිපත් කරන්නේ නැතිව. යුරෝපා සංගමය කියන්නේ, මේ කාලය මාසයකට අඩු කරන්න කියායි. ඒ කටයුත්ත ඔබතුමා කරනවාද, ගරු අධිකරණ ඇමතිතුමනි? කෙනෙකු අත් අඩංගුවට ගත්තාම පැය 48කින් අධිකරණයට ඉදිරිපත් කරන්න ඕනෑ. අද ඒ සංශෝධන ගෙනෙනවාද? ඊළඟට, පාපොච්චාරණ - confession. පොලීසියට ඉදිරිපත් කරන පාපොච්චාරණ පිළිගන්න එපා, අධිකරණයක් ඉදිරියේ මහෙස්ත්‍රාත්වරයකුට ඉදිරිපත් කරන පාපොච්චාරණ පිළිගන්න ඕනෑ කියන මේ සංශෝධන ඉදිරිපත් කරන්නේ නැත්තේ ඇයි? මේවා තමයි ජාත්‍යන්තර ප්‍රජාව බලාපොරොත්තුවෙන් ඉන්නේ.

පසුගිය දවසක ගරු අජිත් නිවාඩ් කබ්රාල් රාජ්‍ය ඇමතිතුමා කියනවා මට ඇහුණා, යුරෝපා සංගමය ඉල්ලන සංශෝධන අපගේ ස්වෛරීභාවයට බලපානවා කියලා. ඔවුන් ඉල්ලන දේවල් අපේ රටේ ස්වෛරීභාවයට බලපානවාද? මේවා තමයි මේ රටේ හැම පුද්ගලයෙක්ම ඉල්ලන දේ. DO ගහලා කෙනෙක් මාස 18ක් තිස්සේ තියාගෙන ඉන්නවා. බලන්න, DO ගහලා ශානි අබේසේකර මාස 9ක් තියාගෙන හිටියා. අන්තිමට ඇපැල් අධිකරණය මොකක්ද කිව්වේ? "මෙය අසත්‍ය නඩුවක්, ගොතපු නඩුවක්, පළි ගන්න දමපු නඩුවක්" කියලා තමයි ඇපැල් අධිකරණය කිව්වේ. තමුන්නාන්සේලා කථා කරන මේ ගුණාත්මකභාවය මොකක්ද? අපිට ගොඩනැඟිලිවලින් වැඩක් නැහැ. මේ රටේ ජනතාව ඉල්ලන්නේ අධිකරණයේ ගුණාත්මකභාවය; quality එක. අන්න ඒක තමයි වැදගත්. ඒකයි ජාත්‍යන්තරයත් කියන්නේ.

දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ, අපි ශ්‍රේෂ්ඨාධිකරණය ස්වාධීන කළා. ඒ ගැන අපි ආඩම්බර වෙනවා. විධායක ජනාධිපතිතුමාට ඒක පාගා ගෙන ඉන්න බැරි වුණා. එම නිසා තමයි එදා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මේ පාර්ලිමේන්තුව විසුරුවා හැරියාට පස්සේ අපි අධිකරණයට ගියේ. ඒ අවස්ථාවේදී අධිකරණය තීන්දු කළා, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පාර්ලිමේන්තුව විසුරුවා හැරීම වැරැදියි කියලා. මොකද, එදා අධිකරණයට ස්වාධීනත්වය තිබුණා. විධායක ජනාධිපතිතුමා ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයෙක් හැටියට එවන නමක්, "මේ නම අපි පිළිගන්නේ නැහැ, වෙන නමක් එවන්න" කියලා ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට තිබුණා. අද ඒ අයිතිය තිබෙනවාද? අද විධායක ජනාධිපතිතුමා එවන හැම නමක්ම පාර්ලිමේන්තු සභාව පිළිගන්න ඕනෑ. අපි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ විධායක ජනාධිපතිතුමාගේ බලතල විමධ්‍යගත කළා. නමුත්, අද නැවත වරක් විධායක ජනාධිපතිතුමාගේ බලතල එක තැනකට අරගෙන තිබෙනවා. අධිකරණ ඇමතිතුමාගෙන් මම අහනවා, ඔබතුමා කියන මේ ස්වාධීනත්වය මොකක්ද කියලා. මට නම් කිසිම දෙයක් තේරෙන්නේ නැහැ. යුරෝපා සංගමය මොකක්ද ඉල්ලන්නේ? මම කලින් කියපු කාරණා තුන විතරයි යුරෝපා සංගමය ඉල්ලන්නේ. රඳවා ගැනීම -DO එක- මාසයයි, පැය 48න් මහෙස්ත්‍රාත්වරයෙකුට ඉදිරිපත් කරන්න, පොලිසියට දෙන පාපොච්චාරණ පිළිගන්න එපා, අධිකරණ විනිශ්චයකාරවරයකු ඉදිරියේ කරන පාපොච්චාරණ තමයි පිළිගන්න ඕනෑ කියන කාරණා රටේ ස්වෛරීභාවයට බලපාන දේවල්ද? යුරෝපා සංගමයෙන් අන්ත පරාජයක් තමයි අපිට අත් වෙන්නේ.

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා ]

අපි GSP සහනය ලබා ගන්න ඕනෑ. මේවා ලංකාවේ කියලා වැඩක් නැහැ. අද ජාත්‍යන්තර වශයෙන් අපි කුණු බක්කියට වැටිලායි ඉන්නේ. සැප්තැම්බර් මාසයේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලය ඉදිරියට ගිහිල්ලා මොකක්ද දෙන උත්තරය කියා මම අධිකරණ ඇමතිතුමාගෙන් අහනවා. ගොඩනැඟිලි හදන කථාව නොවෙයි එතැන තිබෙන්නේ. ඔබතුමාගෙන් මම ඒකට උත්තරයක් බලාපොරොත්තු වෙනවා. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලය ඉදිරියට ගිහිල්ලා අපි මොකක්ද කියන්නේ? යුරෝපා සංගමයට ගිහිල්ලා මොකක්ද කියන්නේ? අන්න ඒවාට තමයි ජනතාව, ව්‍යාපාරිකයන් උත්තර බලාපොරොත්තු වන්නේ.

ගරු ඇමතිතුමනි, අද ගෙන එන මේ සංශෝධනවලට අපි විරුද්ධ නැහැ. අපේ ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා Committee Stage එකේදී සංශෝධනයක් ගෙනෙනවා. ඔබතුමන්ලාගෙන් මේ වාගේ සිල්ලර සංශෝධන නොවෙයි, ජනතාව බලාපොරොත්තු වෙන්නේ. අද යුක්තියේ ගුණාත්මකභාවය - quality of justice - තිබෙනවාද? අපේ ගරු රවුෆ් හකීම් මැතිතුමා එක්තරා නඩුවක් ගැන කිව්වා. ඒ නඩුවෙන් හතර වතාවක් නඩුකාරවරු අයින් වුණා. මේක සාධාරණද? එම නිසා අපි ඇමතිතුමාගෙන් බලාපොරොත්තු වෙනවා නීතිඥයෙකු -ඔබතුමා හොඳ නීතිඥයෙක්.- හැටියට මීට වඩා ක්‍රියාශීලී දායකත්වයක් දක්වන්න ඕනෑ කියලා. අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කරන්න. [බාධා කිරීමක්] ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා උත්තරයක් හදනවාද GSP සහනය ලබාගන්න? ව්‍යාපාරිකයන් අපට ඇවිල්ලා කියනවා 'රජය නිදි' කියලා. GSP සහනය නැති කරනවා කියලා යුරෝපා සංගමය පැහැදිලිව කියා තිබෙද්දී ඒකට රජයේ ප්‍රතිචාරය මොකක්ද ගරු ඇමතිතුමනි?

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමනි, ඔබතුමා මෙහි සිටියා නම් ඔබතුමා දකින්නට ඇති අපේ ගරු විදේශ ඇමතිතුමාගේ නායකත්වයෙන් යුරෝපා සංගමය සමඟ සාකච්ඡා කරලා ඔවුන්ගේ චෝදනාවලට වෙන වෙනම අපි විසඳුම් සහ පිළිතුරු ලබා දීලා තිබෙන බව. හැබැයි, ඒක කරනකොට ඔබතුමා කියූ ආකාරයට අපට ස්වෛරීත්වයට සහ ජාතික ආරක්ෂාවට තර්ජනය වන, බාධා වන දේවල් කරන්න බැහැ. නමුත්, කළ හැකි හා කළ යුතු දේවල් අපි කරන්නට ඕනෑ. ඔබතුමා දන්නවා, අපි යුරෝපා සංගමයට ඒ සම්බන්ධයෙන් පිළිතුරු ලබා දී තිබෙන බව. අපි ඔවුන් සමඟ engagement එකක් ඇති කරගෙන යනවා. ඒ හැරුණාම ඔබතුමා දන්නවා, මේ වෙනකොටත් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත - PTA එක - පිළිබඳව යළි අධ්‍යයනය කරලා අලුතින් තාක්ෂණික වශයෙන්, මූල්‍යමය වශයෙන් Bitcoin හරහා සිදුකරන යම් යම් දේවල්වලට එතැන පරාසය නැහැ. ඒ නිසා ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් තිබෙන කරුණු ශක්තිමත් කරන ආකාරයටම සහ ඔබතුමා කියපු ආකාරයට මානව හිමිකම් සම්බන්ධයෙන් යම් යම් අඩුපාඩුකම් තිබෙනවා නම්, ඒවාත් හඳුනාගෙන විසඳුම් ලබා දීම සඳහා අපේ රජයේ කැබිනට් මණ්ඩලය විසින් වෙනම කමිටුවකුත් පත් කරලා තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු ඇමතිතුමනි, මම දැන් කාරණා තුනක් කිව්වා නේ. එකක් තමයි, රැඳවුම් නියෝගය මාසයක් පමණයි පුළුවන් කියන එක. ඒ වාගේම කෙනෙකු අත්අඩංගුවට ගත්තාම පැය 48න් මහේස්ත්‍රාත්වරයෙකුට ඉදිරිපත් කරන්න ඕනෑය කියන කාරණය. ඒ වාගේම පාපොච්චාරණ. පොලීසියට දෙන පාපොච්චාරණ පිළිගන්න බැහැ, අධිකරණයට දෙන පාපොච්චාරණ වාගේ. ඒ කාරණා තුන ඔබතුමා පිළිගන්නවාද?

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් පසු ගිය ආණ්ඩුවේ සිටියා නේ. ඔබතුමන්ලාගේ ආණ්ඩුව අවුරුදු පහක් තිබුණා. මේවා කර ගන්න තිබුණා නේ. මේක ආප්ප දානවා වාගේ කරන්න බැහැනේ. ඒ සඳහා කාලයක් ගතවෙනවා. ඔබතුමා බලන්න, අපි මේ ගැන වෙනම අනුකමිටුවක් පත්කරලා තිබෙනවා. ඒ කමිටුව තමන්ගේ නිර්දේශ ඉදිරිපත් කරන්න ඕනෑ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඒක තමයි මම කියන්නේ. ඔබතුමා උගුරට හොරා බෙහෙත් කනවා. ගුණාත්මකභාවය ගැනයි, ගොඩනැඟිලි ගැනයි කථා කරනවා. මේ සරල ප්‍රශ්න තුනට උත්තර දෙන්න බැහැ නේ. මේවා ස්වෛරීභාවය පාවා දෙන ඒවාද?

එතකොට, ඔබතුමා කිව්වා අපේ කාලය ගැන. අපේ කාලයේ අපි GSP ගත්තා. මහින්ද රාජපක්ෂ කාලයේ GSP එක නැති කර ගත්තා. ඇයි අපට GSP සහනය දුන්නේ? යහ පාලන ආණ්ඩුවේ අරමුණු ගැන, intentions ගැන ජාත්‍යන්තරයට කිසිම ප්‍රශ්නයක් තිබුණේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Hon. Presiding Member, I am taking two more minutes.

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා කියනවා, එතුමන්ලාගේ කාලයේ ජාත්‍යන්තරයට ප්‍රශ්නයක් තිබුණේ නැති ලු; GSP ගත්තා ලු. නමුත් ගරු මන්ත්‍රීතුමනි, ජාතික ආරක්ෂාව අනතුරේ වැටුණු බව අමතක කරන්න එපා. මේ දෙකේ සමතුලිතතාවක් තිබෙන්න ඕනෑ. නැත්නම් මහ විශාල ප්‍රශ්නයක් මතු වෙන්න ඉඩ තිබෙනවා. අපට ඕනෑ, දීර්ඝ කාලීනව රට ඉදිරියට යන්නයි. ඒ නිසා අපට ජාතික ආරක්ෂාව පාවා දීලා පිට රට සනසන්න බැහැ. ජාතික ආරක්ෂාව ආරක්ෂා කරගන්නා අතරතුරදී, අපේ ආර්ථිකය රැකගන්නා අතරතුරදී අපි මිනිසුන්ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කරගන්නත් පනත් කෙටුම්පතක් ගෙනෙන්නම්.

**ගරු නිමල් ලාන්සා මහතා (ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிமல் லான்சா - கிராமிய வீதிகள் மற்றும் ஏனைய உட்கட்டமைப்பு வசதிகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Nimal Lanza - State Minister of Rural Roads and Other Infrastructure)

Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම අපේ ගරු ඇමතිතුමා කිව්වේ, "ජාතික ආරක්ෂාවත් තහවුරු කරගෙන තමයි අනෙක් කටයුතු ටික සම්බන්ධීකරණය කරන්න ඕනෑ" කියලායි.

ලක්ෂ්මන් කිරිඇල්ල හිටපු ඇමතිතුමා යුද්ධය පැවැති කාලයේ ඕනෑම ගොනෙකුට යුද්ධ කරන්න පුළුවන් කියලාත් කියපු එක්කෙනෙක් නේ. අපි ඒ ගැන දන්නවා නේ. අපි යුද්ධය ජයග්‍රහණය කළේ මේ වාගේ විවිධ බාධක එද්දී එම බාධකවලට උත්තර දී ගෙන ගිය නිසායි. ඒ නිසා අධිකරණ ඇමතිතුමා ඉතාම පැහැදිලිව කිව්වා මේ රටේ අංක එක ජාතික ආරක්ෂාව කියලා.

දෙවනුව, අපි ලෝකයේ සියලු රටවල් එක්ක, සියලු ජාතීන් එක්ක වැඩ කරන්න කැමැති පක්ෂයක්. ඒ නිසා අපි ඒ පිළිබඳව අපේ ස්ථාවරය ඉතාම පැහැදිලිව ගරු කිරිඇල්ල මන්ත්‍රීතුමාට මතක් කරනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රජය බලයට පත් වෙනකොට - 2015දී - GSP සහනය අහෝසි කරලා තිබුණේ. නමුත් අපි එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලය එක්ක, යුරෝපා සංගමය එක්ක සාකච්ඡා කරලා අපේ අරමුණ ගැන දැනුවත් කළා. The International Community was very clear about our intentions. ඒ කියන්නේ අපේ අරමුණ ගැන, පවිත්‍රතාව ගැන පිළිගැනීමක් තිබුණ බවයි. ඒක තමයි ඇත්ත. ඒකයි අපි - [බාධා කිරීමක්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

දැන් නවත්වන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මොකද, අහගෙන ඉන්න බැරිද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Hon. Member, you have exceeded your time. So, please wind up.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මම අපේ පැත්තෙන් වේලාව ගන්නවා. ඔබතුමාට තිබෙන හදිසිය මොකක්ද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමා කාගෙන්ද, වේලාව ගන්නේ?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මමයි, විපක්ෂයේ සංවිධායක. වෙලාව අනෙක් අයගෙන් ක්‍රමානුකූලව අඩු කරන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

හොඳයි.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Sir, I rise to a point of Order.

Sir, whatever time the Hon. Lakshman Kiriella takes must be from the SJB Members of Parliament, not from the other parties in the Opposition.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

හොඳයි. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මේ අවස්ථාවේදී මම කියනවා, අපේ රටේ ආර්ථිකය බේරා ගන්න කියලා, වෙනසක්ම කරන්නේ නැතුව, සංශෝධන ගෙනෙන්නේ නැතුව. මේවා ගෙනෙන ඒවා සිල්ලර; මේවා ඇස් බැන්දුම්. මේ වාගේ සංශෝධන පාර්ලිමේන්තුවට ගෙනෙන්න එපාය කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරනවා. ස්තූතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි දහතුනක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.19]

**ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පත් සමූහයක් ඉදිරිපත් කර තිබෙනවා. මනුෂ්‍ය ඉතිහාසය තුළ වනචාරි යුගයේ ඉඳලා අද සිටින තත්ත්වයට පත් වෙනකොට ඒ දක්වා ගත වුණු කාල රාමුව තුළ මිනිසුන් ජයග්‍රහණ ලබා ගනිමින් එක් එක් සන්ධිස්ථාන පසු කරගෙන ආපු යුගයක් තිබෙනවා. එවැනි එක් ස්ථානයක් තමයි මේ.

විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂයට -අද "සමගි ජනබල වේගය" කියලා බෝඩ් එක මාරු කරගෙන ඉන්නා එකම පිරිසට- මේවා මතක් කරනකොට රිදෙනවා. ටයර් සෑ යුගයක් පසු කරගෙන ඇවිත් ජයග්‍රහණ ලබා ගැනීමට මිනිසුන් ලෙයින්, කඳුළින් තමන්ගේ ජීවිත පරිත්‍යාග කළා. විශේෂයෙන්ම මිනිසුන්ගේ මානුෂීය අයිතිවාසිකම් ගැන කථා කරනකොට, අපරාධ නඩු විධාන සංග්‍රහය පනත් කෙටුම්පත සංශෝධනය වෙනකොට, මෙය හැදුවේ කවුද කියලා අපි සොයා බලන්න ඕනෑ. මේක හැදුවේ සුද්දෝ. සුද්දන්ගේ අවශ්‍යතාව වුණේ යටත් වැසියන් මර්දනය කරලා තමන්ගේ අවශ්‍යතා සපුරා ගන්නයි. ඒ තුළින් මිනිසුන්ට -අපේ රටේ වැසියන්ට- නොයෙක් ආකාරයේ තාඩන පීඩන සිදු වුණා; අපට ගැළපෙන්නේ නැති දණ්ඩන නීති එහි තිබුණා. අපි ඒවා වෙනස් කරමින් තමයි මේ යන්නේ.

දෙවන ලෝක යුද්ධයෙන් පසුව තමයි මානව හිමිකම්, මූලික අයිතිවාසිකම් ගැන වැඩිපුර කථා කරන්නේ. ඊට පසුව අපේ රටේ දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අපි මුලින්ම මූලික අයිතිවාසිකම් හඳුන්වා දෙනවා. ඊට පසුව දෙවන ජනරජ

[ගරු ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා]

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් මේ සඳහා තවත් පිළියම් යොදනවා. යම් අයෙකුගේ මූලික අයිතිවාසිකම් කඩ වෙනවා නම් ඒ අයට අවශ්‍ය සහන ලබා ගන්න පුළුවන් ක්‍රමවේදයක් හදනවා. අපි සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියට අත්සන් කර තිබෙනවා. එය ප්‍රකාරව, ඒ කාරණා රටට ගේන්න තමයි 1994දී වධදීමට සහ අනිකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැළකීමට හෝ දඬුවම්වලට එරෙහිව වූ පනත මේ රටේ නීතියට හඳුන්වා දෙන්නේ. මේක විශේෂ කාරණයක්. ඒ මොකද? රැඳවුම් භාරයේ ඉන්න වින්දිතයා, තැනැත්තා සම්බන්ධයෙන් යම් අමානුෂික සැලකිල්ලක් වෙනවා නම්, ඒ අය සම්බන්ධයෙන් අමානුෂික විධියට කටයුතු කරනවා නම්, ඒ අයට විරුද්ධව තාඩන පීඩන එල්ල කරන බලවත් පුද්ගලයාට විරුද්ධව කටයුතු කර ඔහු නීතිය ඉදිරියට ගේන්න පුළුවන් හැකියාව ඒ පනත තුළින් ලැබී තිබෙනවා. ඒ පනතින් නියම වෙලා තිබෙන රුපියල් 50,000 දඩය අද මේ සංශෝධන පනත් කෙටුම්පත හරහා රුපියල් 200,000 දක්වා වැඩි කරනවා. එය විය යුත්තක්.

අපි දන්නවා, මේ රටේ සැකකරුවෙක් අල්ලා ගත්තාම තියා ගන්නේ පොලීසියේ බව. පොලීසිය ඇතුළේ සිද්ධ වෙන දේවල් ගැන අප අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. විනිශ්චිත නඩු තීන්දු ගණනාවක් තුළින් අපි දැක තිබෙනවා, පොලීසිය කොහොමද මිනිසුන්ට සැලකුවේ කියලා. ඒ අයට ශාරීරික වශයෙන්, මානසික වශයෙන් පීඩන එල්ල කළේ කොහොමද කියලා අපි දන්නවා; අහලා තිබෙනවා.

පසුගිය එක්සත් ජාතික පක්ෂ පාලන සමයේ අධිකරණයට ගිය මිනිසුන්ගේ විනිශ්චිත නඩු තීන්දුවලින් හෙළි වුණා, අණ්ඩ කෝෂ යුගල ලාච්චුවට දාලා වහපු අවස්ථා පිළිබඳවත්. ඒවා හෙළි වුණේ ඒ අය ජීවත් වෙච්ච නිසායි. හැබැයි, මරා දමපු මිනිස්සු කොච්චර ඉන්නවා ද කියලා අපි දන්නේ නැහැ. ඒ නිසා මේ පනත් කෙටුම්පත හරහා ගෙනැවිත් තිබෙන යෝජනාව ඉතාම කාලෝචිත එකක් සහ එය විය යුත්තක්. එක රැයකින් සියල්ල වෙනස් වෙන්නේ නැහැ. විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු කියනවා වාගේ මේ සියල්ල එක රැයකින් වෙනස් කරන්න බැහැ. මේක යම් කාලයක් තුළ සාධනීය ලෙස සිද්ධ විය යුතු දෙයක්.

අද අපට පැහැදිලිව පේන්න තිබෙනවා, මිනිසුන් මූලික අයිතිවාසිකම් ගැන කථා කරන ආකාරය. රජයේ පාර්ශ්වයෙන් වන සිදුවීමකදී වුවත්, තමන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් කථා කරලා අධිකරණයට යන්න ඔවුන්ට පුළුවන්කම තිබෙනවා. ඒ වෙනුවෙන් ඔවුන් ශ්‍රේෂ්ඨාධිකරණයට යනවා. මෙහි තිබෙන සුවිශේෂත්වය තමයි, අධිකාරිත්වය හොබවන පොලීසිය වාගේ ආයතනවල සිද්ධ වන කාරණා සම්බන්ධයෙන් අධිකරණයට යන්න මේ පනතින් පුළුවන්කම ලැබීම. රඳවා ගත්ත පුද්ගලයන්ට යම් හානියක් වුණාම, අත් අඩංගුවට ගත්ත පුද්ගලයන්ට යම් හානියක් වුණාම, ඒ අයට මූලික අයිතිවාසිකම් යටතේ සහන ලැබෙනවා වාගේම, ඒ අදාළ අධිකාරීත්වය වෙනමම දඬුවමකට යටත් වනවා. අද මේ කරන සංශෝධන අනුව මෙහිදී රුපියල් 50,000ක දඩයක් ගෙවලා පැත්තකට වෙන්න බැහැ. ඒ දඩ මුදල අද ලක්ෂ දෙකක් දක්වා ඉහළට ගෙන යන්න කටයුතු කර තිබෙනවා. මෙය විය යුත්තක්. ඒ වාගේම කාලෝචිත දෙයක්.

අපි දන්නවා, යුරෝපා රටවල නීතිඥවරයෙක් නියෝජනය කරන්නේ නැතිව, පෙනී සිටින්නේ නැතිව යම් සැකකරුවෙකුගෙන් කට උත්තරයක්වත් ගන්න පොලීසියට බැරි බව. අපට තවම එතැනට යන්න බැරි වෙලා තිබෙනවා. සාමාන්‍යයෙන් නීතිඥවරයෙක් පොලීසියට ගියාට විමර්ශන කටයුතු කරන අවස්ථාවල ඉන්නෙත් නැහැ. හැබැයි අපි දන්නවා, යුරෝපා රටවල ඒ අයිතිය තිබෙන බව. සැකකරුවෙක් අත් අඩංගුවට ගන්නා මොහොතේම කියනවා, "I want to speak to my lawyer." කියලා. අපි තවම එතැනට ගිහිල්ලා නැහැ. අපේ රටේ මූලික අයිතිවාසිකම් එච්චර දුරට දියුණු වෙලා නැහැ. හැබැයි අද මම සතුටු වෙනවා, අඩුම තරමින් පොලීසියේ රඳවා ගෙන ඉන්න සැකකරුවන් නිරීක්ෂණය කරන්න මේ පනත හරහා හැකියාව ලැබීම පිළිබඳව. බන්ධනාගාරයට විතරක් සීමා වෙලා තිබූ මහෙස්ත්‍රාත්වරයාට තිබුණු අයිතිය අද පොලීසිය සම්බන්ධවත් ලැබී තිබීම පිළිබඳව මම සතුටු වෙනවා. ඒක විය යුත්තක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේකට තමයි අපි civilize වෙනවා කියන්නේ. මේකට තමයි අපේ මූලික අයිතිවාසිකම් දියුණු වෙනවා කියන්නේ. අපේ මූලික අයිතිවාසිකම් කඩ වෙනවා, අපි රටක් හැටියට වනචාරී වෙනවා කියලා අපට චෝදනා එල්ල කරන, ඒ සම්බන්ධයෙන් ජාත්‍යන්තරයට කථා කරන මන්ත්‍රීවරුන්ට, අපි මූලික අයිතිවාසිකම් අතින් ඉස්සරහට යනවා කියන එක පෙන්වා දෙන්න හොඳම උදාහරණ වන්නේ මේවායි.

දැන් විපක්ෂයේ මන්ත්‍රීවරු කියනවා, "අපේ කාලයේ GSP Plus ගත්තා." කියලා. එහෙම දීන වෙන්න අපට බැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ගොල්ලන් GSP Plus ගත්තේ කොහොමද දන්නවාද? අපේ රටේ රණ විරුවෝ යුද අපරාධ කළා කියලා යුරෝපා රටවල් යෝජනා ගෙන එනකොට ඒවාට සම යෝජනා ඉදිරිපත් කරලයි මේවා ගත්තේ. එහෙම දීන වන ආණ්ඩුවක් නොවෙයි මේ ආණ්ඩුව. අපේ රණ විරුවෝ යුද අපරාධ කළා කියලා විදෙස් රටවලින් කියද්දී, අපේ රට නියෝජනය කරමින් එක්සත් ජාතික පක්ෂයෙන් ගිය උදවිය කිව්වා, "ඔව්, ඒක හරි. අපිත් ඒක පිළිගන්නවා." කියලා. එවැනි දේවල් කරලා GSP Plus ගන්න අපට වුවමනාවක් නැහැ. අපි අපේ රටේ රාජ්‍ය ආරක්ෂාව, ජාතික ආරක්ෂාව, ඒකීයභාවය එහාට මෙහාට පාවා දෙන්නේ නැහැ. එවැනි දේවල් අපි කරන්නේ නැහැ. ඒ නිසා ඒ ක්‍රමයයි, අපේ ක්‍රමයයි අතර වෙනස අපේ ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහත්මයා තේරුම් ගන්න ඕනෑ. ඒ ක්‍රමයයි, අපේ ක්‍රමයයි වෙනස්. අපේ රණ විරුවෝ යුද අපරාධ කළා කියලා අපි ලෝකයා ඉදිරියට ගිහිල්ලා කියන්නේ නැහැ. ඒක අපේ ක්‍රමයක් නොවෙයි. එහෙම කරලා යුරෝපයෙන් සොච්චමක්, දෙකක් ගන්න අපට අවශ්‍යතාවක් නැහැ. අපේ අභිමානය රැකගෙන, එකතු වෙලා වැඩ කිරීම තුළ අපට ඊට වඩා දියුණුවක් ලබා ගන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සාමාජිකයන්ගේ වැටුප් හා දීමනා ප්‍රතිශෝධනය කිරීම යටතේ, ඒ අදාළ නිලධාරින්ගේ වැටුප් වැඩි කිරීම උචිත දෙයක්. කෝප් කමිටුවේ සාමාජිකයෙකු හැටියට මම දැකපු කාරණයක් තමයි අපේ රාජ්‍ය යන්ත්‍රණයේ බොහොමයක් මුල් පුටු හිස් වෙලා තිබීම. ඒකට හේතුව, රාජ්‍ය සේවය තුළ ඒ අයට ආකර්ෂණීය වැටුපක් නොලැබීමයි. බොහෝ වෘත්තිකයන් රාජ්‍ය සේවයට එන්න මැළිකමක් දක්වනවා. මොකද, රාජ්‍ය සේවය තුළ ඒ අයට ගැළපෙන වැටුප් තලයක් නැති නිසා. ඒ තුළ බොහොමයක් මුල් පුටු හිස් වෙලා තිබෙනවා. මේ හේතුවෙන් අද රාජ්‍ය යන්ත්‍රණයේ ඇතැම් වැඩබලන තනතුරුවල අවුරුදු 10,15 සිටින නිලධාරින් අපි දකිනවා. ඒ තුළ විශාල වශයෙන් මේ රටට හානියක් වෙලා තිබෙනවා. ඒ නිසා ඒ කාරණය ගැනත් වෙනම කෝණයකින් බලා, ඒ තනතුරු සඳහාත් ආකර්ෂණීය වැටුප් තලයක් ඇති කළ යුතුව තිබෙනවා.

අද ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පත්වලින් යෝජනා කර තිබෙන කාරණාවලට අමතරව අපට දිනා ගන්න තිබෙන කාරණා ගණනාවක් තිබෙනවා. අද ලෝකයේ බොහෝ දෙනෙක් අපේ රට තුළ මානව අයිතිවාසිකම් උල්ලංඝනය වන බවට යම්

මවා පෑමක් කරන්න උත්සාහ කරන බව පෙනෙන්න තිබෙනවා. එය ඉතාම ශෝචනීය තත්ත්වයක්. අද ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පත් අනුව වුවත්, ආණ්ඩුවක් හැටියට අපි වැඩ කරන්නේ කොහොමද කියන කාරණය ඕනෑම අයකුට මැනවින් පෙනී යනවා. කාගේ හෝ මානව අයිතිවාසිකම්, මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමේ අවශ්‍යතාවක් අපට නැහැ.

විශේෂයෙන් අද තිබෙන්නේ උඩුගම් බලා යන ආණ්ඩුවක්. අපි අද අරගෙන තිබෙන්නේ ජනප්‍රිය තීන්දු-තීරණ නොවෙයි. එදා 1970දී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ගත්තා වාගේ තීන්දු-තීරණ ගන්න ආණ්ඩුවක් මේ තිබෙන්නේ. අපි මේ වන විට වගාවන් සඳහා රසායනික පොහොර වෙනුවට කාබනික පොහොර උපයෝගී කරගෙන තිබෙනවා. ඒ සම්බන්ධයෙන් නොයෙකුත් ප්‍රශ්න මතු වුණා. අපට මොන විධියේ තර්ජන, ගර්ජන ද එන්නේ කියන කාරණය අපි පාර්ලිමේන්තුව තුළත් දැක්කා. මේක ජනප්‍රිය තීරණයක් නොවෙයි. හැබැයි, අපි මේක ඉෂ්ට කර ගන්න ඕනෑ. අඩු පාඩු තියෙන්න පුළුවන්. හැබැයි අපි මේ වැඩ පිළිවෙළ ඉස්සරහට ගෙනයන්න ඕනෑ. මේ වැඩ පිළිවෙළ දිනා ගැනීම අපේ රට ලෝකය තුළ බබළවන්න පුළුවන් තවත් කාරණයක් වනවා.

ජර්මනියෙන් විශේෂ ශුභාශිංසන පණිවුඩයක් අතිගරු ජනාධිපතිතුමා වෙත එවා තිබෙනවා අපි දැක්කා. ඒ කියන්නේ මෙම වැඩ පිළිවෙළෙහි හොඳ පැත්ත ලෝකය දකිනවා කියන එකයි. මේවායේ වැරදි අඩු පාඩු තියෙන්න පුළුවන්. අපි ඒවා නිවැරැදි කර ගනිමින්, ප්‍රායෝගික ප්‍රශ්නවලට උත්තර බඳිමින් තමයි මේ කටයුතු කරන්නේ. ඒ නිසා මේවායෙහි නරක පැත්ත ගැනම පමණක් කථා නොකර, හොඳ පැත්ත ගැනත් කථා කරලා, මේ කටයුතුවලට දායකත්වය ලබා දෙන්න අපිත් එක්ක අත්වැල් බැඳගන්නය කියා අපි විපක්ෂයට ආරාධනා කරනවා.

අද විපක්ෂය බැසිල් රාජපක්ෂ මහත්මයා සම්බන්ධයෙන් භීතිකාවක් මවාගෙන, නොයෙකුත් කතාන්දර කියන්න උත්සාහ කරනවා. පසුගිය අවුරුද්දේ 11වැනි මාසයේ තමයි මම කිව්වේ, බැසිල් රාජපක්ෂ මහත්මයා පාර්ලිමේන්තුවට එන්න ඕනෑය කියා. එතුමා පාර්ලිමේන්තුවට ආවාට කිසි ප්‍රශ්නයක් නැහැ. මොකද, එදා -2015- පරාජය එතුමා තමන්ගේ කරපිටට දාගෙන, ඒකාබද්ධ විපක්ෂයේ තිබුණු ඒ දේශපාලන ගමන් මඟ වෙනස් කර, සියලු දෙනා එකට එකතු කරගෙන අපේ පක්ෂය ජයග්‍රහණය කරවීම තුළ අද තුනෙන් දෙකක බලයක් සහිත ආණ්ඩුවක් පිහිටුවාගන්න හැකියාව ලැබී තිබෙනවා. ඒක අපි කවුරුත් දන්නා කාරණයක්. එතුමා මේ පාර්ලිමේන්තුවට ආ යුතු කෙනෙක්ය කියන එක අමුතුවෙන් කිව යුතු දෙයක් නොවෙයි. එතුමා වැඩ කරන්නේ කොහොමද, ෆේල් වෙනවාද, පාස් වෙනවාද කියන එක අපිට කාලානුරූපීව බලන්න පුළුවන්. නමුත්, අද ඇතැම් අය අමුතු තත්ත්වයන් මවා පාන්න උත්සාහ කරන බවක් අපට පෙනෙන්න තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte)

හොඳයි.

ඒ විතරක් නොවෙයි, අද ආණ්ඩුව තුළත් නැති ප්‍රශ්න මවා පාන්න ඇතැම් පිරිස් උත්සාහ දරමින් තිබෙනවා. කරුණාකර, එවැනි දේ නොකරන ලෙස මම ඉල්ලා සිටිනවා. අපේ සහෝදර පක්ෂවල සියලුදෙනා මේ ලබා ගත් ජයග්‍රහණය වෙනුවෙන් අපිත් එක්ක එකතු වෙලා වැඩ කළා. අපි ඒ අයට ගරු කරනවා. ඒ අයත් අපිත් එක්ක දිගටම ඉන්න ඕනෑ. මේ තුනෙන් දෙකක බලයක් සහිත ආණ්ඩුව අපි ආරක්ෂා කර ගන්න ඕනෑ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, ගම්මන්පිල මහත්මයලා, විමල් වීරවංශ මහත්මයලා -අපි ඔක්කෝම- එකතු වෙලා තමයි, මේ ජයග්‍රහණය ලබා ගත්තේ. අපි ඒ සියලු දෙනාටම ගරු කරනවා. ආණ්ඩුවක් හැටියට අපි සියලු දෙනාම එකට ඉන්න ඕනෑ. එම නිසා සියලුදෙනාට මම ඒ සඳහා ආරාධනා කරනවා. අපි පැහැදිලිව කියනවා, මේ ආණ්ඩුව එහෙම වට්ටන්න පුළුවන්කමක් නැති බව.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු සංජීව එදිරිමාන්න මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු අංගජන් රාමනාදන් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சஞ்ஜீவ எதிரிமான்ன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு அங்கஜன் இராமநாதன்] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SANJEEVA EDIRIMANNA *left the Chair and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. ANGAJAN RAMANATHAN] *took the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Hon. Member, please continue.

**ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ආණ්ඩුව, පසුගිය ආණ්ඩුව වාගේ ලාභ තීන්දු තීරණ, පහසු තීන්දු තීරණ අරගෙන ඉදිරියට යන ආණ්ඩුවක් නොවෙයි කියලා මේ අවස්ථාවේදී මම පැහැදිලිවම කියන්න ඕනෑ. අපි ඉදිරියට යන්නේ අපහසු තීන්දු තීරණත් එක්කයි. හැබැයි, ඒවා රටට ගැළපෙන තීන්දු තීරණ.

විපක්ෂය චෝදනා කළා, පසුගිය කාලයේදී ටැබ් පරිගණක දෙන එකට විරුද්ධව අපි කථා කළා කියලා. අපි කවදාවත් ටැබ් දෙන එකට විරුද්ධව කථා කළේ නැහැ. ඒ සම්බන්ධයෙන් වුණු කථා මට හොඳට මතකයි. මොකද, ඔය කාරණයට විරුද්ධව මම එළියේ විශාල අරගළයක් කළා. අපි විරුද්ධ වුණේ වැරදි ටැබ් එකක් දෙන එකටයි. තමුන්නාන්සේලා එදා දෙන්න හැදුවේ තවදුරටත් නිපදවන්නේ නැති, කල් ඉකුත් වූ තාක්ෂණය තුළ තිබුණු ටැබ් එකක්. මේ අවස්ථාවේදී මම ඒ කාරණය මතක් කරන්න ඕනෑ. තමුන්නාන්සේලා එදා දෙන්න හැදුවේ "ලෙනොවො" සමාගමෙන් ගෙනා ටැබ් එකක්. ඒ අවස්ථාවේදී එම සමාගමෙන්ම කිව්වා, "මේ ටැබ් එක තවදුරටත් අපි නිෂ්පාදනය කරන්නේ නැහැ" කියලා. ඒක නිසා තමුන්නාන්සේලාගේ ආණ්ඩුවෙන්ම තමයි එම ක්‍රියාවලිය නැවැත්වූයේ. ඒ ප්‍රසම්පාදන ක්‍රියාවලිය හරියට කළේ නැහැයි කියලා ටැබ් ලබා දීම නවත්වා දීර්ඝ කාලයක් ගතවුණා. එසේ දීර්ඝ කාලයක් ගතවීමෙන් පසු ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් කළා. ඒ තුළින් අපේ රටේ ජනතාවගේ මුදල් කෝටි ප්‍රකෝටි ගණනක් හොරකම් කරන්න ගියා. එහෙම නැතිව, නව තාක්ෂණය පාවිච්චි කිරීම සම්බන්ධයෙන් කොයි වෙලාවකවත් අපේ විරුද්ධත්වයක්

[ගරු ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා]

තිබුණේ නැහැ. 2015ට ඉස්සෙල්ලා මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ විද්‍යා හා තාක්ෂණ යෝජනාවලිය යටතේ අපි පාසල්වලට තාක්ෂණික විද්‍යාගාර ලබා දුන්නා නේ. අපේ මූලික අරමුණ තාක්ෂණය ගමට යාම සහ අපේ දරුවන්ට ඒ යටිතල පහසුකම් ටික සපයා දීමයි.

විශේෂයෙන්ම අද දිනය අපේ මූලික අයිතිවාසිකම් තවත් එක අදියරකට ගෙන යන දවසක්. වධදීමට සහ අනිකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැළකීමට හෝ දඬුවම්වලට එරෙහිව වූ සම්මුතිය (සංශෝධන) පනත් කෙටුම්පත තුළින් දඩ මුදල් වැඩි කිරීම මෙන්ම මහෙස්ත්‍රාත්වරුන්ට සිර මැදිරිවලට යාමට අවස්ථාව ලබාදීම වැනි වැදගත් කටයුතු පිළිබඳ සංශෝධන අපේ ආණ්ඩු කාලය තුළ ගෙන ඒමට හැකිවීම ගැන සතුටු වෙමින්, ඔබ සියලුදෙනාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬවනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The next speaker is the Hon. M.A. Sumanthiran. You have 18 minutes.

[1.33 p.m.]

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Thank you, Hon. Deputy Chairman of Committees, for the opportunity to speak a few words at this very important Debate when the Hon. Minister of Justice has presented to the House Bills to amend the Code of Criminal Procedure Act and the Convention Against Torture and Other Cruel, Inhuman or Degrading Treatment or Punishment Act, a certain Order and another Motion for approval. I must thank the Hon. Minister for remaining in the House after presenting these Bills and listening to the various comments that are being made on those. The Bills that have been placed before the House are very, very important and serious in nature. We welcome what we see in both the Amendment Bills and one Bill seeks to make it obligatory on magistrates to visit police stations. If I heard the Hon. Minister right, it is not just the police stations, but also other detention centres that they should visit to examine and see whether the detainees are properly treated, particularly with a view to ensuring that there is no torture and other cruel, inhuman or degrading treatment meted out to them.

So, on paper, it is a good move. But, one wonders why this window dressing is being made now. Any of us, who are aware of the actual situation with regard to torture in this country, would wonder why this Amendment is being placed today. So much for shouting from the rooftops that we are protecting our sovereignty, we are not bowing down to international pressure and all of that, but all of these facades are being built and I do not know who you are trying to fool. The Convention Against Torture and other Cruel, Inhuman or Degrading Treatment or Punishment Act was passed in 1994 and we have various researches that had been made with regard to the efficacy of this Act. Twenty Six years of this Act has seen just nine convictions, six of which are under appeal. A very recent research publication by the Law & Society Trust states that there were only 47 prosecutions, less than 0.1 per cent of the complaints that had been made. One knows that even the complaints are only about 10 to 20 per cent of the actual happenings. For various fears - fears of reprisals, of further mistreatment, of family members being put in jeopardy and all of those - only about 10 to 20 per cent actually make the complaints and I just worked out the figures.

This Act, in operation, has been a dismal failure. A very generous calculation will show that only 0.06 per cent of the complaints result in any conviction. How is that to be compared with Article 11 of the Constitution? Articles 10 and 11 of the Constitution are two provisions that cannot be abridged, that cannot be restricted, not by law, not by anything. But, we have a situation in this country where, time and again, we had judgments from the Supreme Court, finding police officers guilty of torture. There are judgments written. The Hon. Minister of Justice, being a lawyer, knows that very well, that every single volume of the New Law Reports has judgments of the Supreme Court, finding police officers guilty of the most inhumane methods of torture, but they are not brought before court.

You have this Act to show people around the world that torture is an offence. Today, you are even enhancing the fine. What for? You do not prosecute them. Why did you waste this paper to put it before Parliament? You do not prosecute them. This is to show others. That is why I called it a window dressing. Already, for over 100 years, the Prisons Ordinance requires the magistrates to visit the prisons. Do they do that? When was the last time a magistrate visited a prison? I am asking this question from the Hon. Minister - you may put it here, making it obligatory and that is salutary - how are you going to enforce this, requiring a magistrate to visit police stations and other detention centres? Is there a mechanism here to do that? No. There is no mechanism. You already had that requirement for 100 years - I have known one or two conscientious magistrates who have gone and visited prisons - but they do not do that. Monthly, they must do that. But, they do not do that. And everyone knows that there is no mechanism to enforce that. But, even if you have a mechanism to enforce that, if the magistrates are not conscientious enough to do what the law has required them to do, can you, by force, have them do that? No, you cannot.

Once the UN Special Rapporteur on Torture - I remember his name very well, Manfred Nowak - who was an expert in the field came and visited places of detention. You must read his Report. I think the Report came about 15 or 20 years ago, but it is still valid because he visited a particular place and then, later in the afternoon, he visited that place again and found that people who were not there in the morning were there in the afternoon. He put it all down because those who had been tortured had been taken away and hidden when he went there announced. So, he went unannounced in the afternoon and found them. All of those facts are there. Later, there was another Rapporteur, Méndez, who had given another Report. You allow them to come to this country because you want to

show the world that you are open, that there is no torture. Sri Lanka is one of the worst countries for torture by the police. I am happy that the Minister of Public Security is also present here now. We are one of the worst countries. So, you can say this; you can present this. I heard the Minister of Justice say that buildings are the hardware and the laws that we are passing are the software, and he thinks that that is complete. But, where is the delivery? You have made the computer and you have programmed it, but it does not work. It does not work; even power does not come to your computer with that hardware and software. It is broken. Your whole system, insofar as torture is concerned, is broken and you cannot fix it by passing these laws.

Then, a word about the Prevention of Terrorism Act. Torture, in this country, became an epidemic because of the provision in the PTA that allowed confessions made to police officers as admissible evidence. That is how torture became endemic and that is also how the police officers lost their ability to investigate offences. They no longer had to investigate offences; that skill disappeared long ago. All you had to do was to beat up a fellow or do worse and get his signature. Then, you solved the crime. I have demonstrated that and I do not want to repeat it. I have given stories after stories after stories where crimes are supposed to have been solved. Because you have a confession, you convict the wrong person, but what is dangerous in that is that the real culprit is still roaming free, he is still out there on the street. That is what is dangerous about this. If you are only concerned about national security, as you say, your national security is gone because the one who actually committed the crime is out there and you have caught somebody else, got a confession and put him behind bars. So, not just from the human rights point of view, not from the human dignity point of view, even from your avowed national security point of view, it is a dismal failure.

Sir, the European Union has passed a Resolution that they are withdrawing the GSP Plus. Why? Because in 2017, a guarantee was given by the then Government that they would repeal the PTA and replace it with another law that is compliant with international human rights standards. Some effort was made. When they came up with the CTA, I was the first person to publicly announce that it was worse than the PTA. Subsequently, it came before various Parliamentary Committees. Your Representatives also came to see whether it was complaint and we worked on it and various amendments were brought in. It was not perfect, but it was one hundred times better than the PTA that you have. I repeat, it was one hundred times better than the PTA that is still in our statute books. But, unfortunately, it was not passed because several of our civil society people thought that we must only have a perfect law. So, we now have the PTA because we could not have the perfect law. There were shortcomings in that, but it was far better. The Hon. Lakshman Kiriella mentioned certain matters. Confessions cannot be admissible. In our country, in this culture, confessions made to a police officer cannot be admissible; preventive detention cannot be permitted except for a very short period of time and with judicial supervision.

There are numerous issues with regard to the PTA. Hon. Minister, I can tell you very responsibly that you cannot amend the PTA; you have to repeal the PTA.. The whole basis, the foundation of that law is flawed. I have said this several times. It was brought in just for six months and still bears that name "(Temporary Provisions) Act" brought in 1979. So, you have to repeal it.

We also agree that all the countries in the world have laws to deal with terrorism. We do not say no to that. I agree with you that there has to be a balance, but that balance has to be struck properly. You cannot have Article 11 in our Constitution and then allow even one person to be tortured. I agree with you on that. It is not the numbers, but you did speak about numbers, about the disappeared and I heard you also say that people are making allegations that thousands of people have gone missing. People are not making allegations, your own Government-appointed Commissions have said so. Leave aside what we say, your own Commission, the Paranagama Commission says that it is more than 20,000 people. What have you got to say about that? Your own Commission, the Udalagama Commission, with regard to just the two matters that they inquired into - the deaths of the 17 aid workers in Mutur and the five students in Trincomalee - had said that. Your own Commission, the LLRC - all those three Commissions were appointed by the then President Mahinda Rajapaksa - had said that the persons who had surrendered to the security forces at the end of the war have gone missing. They have given the number: 3000 odd persons. Those are your own Commissions. We have nothing to do with those Commissions.

When your own Commissions had said tens of thousands of people have gone missing and not one has been traced so far, not one has been prosecuted for that, what is the point in saying people are saying so? You have said it; you have admitted to it. Why can you not investigate one case? Eleven young people were abducted by personnel of the Navy in Colombo, not because they were involved in anything, but for ransom. Senior naval officers were involved in that. You interfere in that; you go after investigating officers in that case; you waylay that case and then, you preach sanctimoniously here that this Government will protect the dignity of everyone. How do you make these ends meet then? If you are sincere - I am saying with all sincerity that you are not sincere and this is just window dressing for the European Union - it is too late. I want the European Union and the entire world to know that this is just eyewash, a very weak and feeble attempt by this Government to try to show that they are international human rights compliant. That will not work. Unless you make a genuine turn, you will not succeed in this false effort of yours.

Thank you.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Next, the Hon. John Seneviratne. You have 13 minutes.

[අ.භා.1.51]

**ගරු ජෝන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு ஜோன் செனவிரத்ன)
(The Hon. John Seneviratne)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසුගිය දිනවල ගරු අධිකරණ ඇමතිතුමා විසින් ගැසට් කරන ලද සංශෝධන කීපයක් අද මේ ගරු සභාවේ සාකච්ඡා වෙනවා. ඒ සංශෝධන අද සමාජයේ පවතින තත්ත්වයන්ට ඉතා අනුකූල බව මම කියන්න ඕනෑ. ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමාගේ කථාවෙන් ප්‍රකාශ වුණා වාගේ, අද අපි සාකච්ඡා කරලා සම්මත කරන මේ සංශෝධන අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක කරන්නටත් අපි කටයුතු කරන්න ඕනෑ. එහෙම නැතුව අපි නීති සම්පාදනය කරලා, යම් යම් අයට බලතල පවරලා, එම නීති ක්‍රියාත්මක කිරිමේදී පසු බෑමට ලක් වනවා නම්, නීති සංශෝධනය කිරීමෙන්වත්, නීති පැවතීමෙන්වත් ප්‍රයෝජනයක් වෙන්නේ නැහැ. ඒ කෙසේ වෙතත්, අධිකරණ ඇමතිතුමා විසින් අද ඉදිරිපත් කර තිබෙන මේ සංශෝධන ඉතා වැදගත් වාගේම අපි අගය කළ යුතු සංශෝධන කියා මම හිතනවා.

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පතින් බලාපොරොත්තු වන්නේ, ඇත්ත වශයෙන්ම මහෙස්ත්‍රාත්වරයෙකුට තමුන්ගේ බල ප්‍රදේශය තුළ තිබෙන සියලු පොලිස් ස්ථාන නිරීක්ෂණය කරන්න බලතල ලබා දීමයි. මෙය ඉතා වැදගත්. මොකද, පොලීසියට කෙනෙක් ගියාම ඔහුට කාගෙවත් පිළිසරණක් නැති බව අපි දන්නවා. ඔහු ඒ පොලීසියේ ගොඩනැඟිල්ල තුළ තනි වෙනවා. ඔහු බලන්න සමහර විට ඥාතියෙකුටවත් යන්න දෙන්නේ නැහැ. නීතිඥයෙකුටවත් ඔහු බලන්න යන්න නොදෙන අවස්ථා තිබෙනවා. 1973 කාලයේ මේ රටේ අපරාධ සම්බන්ධව පෙනී සිටි සුප්‍රසිද්ධ නීතිඥවරයෙක් වන අර්ඩ්ලි පෙරේරා මහතා ගැන අපි දන්නවා. එතුමා සිරකරුවකු බලන්න මොරටුව පොලීසියට ගිය වෙලාවේ එතුමාටත් පහර දීලා තුවාල කර තිබුණා. එවැනි තත්ත්ව පොලීසිවල ඇති වනවා. යම්කිසි කෙනෙකුගේ පැමිණිල්ලක් මත, එහෙම නැත්නම් සැකයක් මත පොලීසියට පුද්ගලයකු ගෙන ගියාම ඔහුට අත්වන ඉරණම ගැන අපට අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. ඒ ගැන අපි හොඳට දන්නවා. අපි උසාවිවල වැඩ කරනකොට දැක තිබෙනවා, මොන විධියේ දරදඬුතාවලට ඒ අයට මුහුණ දෙන්න සිද්ධ වනවාද කියලා. සමහර පුද්ගලයන් සුළු වැරදිවලට පොලීසියට ගෙන ගියාම, ඔවුන් ඊට පසුව දා උසාවියට එන්නේ කොර ගහමින්. ඒ ඇයි? ඔවුන්ට තළලා, කකුල්වලට ගහලා තුවාල කරපු නිසා. ඒ අයට ඇප දුන්නත් සති ගණන් නිවාසවල ප්‍රතිකාර ගන්නවා; ආරෝග්‍ය ශාලවල ප්‍රතිකාර ගන්නවා. මේකෙන් වෙන්නේ මොකක්ද? සාමාන්‍ය සුළු වැරැදිවලට ලක් වන අයට සුමාන ගණනක් තමුන්ගේ පවුල් නඩත්තු කර ගන්න, වැඩක් පළක් කර ගන්න බැරි වනවා. මොන වරදකට වුණත් සිරගත කළාම, කෙනෙකුට පහර දෙන්න, ඔවුන්ට ශාරීරික වද හිංසා පමුණුවන්න සහ යම් යම් ප්‍රකාශ ලබා ගන්න පොලීසියට පුළුවන්කමක් නැහැ. යම් යම් අපරාධවලට මූලික හේතු හොයන්න එහෙම පහර දෙන්න පුළුවන්ුහේතු හොයන්න. එහෙම පහහර ්න. එෙකමක් නැහැ. සමහර පොලීසිවලදී කළ පහර දීම් නිසා අපි දන්නවා, සැකකරුවන්ගේ ජීවිත පවා නැති වුණු බව. ඒ නිසා මෙම පනත සංශෝධනය කිරීම ඉතා වැදගත් වනවා. මොකද, එවැනි කාරණයක් ගැන මහෙස්ත්‍රාත්වරයෙකු දැන ගත්තාම, නැත්නම් ඔහුට පැමිණිලි කළාම, ගිහිල්ලා ඒ කාරණය ගැන සොයා බලලා, අවශ්‍ය පියවර ගන්න පුළුවන්කම මේ සංශෝධනය තුළින් ඒ මහෙස්ත්‍රාත්වරයාට තිබෙන නිසා. එතුමාට ඒ පිළිබඳව නිරීක්ෂණය කරන්න පුළුවන්කම තිබෙනවා වාගේම, ඒ සම්බන්ධ පරීක්ෂණයක් කරවන්න පුළුවන්කමත් තිබෙනවා. පොලිස් පරීක්ෂණවලදී හෙළිදරව් වන කරුණු අනුව අවශ්‍ය පියවර ගන්නත් මහෙස්ත්‍රාත්වරයෙකුට අවකාශය තිබෙනවා. ඒ නිසා මේ සංශෝධනය ඉතා වැදගත් බව මා කියන්න ඕනෑ.

ඊළඟ කාරණය තමයි, වධදීමට සහ අනිකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැලකීමට හෝ දඬුවම්වලට එරෙහිව වූ සම්මුතිය (සංශෝධන) පනත් කෙටුම්පත. අපි දන්නවා, දණ්ඩ නීති සංග්‍රහය අපේ රටේ පවතින පැරණි නීතියක් බව. දණ්ඩ නීති සංග්‍රහය පදනම් කරගෙන තමයි අපරාධ චෝදනාවලදී දඬුවම් නියම කරන්නේ. 1983 වාගේ කාලයක සකස් වෙච්ච නීතියක් තමයි දණ්ඩ නීති සංග්‍රහය කියන්නේ. දණ්ඩ නීති සංග්‍රහය සකස් කළ මුල් අවස්ථාවේ අපේ රට බ්‍රිතාන්‍ය කිරීටයට යටත්ව තිබුණු රටක්. ඒ අනුසාරයෙන් තමයි එදා ඒ නීති අපේ රටේත් සකස් වුණේ. අද ඊට වඩා වෙනස් තත්ත්වයක් රටේ තිබෙනවා. අද අපට නිදහස ලැබිලා තිබෙනවා. ඒ වාගේම අද අපේ රට ජන රජයක් බවට පත් වෙලා තිබෙනවා. අද ජනාධිපතිවරයෙක් යටතේ ක්‍රියාත්මක වන ආණ්ඩු ක්‍රමයක් අපේ රටේ තිබෙනවා. එම නිසා මේ පනත් කෙටුම්පතේ තිබෙන සමහර වචන, සමහර යෙදුම් හා සමහර ප්‍රකාශන අදට ගැළපෙන ආකාරයට වෙනස් වෙන්න ඕනෑ කියලා මම හිතනවා.

ඒ වාගේ වෙනස් විය යුතු තැන් ගණනාවක්ම අද සම්මත කිරීමට ඉදිරිපත් කර තිබෙන සංශෝධනවල තිබෙනවා. ඒවා සංශෝධනය කිරීම කාලෝචිතයි කියලා මම කියන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම අපේ රට බ්‍රිතාන්‍ය යටත් විජිතයක් වශයෙන් පැවතුණු කාලයේ අපේ නීතිය ක්‍රියාත්මක වුණේත් ඒ ආකාරයටයි. 1962දී අපේ රටේ හමුදා කුමන්ත්‍රණයක් ඇති වුණා. හමුදාවත්, පොලීසියේ උසස් නිලධාරිනුත් එකතු වෙලා,-

Sir, how many minutes more do I have?

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
You have eight more minutes.

**ගරු ජෝන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு ஜோன் செனவிரத்ன)
(The Hon. John Seneviratne)
Okay, Sir.

එදා තිබුණු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව පෙරළන්න හමුදාවේ සහ පොලීසියේ උසස් නිලධාරින් එකතු වෙලා කුමන්ත්‍රණයක් කළා. ඒ කුමන්ත්‍රණය කිරීමෙන් පසුව අපේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණය ඒ සම්බන්ධ පරීක්ෂණයක් පවත්වලා, ඔවුන්ට දඬුවම් නියම කළා. නමුත් අවසානයේ මොකක්ද සිදු වුණේ? ඒ අයට පුළුවන්කම ලැබුණා, Privy Council එකට අභියාචනයක් ඉදිරිපත් කරන්න. Privy Council එකට ඉදිරිපත් කළ අභියාචන විභාගයෙන් පස්සේ ඒ අය නිදහස් වුණා. එදා ඒ අයට එහෙම කරන්න පුළුවන්කම තිබුණා. ඒකේ වරදක් නැහැ. එදා තිබුණු නීතිය ඒකයි. නමුත් එදා තිබුණු විධිවිධාන අනුව Privy Council එකෙන් කී දෙනෙකුට ප්‍රයෝජනයක් ඇති වුණාද? සමහර වෙලාවට උසාවිවලින් දෙන වැරැදි තීන්දු මඟින් දඬුවම් ලබන අය ඉන්න පුළුවන්. ඒ හැම කෙනාටම එදා Privy Council එකට යන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. විශාල වශයෙන් මුදල් වියදම් කිරීමට හැකියාව තිබෙන අයට පමණයි Privy Council එකට යන්න පුළුවන්කම තිබුණේ. එතැනදී නීතියේ අසාධාරණයක් සිදු වෙනවා. ඒ නිසා තමයි, Privy Council එකට appeal කිරීමේ ක්‍රමය මේ රට ජන රජයක් බවට පත් වීමත් සමඟ අහෝසි වුණේ. අද මේ රටේ සෑම නඩුවක් සම්බන්ධයෙන් අවසානාත්මක තීන්දු දීමේ වගකීම, අයිතිය තිබෙන්නේ අපේ රටේ ඉහළම අධිකරණය වන ශ්‍රේෂ්ඨාධිකරණයට කියන කාරණය මම කියන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එවැනි තත්ත්වයක් රටේ උද්ගත වෙලා තිබෙන මේ වකවානුවේ අපේ දණ්ඩ නීති සංග්‍රහය වාගේ වැදගත් නීතිමය පුස්තකයක, එහෙම නැත්නම් නීතියක තිබෙන මෙවැනි වචන වෙනස් විය යුතුමයි. අදට ගැළපෙන ආකාරයට, අපේ රටේ ඇති වෙන වෙනස්කම්වලට අනුරූප වන ආකාරයට අවශ්‍ය යෙදුම් ඒවායේ යොදන්න ඕනෑ. මම හිතනවා එයත් වැදගත් කියලා.

ඊළඟ කාරණය තමයි, අපේ රටේ බරපතළ එහෙම නැත්නම් කෲර, වධහිංසා පමුණුවන අයට දඬුවම් දීම. සමහර අය දඬුවමක් විධියට සමහර මිනිසුන්ගේ කන කපනවා. සුළු සිද්ධියක් වුණාම කන කපනවා. ඒ වාගේම අවයව කපනවා. ඒ වාගේ නොයෙක් ආකාරයේ දැඩි හිරිහැර කරනවා. මීට සති දෙකකට පෙර තමුන්නාන්සේලා පුවත් පත්වල එවැනි සිද්ධියක් දකින්න ඇති.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමාත් ඒ සිද්ධිය දකින්න ඇති. කපුවෙක් තවත් දෙන්නෙකුත් එක්ක ගිහිල්ලා තරුණයෙකු අපහරණය කරලා ඒ තරුණයා ගහකට තියලා බැඳලා ඊට පස්සේ ඔහුට ඇණ ගහලා තිබුණා. ඒ පුද්ගලයාට බරපතළ තුවාල සිදු වෙලා, පොලීසිය මඟින් ඔහු බේරා ගෙන ආරෝග්‍යශාලාවට ඇතුළු කරලා තිබුණා. මෙවැනි බරපතළ, කෲර වධ හිංසා පමුණුවන අයට දෙන දඬුවම දැඩි කරන්න සංශෝධනයක් තිබෙනවා. 1994දී පනවපු නීතිය අනුව මෙතෙක් කල් තිබුණු දඬුවම තමයි රුපියල් දසදහසකට නොඅඩු සහ රුපියල් පනස්දහසකට නොවැඩි දඩයක් නියම කිරීම. ඒ වෙනුවට, 'රුපියල් පනස්දහසකට නොඅඩු සහ රුපියල් ලක්ෂ දෙකක් නොඉක්මවන දඩයකට' යටත් කිරීම යන වචන ආදේශ කිරීමෙන් මෙම වගන්තිය සංශෝධනය කරනු ලබනවා. රුපියල් 10,000ට තිබුණු අවම දඩය රුපියල් 50,000කටත්, රුපියල් 50,000කට තිබුණු උපරිම දඩය රුපියල් 200,000ක දක්වාත් වැඩි කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දඬුවම් තීන්දු කරන කොට සමාජයීය, ආර්ථික තත්ත්වය සැලකිල්ලට ගන්න ඕනෑ. කෙසේ නමුත් කෙනෙකුට තමන්ගේ ජීවිතයේ ඉදිරි කාලයට බලපාන විධියේ අවයව නැති කිරීමක්, විනාශ කිරීමක් වාගේ දරුණු දඬුවමකට පත් කරනවා නම්, එසේ කරන පුද්ගලයන්ට වැඩි දඬුවමක් දෙන්න ඕනෑය කියන සංකල්පය මේ අවස්ථාවේදී අපට ප්‍රතික්ෂේප කරන්න බැහැ. ඒක නිසා මේ සංශෝධන තුනම අදට ගැළපෙන අත්‍යවශ්‍ය සංශෝධන බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Vijitha Herath. You have eight minutes.

[අ.භා.2.01]

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ඉදිරිපත් කර තිබෙන සංශෝධන සාධනීය සංශෝධන විධියට අපි පිළිගන්නවා. නමුත්, සංශෝධන ඉදිරිපත් කිරීමේදී ඇත්තටම විය යුත්තේ යුරෝපා සංගමය හෝ වෙනත් ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධානවල බලපෑමට අනුව කටයුතු කරන එක නොවෙයි. පැහැදිලිව හා අවංකව අපි කළ යුතු වන්නේ අපේ රටේ මානව හිමිකම් ආරක්ෂා කිරීම වෙනුවෙන්, ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් සංශෝධන ඉදිරිපත් කිරීමයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සංශෝධන ගෙන ඒමේදීත් මොකක්ද වුණේ කියලා අපි දැක්කා. පසුගිය කාලයේ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවා. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට මාරාන්තික ව්‍යවස්ථාවක් ඇතුළත් කර තිබුණා. ගෞරවනීය ස්වාමීන් වහන්සේලාත් එය ප්‍රතික්ෂේප කළා. ඒ, රටට හතුරු සංශෝධනයක් වූ ද්විත්ව පුරවැසිභාවය පිළිබඳ කාරණයයි. එනම්, ද්විත්ව පුරවැසියන්ට පාර්ලිමේන්තුවට එන්න පුළුවන්ද, බැරිද කියන කාරණයයි. අපේ රටේ මහජන නියෝජිතයකු වන්න ඇමෙරිකානු පුරවැසියෙකුට පුළුවන්ද? ඉතා පැහැදිලිව රටේ ජනතාව කිව්වේ, "ඒක වැරදියි, ඒක අහෝසි විය යුතු ව්‍යවස්ථාවක්" කියලායි. නමුත්, එක පුද්ගලයකු වෙනුවෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කළ ආකාරය අපි දැක්කා. බැසිල් රාජපක්ෂ පාර්ලිමේන්තුවට එන එක නොවෙයි මෙතැන තිබෙන ප්‍රශ්නය. එතුමා වෙනුවෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරනවා. ඒ අරමුණ තමයි බරපතළ වන්නේ.

රටේ ජනතාවගේ මූලික නීතිය තනි පුද්ගලයකු වෙනුවෙන් වෙනස් කිරීම කිසිම පුද්ගලයකුට අනුමත කරන්න බැහැ. එදා ආණ්ඩු පක්ෂයේ අය ඒකට විරුද්ධ වනකොට, ආණ්ඩු පක්ෂයේ ඒ අයට පොරොන්දුවක් දුන්නා. එනම්, 2021 අවුරුද්දේ අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදනවා, ඒ අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ද්විත්ව පුරවැසිභාවය පිළිබඳ ව්‍යවස්ථාව වෙනස් කරනවා, එතෙක් ඉවසා ඉන්න, මේ වෙලාවේ විතරක් ඡන්දය දෙන්න කියලා. එලෙස ආණ්ඩු පක්ෂය නියෝජනය කරන අයම රැවැට්ටුවා, ඒ අනුව එතුමන්ලා රැවටුණා. ආණ්ඩු පක්ෂය නියෝජනය කරන අය ඒකට රැවටී තමයි ජනතාවටත් ඒක කිව්වේ. නමුත්, දැන් ඒ මොකක්වත් නැහැ. ඒ සංශෝධනයෙන් දැන් ද්විත්ව පුරවැසියන්ට පාර්ලිමේන්තුවට එන්න ඉඩ හදලා තිබෙනවා. එම සංශෝධනය ප්‍රගතිශීලිද, ජනතාවාදීද කියන එක මත තමයි එය කොතරම් යහපත් ද කියලා තීරණය වෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මේ පනත් කෙටුම්පත්වලට සංශෝධන ගෙනාවාට පොලීසිවල තිබෙන තත්ත්වය කුමක්ද කියලා අපි දන්නවා. පසුගිය දවස්වල විවිධ චෝදනාවලට විවිධ පුද්ගලයන් අත්අඩංගුවට පත් වුණා. ඒ අයට විරුද්ධව ඇති චෝදනා වැරදිද, නිවැරදිද කියන එක ඔප්පු වෙන්නේ උසාවියෙන්. එ්, එම නඩු කටයුත්ත අවසන් වුණාට පස්සේ. නමුත්, මඩකලපුවේ චන්ද්‍රන් විදූෂන් කියන පුද්ගලයාට අමානුෂික ලෙස වධ දීම නිසා මැරුණා. පානදුර උතුර පදිංචිව සිටි තවත් මුස්ලිම් තරුණයකු මැරුණා. ඒ විතරක් නොවෙයි, විවිධ අපරාධවලට සම්බන්ධයි කියලා අත්අඩංගුවට අරගෙන අවුරුදු එකහමාර, අවුරුදු දෙක රඳවා ගෙන සිටි අයත් හිටපු ගමන් ආයුධ පෙන්වන්න කියලා රැගෙන ගිය අවස්ථාවලදී වෙඩි තබා මැරුණා කියලා ප්‍රවෘත්ති නිර්මාණය වෙනවා. මේක පිළිගත් ක්‍රමවේදයක් නොවෙයි. අපි දැක්කා, මධූෂ් ඝාතනය කිරීම සම්බන්ධවත්. පොලීසියෙන්ම කිව්වා, මධූෂ්ට වෙඩි තැබුවේ තවත් කුඩු පාර්සලයක් පෙන්වන්න ගිය අවස්ථාවේදී කියලා. නමුත් වෙනත් කණ්ඩායමක් ඇවිල්ලා තමයි මධූෂ්ට වෙඩි තැබුවේ කිව්වා. ඒ වාගේම, ඒ පැමිණි කණ්ඩායම ආපු බයිසිකලය දමා ගියා කිව්වා. ඒ බයිසිකලය දමා ගියා නම්, ඒක හොඳම ප්‍රබල සාක්ෂියක් නේ. අද වනතුරු ඒ බයිසිකලයත් එක්ක ආපු කණ්ඩායම කවුද කියලා සොයා ගත්තාද? ඒක සොයා ගන්න පුළුවන් නේ. ඒ නිසා අපි මේ නීතියට සංශෝධන ගෙනාවාට ප්‍රායෝගිකව සිදු වෙලා තිබෙන්නේ මොකක්ද? හරි පැහැදිලියි. මේක ඕනෑම පොඩි ළමයෙකුට තේරෙනවා. මේ සිදුවීම් -පොලීසියේ පහර දීම්, අමානුෂික වද දීම්- සිදු වන්නේ රාජ්‍ය යන්ත්‍රණයේ බලය පාවිච්චි කරමින්. එහෙම නැතිව පොලිස් නිලධාරින්ට අත්තනෝමතික විධියට බලය පාවිච්චි කරන්න බැහැ.

පසුගිය කාලයේ බස්නාහිර පළාතේ සිදු වුණු විවිධ පැහැර ගැනීම්, පහර දීම්, පොලිස් අත්අඩංගුවේ සිටි අය ඝාතනය වීම්, මහර බන්ධනාගාරයේ සිදුවූ වෙඩි තබා මරා දැමීම් පිටුපස

[ගරු විජිත හේරත් මහතා]

දේශපාලන මැදිහත්වීම තිබුණා. මේවා නතර කරනවා නම්, කළ යුත්තේ දේශපාලන බල අධිකාරියෙන් මිස පහළ තැන්වලින් නොවෙයි. එතැනින් හරියට තීන්දු තීරණ ගන්නවා නම් මේවා නවත්වන්න පුළුවන්. නමුත් අද එහෙම දෙයක් සිදු වෙන්නේ නැහැ. අද ඉතා අසාධාරණ විධියටයි නීතිය ක්‍රියාත්මක වෙන්නේ. ඊයේ පෙරේදා ගාලු දිස්ත්‍රික්කයේ, බූස්ස ප්‍රදේශයේ පොල් ගෙඩි 15ක් සොරකම් කළා කියලා තරුණයන් දෙදෙනෙක් අත්අඩංගුවට ගත්තා. ඔවුන්ට උසාවියෙන් රුපියල් ලක්ෂ පහළොවක දඩයක් නියම කළා. අද එවැනි තත්ත්වයකට ගිහින් තිබෙනවා. නමුත් කෝටි ප්‍රකෝටි ගණන් කොල්ල කාපු අය, මහජන දේපළ සොරා කාපු අය කොරෝනා වසංගතය අස්සේ නිදොස්කොට නිදහස් කරන ආකාරය අපි දකිනවා. සොහොන් හදන්න මැදිහත් වුණු නිලධාරින්, ඇවන්ට් ගාර්ඩ් නඩුවට සම්බන්ධ අය කොරෝනා වසංගතය අස්සේ, මුළු රටම කොරෝනා භීතියෙන් වෙවුලමින් සිටියදී සියලු නඩුවලින් නිදොස්කොට නිදහස් කරන ආකාරය අපි දකිනවා. ඒවා පරණ චෝදනා. ඒවා එහෙම වෙන්නේ කොහොමද? ඒවාට දේශපාලන බලපෑමක් නැද්ද? මේක ජනතාවට තේරෙන්නේ නැද්ද? ජනතාවට තේරෙනවා. මෙවැනි නිදොස්කොට නිදහස්වීම් පිටුපස දේශපාලන මැදිහත් වීමක් තිබෙනවා.

අද අධිකරණයේ ස්වාධීනත්වයට අත තියලා තිබෙනවා; අධිකරණයට බලපෑම් කරනවා. අධිකරණයට යම් යම් බලපෑම් කරලා තමයි නඩු තීන්දු වෙනස් වෙන්නේ. ඒක ඕනෑම පොඩි ළමයෙකුට තේරෙනවා. බැඳුම්කර නඩුව මෙච්චර ඇදි ඇදී යන්නේ මොකද? බැඳුම්කර හොරුන්ට දඬුවම් දෙන්නේ නැත්තේ ඇයි? බැඳුම්කර හොරුන්ට නැවත ඒ කර්මාන්ත පටන් ගැනීමට අවසර දෙනවා. ඒවා සිදු වෙන්නේ කොහොමද? ඒ විතරක් නොවෙයි, මහජන බැංකුවේ සභාපතිට කථා කරලා කියනවා, "අහවල් සිද්ධිය සම්බන්ධයෙන් තිබෙන නඩුව පස්සට දමන්න" කියලා. එහෙම තමයි මේවා වෙන්නේ. බැඳුම්කර වංචාවේ ප්‍රධාන චූදිතයා අයථා විධියට ලබා ගත් ණය සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගනිද්දී, සභාපතිවරයාට දුරකථනයෙන් කියනවා, "ඒක පැත්තකින් තියන්න, ඒක දැන්ම දමන්න එපා" කියලා. එතකොට කොහොමද නීතිය ක්‍රියාත්මක වෙන්නේ? ඒ නිසා අපි මෙතැනදී මෙවැනි සංශෝධනවලට කොච්චර අත ඉස්සුවත්, ඒවායේ ගුණාත්මකභාවය වැඩි කරන්න කිව්වත් ඒක මහ පොළොවේ සිදු වෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟ බරපතළ කාරණාව තමයි සමාජ මාධ්‍ය පාවිච්චි කරන අය අත්අඩංගුවට ගැනීම. ඒකට පාවිච්චි කරන්නේ අසත්‍ය පුවත් ප්‍රචාරය කිරීම කියන චෝදනාව. 'අසත්‍ය පුවත' කියන එක කවුද තීරණය කරන්නේ? අසත්‍ය පුවතක් කියලා තීරණය කරන්නේ ආණ්ඩුවද, පොලීසියද? පසුගිය දවස්වල බටහිර අප්‍රිකාවේ, ගැම්බියාවේ ශ්‍රේෂ්ඨ ඓතිහාසික නඩු තීන්දුවක් ලබා දුන් බව අපි දැක්කා. අසත්‍ය පුවත කියන එක එහෙම නිර්වචනය කරන්න බැහැ. ඒ නිර්වචනය පිළිබඳ ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේද තිබෙනවා. අපේ රටේ ආණ්ඩුව, පොලීසිය, සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 9 වගන්තිය, 4 වගන්තිය, 19(2) වගන්තිය යන වගන්ති උල්ලංඝනය කර 'අසත්‍ය පුවත' කියන එක නිර්වචනය කරමින් අද බොහෝ තරුණ තරුණියන් අත්අඩංගුවට ගන්නවා.

පසුගිය දවස්වල රජීව් කුරුවිටගේ කියන අය අත්අඩංගුවට ගත්තා; චෝදනා ඉදිරිපත් කළා. හැබැයි, උසාවියට ගියාම ඒ චෝදනා නිෂ්ප්‍රභ වුණා. ඔහු නිදහස් කරන්න සිද්ධ වුණා. උසාවියෙන් රුපියල් ලක්ෂයක ඇපයක් මත ඔහු නිදහස් කළා. හැබැයි, PCR කරලා නැති නිසා එළියට දමන්න බැහැ කියලා බන්ධනාගාරයේ තියා ගත්තා. ඊට පසුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව නැවත උසාවියට ගිහින් ඔහුට විරුද්ධව අලුත් චෝදනා ඉදිරිපත් කිරීමට අවසර ඉල්ලනවා. මේ විහිළුව මොකක්ද ? එක රටක්-එක නීතියක් කියන්නේ ඒකද ? ඔහුට චෝදනා නැති වුණාම, ඔහු රඳවා ගන්න බැරි වුණාම, විනිශ්චයකාරවරයා ඔහු ඇප මත නිදහස් කළාම, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කියනවා, "ඉදිරිපත් කළ චෝදනාවලට ඔහු රඳවා ගන්න බැරි බව ඇත්ත. අලුත් චෝදනා ඉදිරිපත් කිරීමට අවසර දෙන්න" කියලා. ඒ අනුව වෙනත් චෝදනා යටතේ ඔහු තියා ගන්න පුළුවන්ද කියලා බලනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එවැනි තත්ත්වයක් දැනට තිබෙන්නේ. ඒ වාගේම 'ලංකාදීප' පුවත් පතේ තරිඳු ජයවර්ධන කියන මාධ්‍යවේදියා බස්නාහිර පළාතේ Senior DIGට විරුද්ධව පැමිණිල්ලක් කරලා තිබෙනවා. අද වනතුරු ඒ ගැන විභාගයක් නැහැ; කටඋත්තරයක් අරගෙන නැහැ. මාධ්‍ය සංවිධාන ගණනාවක් ඒ පිළිබඳ දැනුම් දීලා තිබෙනවා. ඒ පිළිබඳව ගරු කථානායකතුමාටත් දැනුම් දීලා තිබෙනවා. ඒ වාගේම පොලීසිය භාර ඇමතිවරයාට දැනුම් දීලා තිබෙනවා, පොලිස්පතිවරයාට දැනුම් දීලා තිබෙනවා. [බාධා කිරීමක්] අඩුම ගණනේ කටඋත්තරයක්වත් අරගෙන නැහැ. ඔහු සමාජ මාධ්‍යවල ප්‍රවෘත්තියක් ප්‍රචාරය කළා කියන චෝදනාව තමයි තිබෙන්නේ. Senior DIGට විරුද්ධව මාධ්‍ය සාකච්ඡාවේදී ප්‍රශ්නයක් ඇහුවා කියලා පෞද්ගලික වෛරයක් මත ඔහුගෙන් පළිගන්නවා. නමුත් අඩු ගණනේ ඔහුගෙන් ඒ පිළිබඳ කටඋත්තරයක්වත් අරගෙන නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා ඉතා පැහැදිලිව කියනවා නීතියේ ආධිපත්‍යය ක්‍රියාත්මක වෙන්න නම් භාෂණයේ සහ ප්‍රකාශනයේ අයිතිය හරියට තහවුරු වෙන්න ඕනෑ බව. එම අයිතීන් උල්ලංඝනය කරමින් තමන්ගේ බලහත්කාරය පාවිච්චි කරන තැනකට නීතිය ක්‍රියාත්මක කරනවා නම් ඒක සාධාරණය නොවෙයි; යුක්තිය නොවෙයි. එවැනි දේවලින් අයිතීන් මර්දනය කිරීම කිසිසේත්ම අනුමත කරන්න බැහැ.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Next, the Hon. (Dr.) Suren Raghavan. You have 13 minutes.

[2.10 p.m.]

**ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon.(Dr.) Suren Raghavan)
Thank you, Mr. Deputy Chairman of Committees.

"தகுதி எனவொன்று நன்றே பகுதியால்
பாற்பட்டு ஒழுகப் பெறின்."

Sir, according to Thirukkural 111, justice is good only when it acts impartially regardless of human-made differences.

මා මේ විවාදයට සහභාගි වන්නේ ඉතාම කැමැත්තකින් සහ සතුටකින්. මන්ද යත්, දේශපාලන විද්‍යාව උගන්වන, ඉගෙන

ගන්නා කෙනෙකු හැටියට මා හිතන්නේ අද මේ විවාදය සඳහා ඉදිරිපත් කර තිබෙන සංශෝධන තුළින් සිදුවන්නේ අපගේ ප්‍රජාතන්ත්‍රවාදය හා නීතියේ ආධිපත්‍යය පිළිබඳව අප පොදු ප්‍රකාශනයක් ඇති කර ගැනීමයි. මට කලින් කථා කළ විපක්ෂයේ බොහෝ මන්ත්‍රීවරුන් කියා සිටියා, අපි ලිඛිතව මේ දේවල් ඉදිරිපත් කළාට ප්‍රායෝගික තලයේදී ඉතාම පසුගාමී ස්ථානයකයි ශ්‍රී ලංකාව සිටින්නේ කියලා. මම එතුමන්ලාට මතක් කරන්න කැමැතියි පසුගිය මාසයේ පළ වූ World Justice Projectහි වාර්තාවට අනුව ශ්‍රී ලංකාවේ නීතියේ ආධිපත්‍යයේ ස්ථානය 66 බව, රටවල් 193කින්. පාකිස්තානය සිටින්නේ 120වන ස්ථානයේ. ලෝකයේ ප්‍රබලම ප්‍රජාතන්ත්‍රවාදී රටක් වන ඉන්දියාව සිටින්නේ අපට වඩා පහළින්, 69වන ස්ථානයේ. ඉරානය සිටින්නේ 109වන ස්ථානයේ, චීනය සිටින්නේ 68වන ස්ථානයේ. නමුත් මෙතැනින් කියැවෙන්නේ ශ්‍රී ලංකාවේ සර්ව සාධාරණව, සැමවිටම යහපත්ව නීතිය ක්‍රියාත්මක වනවා කියන එක නොවෙයි, සංසන්දනය කිරීමක්. මන්ද යත්, ප්‍රජාතන්ත්‍රවාදය යන්නත් නීතියේ ආධිපත්‍යය යන්නත් නිතරම සංසන්දනාත්මකව සහ ගුණාත්මකව තිබෙන කාරණා දෙකක් සහ මූලධර්ම දෙකක් වන නිසා. අපි ඉදිරිපත් කර තිබෙන්නේ ඇතැම් අය කියන ආකාරයට window dressing එකක් වෙන්න පුළුවන්. නමුත්, අපි පටන් අරගෙන තිබෙනවා එතුමන්ලාට කරන්න බැරි වුණු, එතුමන්ලා තවමත් තුවාලයක් හැටියට තියාගෙන ඉන්නා වූ ප්‍රධාන කාරණා දෙකකට විසඳුම් දෙන්න. ඒ තමයි, එල්ටීටීඊ සිරකරුවන් හැටියට රඳවාගෙන සිටින රැඳවුම්කරුවන්ට දෙන වධහිංසා පිළිබඳව සහ ඊට පිළියම් යෙදීම පිළිබඳවත්, අතුරුදහන් වූවන් ලෙස නම් කළ අය වෙනුවෙන් වගකියන රජයක් හැටියට අපට ගත හැකි පළමුවන පියවර තැබීමත්. ඒක පවා එතුමන්ලා දකින්නේ සිල්ලර ව්‍යාපාරයක් හැටියටයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම හිතනවා ඒ හරහා එතුමන්ලා රටේ නීතිය සහ නීතියේ ප්‍රතිසංස්කරණ විහිළුවට සහ හාස්‍යයට ලක් කිරීමක් සිදු කළ බව. මන්ද යත්, ප්‍රජාතන්ත්‍රවාදී රටක ඉතාම මෘදු ස්ථානය මෙන්ම ඉතාම දැඩි ස්ථානය තිබෙන්නේ නීතියේ ආධිපත්‍යය හා එම නීතිය ව්‍යවහාරිකව කෙසේ නම් අප පිළිගනීද යන්න තුළයි. කිසි දා නොකැඩිය යුතු සම්බන්ධතා දෙකක් තමයි ප්‍රජාතන්ත්‍රවාදය සහ නීතියේ ආධිපත්‍යය කියන්නේ.

Sir, the rule of law is the cornerstone of contemporary constitutional democracy, as you agree with me. Its role in cementing the recent transaction all over the world is understood, particularly bringing those dictatorial States of the former Soviet Union to democratization in the new process. Those countries kept the rule of law as their compass, as their mind for directional pathfinding in how they would transit and transform their own society. In the absence of the rule of law, contemporary constitutional democracy would be impossible. Beyond that, however, it is not clear what precise characteristics the rule of law must possess to help sustain constitutional democracy.

Therefore, I welcome the Hon. Minister of Justice. He, being a "minority", as this country calls them - possibly his community has faced violence and the most number of cases of human rights violations as much as the community that I represent did - took the chance, the opportunity and the space he has to bring forward these transforming changes.

As great Prophet Isaiah says, learn to do good; seek justice; correct the oppression; bring justice to the fatherless and plead the case of widows.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙම සන්දර්භය ඉතා වැදගත්. මේ රජය බලයට පත් වන විට බොහෝ විවේචකයන් කියා සිටියේ, නැවතත් සුදු වෑන් එනවා, "ONUR ආයතනය වහනවා, අතුරුදහන්වූවන් පිළිබඳ කාර්යාලය වහනවා, Office for Reparations වහනවා" කියලායි. නමුත්, යුද්ධය නිමා කළ ආරක්ෂක ලේකම්වරයා ජනාධිපතිවරයා හැටියට ඉන්න කාලයක තමයි මෙවැනි වූ ප්‍රතිසංස්කරණ, ප්‍රගතිශීලී නීති අපේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ. ඒකෙන් තේරෙන්නේ, යහ පාලන ආණ්ඩුව සමයේ හුදෙක් ලේබල් ගහගෙන හිටියාට නීතිය ක්‍රියාත්මක කරවීමට අවශ්‍ය ආයතනවලට අදාළ කටයුතු හරියාකාරව සිදු කර නොමැති බවයි. අප අද තබා තිබෙන්නේ එහි පළමු පියවරයි.

මෙය ඉතා දිගු ගමනක්. අපි ඒක පිළිගන්නවා. හුඟාක් වැරදි තිබෙන්න පුළුවන්. හිස්තැන් තිබෙන්න පුළුවන්. නමුත් ගමන සාර්ථක වන්නේ, නිවැරැදි දිශාවෙන් ගමන ආරම්භය කළ විටයි. 2018 පෙබරවාරි 28වන දා තමන්ගේ විධායක බලය පාවිච්චි කරමින් මෙරට අතුරුදන්වූවන් පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීමේ ජනාධිපති කොමිසම පත් කළ හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාට අපි ස්තුතිවන්ත විය යුතුයි. මන්ද යත්, අද දෙමළ ජාතිවාදීන් විරුද්ධ වන කාරණයම එතුමා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගත් නිසායි.

අපේ රටේ නීතියේ ආධිපත්‍යය ශක්තිමත් කිරීමට කටයුතු කරන මේ මොහොතේ මා තවත් කාරණයක් මතක් කළ යුතුයි. අපේ රටේ මෑත ඉතිහාසයේ ඉතාම කෲර ලෙස, ම්ලේච්ඡ ලෙස නීතිය කඩ කළ අවස්ථා තිබෙනවා. එදා එල්ටීටීඊය සහ වෙනත් ආයුධ සන්නද්ධ කණ්ඩායම් විසින් පාලනය කරමින් සිටි මේ රටට අයත් සියයට 30ක ගොඩ භූමියේත්, සියයට 45ක මුහුදු ප්‍රදේශයේත් නීතියේ ආධිපත්‍යයට මොකද වුණේ? අදටත් මේ සභාව තුළත්, පිටත තිබෙන ඩයස්පෝරාව තුළත් ඒ ඒ කණ්ඩායම්වලට මතවාද අතිනුත්, ප්‍රජාතාන්ත්‍රික නොවන කටයුතු අතිනුත් උදව් කරන කණ්ඩායම් සිටින බව අපි මතක් කළ යුතුමයි.

ආචාර්ය නීලන් තිරුචෙල්වම් ලෝකයේ බිහි වුණු ප්‍රබල නීති විශාරදයෙක්. මේ සභාවේ ඉන්න කිසිම දෙමළ නියෝජිතයෙක් තවමත් කියලා නැහැ, ඒ මහා ප්‍රාඥයා අමු අමුවේ පාරේ මරා දැමීම නීතියේ ආධිපත්‍යයේ අවමස්ථානය වුණා කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි නීතියේ ආධිපත්‍යය පිහිටුවිය යුත්තේ එල්ටීටීඊ සාමාජිකයන් නිදහස් කිරීම නිසා පමණක් නොවෙයි. බොහෝ අය කිව්වා වාගේ, ඩයස්පෝරාවේ බලපෑම නිසාම නොවෙයි අපි එය කළ යුත්තේ. යුරෝපා සංගමයට, අපේ මේ යෝජනා භාර ගන්න එපා කියලා මේ අය කිව්වා. ඒ ගොල්ලන්ගේ audience එක යුරෝපා සංගමයයි. නමුත්, අපේ audience එක යුරෝපා සංගමය නොවෙයි. අපි මේ නීති ගෙනෙන්නේ යුරෝපා සංගමය අපට බලපෑම් කරන නිසාම නොවෙයි. ඒ අය අපට කියන බව ඇත්ත. නමුත්, ඒ අයගේ ඉතිහාසය දිහා බලද්දී තවත් රටක ප්‍රජාතන්ත්‍රවාදය පිහිටුවන්න ඒ ගොල්ලන් උදව් කරන්නේ කොහොමද කියන ප්‍රශ්නය මතු වනවා. අපි මේ නීති සම්ප්‍රදාය, ප්‍රතිපත්ති ගෙනෙන්නේ ශ්‍රී ලංකාවට මේක අවශ්‍ය නිසායි. We bring in these laws because Sri Lanka needs to be a constitutional democracy, Sir. That is the reason why we are bringing in these laws. We also need to be a country which believes in Dhamma; we need to be a country which is managed by Dhamma. අපි ධර්මය ගැන කථා කරන රටක් පමණක් නොවෙයි, ධර්මයේ හැසිරෙන රටක් ද විය යුතුයි. ඒ නිසා තමයි අපි මේ නීති ගෙනෙන්නේ. එහෙම නැතිව, යුරෝපා සංගමය කියන විධියට නොවෙයි අපි මේවා කරන්නේ. කෙනෙක් යුරෝපා සංගමයට මේක පෙන්වා, මේක වැරදියි කියන්න උත්සාහ කරනවා නම්, අපි ඔවුන්ට කියන්නේ, එසේ කටයුතු

[ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා]

කරන්න එපා කියලා. ඔවුන්ට ශ්‍රී ලාංකිකයන් වෙන්න කියලායි අපි කියන්නේ. ශ්‍රී ලාංකිකයන් අවුරුදු 29ක් වැනි දීර්ඝ කාලයක් තිස්සේ මේ රටේ අනීතික තත්ත්වයන්ට මුහුණ දුන්නා. තුවක්කු, මිලේච්ඡ විධියට මේ රටේ නීතිය පහත් මට්ටමට ඇද දමා තිබූ ඒ යුගය අපි නිමා කළා.

ඒ යුගය නිමා කර අවුරුදු 11ක් ගත වී තිබෙනවා. නීති සම්ප්‍රදාය ගැන දන්නා වෘත්තීය නීතිඥයන් කිහිප දෙනෙක් මේ ගරු සභාවේ ඉන්නවා. ඒ අය දන්නවා, යුක්තිය පිහිටුවීම යනු සත්‍යය සොයා යනවා වාගේම ගවේෂණයක් බව. එය ලෙහෙසි නැහැ. එම නිසා යුක්තිය සහ සාධාරණත්වය තම දේශපාලන පැවැත්ම වෙනුවෙන් පමණක් පටු විධියට පාවිච්චි කරන පක්ෂ හා පුද්ගලයන්ට කියන්න තිබෙන්නේ, යුක්තියේ ආධිපත්‍යයෙන් තොර සැබෑ ප්‍රජාතන්ත්‍රවාදයක් නොමැති බවයි. අපි ඒ ප්‍රජාතන්ත්‍රවාදී ගමන යන්න අවශ්‍යයි. පක්ෂ, පාට, ප්‍රදේශ, කුල වැනි දේවල් අමතක කර අපි යා යුතු ගමන ආරම්භ කළ යුතුයි.

අද මේ පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම ගැන ගරු අමාත්‍යතුමාටත්, කැබිනට් මණ්ඩලයටත්, ඒ වෙනුවෙන් උපදෙස් දුන් අතිගරු ජනාධිපතිතුමාටත් මා ස්තුතිවන්ත වෙනවා. යුක්තිගරුක ශ්‍රී ලංකාවක් වෙනුවෙන්, ප්‍රජාතන්ත්‍රවාදී ශ්‍රී ලංකාවක් වෙනුවෙන් අපි නිරන්තරයෙන් කටයුතු කළ යුතු වනවා. පක්ෂ භේද, භාෂා භේද ඇතුළු පටු දේශපාලන අරමුණුවලින් එහාට ගොස් අපේ ජාතියත්, මව්බිමත් ඔසවා තබන්නට තබා තිබෙන මේ පියවර, දීර්ඝ ගමනක ප්‍රථම පියවර හැටියට මම දකිනවා. ඒ වෙනුවෙන් නැවත වතාවත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Next, the Hon. (Mrs.) Thalatha Athukorala. You have ten minutes.

Order please! Before she starts, will an Hon. Member propose the Hon. Isuru Dodangoda to the Chair?

**ගරු දයාසිරි ජයසේකර මහතා (බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟලුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர - பத்திக், கைத்தறி துணிகள் மற்றும் உள்நாட்டு ஆடை உற்பத்தி இராஜாங்க அமைச்சர்)
The Hon. Dayasiri Jayasekara - State Minister of Batik, Handloom and Local Apparel Products)
Sir, I propose that the Hon. Isuru Dodangoda do now take the Chair.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாபா)
(The Hon. Anura Priyadharshana Yapa)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு இசுரு தொடன்கொட அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. ISURU DODANGODA *took the Chair.*

[අ.භා. 2.21]

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அதுகோரல)
(The Hon. (Mrs.) Thalatha Athukorala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ හිතවත් හිටපු ආණ්ඩුකාරතුමා කිව්වා, සුදු වැන් එයි කියලා අපි කිව්වා ලු. නැහැ, හිටපු ආණ්ඩුකාරතුමනි.

**ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon.(Dr.) Suren Raghavan)
"විවේචකයන්" කියලායි මා කිව්වේ. මොකද, එහෙම වෙලා නැහැ නේ.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அதுகோரல)
(The Hon. (Mrs.) Thalatha Athukorala)
ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට කියන්න හදන්නේ, දැන් සුදු වැන් නැහැ කියලායි. ඒක දැන් පොඩ්ඩක් වෙනස් වෙලා. කෙළින්ම ගෙදරට ඇවිල්ලා පහර දීලා, උස්සාගෙන යනවා. ඊයේ පෙරේදා අසේල සම්පත් කියන කෙනා හොයා ගත්තේත් පස්සේ නේ.

කෙසේ වෙතත්, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයට 43(ආ) ලෙස අලුත් වගන්තියක් එකතු කරමින් කරන ලද සංශෝධනය පිළිබඳව අපි ඉතාම සන්තෝෂ වෙනවා. ඒ කටයුත්ත කරන්නේ විදේශ බලපෑම් නිසා ද, වෙන තත්ත්වයක් නිසාද කියන්න දන්නේ නැහැ. කොහොම කෙරුණත් එය විය යුතු දෙයක්.

ඉතිහාසයේ සාමාන්‍යයෙන් සැකකරුවෙකු පොලීසියකට ගෙන ගියාම, පොලිස් ආඥා පනතට අනුව නීතිඥ මහත්මයකුට ගිහිල්ලා ඒ අවශ්‍ය කටයුතු කරන්න පුළුවන්. දැන් මේ කරන සංශෝධනයත් එක්ක මහෙස්ත්‍රාත්තුමෙකුට තමන්ගේ අධිකරණ බලප්‍රදේශය තුළ තිබෙන පොලිස් ස්ථානවල සිටින සැකකරුවන් ගැන සොයා බලන්නට -සුබසාධනය සම්බන්ධයෙන් වෙන්න පුළුවන්, වෙනත් කටයුතු සම්බන්ධයෙන් වෙන්න පුළුවන්- මසකට වරක් පොලීසියකට යන්න අවස්ථාව ලැබෙනවා. ඒ අනුව, මහෙස්ත්‍රාත්තුමෙකුට පෞද්ගලිකව ගිහිල්ලා තනිවම ඒ සැකකරුවෙක් එක්ක කථා කරන්න, ඔහු ගැන සොයා බලන්න, පැමිණිල්ලක් තිබෙනවා නම් ඒක වාර්තා කරන්න, කුමන හෝ වෛද්‍ය ප්‍රතිකාරයක් අවශ්‍ය නම් වෛද්‍යවරයෙකුට ඉදිරිපත් කරන්න බලය ලැබෙනවා. මොනවා හෝ තුවාලයක් තිබෙනවා, එහෙම නැත්නම් පහර දීමක් පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා කියලා, වෛද්‍යවරයා කිව්වොත් ඒ ගැන පොලිස්පතිවරයාට දන්වන්න පුළුවන්, නීතිපති මඟින් නඩු කටයුත්තක් පටන් ගන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ICCPR සහ වධහිංසාවට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය -UNCAT - වැනි ජාත්‍යන්තර සම්මුති කිහිපයක් සමඟම අපි බැඳී සිටිනවා. පසුගිය කාලයේ මානව හිමිකම් කොමිෂන් සභාවේත්, යුරෝපා පාර්ලිමේන්තුවේත් ඉදිරිපත් වුණු සහ සම්මත කරන ලද යෝජනා එක්ක බලනකොට, මේ වාගේ පියවරක් ගැනීම ගැන කවුරුවත් සෑහීමකට පත් කරන්න පුළුවන් වෙයි කියලා මම හිතන්නේ නැහැ. මොකද, අපි මුලින්ම මේ සම්බන්ධයෙන් නිසි යන්ත්‍රණයක් සකස් කරන්න අවශ්‍යයි. මොකද, මේ කාරණයේදී කුමක් හෝ පැමිණිල්ලක් කරන්නේ පොලිස් නිලධාරියෙකුට විරුද්ධවයි. එතකොට පොලිස් දෙපාර්තමේන්තුවට ඒ පැමිණිල්ල විභාග කරන්න, ඒ සම්බන්ධයෙන් යම්කිසි පියවරක් ගන්න සිදු වනවා නම්, ඒකට කවදාවත් සාධාරණයක් ඉටු වෙන්නේ නැති බව අපිට අනිවාර්යයෙන්ම කියන්න වෙනවා.

ඒ සම්බන්ධයෙන් නිසි යන්ත්‍රණයක් සැදිය යුතු වනවා වාගේම, එය අනිවාර්යයෙන්ම පොලිස් දෙපාර්තමේන්තුවෙන් පරිබාහිරව විය යුතුයි කියා මා මේ වෙලාවේ ඔබතුමාට කියනවා, ගරු ඇමතිතුමනි. ඒක පොලීසිය භාර මහජන ආරක්ෂක අමාත්‍යාංශය යටතේ හෝ කළාට කමක් නැහැ. නීති හැදුවාට වැඩක් නැහැ, ඒ නීති ක්‍රියාත්මක කිරීමේදී යම් යම් අඩු පාඩුකම් සිද්ධ වනවා නම්. එහෙම වෙනවා නම්, නීති සෑදීම සඳහා ඔබතුමන්ලා කාලය නාස්ති කරලා කරන කැප කිරීම්වලිනුත් වැඩක් වෙන්නේ නැහැ. අපි දන්නවා පසුගිය කාලයේ ඒ වාගේ සිදුවීම් දෙකතුනක් වූ බව. ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා නීතිඥ සංගමය ගැන. ඔබතුමාත්, මමත් දෙදෙනාම එහි සාමාජිකයන්. පසුගිය දවස්වල නීතිඥ සංගමය පැමිණිල්ලක් කළා, යම්කිසි සැකකාරයෙකු සම්බන්ධයෙන්. මම දන්නේ නැහැ ඒ ගොල්ලන් ඒ කරුණු සොයා ගත්තේ කොහොමද කියලා. පොලිස්පතිවරයාට පැමිණිල්ලක් කළා, එම සැකකරුගේ ජීවිතයට අවදානමක් තිබෙනවා කියලා. හැබැයි, රැයක ගෙනහිල්ලා ආයුධ හොයන ගමන් ඔහු මරා දැම්මා. මේ වනතෙක් ඒ සම්බන්ධයෙන් පොලිස්පතිවරයා නිසි පරීක්ෂණයක් කළාද කියා හෝ ඒ සම්බන්ධයෙන් පොලිස්පතිවරයා ගත් ක්‍රියා මාර්ගයක් ගැන හෝ අපි කවුරුවත් දන්නේ නැහැ. මේ හදන නීතිවල අවසාන ප්‍රතිඵලය වශයෙන් එවැනි සිදුවීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම පොලිස්පතිවරයාට පැවරෙනවා නම්, ඒකෙන් කිසිම සැකකාරයෙකුට සාධාරණයක් ඉටු වනවා කියා මම හිතන්නේ නැහැ. මේ රටේ තිබෙන, අප සාමාජිකත්වය දරන නීතිඥ සංගමය කළ පැමිණිල්ලක්වත් ගණන් ගත්තේ නැති, ඒ ගැන ක්‍රියාත්මක වුණේ නැති තත්ත්වයකට තමයි අද මේ රට පත් වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා, රඳවා ගැනීමේ නියෝගයක් ආරක්ෂක ඇමතිවරයාට නිකුත් කරන්න පුළුවන් බව. මේ රටේ ආරක්ෂක ඇමතිවරයා, අතිගරු ජනාධිපතිතුමා. රඳවා ගැනීමේ නියෝග නිකුත් කරලා එතුමාට පුළුවන්, මාස 18ක් වනතෙක් මාස 3න් 3ට රඳවා ගැනීමේ නියෝගය අලුත් කරන්න, අපේ රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමව තබාගෙන සිටිනවා වාගේ. හැබැයි, ඒ විධියට රඳවා තබාගෙන හිටපු මනුස්සයෙකුත් ගෙනියනවා; ඊට පසුව හදිසියේම නන්නාඳුනන පිරිසක් ඇවිල්ලා වෙඩි තියලා ඔහු මරනවා. ඔහු මත් ද්‍රව්‍ය හොයන්න ගෙන ගියාද කියන්න මම දන්නේ නැහැ. ඔහු සැකකරුවෙකු වෙන්න පුළුවන්; පාතාල නායකයෙකු වෙන්න පුළුවන්. ඒ අය වැරැදි කරපු මිනිසුන් වෙන්න පුළුවන්. නමුත්, තවම කිසිම උසාවියකින් ඒ සිද්ධියට අදාළ වග කිව යුත්තන්ට දඬුවම් දීලා නැහැ, ගරු ඇමතිතුමනි. එතකොට, මේ රටේ ආරක්ෂක ඇමතිවරයාගේ තත්ත්වය මොකක්ද? එතුමා දීපු නියෝගයක් ගැනවත්, එතුමා විසින් භාර දී තිබෙන පුද්ගලයෙකු ගැනවත් කිසිම සැලකිල්ලක් දක්වන්නේ නැහැ. මෙතැනදී නැවතත් අපට ඔබතුමාට කියන්න සිද්ධ වන්නේ, මේ සඳහා නිසි යන්ත්‍රණයක් අනිවාර්යයෙන්ම අවශ්‍ය වන බවයි. නමුත් මම දන්නේ නැහැ, ඒ වෙනුවෙන් වැඩ පිළිවෙළක් තිබෙනවාද නැද්ද කියලා.

පසු ගිය දවස්වල අපි දැක්කා, ගවේෂණාත්මක මාධ්‍යවේදියෙකු වන තරිඳු ජයවර්ධනට කරපු දේ. ඕනෑම මාධ්‍යවේදියෙකුට මාධ්‍ය සාකච්ඡාවකට ගිහින් නිදහසේ තමන්ට කැමැති ප්‍රශ්නයක් අහන්න පුළුවන්. ඒ මාධ්‍යවේදියා මාධ්‍ය සාකච්ඡාවකට ගිහින් අහපු ප්‍රශ්නයක් පිළිබඳ ප්‍රවෘත්තියක් තමන්ගේ මුහුණුපොතේ දැම්මා ම, බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා ඒ මුහුණුපොතට comment එකක් දානවා, "ප්‍රභාකරන්ට වෙච්ච දේ වෙනවාට කැමැතිද?" කියලා අහලා. කියන්න කනගාටුයි, අපේ හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා එදා මෙතැන කරපු කථාවකට, අතිගරු ජනාධිපතිතුමා ඇහුවා, ප්‍රභාකරන් බල්ලෙක් වාගේ ඇදගෙන ආ හැටි මතකද කියලා.

මේ රටේ සාමය ආරක්ෂා කරන්න තිබෙන, ඒ වාගේම සියලුදෙනාට යන්න තිබෙන එකම තැන පොලීසියයි. බස්නාහිර පළාත භාරව වැඩ කරන නියෝජ්‍ය පොලිස්පතිවරයා අර අහිංසක මාධ්‍යවේදියාගේ මුහුණුපොතට ඒ විධියේ comment එකක් දානවා. කොහේද, ගරු ඇමතිතුමනි අපි යන්නේ? මම දන්නේ නැහැ EU එකේ concerns ද, එහෙම නැත්නම් UNHCR එකේ concerns ද කියලා. අපි බලයේ සිටින විටත් මේ ගැන මේ විධියටම කථා වුණා. ඒ වෙලාවේ පොලීසිය භාර අමාත්‍යාංශය, ගරු අගමැතිතුමා සහ විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා තමයි ඒ වැඩ ටික කෙරුණේ. දැන් සුදු වෑන් ගැන කථා කරනවා. 2014 වර්ෂයට පෙර ලසන්තට, එක්නැලිගොඩට, එහෙම නැත්නම් පෝද්දල ජයන්තට වෙච්ච දේ ද, "සිරස" ආයතනයට ගිනි තැබීම වාගේ සිද්ධි ද ආපසු වෙන්න යන්නේ කියන සැකය අපට ඇති වන බව මම මේ අවස්ථාවේ කියන්න ඕනෑ.

මේ තත්ත්වය අනුව, පොලීසියට පමණක් නොවෙයි, බන්ධනාගාරයටත් ගිහිල්ලා සොයා බැලීම් කරන්න මහෙස්ත්‍රාත්වරයෙකුට බලය දෙන්න. බන්ධනාගාර තුළත් ඝාතන සිදු වෙනවා. පසු ගිය දවස්වල මහර බන්ධනාගාරයේ වෙච්ච සිද්ධිය සම්බන්ධයෙන් තවම හරි විස්තරයක් නැහැ. ගරු ඇමතිතුමනි, අපි දන්නේ නැහැ, ඔබතුමා ඒ සම්බන්ධයෙන් ක්‍රියා මාර්ගයක් ගත්තාද කියලා. මොකද, අපි මාධ්‍ය හරහා එවැනි දෙයක් දැක්කේ නැහැ. අද සෞඛ්‍ය නීති උල්ලංඝනය කළාය කියා පොලීසිවලට යන අයටත් සමහර වෙලාවට මරණය හිමි වී තිබෙනවා.

අවසාන වශයෙන්, මා තවත් කාරණයක් කියන්න ඕනෑ. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සාමාජිකයන්ගේ වැටුප් හා දීමනා ප්‍රතිශෝධනය කිරීම සම්බන්ධයෙන් අපි ඇත්තටම සන්තෝෂ වෙනවා. ඔවුන්ගේ දීමනා වැඩි කිරීම ගැන අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. මොකද, මෙවන් යන්ත්‍රණයක් ශක්තිමත්ව දේශීයව පැවතුණොත්, විදේශීය වශයෙන් අපට කෙරෙන අත පෙවීම් අඩු වෙනවා. එතකොට ඒ කිසි කෙනෙක් මේ කටයුතුවලට අත පොවන්න එන්නේ නැහැ. එවිට අපේ වැඩ කටයුතු අපට බලාගන්න පුළුවන්. අපි පසුගිය කාලයේ ගොඩක් උත්සාහ කළා, ඒ තත්ත්වය ඇති කරන්න.

ගරු ඇමතිතුමනි, මම අවසාන වශයෙන් කනගාටුවෙන් වුණත් එක කාරණයක් කියන්න ඕනෑ. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සභාපතිවරයා හැටියට කටයුතු කළ ජනාධිපති නීතිඥ සාලිය පීරිස් මහත්මයා නීතිඥ සංගමයේ සභාපති ධුරයට තරග කළ වෙලාවේ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ දැනට සාමාජිකයෙකු වෙලා සිටින නීතිඥ මහත්මයෙකු එතුමාගේ මුහුණු පොතේ comment එකක් දමා තිබුණා. මම මෙතැනදී ඒ ගැන කියන්න කැමැති නැහැ. පසුගිය කාලයේ ඒවා ගැන කියලා ඔහු අහනවා, "ඒ වාගේ අයට ද, නීතිඥ සංගමය භාර දෙන්න යන්නේ" කියලා. එතුමාට අවමන් කළේ ඇයි? අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ස්ථාපිත කළේ උතුරු-නැගෙනහිර පළාත්වල අතුරුදහන් වූවන් වෙනුවෙන් පමණක් නොවෙයි. 1983 කාලයේ ඉඳලා මේ වනතුරු ම අතුරුදහන් වූ හැම කෙනෙකුම සම්බන්ධයෙන් නිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම, චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ පාලන කාලයේ සිට පටන් ගත් දෙයක්. අපි හිතනවා, ගරු ඇමතිතුමා මේ කෙරේ අවශ්‍ය අවධානය යොමු කරාවි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ කාලය ලබා දුන් ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු දයාසිරි ජයසේකර රාජ්‍ය අමාත්‍යතුමා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.31]

**ගරු දයාසිරි ජයසේකර මහතා (බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟලුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர - பத்திக், கைத்தறி துணிகள் மற்றும் உள்நாட்டு ஆடை உற்பத்தி இராஜாங்க அமைச்சர்)
The Hon. Dayasiri Jayasekara - State Minister of Batik, Handloom and Local Apparel Products)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ කාලය ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. දෙවැනි වර කියවා සම්මත කිරීමට නියමිත පනත් කෙටුම්පත් දෙකක් ඇතුළු කාරණා කිහිපයක් පිළිබඳව සාකච්ඡා කරන මේ වෙලාවේ මම මූලික වශයෙන් කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න කල්පනා කරනවා.

මෙය, අපේ රට එක පැත්තකින්, රටක් විධියට විශාල අර්බුද ගණනාවකට මුහුණ දී තිබෙන වෙලාවක්. මේ කාල වකවානුව තුළ මේ රටට විරුද්ධව සහ මේ ආණ්ඩුවට විරුද්ධව අද ජාත්‍යන්තර වශයෙන් පවා ප්‍රශ්න ගණනාවක් ඇති කරමින් තිබෙනවා. එක පැත්තකින්, අප අපේ සංවර්ධන ක්‍රියා දාමයන් ඉස්සරහට ගෙන යන කොට, අපේ අලුත් ආයෝජන ප්‍රතිපත්ති ඉස්සරහට ගෙන යන කොට ඒවාට -විශේෂයෙන්ම චීනය එක්ක කරගෙන ගෙන යන සංවර්ධන ක්‍රියාදාමයට- එරෙහි වන විවිධ බලවේග තිබෙනවා. අපේ රට, හැම රටක් සමඟම සහයෝගයෙන් වැඩ කරන රටක්. අපි එක රටක් හෝ ජාතියක් එක්ක පමණක් නොවෙයි කටයුතු කරන්නේ. නමුත්, රටක් විධියට අප ගන්නා වූ නිශ්චිත ක්‍රියා මාර්ග ආපස්සට හැරවීමේ ක්‍රියාවලියක් විශාල වශයෙන් සිදු කරමින් තිබෙනවා. විශේෂයෙන්ම ජාත්‍යන්තර වශයෙන් එවැන්නක් සිදු වෙනවා. මෙය, එක රටක් පමණක් නොව රටවල් ගණනාවක් එකතු වෙලා කරගෙන යන ක්‍රියාවලියක්. මේ සම්බන්ධයෙන් අපට කරන්න තිබෙන්නේ, ඔවුන් එක්ක රණ්ඩු කරගැනීමයි කියා මම කියන්නේ නැහැ. ඒක නොවෙයි කළ යුතුව තිබෙන්නේ. ඔවුන් සමඟ සාකච්ඡා කරමින්, ඔවුන්ගේ අරමුණු හරියාකාරව හඳුනා ගනිමින්, ඔවුන් අප තල්ලු කරන්න හදන්නේ කොහේටද කියන කාරණය අවබෝධ කර ගනිමින්, ඔවුන් සමඟ ගනුදෙනු කරමින් රටක් විධියට ඉදිරියට යෑම තමයි අප මෙහිදී කළ යුතුව තිබෙන්නේ. විවිධ රටවල සිද්ධ වන ක්‍රියාවලි පිළිබඳව අප මේ ගරු සභාව තුළ සාකච්ඡා කළ යුතුයි. නමුත්, අපි මේ පාර්ලිමේන්තුව ඇතුළේ ඒවා ගැන සාකච්ඡා කරනවා අඩුයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දෙමළ ජාතික සන්ධානය ඇවිල්ලා එක එක කාරණා කිව්වාම, එම කාරණාම අරගෙන පිට රටවල සිටින දෙමළ ඩයස්පෝරාවේ අය වැඩ කරන විධිය, ඊට පසුව ඔවුන් ඒවායෙන් ජීවත් වන විධිය, ඒක මේ රටට කොයි ආකාරයට බලපානවාද කියන කාරණය පිළිබඳව අපි කවුරුවත් ඒ තරම් දුරට කල්පනා කරන්නේ නැහැ. මේ ක්‍රියාවලිය පිළිබඳව මා තව දුරටත් යමක් කිව යුතුයි. 2019 වර්ෂයේදී තනිගසලාම් කියන පුද්ගලයා Ontario Province එකේ ඔවුන්ගේ සභාවෙන් ගෙන ආ යෝජනාවලියක් දිගින් දිගටම ඉදිරිපත් කළා. First Reading කළේ, 2019 අප්‍රේල් 30වැනි දා.

ඊළඟ ක්‍රියාවලියට යනවා 2021 මැයි මාසයේ 12වැනි දා. දැන් මෙකෙන් ඔවුන් කියන්න හදන්නේ මොකක්ද? ඔවුන් කියන්න හදන්නේ, "2009 යුදමය වාතාවරණය තුළ දැවැන්ත මනුෂ්‍ය ඝාතනයක්, නැත්නම් විශාල genocide එකක් සිද්ධ වුණා. ඒකෙන් දෙමළ ජනතාවට විශාල විනාශයක් සිද්ධ වුණා, දෙමළ ජනතාව 40,000ත්, 75,000ත් අතර ප්‍රමාණයක් මරා දැම්මා" කියන එකයි. මෙකේ බොහොම පැහැදිලිව කියනවා, "The United Nations Organization estimates that in May, 2009 alone about 40,000 to 75,000 Tamil civilians were killed. Other estimates place the death toll at 146,679 civilians. These figures only reflect the death toll in 2009 leading up to May 18th, the day on which the civil war ended." කියලා. දැන් මේ කියන්න හදන්නේ මොකක්ද? මේ කාලවකවානුව තුළ 40,000ත්, 75,000ත් අතර ප්‍රමාණයක් මරා දැම්මා; genocide එකක් සිදුවුණා කියලායි. ඒ කියන්නේ මිනිස්සු එක තැන මරා දැම්මා කියන එකයි. ජර්මනියේ ඇඩොල්ෆ් හිට්ලර්ගේ කාලයේ කළා වාගේ, විලි දේශයේ ඔගස්ටෝ පිනෝචේ කළා වාගේ මේ රටේ 40,000ත්, 75,000ත් අතර ප්‍රමාණයක් දෙමළ ජනතාව ඝාතනය කළා කියලා තමයි ඔවුන් කියන්න හදන්නේ. දැන් මේවාට තටු එන්නේ මේ පාර්ලිමේන්තුව ඇතුළේම දමිළ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරු ඇවිල්ලා කරන එක එක ප්‍රකාශ එක්ක. මොකද, මේවා පාවිච්චි කරලා යුරෝපා රටවල සිටින අය තමන්ගේ දෙමළ ඩයස්පෝරාවේ ක්‍රියාවලිය ඉස්සරහට ගෙන යනවා. දැන් මේවා සම්බන්ධයෙන් කවුරුවත් කථා කළේ නැහැ. 2019 අප්‍රේල් මාසයේ තමයි මේ කථාව පටන් ගත්තේ. එවකට පාර්ලිමේන්තුවේ මැති ඇමතිවරු කථා කළේත් නැහැ; විදේශ ඇමති කථා කළේ නැහැ; කවුරුවත් මේ ගැන කථා කළේ නැහැ. දැන් ඒක දිගින් දිගටම ඔවුන් ගෙන යනවා. "The United Nations Organization estimates ...." කියලා තමයි මේකෙන් කියන්නේ. හැබැයි, එහෙම එකක් වුණේ නැහැ. බොහොම පැහැදිලිව දරුස්මාන් වාර්තාවේ කියනවා, දමිළ ජාතිකයන් 40,000ක ප්‍රමාණයක් මරා දැම්මා කියලා. මේ රටේ දමිළ, මුස්ලිම්, සිංහල කියලා භේදයක් නැතිව අපි සියලු දෙනාම ඇස් දෙකෙන් දැක්කා, වෙල්ලමුල්ලිවයික්කාල්වල ඉඳන් විශාල අමාරුවකින් එළියට ආපු ලක්ෂ තුනකට වැඩි ජනතාවක් අපේ හමුදාව විසින් බේරා ගත්ත ආකාරය. මේ අයගේ සමහර දරුවෝ අපේ හමුදාවේ අය උස්සාගෙනයි අරගෙන ආවේ. සමහර අම්මලා, තාත්තලා ඇතුළු චූටි දරුවෝ කරේ තියාගෙනයි අපේ හමුදාවේ අය අරගෙන ගියේ. එහෙම තමයි ඒ අය අරගෙන ගියේ.

හැබැයි, ඒ වෙලාවේ මෙන්න මේ ලක්ෂ තුනක් පමණ වෙච්ච ජනතාවට වෙඩි තියලා, ෂෙල් ගහලා, ගෑස් ගහලා මොනවා හරි කරලා මරා දැම්මා නම් කියන්න පුළුවන් genocide එකක් කියලා. නමුත් අපි ලක්ෂ තුනක විතර දමිළ ජනතාව බේරා ගත්තා. ඊළාම් යුද්ධයේදී "ඊළාම් පාඩෙයි, මක්කල් පාඩෙයි" කියලා බලඇණියක් තිබුණා. මේවා නිත්‍ය බලඇණි. විශේෂයෙන්ම ඒ අයගේ සන්නද්ධ අය ලෙස සැලකූ dog tag එක තිබිච්ච අය හැර, - LTTE සංවිධානයේ මේ කියන අය හැර- මම කලින් කිව්වා වාගේ "ඊළාම් පාඩෙයි, මක්කල් පාඩෙයි" කියලා 7,000ක විතර ප්‍රමාණයක් හිටියා. ඒ අය සාමාන්‍ය ගොවියෝ; සාමාන්‍ය අහිංසක මිනිස්සු. මේ අයට අවි ආයුධ දීලා, තුවක්කු දීලා, උදලු දීලා මොනයම් විධියකින් හෝ පහර දෙන්න පුළුවන් අය විධියටයි හුරු කරලා තිබුණේ. මේ අයත් හමුදාවක් විධියට තමයි අවසාන වශයෙන් පාවිච්චි වුණේ. ඒ සිවිල් යුද්ධයේදී යම් ප්‍රමාණයක් මිය යන්න ඇති. ඒක වෙනම කාරණයක්. නමුත් පැහැදිලිව අපි කියන්න කැමැතියි, මේ කියන ආකාරයේ මනුෂ්‍ය ඝාතනයක් සිද්ධ වුණේ නැහැ කියලා. දැන් මේ කරන්න හදන්නේ මොකක්ද? මේ ගෙනෙන වැඩ පිළිවෙළ තුළ ඒ ගොල්ලන් යෝජනා කරනවා, දින හතක කාල සීමාවක් "Ggenocide Education Week" එකක් - the Bill proclaims the seven-day period in each year ending on May 18 as Tamil Genocide Education Week - ලෙස ප්‍රකාශයට පත් කරන්න කියලා. මේ තුළින් අපේ අහිංසක දමිළ ජනතාව තුළ, දමිළ දරුවන් තුළ, අපේ පළමුවැනි, දෙවැනි, තුන්වැනි පරම්පරාවල දරුවන්ගේ සිත් තුළ ඇති වෙන්නේ වෙනත් ආකල්පයක්. ලංකාවේ දමිළ ජනතාවට විශාල විනාශයක්, හිරිහැරයක්, කරදරයක්, - torture කිරීමක් - සිද්ධ වෙනවා කියලා තමයි මේ කියන්න හදන්නේ. ඒ වාගේ තත්ත්වයක් තමයි ඇති කරන්නයි හදන්නේ. අපි මේ ගැන පාර්ලිමේන්තුව තුළ කථා කරනවා විතරක් නොවෙයි, අපේ විදේශ කටයුතු අමාත්‍යාංශයත් එක්ක එකතු වෙලා මේකට විරුද්ධව අනිවාර්යයෙන් යම් පියවරක් ගත යුතුයි. මොකද අද වන විට කැනඩාවේ ජීවත් වෙන ශ්‍රී

ලාංකිකයන් වන සිංහල, දමිළ, මුස්ලිම් සාමාන්‍ය ජනතාව සියලුදෙනා විශාල භීතියකට පත් වෙලා තිබෙනවා, මේ වාගේ යෝජනා හැම පළාතකින්ම එන්න පටන් ගත්තොත් ඇති වන තත්ත්වය මොකක්ද කියලා. ඒ නිසා විශාල අර්බුදයක් ඇතිවෙලා තිබෙනවා. සිංහල ජනතාවට අද දමිළ ප්‍රදේශවල ජීවත් වෙන්න බැරි තැනට පත් වෙලා තිබෙනවා.

මේක විශාල අර්බුදයක්. මේ ගැන මේ පාර්ලිමේන්තුව තුළ කථා කළ යුතුයි. රටක් ඇතුළේ මේ කාරණා සිද්ධ වෙනවාය කියන එක තුළින් ඔවුන් අවසානයේ බලාපොරොත්තු වන්නේ මොකක්ද? ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට මතක ඇති, ලංකාවේ 38දෙනෙකු මේ යුද අපරාධවලට සම්බන්ධයි කියලා දරුස්මාන් වාර්තාවේ තිබුණු බව. ඒක කොහේවත් යන කැලෑ පත්තරයක්. මේ 38දෙනාගේ නම් ටික අද ලෝකයේ කොහේටවත් යන්න බැරි අයගේ නම් ලැයිස්තුවකට දමා තිබෙනවා. මේක හැම තැනම සිද්ධ වෙන්න පුළුවන්. කැනඩාවේ, ඇමෙරිකාවේ විතරක් නොවෙයි, දමිළ ඩයස්පෝරාව ක්‍රියාත්මක වන හැම තැනකම මේක සිද්ධ වුණොත්, ලංකාවේ යුද්ධයට සම්බන්ධ වුණු රණවිරුවන් විශාල සංඛ්‍යාවකට විශාල අර්බුදයක් බවට පත් වෙනවා. ඒ නිසා මම කියන්න කැමැතියි, මේ වාගේ පනත් ගෙනෙන්න කලින් මේ වාගේ දේවල් නවත්වන්නේ කොහොමද කියලා අපි සාකච්ඡා කළ යුතු බව. දෙවනුව කළ යුතු අනෙක් කාරණය තමයි, ඒවාට අවශ්‍ය වැඩ පිළිවෙළ අපි සකස් කළ යුතු වීම. එහෙම නොවුණොත් අප බිත්තියට හේත්තු කරලා, ශ්‍රී ලංකාව ඒ අයට වුවමනා විධියට පාලනය කර ගන්න පුළුවන් වැඩ පිළිවෙළක් සකස් කිරීම එක පැත්තකින් සිද්ධ වෙනවා. දෙවනුව, අනෙක් පැත්තෙන් රටක් විධියට අපට අපේ ස්වෛරීභාවය, ස්වාධීනත්වය ඉස්සරහට අරගෙන යන්න බැරි තැනකට පත් වෙනවා. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාත් දන්නවා ඇති මේ වාගේ තත්ත්වයක් ඇති වුණාම ජාත්‍යන්තර නීතිය අනුව, මානව වර්ගයාට එරෙහිව වන අපරාධ - crimes against humanity - විධියට තමයි මේ අයට විරුද්ධව මේ ක්‍රියාවලිය ගෙන ගියේ කියන එක. උදාහරණයක් විධියට ගත්තාම, චිලී රටේ හිටපු පිනෝචේ එංගලන්තයට අරගෙන ඇවිල්ලා, ඔහු එංගලන්තයේ ඇවිදිනකොට, එහි දාලා තිබුණු නඩුවකට ඔහු අත්අඩංගුවට අරගෙන, පසුව සිර භාරයට පත්කළා. ලංකාවේ අයත් මේ රටින් එළියට ගියාට පසුව මේ වාගේ ක්‍රියාවලි ගණනාවක් සිද්ධ වෙන්න පුළුවන්. යුගෝස්ලාවියාවේ යුධ සෙනෙවියෙකුට විරුද්ධව බෙල්ජියමේ නඩුවක් ගෙන ගියා. ඒරියල් ෂැරෝන් මහත්මයා ඒ කාලයේ ඊශ්‍රායලයේ හිටපු අග්‍රාමාත්‍යවරයෙක්. එතුමාට විරුද්ධවත් මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළා. මේ ක්‍රියාවලිය ඉස්සරහට ගෙන යන්න තිබෙන තත්ත්වය තව තවත් වැඩි දියුණු වෙනවා. එම නිසා මම කියන්න කැමැතියි, මේ පිළිබඳව රජයක් විධියට අපි කටයුතු කළ යුතුයි කියන ස්ථාවරයේ මම ඉන්නවාය කියන කාරණය.

ඊළඟට, මේ GSP Plus සම්බන්ධවත් මම කියන්න කැමැතියි. අද ලංකාවේ මේ සම්බන්ධව විශාල කාර්යභාරයක්, නැත්නම් සාකච්ඡාවක් සිද්ධ වෙමින් තිබෙනවා. අපේ අධිකරණ ඇමතිතුමා ඒකට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා. විශේෂයෙන්ම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට සංශෝධන ගණනාවක් අපි ඉදිරිපත් කර තිබෙනවා. මේක මේ කාටවත් බයේ කරන එකක් නොවෙයි. පසුගිය ආණ්ඩුව කාලයේත් මේ සම්බන්ධ යෝජනාවලියක් ගෙනැල්ලා තිබුණා. ඒ කාලයේ කැබිනට් මණ්ඩලයේ සිටියදී මමත් ඒ සමහර ඒවාට විරුද්ධ වුණා. ඒ ගෙන ආ යෝජනාවලියට සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා සම්පූර්ණයෙන්ම විරුද්ධ වුණා. අපි විතරක් නොවෙයි විරුද්ධ වුණේ. රවුෆ් හකීම් මැතිතුමා මෙම ගරු සභාවේ ඉන්නවා. ඔබතුමාට මතක ඇති, ඒ ගෙන ආ යෝජනාවලියට සජිත් ප්‍රේමදාස මැතිතුමා කොයිතරම් විරුද්ධ වුණාද කියන එක. ඒ වාගේම, අනෙකුත් ඇමතිවරුත් විරුද්ධ වෙලා ඒක අකුළාගන්න සිද්ධ වුණා. අපේ අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමාත් මේ අවස්ථාවේ ගරු සභාවේ සිටිනවා. එතුමාත් දන්නවා ඇති, ජෝන් සෙනෙවිරත්න මැතිතුමාත් දන්නවා ඇති, අපි ඒකට විරුද්ධ වුණා. මේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සංශෝධනය කළ යුතුයි. හැබැයි, ඒ ක්‍රියාවලිය ලංකාවේ අනාගතය වෙනුවෙන් සිදු විය යුතුයි. ලංකාවේ පැවැති ත්‍රස්තවාදය විතරක් නොවෙයි, අනාගතයේ යුද්ධයක් ආවොත් මීට වඩා භයානක වෙන්න පුළුවන්. ඒ වාගේ තත්ත්වයක් වළක්වන්න පුළුවන් නවීන නීති ක්‍රමවේදයක් ගෙනෙන්න ඕනෑ. අපේ අලි සබ්රි ඇමතිතුමා දැන් එම ක්‍රියාවලිය ඉදිරියට ගෙනැල්ලා තිබෙනවා කියලා මා හිතනවා. ජාත්‍යන්තරව අපට තියෙන සහයෝගය අනුව, යුරෝපය, ඇමෙරිකාව ඇතුළු රටවල් සියල්ල එක්ක අපි අපේ ගනුදෙනු කරනකොට පැහැදිලිව අපි මේ ක්‍රියාවලිය තුළ ඉදිරියට යා යුතුයි කියන ස්ථාවරයේ මම ඉන්නවා. වෙන හේතුවක් නිසා නොවෙයි. අපට පළමුව රටක් අවශ්‍යයි. රටක් අවශ්‍ය නම් අපි ඒ රටවල් එක්ක වැඩ කරන ක්‍රියාදාමයේ දී නිවැරදි ජාත්‍යන්තර ප්‍රමිති එක්ක වැඩ කිරීම අත්‍යවශ්‍ය කාරණයක් බවට පත් වෙලා තිබෙනවා. හැබැයි එම ක්‍රියාවලිය සිද්ධ වෙනකොට රටක් විධියට අපි ඒ රටවල් මත සිටිමින් අපේ සියලු දේවල් පාවා දෙනවාද නැද්ද කියන කාරණය පිළිබඳව අපි සියලුදෙනා කල්පනා කරන්න ඕනෑ. එපමණයි; වෙන දෙයක් නොවෙයි. අපි ජාත්‍යන්තරයේ තියෙන නීතිරීතිවලට අනුගත වෙනවා වාගේම, ඔවුන් එක්ක ක්‍රියා කරනවා වාගේම, අප පෙරළා පාලනය කිරීමට ඔවුන්ට තිබෙන අයිතිය අහෝසි කරන වැඩ පිළිවෙළක් තුළයි අප ඉදිරියට යා යුත්තේ කියා මා විශ්වාස කරනවා.

විශේෂයෙන්ම අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සාමාජිකයන්ගේ වැටුප් වැඩිවීම සම්බන්ධවත්, වැඩි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සම්බන්ධවත් ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රවුෆ් හකීම් මැතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[2.44 p.m.]

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)

Hon. Presiding Member, we are trying to pass some of these Legislations today as an attempt to improve our criminal justice system when it comes to the liberty of the individual. Today, this afternoon, the Hon. Minister was heard to say that the Government follows a policy of zero tolerance against torture. These are all very pious words; these are all, I would say, utopian dreams. To make it a reality, there needs to be a paradigm shift in the manner in which we administer our criminal justice system. It is a known fact that torture is an endemic problem in the culture of policing in this country.

Together with that comes the need to have a relook at the Prevention of Terrorism Act. Several speakers before me had talked about the Act itself being a very temporary one when it was enacted way back in 1979. But, in its implementation, we have found that it had paved the way for terrible abuse of suspects in custody, particularly when it comes to torture. Torture is not simply physical

[ගරු රවුෆ් හකීම් මහතා ]

torture. What about the mental trauma that you subject an individual when you subject him to administrative detention without any judicial supervision for months on end? For almost one and a half years, you can keep somebody incarcerated without any judicial supervision. So, it is a very draconian piece of legislation which must be revised and we must bring an end to this endemic culture of torture. Arbitrary detention finally ends up in facilitated torture; you facilitate torture by arbitrarily detaining somebody. We have several such people in such detention centres in several places of this country.

Then, I would quote here what the United Nations Special Rapporteur on the Promotion and Protection of Human Rights and Fundamental Freedoms while Countering Terrorism said in 2017:

" ..it -"

That is, the Prevention of Terrorism Act.

"- has fostered the endemic and systemic use of torture. Entire communities have been stigmatized and targeted for harassment and arbitrary arrest and detention."

We saw what happened after the Easter Sunday attacks. Almost 2000 to 3,000 Muslims were arrested *en masse* and detained. Subsequently, over a long period of time, one by one, several got released. There are 200 others in custody. Among those are some young people who have even got university entrance; some have even got entrance to the Medical College and there are also engineering students under custody. If there is substantial evidence, bring those young people before the court of law and charge them. But now, you are adopting another procedure which some dictatorial, despotic countries have adopted. That is, to set up detention centres where you go with a de-radicalization programme. You have already published a Gazette, but there are certain anomalies in that. If you want to de-radicalize somebody, first produce the evidence before a judge and show why he had been held in custody, why he should be de-radicalized and what are the reasons for that.

You also use various other provisions. About several other notable detainees, we have talked several times. Against Mr. Hejaas Hizbullah, a young lawyer who has been detained for a long time, now you have decided to file a case under hate speech provisions of the ICCPR Act. Up to now, you have only been able to do that. And you have known to have tortured and pressurized witnesses to incriminate him saying that he took part in various radicalization classes, all of which has a figment of the imagination of some of those people who have other vested interests to achieve. So, the abuse of these provisions have finally resulted in the European Union looking at it in a roundabout way, bringing some economic sanctions. When I say economic sanctions, the Preferential Tariff Arrangements are in danger today because of our attitude towards the people who are under custody.

Then, you go and pardon 16 detainees who were held under the PTA, and under that pretext, you slowly also pardon a murder convict to appease one of your supporters who has a very popular TV station, who has been singing your hosannas for several years now and who was responsible even to bring you to power. There are two specific TV stations which have been amply rewarded by several means.

Some are also being awarded tenders to buy rapid antigen test kits and all sorts of things. So, these things are happening. These things are being monitored and looked at. If you look at what is happening in the outside world today, it is very obvious that the Government is becoming unpopular by the day. So, you need all these friends who run electronic media to boost your sagging morale. So, what do you do? You go and pardoned 16 PTA detainees along with another person whom you have pardoned when he had been under the death sentence confirmed by five senior Judges of the Supreme Court. That is a very cynical move. It is seen as a cynical move for nothing else because most of those 16 detainees had been under detention for more than 10 years. Some of them, even if they were convicted, would have already served the sentence, having been there for so many years. So, such cynical moves will be laughed at by the international community. We have already invited a lot of wrath from well-meaning friends among the international community.

Now, let me also move on to some of the other issues. Particularly the Criminal Investigation Department, the Attorney-General's Department, all these departments are those which had a certain sense of pride in their work. They were seen as very independent institutions. But, because of unnecessary politicization and pressure, they are seem to be losing their independence.

You appoint a Presidential Commission on Political Victimization and some of the Commissioners are instructing the Attorney-General's Department to discontinue cases which have already been filed in courts and which are in the process of being heard. The Attorney-General openly comes and protests about that. You are also blaming and passing strictures on members of the Attorney-General's Department who have sincerely done their duty and work. So, such is the attempt that is causing all these problems for us in the international arena. Therefore, we need to have a relook at all these things; we need to have some reform in these areas. Particularly, I would urge the Hon. Minister to look at the so-called de-radicalization Gazette and the manner in which it is going to be implemented. I saw that you have enlisted some Muslim theologians and learned men to de-radicalize those young detainees. By doing such a programme without sufficient evidence against them, you will only radicalize them rather than de-radicalizing. That is what I feel. Therefore, these matters have to be looked at with a different approach and then some of these issues need to be corrected.

I would also talk about the Office for Reparations. The Hon. Minister said that it was a substitute for REPPIA. Now, there are several compensation issues

pertaining to the Digana riots, the riots in Ampara and the riots in the Kurunegala District, for which large amounts are still to be doled out. Therefore, those people who have suffered serious property damage have to be compensated. I hope the Government will look into it and have those matters also attended through the Office for Reparations very soon.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. Jayantha Weerasinghe, PC. You have 13 minutes.

[අ.භා.2.56]

**ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා**
(மாண்புமிகு (சனாதிபதி சட்டத்தரணி) ஜயந்த வீரசிங்க)
(The Hon. Jayantha Weerasinghe, PC)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෑම පැයෙන් පසු මම මේ ගරු සභාවට එනකොට රේඩියෝ එකේ මට ඇහුණා, ගරු දයාසිරි ජයසේකර මැතිතුමා කළ කථාව. ඒ කථාව ගැන මම බොහොම සතුටුවනවා. ඒ වාගේම මම එම කථාව බොහොම අගය කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තරම් කෙටි කාලයක් ඇතුළත සමාජයට, රටට අත්‍යවශ්‍ය වෙලා තිබුණු නීති ගණනාවක් කෙටුම්පත් කර ඉදිරිපත් කිරීම ගැන ප්‍රථමයෙන්ම ගරු අධිකරණ ඇමතිතුමාට මම ස්තුතිවන්ත වනවා. ගරු ඇමතිතුමනි, මේ පනත් කෙටුම්පත් හදන්න මගේ දායකත්වයත් ලැබුණා. මාත් එම committeesවල සිටියා. ඒ නිසා ඔබතුමා මෙපමණ ඉක්මනට මේ පනත් කෙටුම්පත් ගෙන ඒම මටත් ආඩම්බරයක්. හැබැයි, මේ සම්බන්ධයෙන් විපක්ෂය කථා කරන විධිය දැක්කාම මට කනගාටුවක් දැනෙනවා. හැබැයි අද කියනවා, "cynical approach" කියලා. මේක නිකම් පිට රටවලට පෙන්වන්න මේ ආණ්ඩුව කරන දෙයක් කියලා එතුමන්ලා කියනවා. ඒක සම්පූර්ණයෙන් වැරදියි. නිවැරදි දෙයක් කළත් විපක්ෂයට වැරදියි, වැරදි දෙයක් කළත් එහෙමයි.

මේ ගරු සභාවේ සිටින ද්‍රවිඩ ජාතික මන්ත්‍රීවරු -විශේෂයෙන්ම චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමා- මේ සම්බන්ධයෙන් මා දරන අදහස් පිළිබඳව දන්නවා. මීට මාස ගණනාවකට පෙර එතුමන්ලා මට ඇවිල්ලා කිව්වා, "සාක්ෂි නැතිව LTTE එකේ බොහෝ දෙනෙකු අවුරුදු ගණනාවක් තිස්සේ නිකම් ඇතුළේ තබාගෙන ඉන්නවා. ඒ ගොල්ලන් වෙනුවෙන් කථා කරන්න ඉදිරිපත් වන්න පුළුවන්ද?" කියලා. මම කිව්වා, "පුළුවන්" කියලා. මොකද, මගේ ප්‍රතිපත්තියත් ඒක. සාක්ෂි නැතිව කෙනෙකු ඇතුළේ තබාගන්න බැහැ. ඊට පස්සේ කොළයක් ගෙනැල්ලා මටත් අත්සන් කරන්න කිව්වා. මමත් ඒක අත්සන් කරලා දුන්නා. ඒ කොළයේ මගේ අත්සන ඇති. ඊට පස්සේ එතුමා මගෙන් ඇවිල්ලා ඇහුවා, "අපි ජනාධිපතිතුමා හම්බ වන්න ගියොත් මේ අය වෙනුවෙන් කථා කරන්න ඔබතුමාත් එනවාද?" කියලා. මම කිව්වා, "මම එන්නම්" කියලා. ඒ ගැන නිර්මලනාදන් මන්ත්‍රීතුමා දන්නවා. අපි එහෙම සාධාරණ විධියටයි වැඩ කරන්නේ. මම ඒ අනුව ඉතා සතුටුවනවා, ගරු අධිකරණ හිටපු ඇමතිතුමා ඔය කියන "cynical" කෑලි මොකුත් නැතිව ඇත්ත වශයෙන්ම සමාජයට, පුරවැසියන්ට යහපතක් වන මේ පනත් කෙටුම්පත ගෙන ඒම පිළිබඳව. මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කථා කරන්න කලින් මට තවත් කාරණයක් කියන්න තිබෙනවා.

ගරු නාමල් රාජපක්ෂ ඇමතිතුමා පසුගිය දිනක ගෙනා යෝජනාව ගැන විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු කථා කරපු විධිය ගැන මට පුදුම හිතුණා. එතුමා එදා කෙළින්ම කිව්වා, සාක්ෂි නැති නිසා LTTE සාමාජිකයන් සහ අනෙක් අය මෙපමණ පිරිසක් එළියට දමන්න අපි ලැහැස්තිවනවා කියලා. මම හිතුවා, විපක්ෂයේ සුළු ජාතික පක්ෂ නියෝජනය කරන මන්ත්‍රීවරු මෙම යෝජනාවට පක්ෂව හිටගෙන ඔල්වරසන් දෙයි කියලා; I thought they would give a standing acclamation. නමුත්, වුණේ ඒකේ අනික් පැත්ත. ඒ අවස්ථාවේදී ගරු කථානායකතුමාගෙන් එක් මන්ත්‍රීවරයකු ඇහුවා, "මොන ස්ථාවර නියෝගය යටතේද ගරු නාමල් රාජපක්ෂ ඇමතිතුමාට ඒ යෝජනාව ඉදිරිපත් කරන්න ඉඩ දුන්නේ" කියලා. ජනතාවට සහන දෙනවා නම්, ස්ථාවර නියෝග අවශ්‍ය වනවාද? ඒකට බලපාන්නේ ස්ථාවර නියෝගයද? ඒකද issue එක? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහරුන්ට හිඟන්නාගේ තුවාලය - like the beggar's wound - වාගේ වෙලා තිබුණු, හැම දාම පහසුවට අරගෙන ජාත්‍යන්තරයට පෙන්වමින් රටේ තරුණ ජනතාව නොමඟ යවමින්, අපට ලොකු අසාධාරණයක් වෙනවා, අපි පාගාගෙන ඉන්නවා කියන එක පෙන්වමින් ඡන්දය ගන්න තිබුණු අවස්ථාව දැන් ගිලිහී යන බව පෙනෙනකොට බොහොම අමාරු ඇති. නමුත්, අධිකරණ ඇමතිතුමා කටයුතු කළේ ඒ අනුව නොවෙයි. විශේෂයෙන්ම criminal නීතිය හා සම්බන්ධ ජනාධිපති නීතිඥවරයකු වශයෙන් මම, අධිකරණ ඇමතිතුමා විසින් මේ පනත් කෙටුම්පත ගෙන ඒම බොහොම අගය කරනවා.

මේකේ පැහැදිලිව කියලා තිබෙනවා, යම්කිසි කෙනෙකු අත්අඩංගුවට ගත්තාට පසු මහෙස්ත්‍රාත්තුමාට පෞද්ගලිකව ගිහින් බලන්න අයිතිය තිබෙනවා කියලා. විපක්ෂය කියන විධියට මේකෙන් ආණ්ඩුවට ගන්න තිබෙන credit එක මොකක්ද? අත්අඩංගුවට ගත් අයකු පෞද්ගලිකව ගිහින් බලන්න, ඒ පුද්ගලයා සමඟ කථා කරන්න මහෙස්ත්‍රාත්තුමාට අයිතිය තිබෙනවා කියලායි මේකේ කියන්නේ. ඒ අවස්ථාවේදී ඒ පුද්ගලයා එතුමාට කිව්වොත් "මට ගැහුවා" කියලා, එතුමාට ඒක නීතිපති දෙපාර්තමේන්තුවට වාර්තා කරන්න පුළුවන්. මොකද, යම් පුද්ගලයෙකුට විරුද්ධව නඩුවක් පවරා අවුරුදු 3කට, 4කට, 5කට පසුව "සර්, ඔය කටඋත්තරය මම දීපු එකක් නොවෙයි. මට ගහලායි ඒක ලියා ගත්තේ. කොච්චර ගැහුවාද කිව්වොත් මම රෝහලේ හිටියා" කිව්වොත්, අපට නඩුවට අවශ්‍ය වෛද්‍ය වාර්තාව ගෙන්වා ගන්න බැහැ. රෝහල්වලින් ඇහුවාම, "එහෙම එකක් නැහැ" කියනවා. Criminal Law සම්බන්ධ කටයුතු කරන නීතිඥවරු විධියට අපි මෙවැනි තත්ත්ව දැක තිබෙනවා. නමුත්, අද මේ ගෙනෙන සංශෝධනවලට අනුව ඉදිරියට එවැනි තත්ත්වයක් ඇති වෙන්නේ නැහැ. මොකද, එවැනි සිද්ධියකදී ඒ පුද්ගලයා වෛද්‍යවරයෙකුට යොමු කරන්නේ මහෙස්ත්‍රාත්තුමායි. ඒ ආකාරයට කටයුතු කළාම ඒ වෛද්‍ය වාර්තා බොහොම පරිස්සමට අරන් තියලා ඕනෑම අධිකරණයකින් ඉල්ලුවාම ඒවා ලබා දෙනවා. ඒ නිසා ගරු අධිකරණ ඇමතිතුමනි, මේ සංශෝධනය ගෙන ඒම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අද උදේ මම අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත කියෙව්වා. එහි දෙවැනි වගන්තියේ 3වන උප වගන්තිය යටතේ සඳහන් වනවා, "...අධිකරණ වෛද්‍ය නිලධරයකු වෙත හෝ ආණ්ඩුවේ වෛද්‍ය නිලධරයෙකු වෙත ඉදිරිපත් කරන ලෙස ද, එම වෛද්‍ය නිලධරයා විසින් මහෙස්ත්‍රාත්වරයා වෙත ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ද මහෙස්ත්‍රාත්වරයා විසින් විධාන කරනු ලැබිය හැකි ය." යනුවෙන්. ඒ කියන්නේ, වෛද්‍ය නිලධාරියෙක් වෙත ගෙන යනවා විතරක් නොවෙයි, JMOටත් ඉදිරිපත් කරන්න පුළුවන් කියන එකයි. අපි JMO වාර්තාව ඉල්ලුවාම JMOලා අපට කියනවා, "එහෙම ඒවා නැහැ" කියලා. ඒ නිසා මෙවැනි සංශෝධනයක් ගෙන ඒම තුළින් එවැනි

[ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා]

සිද්ධියකට මුහුණ පා සිටින මනුෂ්‍යයකුගේ අයිතිවාසිකම් සම්පූර්ණයෙන් ස්ථිර වෙනවා; ස්ථාපිත වෙනවා. වෛද්‍ය නිලධාරියා විසින් මහෙස්ත්‍රාත්වරයා වෙත ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්න ඕනෑ. එහෙම වාර්තාවක් ලබා දුන්නාම ඒක file එකකට දමලා, අංකයක් දමලා, ඒක වෙනත් ලේඛනයකත් සටහන් කරලා, උසාවියේ ලිපිගොනුවලට දමන්න මහෙස්ත්‍රාත්තුමාට සිදු වෙනවා. එවිට අපටත් අවශ්‍ය විටකදී එම ලේඛනයේ copy එකක් ගන්න පහසු වෙනවා.

ඊළඟට, පනත් කෙටුම්පතේ 5වන උප වගන්තිය යටතේ තිබෙන කාරණයත් බොහොම වැදගත්. එහි සඳහන් වනවා, "වධදීම සිදුකර ඇතැයි චෝදනා ලැබ සිටින තැනැත්තාට එරෙහිව අපරාධ නීති කෘත්‍යයක් ආරම්භ කිරීම සඳහා නීතිපතිවරයාට හැකි කරවනු පිණිස, කරන ලදැයි කියනු ලබන වධදීම පිළිබඳව විමර්ශනයක් ආරම්භ කරන ලෙස මහෙස්ත්‍රාත්වරයා විසින් පොලිස්පතිවරයා වෙත විධාන කිරීම ද කරනු ලැබිය යුතු ය." යනුවෙන්.

දැන් බලන්න, පුද්ගලයෙකුගේ නිදහස, විශේෂයෙන් අත්අඩංගුවට ගත් කෙනෙකුගේ නිදහස වෙනුවෙන් මේ තරම් දෙයක් කළ රජයකට සහ ඇමතිවරයෙකුට දොස් කියමින්, "මේවා කෙටි ප්‍රයෝජන ගන්න කරපුවා" කියලා සමහරු කියනවා. ජාත්‍යන්තර වශයෙන් එක එක ප්‍රයෝජන ගන්න මේ රජයට අවශ්‍යතාවක් නැහැ. එහෙම ප්‍රයෝජන ගන්න බලාගෙන නොවෙයි, මෙච්චර කල් වැඩ කළේ. එහෙම ප්‍රයෝජන බලාගෙන වැඩ නොකළ නිසා තමයි අපේ ගරු විදේශ ඇමතිවරයා ජිනීවාවලට ගිහින් කලින් විදේශ ඇමතිවරු දෙදෙනෙක් කටයුතු කළ ආකාරයට කටයුතු නොකළේ. ජිනීවාවලින් අපට විරුද්ධව ගෙන ආ චෝදනා පිළිගෙන, ලජ්ජා නැතිව මේ රටට ආපසු පය ගැහුවා වාගේ වැඩ නොකර, "අපේ හමුදා මිනී මරලා නැහැ, අපේ හමුදා වැරැදි කරලා නැහැ" කියලා අපේ විදේශ ඇමතිවරයා ජිනීවාවලදී කිව්වා. එහෙම කටයුතු කළ රජයකට මෙවැනි පනත් කෙටුම්පතක්, දෙකක් ගෙන ඒම හරහා ඒ කියන වාසි ගන්න අවශ්‍ය නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ ඉදිරිපත් කර තිබෙන සංශෝධන හරහා, ඒ අදාළ කාරණා සම්බන්ධයෙන් වැරැදිකරුවන් වන අයට අය කරන දඩ මුදලත් වැඩි කරලා තිබෙනවා.

ගරු අධිකරණ ඇමතිතුමා විසින් මෙවැනි amendments ගණනාවක් තව ගෙනෙන්න නියමිතව තිබෙනවා. යම් ප්‍රමාණයක් අපිත් සකස් කරලා එතුමාට දීලා තිබෙනවා. මේ කරපු කර්තව්‍යය වෙනුවෙන් අපි එතුමාට ස්තුතිවන්ත වනවා.

ඒත් එක්කම මම කියනවා, "අපේ හමුදාව මිනී මැරුවා"ය කියලා ජිනීවාවලට හෝ වෙන කොහේට හෝ ගිහින් කියන්න කවුරු හෝ බලාපොරොත්තුවෙන් ඉන්නවා නම් ඒවාට නිසි උත්තර අපි එදාට දෙන්නම්; දෙන්න ඕනෑ දවසට දෙන්නම් කියලා. අන්න ඒ අසත්‍ය හෙළි වනවාට තමයි දරුස්මාන් වාර්තාව ඉදිරිපත් කරනකොට ඩයස්පෝරාවේ කුණු බක්කිවලින් හොයා ගත්ත සාක්ෂි ටිකක් ඒකට දාලා ඒවා වසන් කරන්න රෙගුලාසියක් ගෙනාවේ. ඒ තමයි, අවුරුදු 20කට එහි මූලාශ්‍ර හොයන්න බැහැ කියන එක. වැඩේ නරක නැහැ නේද? කවුද මේවා කිව්වේ, මේවාට තිබෙන සාක්ෂි මොනවාද කියලා පෙන්වන්න අවුරුදු 20ක් යනකල් බැහැ. කොහොමද ඒ සෙල්ලම! එංගලන්තයේ සාමි මන්ත්‍රී මණ්ඩලයේදී නේස්බි සාමිවරයා පැහැදිලිව කිව්වා, "ශ්‍රී ලංකා හමුදාව ඔය කියන විධියට ලක්ෂ ගණන් මරලා නැහැ" කියලා. එතුමා පැහැදිලිව සංඛ්‍යාලේඛන දුන්නා. ඇමෙරිකානු ජාතිකයකු වන "ගැෂ්" කියන මහත්මයා එම තොරතුරු සටහන් කරලා තිබියදීත් ඒවා ඉදිරිපත් නොකර හංගලා තිබෙනවා. එහෙම කර කර අහිංසක දරුවන්ගේ කරේ සයනයිඩ් කරල එල්ලපු ඇඩෙලා බාලසිංහම් නෝනා එංගලන්තයේ යහතින් ඉන්නවා. හැබැයි, අපේ හමුදා නිලධාරියෙක් අතින් බෙල්ල පෙන්නුවාය කියලා ඔහුට විරුද්ධව නඩු දැම්මා. ඔන්න, ඩයස්පෝරාවේ ක්‍රියාකාරිත්වයේ තරම. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ඇමතිවරු මේ වාගේ නීති ගෙනැල්ලා මේ රටේ තිබෙන සාධාරණත්වය පෙන්නුවාම ඒ අයගේ කටවල් වැහෙයි කියලා මම හිතනවා.

මම මේ ගැන මීට වඩා කියන්න යන්නේ නැහැ. මේ සංශෝධන මෙච්චර ඉක්මනට ගෙන එන්න කටයුතු කිරීම ගැන ගරු අධිකරණ ඇමතිතුමාට නැවත වරක් ස්තුතිවන්ත වෙමින්, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.08]

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අධිකරණ ක්ෂේත්‍රයට අදාළ පනත් ගණනාවකට සංශෝධන ගෙනැවිත් තිබෙන මේ මොහොතේ විශේෂයෙන් අප මතක් කළ යුතුයි, අපේ රටේ මෑත ඉතිහාසයේ ජනතාව ඝාතනය වුණු, තුවාල ලබපු ඉතා බිහිසුණු සහ දරුණු ප්‍රහාරයක් වන අප්‍රේල් 21වන දා - පාස්කු ඉරිදා- සිදු වූ බෝම්බ ප්‍රහාරයෙන් අසරණ වූ ජනතාවට තවමත් සාධාරණයක් ඉටු වෙලා නැති බව. මේ රටේ ජනතාව ඒ වෙනුවෙන් සාධාරණය බලාපොරොත්තුවෙන් ඉන්නවා. අපේ රටේ අධිකරණ පද්ධතිය කාර්යක්ෂම කරන්නට වාගේම, මේ රටේ ජනතාවගේ අයිතිවාසිකම් ශක්තිමත් කරන්නට අද මේ සංශෝධන ඉදිරිපත් කළත්, පාස්කු ඉරිදා ප්‍රහාරයට වග කිවයුත්තන්ට නඩු පැවරීම ඇතුළු ඒ අධිකරණ ක්‍රියාදාම අද වනකොටත් ඉතා ප්‍රමාද වෙලා තිබෙනවා කියලා මේ අවස්ථාවේ සියලුදෙනාටම මතක් කරන්න ඕනෑ. පාස්කු ඉරිදා ප්‍රහාරය පිළිබඳව විටින් විට කථා කළත්, මේ වන විට ඒ පිළිබඳව අමතක වන ප්‍රවණතාවක් මේ රටේ තිබෙනවා.

හිටපු නීතිපතිතුමා විශ්‍රාම යන්න ඉස්සෙල්ලා ප්‍රකාශ කළා, "පාස්කු ඉරිදා ප්‍රහාරය පිළිබඳ විශාල කුමන්ත්‍රණයක් තිබෙනවා" කියලා. "පොලිස් වාර්තා සහ විමර්ශන ඉක්මන් කරලා මේකට සාධාරණයක් ඉෂ්ට කරන්න" කියලා එතුමා පොලිස්පතිතුමාට ලිපියකුත් යැව්වා. නමුත්, අද වනතෙක් ඒ සම්බන්ධව ක්‍රියාත්මක වන බවක් අපි දකින්නේ නැහැ. වත්මන් රජය එදා බලයට එන්න දුන් ප්‍රධානම පොරොන්දුව තමයි, "පාස්කු ඉරිදා ප්‍රහාරයේ මහ මොළකරුවන් අල්ලනවා, නඩු දානවා, ඒ අයට විරුද්ධව කටයුතු කරනවා" කියන එක. එහෙම කියලායි බලයට ආවේ.

හිටපු නීතිපතිතුමාම කියපු ආකාරයට ඒවා නිවැරැදි කරන්න අද වන කල් කටයුතු කර තිබෙනවාද කියා රජයෙන් ප්‍රශ්න කරන්න අපට සිදු වෙනවා. ඒ බෝම්බ ප්‍රහාරයෙන් 267 දෙනකු මැරුණා; 500 දෙනකුට වඩා තුවාල වුණා; දේවස්ථාන තුනක්

විනාශ වුණා. ඊට අමතරව, මේ රටේ ප්‍රධාන පෙළේ හෝටල් කීපයකුත් විනාශ වුණා. ඒ ප්‍රහාරය නිසා අපේ ජනතාවගේ ආරක්ෂාවට මෙන්ම අපේ රටේ ආර්ථිකයට ද විශාල පහරක් වැදුණා. අපේ පොලිසිය භාර අමාත්‍යතුමා කලකට පෙර මේ පාර්ලිමේන්තුවේදී කිව්වා, "නවුෆර් මවුලවිතුමා තමයි එහි මහ මොළකරු" කියලා. නමුත්, අද වන කල් ඒ වෙනුවෙන් ගෙන තිබෙන ක්‍රියා මාර්ග මොනවාද කියා අපට මේ අවස්ථාවේදී ප්‍රශ්න කරන්න සිදු වෙනවා. යුක්තිය බලාපොරොත්තුවෙන් හිටපු කතෝලික ජනතාව ඇතුළු සමස්ත ජනතාවගේ බලාපොරොත්තු නඩු පැවරීම ප්‍රමාද කිරීම නිසා බිඳ වැටී තිබෙනවා. කතෝලික සභාව, කාදිනල් හිමිපාණන් වහන්සේ ඇතුළු සියලුදෙනා මේ රජයේ ක්‍රියා කලාපය ගැන කිසිම විශ්වාසයක් නැතිව අද කථා කරන්න පටන්ගෙන තිබෙනවා. ඒ හින්දා අපි මේ අවස්ථාවේදී නැවතත් රජයෙන් ඉල්ලා සිටිනවා, පාස්කු ඉරු දින ප්‍රහාරය පිළිබඳ විමර්ශන කඩිනම් කරලා, ඒ කටයුතු සම්පූර්ණයෙන් අවසන් කරලා, එහි මහ මොළකරුවන්ට පැන යන්න දෙන්නේ නැතිව, එදා තමන්ගේ ජීවිතවලින් වන්දි ගෙවපු, තුවාල ලැබූ සියලුදෙනා වෙනුවෙන් යුක්තිය ඉෂ්ට කරන්න කියා.

මෑත ඉතිහාසයේ තවත් භයානක ඛේදවාචකයක් වුණා. ඒ තමයි "එක්ස්ප්‍රස් පර්ල්" නෞකාව ගිනිගැනීම. ඒ තුළින් අපේ ධීවර ජනතාවට විශාල හානියක් සිදු වුණා. ඒ ධීවර ජනතාවට අද වන කොට තමන්ගේ ධීවර කටයුතු කරගන්න බැරිව තිබෙනවා. ඒ වාගේම රටේ ජනතාව බය වෙලා ඉන්නවා, ඒ සිදුවීම නිසා මත්ස්‍ය සම්පතට රසායන ද්‍රව්‍ය එකතු වෙලා තිබෙනවා කියා. මෙය, ඒ ධීවර ජනතාව වන්දියක් බලාපොරොත්තුවෙන් සිටින මොහොතක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්.

වන්දි ලබා දෙන බවට විවිධ අමාත්‍යවරුන් මේ ගරු සභාවේ යම් යම් ප්‍රකාශ කළත්, වන්දි ලබා දීම සඳහා අවශ්‍ය කරුණු ඉදිරිපත් කරන්න කියා ඒ ජනතාවගෙන් ඉල්ලා තිබුණත් එහි ප්‍රගතිය පිළිබඳව අද වන කොට අපට විශාල ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. මීගමුවට විතරක් නොවෙයි, ඒ ප්‍රදේශයෙන් ඉතා ඈත වෙන්නප්පුව, හලාවත, මන්නාරම වැනි ප්‍රදේශවලටත් එම සිදුවීමෙන් බලපෑම් එල්ල වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මේ වන විට වාර්තා වෙනවා, "එක්ස්ප්‍රස් පර්ල්" නෞකාවේ සුන් බුන් ඉන්දියාවට පවා ගසාගෙන ගිහින් තිබෙනවා කියා; ඒ රටේ මුහුදු සීමාවේ මුහුදු ජලයටත් ඒ නැවේ රසායනික ද්‍රව්‍ය මිශ්‍ර වී තිබෙනවා කියා.

අපේ ධීවර ප්‍රජාවට අවශ්‍ය වන්දි ලබා දීමට කඩිනමින් කටයුතු කරන්න. වන්දි ලබා දීමට තක්සේරු වාර්තා සකස් කරමින් අනුගමනය කළ යුතු යම් ක්‍රියා මාර්ගයක් තිබෙන බව අපි පිළිගන්නවා. නමුත්, ඒ ක්‍රියා මාර්ගය ගන්නවා වාගේම ඉන් ඔබ්බට ගිහින් ඒ අහිංසක ධීවර ජනතාවට වන්දි ලබා දීම සඳහා ඉක්මනින් කටයුතු කිරීමේ වගකීම මේ රජය සතු වනවා. එහිදී අපේ අධිකරණ අමාත්‍යතුමාගේ අධීක්ෂණය යටතේත් යම් යම් කාරණා ඉටු වෙන්න තිබෙනවා. ඒ නිසා අපි ඉල්ලා සිටිනවා, ඒ කටයුතු ඉක්මන් කරන්න කියා. ධීවර ජනතාව කියන්නේ ඉතාම අහිංසක ජනතාවක්; දරිද්‍රතාවෙන් පෙළෙන ජනතාවක්. තමන්ගේ ජීවනෝපාය අහිමි වන කොට ඒ අයට ජීවත් වෙන්න වෙනත් වත්කම් නැහැ. ඒ හින්දා ඔවුන්ට වන්දි ලබා දීමේ ක්‍රියාවලිය ඉක්මන් කරන්න කියමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

Order, please!

මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු මන්ත්‍රීවරයකුගේ නමක් යෝජනා කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු නිමල් පියතිස්ස මහතා**
(மாண்புமிகு நிமல் பியதிஸ்ஸ)
(The Hon. Nimal Piyathissa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු සමන්ප්‍රිය හේරත් මහතා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු මංජුලා දිසානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) மஞ்சுலா திசாநாயக்க)
(The Hon.(Mrs.) Manjula Dissanayake)

***විසින් ස්ථිර කරන ලදී***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන් ගරු සමන්ප්‍රිය හේරත් මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு இசுரு தொடன்கொட அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சமன்பிரிய ஹேரத் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. ISURU DODANGODA *left the Chair, and* THE HON. SAMANPRIYA HERATH *took the Chair.*

[අ.භා. 3.15]

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாபா)
(The Hon. Anura Priyadharshana Yapa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම ප්‍රායෝගික, ඉතාම කාලෝචිත, ඒ වාගේම රටක ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ මතවාදය තවදුරටත් ස්ථාවරභාවයට පත් කිරීම සඳහා හේතු වන සංශෝධන පනත් කෙටුම්පත් දෙකක් ගැන අද අපි ප්‍රධාන වශයෙන් සාකච්ඡා කරනවා.

මෙහිදී විශේෂයෙන්ම ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත ගැන කථා කරන්න මම කැමැතියි. මොකද, ඒ පනත පිළිබඳව අද මේ පාර්ලිමේන්තුවේදී මත ගණනාවක් ඉදිරිපත් වුණ නිසා. මම මේ පාර්ලිමේන්තුවට කියන්න කැමැතියි, එම පනතේ ආරම්භය ගැන අප කල්පනා කළ යුතු බව. ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත ගෙනාවේ 1980 ගණන්වල මේ රටේ ඇති වුණු ත්‍රස්තවාදය නිසායි. එය සුළුපටු ත්‍රස්තවාදයක් නොවෙයි. එය ලෝකයේ තිබෙන දරුණුම

[ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා]

ත්‍රස්තවාදය බවට පත් වෙලා, දළ වශයෙන් අවුරුදු 30ක් පමණ ක්‍රියාත්මක වෙමින් අපේ රට පසුපසට ඇදගෙන ගියා. එවැනි දැවැන්ත ත්‍රස්තවාදයක් අවසන් කිරීමට තමයි ඒ පනත ගෙනාවේ. මම හිතන්නේ නැහැ ඒ වන කොට යුරෝපයේවත්, වෙනත් රටවලවත් ඒ තරම් ප්‍රබල ත්‍රස්තවාදයක් පිළිබඳ අදහසක් තිබුණා කියලා. මොකද, අද ත්‍රස්තවාදය ගැන කථා කරන ඒ බොහෝ රටවල් ආයුධ සන්නද්ධ ත්‍රස්තවාදය පිළිබඳව අපේ රට ලැබූ තරම් ලොකු අත්දැකීම් තවමත් ලබා තිබෙනවා කියා මම විශ්වාස කරන්නේ නැහැ. ඒ රටවල බොහොම සාමකාමී සහජීවනයක් තමයි තිබෙන්නේ. ඒ රටවල වෙනත් ප්‍රශ්න තිබෙන්න පුළුවන්. ඒ රටවලටත් ආයුධ සන්නද්ධ ත්‍රස්තවාදයේ බරපතළකම තේරුණේ විශේෂයෙන් අන්තවාදී අදහස් දරන සමහර ආගමික කොටස්වල ක්‍රියාකාරකම් නිසායි. නමුත්, අපේ රට අවුරුදු ගණනක් තිස්සේ එය අත්වින්දා. ත්‍රස්තවාදය හේතුවෙන් අපේ රටේ විශාල පිරිසක් මිය ගියා. යම්කිසි ජන වර්ගයක් අපහසුතාවට පත් කිරීම සඳහා මා මෙසේ කියනවා නොවෙයි. ඒ ත්‍රස්තවාදය නිසා අපේ රටට විශාල පාඩුවක් සිදු වුණා. එමඟින් හැම කෙනෙකුටම පාඩුවක් සිදු වුණා. ඒ නිසා තමයි එදා එම පනත ගෙනාවේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා වාගේම, ආණ්ඩුවත් අද පිළිගෙන තිබෙනවා, නැවත වතාවක් විමසා බලා ඒ පනත සුදුසු පරිදි වෙනස් කළ යුතුයි කියලා. අද අපි සාකච්ඡා කරන්න ඕනෑ ඒ ගැනයි කියා මම හිතනවා. නමුත්, අද කථා කරන බොහෝදෙනෙකුට අමතක වෙලා තිබෙනවා, අපි කොපමණ භයානක කාලයක් පසුකරගෙන ආවාද කියන එක. 2009 වර්ෂයේ යුද්ධය අවසන් වනතුරු ම අපට නිවනක් තිබුණා කියා මම හිතන්නේ නැහැ. 2009 වර්ෂයේදී තමයි ඒ ගැටුම, ත්‍රස්තවාදී බලපෑම් අවම කර ගන්න අපට පුළුවන් වුණේ.

මම පිළිගන්නවා ඕනෑම ප්‍රජාතන්ත්‍රවාදි රටක නීති පද්ධතිය තුළ හැමෝටම සාධාරණයක් ඉටු වෙන්න ඕනෑ කියලා. ඕනෑම වරදක් කරන පුද්ගලයකුට නිසි පරිදි නීතිඥ සහාය ලබා ගැනීමට තිබෙන අයිතිය, තමා වෙනුවෙන් කථා කරන්න තිබෙන අයිතිය, නිසි නඩු විභාගයකට මුහුණ දීමේ අයිතිය සහ අසාධාරණ ලෙස සිරභාරයට පත් නොවී සිටීමේ අයිතිය කියන සියල්ල ආරක්ෂා වෙන්න ඕනෑය කියා මම විශ්වාස කරනවා. අමාරුම කාලයකින් පසුව අපි දැන් තමයි නැවත ප්‍රකෘති තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා අපට වෙනදාට වඩා වගකීමක් තිබෙනවා, අපි කොහොමද මේ කටයුත්ත කරන්නේ කියන කාරණය ගැන කල්පනා කරන්න.

අපි දන්නවා අපේ රටේ පොලීසියේ ක්‍රියාකාරිත්වය ගැන. මට මතකයි අපි අධිකරණවලට ගිය මුල් කාලයේ නඩු සම්බන්ධව කටයුතු කරන්න පොලීසියට වෙනම නිලධාරින් සිටි බව. ඒ අය, ඉතාම හොඳ දැනුමක් තිබුණු අය. ජනාධිපති නීතිඥ අපේ ජයන්ත වීරසිංහ මන්ත්‍රීතුමාටත් එය මතක ඇති කියා මම හිතනවා. නමුත් පසු ගිය කාලය තුළ, විශේෂයෙන් යුද්ධය පැවැති කාලය තුළ එම තත්ත්වය ක්‍රමානුකූලව ඉවත් වෙමින් ගිය බව අපි දැක්කා. එම නිසා පොලීසිය වෙත එල්ල වූ චෝදනාව තමයි, අපරාධ නඩුවක් විසඳීම සඳහා වන ක්‍රියාවලියේදී සාක්ෂි ලබා ගැනීම සඳහා ඒ අය බොහෝ දුරට තමන්ගේ බාහු බලය පාවිච්චි කරනවාය කියන එක. මේක තමයි ඇත්ත කථාව. ඒ නිසා තමයි නීති පද්ධති ගණනාවක විවිධ සංස්කරණ, එහෙම නැත්නම් වෙනස්කම් සිද්ධ වුණේ. අදත් මේ කරන්නේ ඒක තමයි.

නීතිඥවරයකුට තමන්ගේ සේවාදායකයා වෙනුවෙන් පොලීසියට ගිහින් පෙනී සිටීමේ අයිතිය පසුගිය කාලයේ ලබා දුන්නා. අපේ රටේ නීතියට අනුව වුණත් ලෝකයේ වෙනත් රටක නීතියකට අනුව වුණත් පුද්ගලයකු අත්අඩංගුවට ගන්නවා නම්, ඒ පුද්ගලයාට තිබෙන චෝදනාව කියන්න ඕනෑ, "තමුන් මෙන්න මේ වරද කරලා තිබෙනවා. ඒ නිසායි අත්අඩංගුවට ගන්නේ" කියලා. නමුත් සමහර අවස්ථාවල වන සිදුවීම් දෙස බලද්දී අපට පෙනෙනවා මේ මොහොත වනතුරුත් පොලීසිය එවැනි තත්ත්වයකට පත් වෙලා නැති බව. පොලීසිය ගිහින් අත්අඩංගුවට ගන්නා සමහර මිනිසුන් දන්නේ නැහැ තමන් අරගෙන යන්නේ මොකටද කියන එක වත්. ඒ නිසාම නඩු විභාගය පවත්වාගෙන යද්දී තමා වෙනුවෙන් පෙනී සිටින්න, එහෙම නැත්නම් තමන්ට ඇප ලබා ගන්න අවශ්‍ය නීතිඥ සහාය ලබා ගන්නවත් ඔහුට හැකියාවක් ලැබෙන්නේ නැහැ. අත්අඩංගුවට ගැනීම් සිද්ධ වන්නේ බොහෝ විට රාත්‍රියේ. ඒ නිසා ඒ මනුස්සයා දවසක් විතර කූඩුවේ ඉන්න ඕනෑ. අපේ ගරු අධිකරණ ඇමතිතුමා මේ කරුණු ගැන ඉතාම හොඳ අධ්‍යයනයක් කර තිබෙනවා කියා මම හිතනවා. අපේ රටේ නීතිය, ප්‍රජාතන්ත්‍රවාදී ලෝකයේ තිබෙන අනෙකුත් නීතිවලට සමපාත විය යුතුයි කියන තර්කයට විරුද්ධ තර්කයක් ගේන්න මම කොයි වෙලාවක වත් කැමැති නැහැ. නීතිය එසේ විය යුතුයි කියා මම පිළිගන්නවා.

අපේ නීති තත්ත්වය ලෝකයේ දියුණු රටවල නීති තත්ත්වය දක්වා පරිවර්තනය වෙනවා කියන්නේ හොඳ දෙයක්. මම කොහොමත් කැමැති නැහැ, පුද්ගලයෙක් රිමාන්ඩ් කරනවාට. රිමාන්ඩ් කළාට තේරුමක් නැහැ. මේ ආණ්ඩුව ආවාට පස්සේ පසුගිය කාලයේ දාපු සමහර නඩුවලින් සමහරු නිදහස් වුණා කියලා තමුන්නාන්සේලා කිව්වා; ලොකු චෝදනා ඉදිරිපත් කළා. හැබැයි, ඒ නඩු පැවරුවේ යම්කිසි ආකාරයක දේශපාලන වුවමනාවකට කියන කාරණය කවුරුත් අමතක කරනවා. ඒක තමයි ඇත්තටම සිද්ධ වුණේ. ඒ නිසා එම නඩු විනිශ්චයකාරතුමෙක් ඉදිරියට ගියාම එය පවත්වාගෙන යන්න කිසිම ආකාරයක හැකියාවක් නැහැ. ඒ නිසා එම පුද්ගලයන් නිදහස් කරනවා. දේශපාලන වශයෙන් නොවෙයි ඒ කටයුතු කළ යුත්තේ. පාර්ලිමේන්තුවට අයිතිවාසිකමක් නැහැ, නඩු කෘත්‍යයක තිබෙන කාරණා ගැන කථා කරන්නට. මොකද, ඒක අධිකරණ කාර්යයක් නිසා. ඒ නිසා මේ තත්ත්වය වෙනස් වෙලා මීට වඩා පුළුල් සංවාදයක් සහිත, මතවාදයක් සහිත නවීන ලෝකයට ගැළපෙන ලෙස ක්‍රියා කිරීමේ කටයුත්තකට අපි එළඹෙන්න ඕනෑ. මම එහෙම කියන්නේ මේ නිසායි. කොයි පැත්තක වුණත්, දේශපාලන හේතුවක් මත කවුරු හරි රිමාන්ඩ් කරනවාට මම කොහොමවත් කැමැති නැහැ. මම ඒකට කැමැති නැහැ. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක තිබෙන වැදගත් අංගය තමයි 'පුද්ගලයෙකුට හිරිහැර කිරීමට දේශපාලනය අවියක් නොවිය යුතුයි' කියන එක. නමුත් පසුගිය රජය කාලයේ ඒක වුණා. අපි ඒක දැක්කා. අපි ඒවාට විරුද්ධ වුණා. නමුත් ඒ වෙලාවේ ඒ සම්බන්ධයෙන් කරන්න දෙයක් තිබුණේ නැහැ. වෙනම අධිකරණ පද්ධති නොවෙයි, වෙනම පරීක්ෂණ ක්‍රමවේද හැදුවා. FCID කියලා එකක් හදලා ඒකට රජයේ නිලධාරින්, දේශපාලනඥයන් සහ වෙන වෙන අය බුරුතු පිටින් අරගෙන ගියා. ඒක මම දැක්කේ හරියට අර, සෝවියට් රුසියාවේ ස්ටාලින්ගේ යුගය වාගෙයි. මම ඒ උදාහරණය ගන්නේ ඒ රට එක්ක තිබෙන ගැටුමක් නිසා නොවෙයි. විශේෂයෙන් ස්ටාලින්ගේ යුගයේ තිබුණු ක්‍රමය වාගේම ක්‍රමයක් නිර්මාණය කරන්න එදා උත්සාහ කළා. ඒවා තමයි අපේ රටේ තිබුණු වැරදි. ඒ නිසා අපි කවුරුත් මේ ක්‍රමවේදවල වැරැද්ද තේරුම් අරගෙන නැවත සැරයක් ඒවා මේ රටේ සිදු නොවෙන්න කටයුතු කරන්න ඕනෑ. මොකද, දේශපාලන මතයක් දැරීම, දේශපාලනික වශයෙන් යම්කිසි ආකාරයක ක්‍රියාවක් කිරීම යන කාරණා සම්බන්ධයෙන් කවුරුන් හෝ රිමාන්ඩ් භාරයට පත්විය යුතුයි කියා මම විශ්වාස කරන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සංශෝධනයෙන් පමණක් අපේ රටේ ප්‍රශ්න විසඳෙන්නේ නැහැ කියන කාරණය මම මතක් කරන්න කැමැතියි. මේ සඳහා පොලීසිය සන්නද්ධ කරන්න ඕනෑ. අපි දන්නවා, පොලීසියට අවශ්‍ය පහසුකම් දෙන්න ඕනෑ බව. මොකද, පොලීසියෙන් තමයි අධිකරණයට නඩු ඉදිරිපත් කරන්නේ. නඩු ඉදිරිපත් කරන්න පෙර ඒ සම්බන්ධයෙන්

පරීක්ෂණ පවත්වන්න, කටඋත්තර ගන්න පොලිසියට තමයි බලය තිබෙන්නේ. ඒවා තමයි අධිකරණයට ගිහිල්ලා ඉදිරිපත් කරන්නේ. ඒ ඉදිරිපත් කරන කාරණාව සම්බන්ධයෙන් තමයි රජයේ නීතිඥයා වෙන්න පුළුවන්, වෙනත් නීතිඥ මහත්මයෙක් වෙන්න පුළුවන් පෙනී සිටින්නේ. විනිශ්චයකාරවරයා ඉදිරියේ තිබෙන කරුණු මත තමයි තීන්දුවක් දෙන්න බල කරලා තිබෙන්නේ. මොකද, වෙනම independent inquiry එකක් යන්නේ නැහැ නේ. නමුත් වෙනත් රටවල මේ තත්ත්වය හුඟක් වෙනස් වෙලා තිබෙනවා. පුද්ගලයෙක් යම්කිසි ආකාරයකට තමන්ගේ චිත්ති වාචකයක් ඉදිරිපත් කළා නම්, ඒ චිත්ති වාචකය සාධාරණ ද කියලා බලන ක්‍රමවේද ඒ රටවල දියුණු කරලා තිබෙනවා. අපේ රටේ එහෙම දියුණු කරලා නැහැ. ඒ නිසා පැහැදිලිව බැලුවොත් එවැනි චිත්ති වාචකයක් ගෙනාවා වුණත්, පොලිසිය ඉදිරිපත් කරන තොරතුරු මත රැඳිලා ඉදිරියට යන්න සිද්ධ වෙනවා. මොකද, ඒ අවශ්‍ය පහසුකම් කාටවත් දීලා නැති නිසා. අධිකරණවලට ඒ පහසුකම් දීලාත් නැහැ; නිලධාරින්ට පහසුකම් දීලාත් නැහැ; පුහුණුවක් දීලාත් නැහැ. ඒ වාගේම, නවීන තාක්ෂණ ක්‍රමවේද කොයි වෙලාවකවත් අත්හදා බලලා නැහැ. ඔබතුමන්ලා දකින්න ඇති, ඊයේ පෙරේදා ඇමෙරිකාව වාගේ රටවල නඩු අහලා වැරදිකාරයන් කළා වුණත්, ඒ පුද්ගලයා එය කළේ නැහැ කියලා පසු කාලීනව ඔප්පු වෙනකොට ඒ අය නිදහස් කිරීමේ ක්‍රමවේදයක් ඒ රටවල තිබෙනවා. ඉතින්, අපත් ඒ තත්ත්වය දක්වා වර්ධනය කර ගැනීමට අවශ්‍ය මූලාරම්භය තමයි අද අරගෙන තිබෙන්නේ. ඒ නිසා, මහේස්ත්‍රාත්වරයෙකු ගිහිල්ලා පොලිසිවල ඉන්න අය බලන්න ඕනෑය කියන එක, ඒ වාගේම ඒ අය අධිකරණ වෛද්‍ය නිලධාරිවරයෙකුට ඉදිරිපත් කරන්න ඉඩ ලබා දෙන එක, කෲර ලෙස හැසිරීම සම්බන්ධයෙන්, පහරදීම් සම්බන්ධයෙන්, අමානුෂික නින්දිත සැලකීම් සම්බන්ධයෙන් ක්‍රියාකිරීම, එහෙම නැත්නම් ඒ සම්බන්ධ දඬුවම් වැඩි කිරීමට ක්‍රියා කිරීම යන සියලු කාරණා ඉතාම හොඳ දේවල්. නමුත් පොලිසියට අවශ්‍ය පහසුකම් නොදීම තුළ මේවා ක්‍රියාත්මක කරන්න පුළුවන් වෙයි කියා මම හිතන්නේ නැහැ, ගරු අධිකරණ ඇමතිතුමනි.

මහජන ආරක්ෂක අමාත්‍ය ගරු සරත් වීරසේකර මැතිතුමාත් මේ අවස්ථාවේ ගරු සභාවේ ඉන්නවා. තාක්ෂණය දියුණු කිරීමෙන් හා නිලධාරින් පුහුණු කිරීමෙන්, අපරාධ කොට්ඨාසය තවදුරටත් ශක්තිමත් කිරීමෙන් තමයි මෙම සේවාවේ ප්‍රතිඵල ගන්න පුළුවන් වෙන්නේ. එහෙම නැත්නම් පැවැති පරණ ක්‍රමයම ක්‍රියාත්මක කරමින් අපි හැමදාම මේ ගැන සාකච්ඡා කරන එක පමණයි සිදුවන්නේ. අපි ඔක්කොම එකට එකතු වෙලා ඒ දියුණු කිරීම කළ යුතුයි.

අද පොලිසි ප්‍රමාණය වැඩි කිරීමට කටයුතු කරලා තිබෙනවා. ඒක හොඳ දෙයක්. හැබැයි, දේශපාලනඥයා කියන පුද්ගලයා මේ පොලිසිවලට අතගැසීම වැළැක්වීමට ක්‍රියා කිරීමෙන් සහ නීතියේ ආධිපත්‍යය මත රැඳෙන අලුත් සම්ප්‍රදායක් බිහි කිරීමෙන් තමයි අපේ රටේ නීතිය පිළිබඳ විශ්වාසය ඇති වෙන්නේ කියන එක අපි හැම වෙලාවේම කල්පනා කරන්න ඕනෑ. මේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රම අපි දියුණු කළොත් කිසිම රටකට අපට දොස් කියන්න බැහැ කියලා මම විශ්වාස කරනවා. අපට එරෙහි චෝදනා ඉදිරිපත් කරන්නත් බැහැ; කථා කරන්නත් බැහැ; වැරැදියි කියන්නත් බැහැ. ඒ තත්ත්වය අප විසින්ම ඇති කරගත යුතු කාර්යයක්. එවැනි කාර්යයන් රැසක් අපට කර ගන්න තිබෙනවා. මොකද, අපට අවුරුදු 30 ගණනක් තිස්සේ කිසිම දෙයක් කර ගන්න බැරි වුණා. දියුණු වෙන්න බැරි වුණා; ඉදිරියට යන්න බැරි වුණා; ක්‍රමවේද වැඩි කර ගන්න බැරි වුණා. අපි බරපතළ ගැටලුවකට ලක් වුණා. අපි ඒ බාධක නවත්වලා ආපසු හැරෙනකොට වෙනත් වෛශයකින් පැමිණි පාස්කු ප්‍රහාරය මඟින් අප තවත් පැත්තකට අරගෙන ගියා. ඒ නිසා මේ තත්ත්වය පිළිබඳව හොඳට තේරුම් අරගෙන ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රම නිර්මාණය කිරීමේ අවශ්‍යතාව තිබෙනවා. ඒ පිළිබඳ සමස්ත ජනතාව සම්බන්ධ වෙන වැඩ පිළිවෙළකට අපි හැමෝම ගමන් කළ යුතුයි කියලා මම විශ්වාස කරනවා.

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මනූෂ නානායක්කාර මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.28]

**ගරු මනූෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ 11වන පරිච්ඡේදයේ සඳහන් වන 109වන වගන්තියේ ඉඳලා 125වන වගන්තිය දක්වා විමර්ශන බලතල සියල්ල පැවරෙන්නේ පොලිසියටයි. එතකොට මේ බලතල අනුව, විමර්ශන කටයුතු සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වාගේම පොලිසියේ විවිධ කොට්ඨාසවලට මේ කර්තව්‍යයන් පැවරෙනවා. පොලිස් අත්අඩංගුවේ සිටින පුද්ගලයන්ට වධහිංසා පැමිණවීම හා අමානුෂික ලෙස සැලකීම වැළැක්වීමට "මේ පොලිසිය කණපිට හරවලා හෝ හදනවා" කියලා පොලිසිය භාර ඇමතිතුමා කිව්වා. හැබැයි, පොලිසිය භාර ඇමතිතුමනි, ඔබතුමාට තවමත් ඒ කාරණාව කර ගන්න පුළුවන් වුණේ නැහැ. ගිය මාසයේදීත් මඩකලපුව පොලිසියට අනුයුක්තව හිටපු පොලිස් බුද්ධි අංශ නිලධාරින් විසින් අත්අඩංගුවට ගත් තරුණයෙක්, පානදුරේ දී අත්අඩංගුවට ගත් තරුණයෙක් හිරකූඩුව ඇතුළේදීම මිය ගියා. අපි එතුමාගෙන් අහනවා, මේ වෙලාවේ රුපියල් මිලියන 829ක් වියදම් කරලා ත්‍රීවිල් 2,000ක් මිලදී ගත්තේ මේ වාගේ ප්‍රශ්න විසඳන්නද කියලා. මම දන්නේ නැහැ, මොන පදනමක් යටතේද මේ ත්‍රීවිල් මිලදී ගත්තේ කියලා. ඉලෙක්ට්‍රික් වාහන භාවිතය ගැන, කාබනික දේවල් ගැන කථා කරන අවස්ථාවක ත්‍රීවීලර් 2,000ක් මිලදී ගත්තේ ඇයි කියන එක ගැනත් පොඩි ප්‍රශ්නයක් තිබෙනවා.

අපේ ගරු තලතා අතුකෝරල මන්ත්‍රීතුමිය සඳහන් කළා වාගේ, අධිකරණ නියෝග තිබිය දී පාතාලයට සම්බන්ධ අපරාධකරුවනුත් ඝාතනයකට ලක් වෙනවා. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රිෂාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා වාගේ අය බන්ධනාගාරගත වෙලා ඉන්නවා. මේක බරපතළ ප්‍රශ්නයක්. මොකද නීතිය පැත්තක තිබියදී නීතියට පිටින් මේවා ක්‍රියාත්මක වෙනවා. "ලංකාදීප" පුවත් පතේ තරිඳු ජයවර්ධන කියන මාධ්‍යවේදියා අප ගැනත් විවේචන ඉදිරිපත් කරනවා; ඔබතුමන්ලාත් විවේචනය කරනවා, ප්‍රශ්න අහනවා. දේශබන්දු තෙන්නකෝන්, බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ පොලිස්පතිවරයා ඔහුට තර්ජනය කිරීම සම්බන්ධව අද පැමිණිල්ලක් දාලා තිබෙනවා. ඒ ගැන විමර්ශනයක් සිදු කරලා තිබෙනවාද? ඒ සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග මොනවාද? ඒ කිසිම දෙයක් පිළිබඳව තොරතුරු තවම එළියට ඇවිල්ලා නැහැ. හැබැයි, ඔබතුමාට මම මතක් කරලා දෙනවා. එදා ලසන්ත වික්‍රමතුංග, කීත් නොයාර්, එක්නැළිගොඩ යන සිද්ධිදාමයත් එක්ක මේවාත් එකට ගැටෙනවා. "https://economynext.com" කියන වෙබ් අඩවියේ "Sri Lanka president among three South Asian leaders in RSF 'press freedom predators gallery' " යනුවෙන් සඳහන් වෙනවා. ඒ අනුව 'ජනමාධ්‍ය නිදහසේ හතුරන්' කියන ලැයිස්තුවට 2021 RSF වාර්තාවට අනුව ලංකාවේ ජනාධිපතිවරයා

[ගරු මනූෂ නානායක්කාර මහතා ]

අයිති වෙනවා. මේ ලැයිස්තුවේ photo gallery එකට ලෝකයේ නායකයන් 37 දෙනෙකු තෝරා ගෙන තිබෙනවා. ඒ 37 දෙනාගෙන් දකුණු ආසියාවේ සිටින තුන්දෙනාගෙන් එක්කෙනෙක් බවට අපේ ජනාධිපතිවරයා පත් වෙනවා. ජනමාධ්‍ය නිදහසේ හතුරෙක් හැටියට එතුමා නම් වෙන්නත් මේවා හේතු වෙනවාය කියන එක මම මේ වෙලාවේ මතක් කරනවා.

පසුගිය කාලයේ පැවැති අපරාධ නඩු සම්බන්ධයෙන් කටයුතු කළා. අපි කලින් මතක් කරපු පසුගිය කාලයේ තිබුණු නඩු පිළිබඳව, ලසන්ත වික්‍රමතුංග ඝාතනය, කීත් නොයාර්ට පහරදීම, එක්නැළිගොඩ අතුරුදහන් කිරීම, තාජුඩීන් ඝාතනය, පාසල් සිසුන් 11 දෙනෙකු පැහැර ගෙන ත්‍රිකුණාමලයට ගිහිල්ලා කප්පම් ඉල්ලපු සිද්ධිය වාගේ දේවල් ගැන පරීක්ෂණ කළාට ඒවා අතරමඟදී නතර වුණා. හිටපු ජනාධිපතිතුමා, හිටපු ආරක්ෂක ලේකම්වරයා තමයි යෝජනා කළේ ඒ සමහර ඒවා පිළිබඳ පරීක්ෂණ කරන්න කියලා.

හැබැයි, ඒ පරීක්ෂණ අතරමඟ නතර වුණා. ඒ පරීක්ෂණ අතරමඟ නතර වනකොටම කිව්වා, මේ කරන්නේ රණවිරු දඩයමක් කියලා. මේවාට හමුදාවේ අය සම්බන්ධයි කියලා හෙළි වනකොට, රණවිරු දඩයමක් තමයි සිද්ධ වෙන්නේ කියලා මේ පරීක්ෂණ යට ගැහුවා. රට ඇතුළේ මතවාදයක් ගොඩනැඟුවා, "මෙන්න, රණවිරුවන්ට ගහනවා" කියලා. මම ඉතිහාසය දිහාවට ඔබතුමන්ලාගේ අවධානය යොමු කරවන්න කැමතියි. ප්‍රේමවතී මනම්පේරි ඝාතනය කළ හමුදා සාමාජිකයන්ට ජීවිතාන්තය දක්වා සිර දඬුවම් ලැබුණා; සූරියකන්ද සමූහ ඝාතනයට සම්බන්ධ වුණු හමුදා නිලධාරින්ට ජීවිතාන්තය දක්වා සිර දඬුවම් ලැබුණා; උඩතලවින්න ඝාතනයට සම්බන්ධ වුණු සෙබළුන්ට නීතිය ප්‍රකාරව සිර දඬුවම් ලැබුණා. 2001 මාර්තු 11වන දා පෑලියගොඩ පොලිස් වසමේ බෙම්මුල්ල පාලම අසලදී ජ්‍යෙෂ්ඨ අධිකාරි සුජිත් ප්‍රසන්න ඝාතනය කිරීම සම්බන්ධයෙන් යුද හමුදාවේ රයිඩර් බලකායේ සාමාජිකයෙකුට දඬුවම් ලැබුණා. හැබැයි, මේ එක වෙලාවකවත් "රණවිරුවෝ ඝාතනය කරනවා. රණවිරුවෝ දඩයම් කරනවා" කියලා කිව්වේ නැහැ. හැබැයි, පසුගිය ආණ්ඩුවට කලින් පැවති ආණ්ඩුව කාලයේ සිදු වෙච්ච අපරාධවලට යුද හමුදාවේ බුද්ධි අංශ සාමාජිකයන් සම්බන්ධ බවට පරීක්ෂණවලින් ඔප්පු වනකොට තමයි "රණවිරු දඩයම" කියලා ලේබල් ගහන්න පටන් ගත්තේ. එම අපරාධවලට යුද හමුදාවේ බුද්ධි අංශ සාමාජිකයන් සම්බන්ධ බවට ඔප්පු වූ පරීක්ෂණ, එදා ආරක්ෂක ලේකම්වරයා වාගේම ජනාධිපතිවරයා විසින්ම නියෝග කරපු පරීක්ෂණ. හැබැයි, මේ අපරාධවලට යුද හමුදාවේ බුද්ධි අංශ නිලධාරින් සම්බන්ධ වන බවට පරීක්ෂණවලින් කරුණු හෙළිදරව් වනකොට "රණවිරු දඩයම" කියන ලේබලය ඉදිරියට අරගෙන ආවා. රණවිරු දඩයම වාගේම දේශ ප්‍රේමීත්වය ඉදිරියට දමලා අපරාධකරුවන් හංගන්න උත්සාහ කළේ ඇයි? එහෙනම් මේ අපරාධ පිටුපස මේ ආණ්ඩුවට සම්බන්ධ කවුරු හෝ හිටියාද? නමුත් ප්‍රධාන ප්‍රශ්නය මතු වෙන්නේ එතැනදී නොවෙයි. මේ අපරාධ පිළිබඳව පරීක්ෂණ කරපු CID එකේ නිලධාරින් එහාට මෙහාට මාරු කරලා දැම්මා. ශානි අබේසේකර මාරු කළා විතරක් නොවෙයි, එතුමාට තිබුණු ආරක්ෂාවත් පැත්තකට දමලා, එවකට ජනාධිපති වශයෙන් හිටපු ගරු මහින්ද රාජපක්ෂ මහත්මයාම එතුමාට භාර දුන් වාස් ගුණවර්ධන මහත්මයාගේ නඩුව සම්බන්ධ අසත්‍ය සාක්ෂි හදලා, මාස ගණනාවක් එතුමා හිරේ තියාගෙන හිටියා. අද එතුමාගේ ආරක්ෂාව පැත්තකට දමලා තිබෙනවා. එතුමා සන්තකයේ තිබුණු ආයුධයවත් අද එතුමාට නැහැ. එතුමා 48 දෙනෙක් convict කරලා, ජීවිතාන්තය දක්වා සිර දඬුවම් ලබා දීමට තීන්දු කරපු නඩු රාශියක් -දුමින්ද සිල්වා මහත්මයාගේ නඩුව, ලසන්ත වික්‍රමතුංග ඝාතන නඩුව, ළමුන් 11 දෙනෙක් පැහැර ගැනීම සම්බන්ධයෙන් වූ නඩුව- පිළිබඳ පරීක්ෂණ කරපු පුද්ගලයෙක්. අද එතුමාගේ ජීවිත ආරක්ෂාව පිළිබඳව ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. එදා SIS එකෙන් ආරක්ෂාව ලබා දෙන්න කියපු බුද්ධි වාර්තාව අනුව තමයි එතුමාට ආරක්ෂාව ලබා දුන්නේ. අද ඒ බුද්ධි වාර්තාව පැත්තකට දමලා, එතුමාගේ ආරක්ෂාව සම්පූර්ණයෙන්ම නැති කර තිබෙනවා. "රණවිරු දඩයම" කියන ලේබලය ගහලා, මේ කරුණු පැත්තකට දමන්න එය හේතුවක් කර ගත්තා. ඒ හැම එකටම "රණවිරු දඩයම" කියලා ලේබල් ගහලා, පනත් සංශෝධනය කරලා ඒවා සම්මත කළාට වැඩක් නැහැ කියලා අපි කියනවා. මේවා ක්‍රියාත්මක කරන්න විමර්ශන නිලධාරින් හැටියට බලය ලබා දීලා තිබෙන්නේ CID එකට. සාක්ෂි සහිතව අධිකරණයේ කරුණු ගොනු කරලා, indictments issue කරපු අය වැරැදිකරුවන් වෙන්න ඔන්න මෙන්න කියා තිබියදී CID එකේ නිලධාරින්ගෙන් පළි ගැනීම ඉතා වැරැදියි කියන කාරණය මේ වෙලාවේ අපි කියනවා.

අපි නැවත වතාවක් ඔබතුමන්ලාගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා, මානව හිමිකම් කවුන්සලයවත් නැත්නම් කාගේවත් ඉල්ලීම් එනතුරු ඉන්නේ නැතිව ඒ වාගේ නිලධාරින්ට අවශ්‍ය ආරක්ෂාව ලබා දෙන්න කටයුතු කරන්න කියලා. ඒ වාගේම ඒ පරීක්ෂණ කටයුතු ඉදිරියට කරගෙන යන්න. රණවිරුවෝ හැමෝම හොඳ මිනිස්සු නොවෙයි. රණවිරුවන් අතරේත් සමහර වෙලාවට වැරැදි කරන අය ඉන්නවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.35]

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මොහොතේ අපේ රටට ඉතාම කාලෝචිත වූ නීති සංශෝධනයක් ගෙන ඒම පිළිබඳව වර්තමාන අධිකරණ අමාත්‍යතුමාට පළමුවෙන්ම මගේ ස්තුතිය පුද කරන්න කැමැතියි. මේ සංශෝධනය හුදකලාව කළ පමණින් රටක් හැටියට, ජාතියක් හැටියට, නීති පද්ධතියක් හැටියට අපි බලාපොරොත්තු වන සියලු දේ ඉටු වෙන බව කියන්න මම කැමැති නැහැ. ලෝකයේ දියුණු ජාතියක් බවට අපි පත් වෙන්න නම්, ලෝකයේ දියුණු ජාතීන් එක්ක අපි තරග කරන්න නම් දියුණු, විනිවිද පෙනෙන, කාර්යක්ෂම වූ නීති පද්ධතියක් සහ නීතිය පසිඳලන ක්‍රියාවලියක් මේ රටට අවශ්‍ය වනවා.

අපි ශිෂ්ට සම්පන්න ජාතියක් හැටියට දීර්ඝ කාලයක් තිස්සේ ලෝකයේ නම් දැරූ රටක්. රජ කාලයේදී පවා අපේ අධිකරණ ක්‍රියාවලිය යම්කිසි ක්‍රමවේදයක් තුළ පවත්වාගෙන ගියා. හැබැයි, පසු ගිය කාලයේ මේ රටේ ත්‍රස්තවාදය ඇති වුණා. ඒ ත්‍රස්තවාදය මර්දනය කිරීමේ බලාපොරොත්තුවෙන් අපට මේ පාර්ලිමේන්තුවේදී විවිධ නීති, කෙටුම්පත් සම්මත කරන්නට සිද්ධ වුණා. එදා අන්තර්ජාතිකව අපි අත්විඳි ඒ කෲර, අමානුෂික තත්ත්වය වාගේම අභියෝගාත්මක තත්ත්වය නොතේරුණු අපේ සමහර මිත්‍ර රටවල් පවා ඒවා පිළිබඳ මර්දනකාරී විධියට කටයුතු කරන්නත් උත්සාහ කළා. Those were called "draconian pieces of legislation". But, unfortunately, those countries had not been able to expose themselves toward such

conditions during such period. But, of course, as of now, we see them facing an even worse situation. අපි රටක් හැටියට එදා ඒ තත්ත්වයෙන් මිදෙන්නට ගෙනා නීති හකුළා ගැනීමේ අවශ්‍යතාව වර්තමානයේ මතුව තිබෙනවා. ගරු අධිකරණ ඇමතිතුමා ඒ බව තේරුම් ගෙන රජය හැටියට මේ සංශෝධන ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම ගැන අපි සතුටු වෙන්න ඕනෑ. මේකෙන් කියන්නේ නැහැ, රටේ ජාතික ආරක්ෂාව කිසිදු ආකාරයකින් පහත හෙළීම සඳහා තීරණ ගත යුතුයි කියලා. මේ රටේ කවදා හෝ ජාතික ආරක්ෂාව පිළිබඳව ප්‍රශ්නයක් මතු වුණොත්, පක්ෂ - විපක්ෂ භේදයකින් තොරව හැමදෙනාම එය මූලිකත්වයෙහි ලා සැලකීමට මැදිහත් වෙයි කියා මා විශ්වාස කරනවා.

අද අපට තිබෙන අභියෝගයක් තමයි, මේ රටේ ආර්ථිකය ගොඩනැංවීම. ඒ වෙනුවෙන් අපට ලෝකය සමඟ මිත්‍රශීලීව කටයුතු කරන්න සිද්ධ වෙනවා. ඒ වාගේම ලෝකයේ විවිධ සංවිධාන බලාපොරොත්තු වන යම් යම් නිර්ණායක, අපේක්ෂා හා එකඟව කටයුතු කරන්න හැකි වන ආකාරයේ නීති පද්ධතියක් අප රටට හඳුන්වා දීලා, ඒවා ක්‍රියාත්මක කිරීමත් අවශ්‍ය වෙනවා. ඒ නිසා මේ සංශෝධන ඉදිරිපත් කිරීම අතිශයින්ම වැදගත් වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සංශෝධනවලට අනුකූලව රටේ නීතිය ක්‍රියාත්මක කිරීමේදී ඉදිරියේදී යම් යම් ප්‍රායෝගික ප්‍රශ්න ඇති වන්නත් පුළුවන්. නීති ක්‍රියාත්මක කිරීමේදී, ඒ නීති ක්‍රියාත්මක කිරීමට තිබෙන ගැටලු සහගත තැන් මොනවාද කියා අපි හඳුනා ගන්න ඕනෑ. යම් අපරාධයක් සිදු වුණාම බොහෝ දෙනෙකු අහන්නේ පොලීසියෙන් ඇල්ලුවාද, නඩුවෙන් වැරැදිකරු ඔප්පු කළාද, වරදකරුවන්ට දඬුවම් දුන්නාද, වරදකරුවන්ට දඬුවම් ලබා දෙන්න තවම ප්‍රමාද ඇයි කියන ප්‍රශ්න නේ. මේවා සාමාන්‍ය ජන වහරට අනුව ජන සමාජය අහන දේවල්. නමුත්, රටේ සම්මත කර තිබෙන නීතියට අනුකූලව පොලීසියට තමන්ගේ කාර්යභාරය, වගකීම ඉටු කරන්න අවශ්‍ය කරන සම්පත් හා බලතල -මේ සියල්ල පැත්තකින් තැබුවත්- තිබුණත් ඒ සඳහා අවශ්‍ය පුහුණුව ඔවුන්ට නැහැ. පොලීසිය භාර ඇමතිවරයා මේ අවස්ථාවේදී ගරු සභාවේ ඉන්නවා. පොලිස් නිලධාරින්ට අවශ්‍ය පුහුණුව ලබා දෙන්න ඕනෑය කියන කාරණය මම මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා. පුහුණුව තිබෙන නිලධාරින් දක්ෂතාව මත ඒ ස්ථානවලට පත් කරන්න ඕනෑ. පොලිස් ස්ථානාධිපතිවරයකු පත් කරන විට ඔහු තෝරා ගන්න ඕනෑ සුදුසුකම් මත මිසක් දේශපාලනඥයාගේ ලියුම මත නොවෙයි. එහෙම වුණොත් මොකද වෙන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය දවසක මම සම්බන්ධීකරණ කමිටුවේදී කුඩු මර්දනය ගැන ප්‍රශ්න කළා. එම සම්බන්ධීකරණ කමිටුවේදී හිටපු OIC කෙනෙකු කිව්වා, "හරි වැඩේ නේ. කුඩු අල්ලන්න ගියාම මානව හිමිකම් නඩු දමනවා නේ" කියලා. මානව හිමිකම් නඩු දමන්නේ පොලීසිය මානව හිමිකම් කඩවන ආකාරයට නීතිය ක්‍රියාත්මක කරන්න උත්සාහ කළොත් පමණයි. පොලිස් නිලධාරියා නිසි පුහුණුව තිබෙන කෙනෙක් නම්, එම කටයුත්ත කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුමින් සහ අවශ්‍ය ඒ අංගෝපාංගවලින් ඔහු සන්නද්ධ වෙලා ඉන්නවා නම්, ඔහු දක්ෂ නිලධාරියෙකු නම් ඒ කටයුත්ත කරන්න බැරිකමක් නැහැ. ඒ නිසා බලාපොරොත්තු වන ආකාරයට මේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය පුහුණුව ලබා දෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලනවා.

දියුණු රටක් වුණාම අපි සම්මත කරන නීති පද්ධතිය, ක්‍රියාත්මක කරන නීති පද්ධතිය එක එක්කෙනාට ඕනෑ විධියට වෙනස් කරන්න පුළුවන් ආකාරයේ, එක එක්කෙනාට ඇඹිලි ගහන්න පුළුවන් ආකාරයේ නීති පද්ධතියක් විය යුතු නැහැ. නමුත් අදටත් යම් යම් ඇඹිලි ගැසීම් වෙනවාය කියන එක, එහෙම නැත්නම් බලාපොරොත්තු නොවුණු යම් යම් දේවල් වෙනවාය කියන එක සමහර විට අපි දකිනවා. මේ තත්ත්වයෙන් මිදෙන්න පොලීසිය පමණක් නොවෙයි, අධිකරණයත් අවධානය යොමු කළ යුතුයි.

ගරු ඇමතිතුමා මෙතැන සිටිනවා. මම උපදේශක කාරක සභාවේදී ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුගේ අත්අඩංගුවට ගැනීමක් සම්බන්ධ කාරණයක් යොමු කළා, අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාස දෙකකට වැඩි කාලයක් ඒ මන්ත්‍රීවරයා අත්අඩංගුවේ සිටියා. හේතුව, අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් - Judicial Service Commission - කරන ලද දැනුම් දීමක් මත මහෙස්ත්‍රාත්තුමාට නඩු තීන්දුව දෙන්න බැරිකමයි. මහෙස්ත්‍රාත්තුමා ඒ පිළිබඳව අධිකරණයේ නීතිඥයන් වන අපට කියනවා. එතකොට මොන බලයක් යටතේද, මොන පදනමක් මතද, අධිකරණ සේවා කොමිෂන් සභාවට මහෙස්ත්‍රාත්වරයාගේ නඩු තීන්දුව දීම ප්‍රමාද කිරීමට හැකියාව තිබෙන්නේ? මේ වාගේ දේවල් සිදු නොවිය යුතුයි. මේ වාගේ සිද්ධි ඇති වෙලා තිබෙන හේතුව කුමක්ද කියන එක සොයා බැලිය යුතුයි.

අද උදේ කථා වුණා, යම් නඩුවක් විභාග කිරීමට පත් කළ නඩුකාරවරුන් හතරදෙනෙකු පැත්තකට වෙන එක ගැන. මේ ආකාරයේ කටයුතු නොවන විධියට අපේ ක්‍රමවේදය ක්‍රියාත්මක විය යුතුයි. ඒ සඳහා වුණු පුහුණුව, ඒ සඳහා වුණු ආත්ම ශක්තිය, ඒ සඳහා වුණු නීතිය, ඒ සඳහා වුණු නිදහස ඔවුන්ට ලැබිය යුතුයි. නැත්නම් අපි බලාපොරොත්තු වන නිදහස ඇති වෙන්නේ නැහැ. එදා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ කාලයේ පර්සි කොලින් තෝමේ විනිශ්චයකාරතුමා නඩු තීන්දුව දීලා ගෙදර ගියාම එතුමාගේ ගෙදරට ගල් ගැහුවා. එතුමාගේ ගෙදරට ගල් ගැහුවා විතරක් නොවෙයි, පර්සි කොලින් තෝමේ විනිශ්චයකාරතුමා "ගෙට ගල් ගහනවා" කියලා පොලීසියට telephone කරන කොට, "Railway Station, Sir" කියලා උත්තර දෙන්න කියලා පොලිස් ස්ථානාධිපතිවරයාට නියෝග කර තිබුණා. ඒ තරම් සංවිධානාත්මකව නීතිය ක්‍රියාත්මක නොවන ආකාරයට කටයුතු කළ ඉතිහාසයක් අපේ රටේ දේශපාලනික වශයෙන් තිබුණා. වර්තමානයේ එම තත්ත්වය මැඩ පවත්වාගෙන, එම තත්ත්වයෙන් මිදී ඉදිරියට යන ගමනක් ගැන අපි විශාල බලාපොරොත්තුවක් තබා තිබෙනවා. ලෝකයත් එක්ක අපේ ගනුදෙනු මීට වඩා විනිවිද පෙනෙන විධියට, මීට වඩා විශ්වාසය ඇති කරගෙන සිදු කරන්නට අවශ්‍ය මූලාරම්භයක් මේ තුළින් ලබා ගන්නට හැකියාව ලැබෙයි කියලා අපට විශ්වාසයක් තිබෙනවා.

මම ඉල්ලීමක් කරනවා, අධිකරණ පද්ධතියට අවශ්‍ය පහසුකම් වර්ධනය කිරීමට කටයුතු කරන්න කියා. ඒ වාගේම, නීතිඥ වෘත්තියේ ගෞරවය ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය පහසුකම් ලබා දෙන්න. අද කාර්යාල පහසුකම් නැතිව නීතිඥයන් විශාල සංඛ්‍යාවක් සිටිනවා. ගාලු අධිකරණ සංකීර්ණයේ ඉදිකිරීම් අපි අවුරුදු ගණනක් තිස්සේ කරගෙන යනවා. මේ මොහොතේත් ඒ අධිකරණ සංකීර්ණයේ ඉදිකිරීම් කළාට නීතිඥවරුන්ට කාර්යාල ලබාදීමේ කටයුත්ත සඳහා වූ වැඩ පිළිවෙළ තවම ආරම්භ වෙලා නැහැ. ගරු ඇමතිතුමා ඒ සඳහා උත්සාහ ගන්නා බව අපි දන්නවා. නමුත් ඒ සඳහා ඉඩම් අත්පත් කර ගැනීම තවම සිද්ධ වෙලා නැහැ. ඒ නිසා මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා, කරුණාකර ඒ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුත්තත් සිදු කරලා මේ කටයුතු වේගවත් කරන්න කියලා. [බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉදිරියේදී හැමදෙනාම පිළිගන්නා විනිවිද පෙනෙන සාර්ථක, සාධනීය නීති පද්ධතියක් ලබා ගැනීමේ මූලාරම්භයක් ඇති කිරීම පිළිබඳව නැවතත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.47]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද අපරාධ නඩු විධාන සංග්‍රහයට සංශෝධන කීපයක් ගෙන ඒම ගැන අපි විපක්ෂයේ හිටියත් එය අගය කරන්න ඕනෑ. අපි හිතනවා ඒවා හොඳ ධනාත්මක සංශෝධන කියලා. ඒ වාගේම, කමිටු අවස්ථාවේදී ඉදිරිපත් කරන්න මට සංශෝධන කීපයකුත් තිබෙනවා. විශේෂයෙන්ම මහේස්ත්‍රාත්වරු පොලීසියට යෑම පමණක් නොවෙයි, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, ත්‍රස්ත විමර්ශන කොට්ඨාසය, රැඳවුම් නියෝග මත රැඳවුම් කඳවුරුවල ඉන්න අයත් බැලීමේ ඒ අවස්ථාව මහේස්ත්‍රාත්වරුන්ට ලබා දෙන්න ඕනෑය කියන සංශෝධනයත් ඒ හරහා ඉදිරිපත් කරනවා. අපි හිතනවා අධිකරණ ඇමතිතුමා සහයෝගය ලබාදීලා ඉතාම ප්‍රගතිශීලී ඒ සංශෝධනයත් ඉදිරියට ගෙන යයි කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම රැඳවුම් නියෝග මත, නඩු පවරන්නේ නැතිව විශාල පිරිසක් රිමාන්ඩ් බන්ධනාගාරවල ඉන්න බව අපි දන්නවා. අවුරුදු දෙක, තුන නොවෙයි, ඊට වඩා වැඩි කාලයක සිට පිරිසක් ඉන්නවා. මම හිතනවා, මේ පිරිස ගැන රජය කඩිනම් අවධානය යොමු කරන්න ඕනෑ කියලා. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයේ තිබෙනවා, විශේෂයෙන්ම වසර ගණනාවක් රිමාන්ඩ් බන්ධනාගාරගතව ඉන්න අය ගැන ඉතා ඉක්මනින් සොයා බලා ක්‍රියා කරනවා කියලා. "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයේ ඒ පොරොන්දුවත් අඩංගු වෙලා තිබෙන බව මම දැක්කා. අපි දන්නවා, අද වෙනකොට විශාල පිරිසක් මේ ආකාරයෙන් බන්ධනාගාරගතව ඉන්නා බව. විශේෂයෙන්ම විශ්වවිද්‍යාලවලට තේරී පත් වෙච්ච ශිෂ්‍යයෝ 5දෙනෙක්, 6දෙනෙක් විතර අවුරුදු එකහමාරකට, දෙකකට ආසන්න කාලයක් තිස්සේ කිසිදු ආකාරයේ චෝදනාවක් නොමැතිව, නඩු පවරන්නේ නැතිව තවම රිමාන්ඩ් බන්ධනාගාරවල කාලය ගත කරනවා. ඒ හින්දා අපි අධිකරණ ඇමතිතුමාට කියනවා ඔවුන්ගේ අනාගතය ගැන හිතන්න කියලා. ඒ තරුණ අය. ඔවුන්ට චෝදනා තිබෙනවා නම් ඒවා ඉදිරිපත් කරන්න. ඒ අයට නඩු දාන්න පුළුවන් සාක්ෂි තිබෙනවා නම් නඩු දාලා එම නඩු ඉක්සරහට ගෙන යන්න. එහෙම නැතිව නිකම් ඔවුන් රැඳවුම් බාරයේ හෝ රිමාන්ඩ් බන්ධනාගාරවල රඳවා ගැනීම තුළ ඔවුන්ගේ අනාගතය සම්පූර්ණයෙන්ම විනාශයට පත් වෙනවා. තමුන්නාන්සේලාත් ඒකේ වග කිවයුතු කොටස්කාරයෝ බවට පත් වෙනවා කියන එකත් මම මතක් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2020 නොවැම්බර් මාසයේ 24වැනි දා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පොලිස්පතිතුමාට යවපු ලිපියක් තිබෙනවා.

ඒ ලිපියේ ප්‍රධාන කාරණාවක් තිබෙනවා. විශේෂයෙන්ම රැඳවුම් බාරවල ඒ වාගේම පොලිස් අත්අඩංගුවේ ඉන්න උදවිය සම්බන්ධව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් ලබාදී තිබෙන වාර්තාවේ, පාපෝච්චාරණය කරන අය හා පාපෝච්චාරණය කරන්න අවවාද කළාය කියලා ලැයිස්තුවක් ලබා දීලා තිබෙනවා. ඒ ලැයිස්තුව අනුව අපට පෙනී යන දෙයක් තමයි මානව හිමිකම් සංවිධානය පොලිස්පතිතුමාගෙන් ඉල්ලා තිබෙනවා විශේෂයෙන්ම මේ පිළිබඳවත් පරීක්ෂණ කරන්න කියලා. මොකද, පාපෝච්චාරණය කිරීමට අවවාද කිරීම කියන එකත් වදහිංසාවක්. ඒකත් බලහත්කාරකමක්. එහෙම කරන්න බැහැ. නමුත්, රැඳවුම් කඳවුරුවල ඉන්න, එහෙම නැත්නම් ත්‍රස්ත විමර්ශන අංශවල ඉන්න, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් අත්අඩංගුවට අරගෙන ඉන්න අයට යම් යම් බලපෑම් සිද්ධ වෙනවා, ඔවුන්ට පාපෝච්චාරණය කරන්න කියලා. අන්න ඒ පිළිබඳව ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිෂන් සභාව අපේ පොලිස්පතිතුමාට 2020 නොවැම්බර් මාසයේ 20වැනි දා දැනුම් දීලා තිබෙනවා. ඒ නිසා අපි අධිකරණ ඇමතිතුමාට කියනවා, ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරලා ඒවාට ගත යුතු ක්‍රියා මාර්ග ගන්න කියලා.

ඒ වාගේම, දේශපාලන වශයෙන් පළිගැනීම්වලට ලක්වුවන් සිටින බවත් අපි දන්නවා. රිසාඩ් බදියුදීන් හිටපු ඇමතිතුමා ඉන්නවා; අසාද් සාලි හිටපු ආණ්ඩුකාරතුමා ඉන්නවා; හිජාස් හිස්බුල්ලා අපේ දක්ෂ නීතිඥතුමා ඉන්නවා. මම හිතන විධියට එතුමා අධිකරණ ඇමතිතුමා එක්ක සමකාලීනව උසාවිවල කටයුතු කරපු නීතිඥවරයෙක්. එතුමා අද දේශපාලන පළිගැනීමකට ලක් වෙලා ඉන්නවා. හිජාස් හිස්බුල්ලාට මෙම සිදුවීම වුණේ, දින පණස්දෙකේ ආණ්ඩුව පත් වුණාම එදා එතුමා අපේ ආණ්ඩුව පැත්තට පෙනී සිටි නිසායි. එයට පළිගැනීමක් හැටියටයි හිජාස් හිස්බුල්ලා මහතාට අසත්‍ය චෝදනාවක් දාලා අත්අඩංගුවට ගත්තේ. චෝදනා ගොනු කළා විතරක් නොවෙයි, එතුමාට විරුද්ධව කටඋත්තර දෙන්න කියලා එතුමාගේ ළමයින්ටත් බලපෑම් කරලා තිබෙනවා. අවුරුද්දක් පමණ ගත වෙලාත් තවම එතුමාට විරුද්ධව චෝදනාවක් එල්ල කරගන්න බැරි වෙලා තිබෙනවා. තවම ඒ පරීක්ෂණ අවසන් කරගන්න බැරි වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ කෙරෙමින් යනවා කියලා හැම දාම කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන්, ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරු ඉල්ලා අස්වීමේ කාරණය පිළිබඳවත් මම වචන කිහිපයක් කියන්න ඕනෑ. ඒක මේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණයට විතරක් බලපාන කාරණයක් නොවෙයි. එය, අපේ රටේ නීති පද්ධතියේ ගෞරවය නැතිවීමට බලපාන කාරණයක්. අපේ ගෞරවයට හානියක්, අපේ නීතියට හානියක්. මොකද, නඩුවක් ආවාම ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරු "මම මේ නඩුව කරන්නේ නැහැ" කියනකොට ජාත්‍යන්තර වශයෙන් අපේ අධිකරණ හැල්ලුවට පත් වෙනවා විතරක් නොවෙයි, ඒක වින්දිතයාට කරන බරපතළ අපරාධයක් වෙනවා. දැන් මාස දෙක තුනක් තිස්සේ, රැඳවුම් නියෝග මත රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා තබා ගෙන ඉන්නවා. එතුමාගේ නඩුව වෙනුවෙන් පෙනී සිටිය යුතු විනිශ්චයකාරවරු හතරදෙනෙකුම අද වෙනකොට එයින් ඉවත් වෙලා තිබෙනවා. ඒක අපේ ක්‍රමවේදයේ තිබෙන විශාල අඩු පාඩුවක් විතරක් නොවෙයි, ජාත්‍යන්තර වශයෙනුත් අපි හැල්ලුවට ලක් වෙන කාරණාවක්. එම නිසා මේ පිළිබඳව අවධානය යොමු කරන්න කියා අපි ගරු අධිකරණ ඇමතිතුමාට කියනවා. මොකද, විනිශ්චයකාරවරුන්ට නඩු ඉදිරිපත් වුණාට පසු නියමිත දිනයේ උදේට ඇවිල්ලා කියනවා නම් "මම මේ නඩුව භාර ගන්නේ නැහැ" කියලා, ඒක විශාල ප්‍රශ්නයක්. රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමාගේ නඩුව වෙනුවෙන් පෙනී සිටිය යුතු විනිශ්චයකාරවරු හතරදෙනෙකුම මේ වන විට එයින් ඉවත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විශාල පිරිසක් නඩු නැතුව අත්අඩංගුවේ රඳවාගෙන ඉන්නවා. අවුරුදු එකහමාර, දෙක, තුන, හතර මේ අය අත්අඩංගුවේ රඳවාගෙන ඉන්නවා. ඔවුන්

උසාවියටත් ඉදිරිපත් කරනවා. නීතිපති දෙපාර්තමේන්තුවෙන් චෝදනා එල්ල වෙන්නේත් නැහැ. නැවත ඔවුන් රිමාන්ඩ් බන්ධනාගාරයට ගෙනයනවා. එවැනි විශාල පිරිසක් ඉන්නවා. ඒ පිළිබඳව ඉක්මනින් ක්‍රියාමාර්ගයක් ගන්න; ඒ පිළිබඳව ඉක්මනින් ක්‍රියාත්මක වෙන්න. ඔවුන් චෝදනාවලට ලක් වෙලා සිටින අය නම්, ඔවුන් වරදක් කර තිබෙනවා නම්, ඒ පිළිබඳව සාක්ෂි තිබෙනවා නම් ඒ අවශ්‍ය නඩු ගොනු කරලා, ඔවුන් නීතිය ඉදිරියට පමුණුවා දඬුවම් ලබා දෙන්න. ඒ ගැන අපට ප්‍රශ්නයක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණ ඇමතිතුමා මෙම ගරු සභාවේ ඉන්න නිසා මම එතුමාගෙන් ප්‍රශ්නයක් අහන්න කැමැතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මට තව තත්පර කිහිපයක් දෙන්න.

Hon. Minister, as you know, there has been a press release in the media these days about the Quazi Court. I do not know whether you are the Cabinet Minister in charge of law and order. Even the Muslim law comes under your Ministry. You have appointed a Committee for Muslim law reforms. The Committee has already handed over all Muslim law reforms - [*Interruption*]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු මධුර විතානගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා. [බාධා කිරීමක්]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

Sir, I rise to a point of Order.

ඔබතුමා Chairman's Panel එකේත් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම ඔය Chairmen's Panel එකේ හිටපු කෙනෙක්. කථාවක් අවසාන කරන්න තත්පර කිහිපයක් ලබා දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
එහෙම කරන්න එපා. ඔබතුමා දන්නේ නැත්නම් ඉගෙන ගන්න. කථා කරමින් ඉන්නකොට එහෙම mike එක off කරන්නේ නැහැ. කථාව අවසාන කරන්න දෙන්න. මම අධිකරණ ඇමතිතුමාගෙන් වැදගත් ප්‍රශ්නයක් ඇහුවේ. ඒ නිසා ඒ කාරණය අවසන් කරන්න තත්පර කිහිපයක් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මධුර විතානගේ මන්ත්‍රීතුමා.

[අ.භා. 3.56]

**ගරු මධුර විතානගේ මහතා**
(மாண்புமிகு மதுர விதானகே)
(The Hon. Madhura Withanage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ අධිකරණ ඇමතිතුමා, අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත ඇතුළු තවත් කාලෝචිත සංශෝධන කිහිපයක් ගෙන ඒම පිළිබඳව මා එතුමාට ස්තුතිවන්ත වෙනවා.

අධිකරණ ඇමතිතුමාත්, පොලීසිය භාර ඇමතිතුමාත් මේ අවස්ථාවේ ගරු සභාවේ සිටින නිසා වැදගත් කාරණා කිහිපයක් ඉදිරිපත් කරන්න මම බලාපොරොත්තු වනවා. මේ ගරු සභාවේදී අද දවස පුරාම කථා කළේ, අත්අඩංගුවේ සිටින සැකකරුවන්ගේ අයිතිවාසිකම් පිළිබඳවයි. එම කාරණාව ඉතා හොඳ, කාලෝචිත කාරණාවක් වාගේම අපේ රට ජාත්‍යන්තර මට්ටමින් ඉහළ පිළිගැනීමකට ලක් වන කාරණාවක්.

ගරු ඇමතිතුමනි, සැකකරුවන්ට වාගේම නීතිය ක්‍රියාත්මක කරන අනෙකුත් නිලධාරින්ට, ඒ වාගේම ඒ නීති ක්‍රියාදාමයට සම්බන්ධ සියලු දෙනාට මානසික සහ ශාරීරික සුවය ලැබෙන විධියේ, ඔවුන්ගේ අයිතිවාසිකම් රැකෙන විධියේ යන්ත්‍රණයක් ක්‍රියාත්මක කරන්න ඕනෑ. සැකකරුවන් වෙනුවෙන් කථා කරන්න අපි අනිවාර්යයෙන්ම බැඳී සිටිනවා. නමුත්, නීතිය ක්‍රියාත්මක කරන බොහෝ නිලධාරින්ට අවශ්‍ය මූලික යටිතල පහසුකම්වත් නොමැති බව පසුගිය කාලය පුරාවටම අපි දැක්කා. උදාහරණයක් විධියට නීතිපති දෙපාර්තමේන්තුව ගත්තොත්, නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට විශාල අපහසුතා තිබෙනවා. ඒ වාගේම ඔවුන්ට අවශ්‍ය මූලික යටිතල පහසුකම් ටිකවත් ලැබෙන්නේ නැහැ. මගේ සමකාලීන මිත්‍රයෝ නීතිපති දෙපාර්තමේන්තුවේ ඉන්නවා. ඔවුන්ගේ දුක්ගැනවිලි ඇහුවාම පෙනෙනවා, කූඩුවේ සිටින සැකකරුට වඩා දුක්ගැනවිලි නීතිය ක්‍රියාත්මක කරන නිලධාරින්ට තිබෙන බව. අපි ඒ හැම දෙයක් ගැනම අවධානය යොමු කරන්න ඕනෑ.

සමහර වෙලාවට පැමිණිල්ලක් දමන්න පොලීසියට ගියාට පසු ඒ පැමිණිලිකරුට කියනවා, සැකකරුවන් අල්ලන්න යන්න වාහනයක් හොයා ගෙන එන්න කියලා. එතකොට පොලීසියට සැකකරු අල්ලන්න යන්න වෙන්නේ පැමිණිලිකරුගේ වාහනයෙන්. එම නිසා නීති-රීති ගැන, සංශෝධන ගැන කථා කරනවාට වඩා අද තිබෙන එවැනි මූලික ප්‍රශ්න ටික විසඳා ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් දියුණු කර ගන්න පුළුවන් නම්, ඒවා සංවර්ධනය කරන්න පුළුවන් නම් එය ඉතාම වැදගත් වනවා.

විපක්ෂයේ කණ්ඩායම පොලීසිය ගැන, ඒ පිරිහීම ගැන ලොකු උද්‍යෝගයකින්, ලොකු හඬකින් කථා කළ ආකාරය මම දැක්කා. පසුගිය කාලයේ හිටපු පොලිස්පතිතුමා පෙරහැරේ නටන නැටුම් නටපු ආකාරය අපි දැක්කා. එදා එතුමා නීතිය නවලා තමයි රටේ වැඩ කටයුතු කළේ. ඒ වාගේම පොලිස් මූලධර්මවලට, නීති-රීතිවලට පටහැනිව ගොඩ නහපු FCID වැනි ආයතන තුළින් රාජ්‍ය සේවකයන්ට මානසිකව මෙන්ම ශාරීරිකව ද විශාල පීඩනයක් ඇතිකර රාජ්‍ය යන්ත්‍රණය කඩා බිඳ දැම්මා.

ඊළඟට, එදා ලොකු හඬපට හුටපටයක් තිබුණා අපි දැක්කා. ඒ හඬපට සන්දර්ශනයත් එක්ක එදා අධිකරණය මොන තරම් ප්‍රපාතයකට වැටිලාද තිබුණේ කියන එක අපි දැක්කා. නීතිය ක්‍රියාත්මක කරන නිලධාරින්ට, විමර්ශන නිලධාරින් ඇතුළු නීතියට සම්බන්ධ අනෙකුත් සියලුදෙනාට මොන තරම් පීඩනයක්

[ගරු මධුර විතානගේ මහතා]

එල්ල කරලාද පසුගිය කාලයේ තමන්ට අවශ්‍ය නඩු තීන්දු ටික ගත්තේ කියලා අපි දන්නවා. මේවා ගැන කියන්න ගියොත් අපට බොහෝ දේවල් කථා කරන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අද කථා කරන්නේ පොලීසියේ ගුණාත්මක පැත්තයි. ඒ වාගේම පොලීසියේ පිරිහීමට හේතු විමසා ඒ සම්බන්ධයෙන් සංවාදයක් ඇති කරන්න මම අද සභාව කල් තැබීමේ යෝජනාවක් ඉදිරිපත් කරන්නත් අවසර ඉල්ලා තිබෙනවා.

ගරු ඇමතිතුමනි, අද ඉදිරිපත් කර තිබෙන සංශෝධන සම්බන්ධයෙන් මම ඔබතුමාට ස්තුතිවන්ත වනවා. විශේෂයෙන් මේ අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත සම්මත වුණාට පසුව ජාත්‍යන්තර ප්‍රමිතිය අනුව කටයුතු කිරීමේ අවස්ථාව අපට ලැබෙනවා. යම් සැකකරුවකු රිමාන්ඩ්ගතවෙලා සිටිනවා නම්, පොලීසියක කූඩුවක ඉන්නවා නම්, ඔහුගේ ආරක්ෂාව සම්බන්ධයෙන්, ඔහුගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් රජයක් විධියට ගන්නා වූ මේ සාධනීය පියවර ගැන අපි සතුටු වනවා. මහෙස්ත්‍රාත්වරයකුට මසකට වරක්වත් සැකකරුවන් පරීක්ෂා කිරීමට යන්න පුළුවන් නම්, ඒ පොලිස් ස්ථාන නිරීක්ෂණය කිරීම සඳහා යන්න පුළුවන් නම් ඒක කාලෝචිත කාරණාවක්.

සැකකරුවන් අත්අඩංගුවට ගැනීමේ ක්‍රියාවලියේදීත් අපි ලොකු ගැටලුවක් දැක්කා. පසුගිය දිනක සමාජ මාධ්‍යවල වීඩියෝ පටයක් තිබුණා, එක්තරා සැකකරුවකු පොලිස් අත්අඩංගුවේ සිටි වෙලාවේ අසභ්‍ය වචනයෙන් අමානුෂික ලෙස පොලිස් නිලධාරින්ට බණින දර්ශන ඇතුළත්. මම හිතනවා, ඔබතුමන්ලා සියලුදෙනා එම වීඩියෝව දකින්න ඇති කියලා. මේක තමයි ඇත්ත කථාව. අද පොලීසියට, නීතිය ක්‍රියාත්මක කරන සැමදෙනාට, ඒ වාගේම අධිකරණයට මිනිසුන් බැණ වදින්න පටන් ගෙන තිබෙනවා. අපි ආණ්ඩුව අරගෙන තවම මාස නවයයි. නමුත්, වසර ගණනාවක් තුළ නීතිය ක්‍රියාත්මක කිරීමේදී ඇති වුණු ගැටලුත් එක්ක, පිරිහීමත් එක්ක තමයි මේ දේවල් වෙලා තිබෙන්නේ. නීතිය ක්‍රියාත්මක කරන සෑම ආයතනයකම වෙනස් කිරීම් සම්බන්ධයෙන් අපට හොඳ කතිකාවක් ආරම්භ කිරීමට සිදු වෙනවා කියලායි මම හිතන්නේ. එහෙම නැතිව අපි හැම දාම මේ විධියට විවාද කිරීම විතරක් ඵලදායී වෙන්නේ නැහැ. අපි යම් කිසි ක්‍රමවේදයක්, Action Plan එකක් සකස් කරලා අහවල් කාලය වෙනකොට නීතිය ක්‍රියාත්මක කිරීමට සම්බන්ධ සියලු ආයතනවල ගුණාත්මක බව වැඩි කර, ඒවාට අවශ්‍ය මූලික පහසුකම් ටික ලබා දිය යුතුයි කියන තැන ඉන්න ඕනෑ. අපට සමාජයේ පැතිකඩ පෙනෙන්නේ අපරාධ රැල්ලත් එක්කයි. අපි සිර ගෙවල් හදලා, සැකකරුවන්ගේ අයිතිවාසිකම් ගැන කථා කරලා වැඩක් නැහැ. සැකකරුවන් සමාජය තුළ බිහි වීම නවත්වන ක්‍රමවේදයක් ගැනයි අපි බලන්න ඕනෑ. එහෙම නොකර, අපි හැමදාම මෙතැනට ඇවිත් මේ දේවල් ගැන කථා කළාට වැඩක් නැහැ.

මම තව විශේෂ කරුණක් අපේ ගරු ඇමතිතුමන්ලා දෙදෙනාගේ අවධානයට යොමු කරනවා. මේ වන විට online අධ්‍යාපනය තුළින් සමාජයේ ළමා පරපුර දැවැන්ත අපරාධ රැල්ලකට, නීති විරෝධී වැඩසටහන්වලට සම්බන්ධ වෙමින් සිටිනවා. මම ඒක වගකීමෙන් කියන්නේ. අපට හිතා ගන්නත් බැරි විධියට ඒ දරුවන්ගේ දැනුමත් එක්ක ඒ ගොල්ලන් පියවර කිහිපයක් ඉදිරියට ගිහින් තිබෙනවා. ඒ කාරණා ගැන පොලීසියට හිතන්නවත් බැහැ. පොලීසිය හැරෙනකොට ඒ අය තාක්ෂණය පාවිච්චි කරලා, දැනුම පාවිච්චි කරලා කටයුතු කරනවා. අද සමාජයට වැඩක් වෙනවාට වඩා සමාජයට වැරැදි කරන අපරාධකරුවන් බිහි වෙන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා.

මේ ගැනත් අප විශේෂයෙන්ම අවධානය යොමු කළ යුතුයි කියා මා සිතනවා. (14th Start)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොලිස් ළමා හා කාන්තා කාර්යාංශය පිළිබඳවත් මා කියන්න ඕනෑ. මා මීට කලිනුත් කීප වතාවකදීම මේ කෙරේ ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවූවා. සෑම පොලිස් ස්ථානයකම පොලිස් ළමා හා කාන්තා කාර්යාංශයේ ඒකකයක් පිහිටුවා තිබෙනවා. ඒවා ඉතාම දුර්වල තත්ත්වයකට පත්ව තිබෙනවා. ගරු ඇමතිතුමනි, එම නිසා මම මේ වෙලාවේ ඔබතුමාගෙන් විවෘතව ඉල්ලා සිටිනවා, ඒ කාරණය කෙරේ අවධානය යොමු කරන්න කියා. ඇත්තටම ඒ ඒකකය පොලිස් ස්ථානයේ පිටුපසට දාලායි තිබෙන්නේ; නිකම් ලිප් බොක්කට දාලා වාගෙයි තිබෙන්නේ. ඉඩ කඩ අඩු පොලිස් ස්ථානවල බොහෝ අපහසුතා මැද්දේ තමයි ඒ ඒකකය පවත්වාගෙන යන්නේ. හැබැයි, අද වන විට පොලිස් ස්ථානයක තිබෙන වැදගත්ම අංශයක් විධියට මම දකිනවා, පොලිස් ළමා හා කාන්තා කාර්යාංශයේ ඒකකය. මොකද, එම කාර්යාංශයට අපට අදහා ගන්නවත් බැරි තරමට පැමිණිලි ලැබෙනවා. ගරු ඇමතිතුමනි, මේ කාරණය සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

ඊට අමතරව, තවත් කාරණයක් කිව යුතුයි. ගරු ඇමතිතුමනි, සැකකරුවන් අද පොලීසියට විරුද්ධව ප්‍රසිද්ධියේම, පොලිස් ස්ථානය තුළදීම චෝදනා කරනවා. එසේ කරන්න හේතුවක් තිබෙනවා. අපි ඒ පිළිබඳව හදවතට එකඟව කථා කළොත්, පොලීසිය කියන්නේ, පගා ගන්නා, අල්ලස් ගන්නා තැනක් කියලා අද මුළු සමාජයේම ලොකු කථාවක් තිබෙන බව කිව යුතුයි. නිලධාරින් කීප දෙනෙකු කරන වැරැදි වැඩ නිසා අද මුළු පොලිස් දෙපාර්තමේන්තුවටම චෝදනා කරන තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. ජනතාව අතින් සිදු වන වරදක් ගැන පොලීසියට ගිහින් පැමිණිලි කරන්න හැකි වුණාට, පොලිස් නිලධාරියෙකුගෙන් සිදු වන වරදක් සම්බන්ධයෙන් එම පොලිස් නිලධාරියාට විරුද්ධව පැමිණිලි කරන්න තැනක් නැහැ. නමුත් යුද්ධ හමුදාවේ නම් එවැනි කාරණා සම්බන්ධයෙන් ක්‍රියා කරන්න Military Police නමින් ඒකකයක් පිහිටුවා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ ගැනත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියා මා ඉල්ලා සිටිනවා. පොලිස් සිර මැදිරි ද ඇතුළුව පොලිස් ස්ථාන තුළ සිදු වන වැරැදි ගැන, පොලිස් නිලධාරින්ගේ අකටයුතුකම් ගැන, නීති විරෝධී ක්‍රියා ගැන, ඔවුන් කරන වැරැදි ගැන පැමිණිලි කරන්නත් යම්කිසි නිශ්චිත ආයතනයක්, ස්වාධීන ස්ථානයක් තිබෙනවා නම් පොලීසිය මීට වඩා හොඳ තැනකට ගෙන එන්න අපට පුළුවන් කියා මම හිතනවා.

මේ නූතන දියුණු මානව සමාජයේ අත්අඩංගුවට ගන්නා සැකකරුවන්ගේ මූලික අයිතිවාසිකම් රැක දීමට කැප වෙමින් මේ වාගේ සංශෝධන ගෙනැවිත් අපේ නීති පද්ධතිය යාවත්කාලීන කර, මේ සමාජයට ගැළපෙන විධියට සකස් කිරීම ඉතා කාලෝචිත පියවරක්. ඒ වෙනුවෙන් කටයුතු කිරීම සම්බන්ධයෙන් මම ගරු අධිකරණ අමාත්‍යතුමාට ස්තුතිය පුද කරනවා. ඉදිරියේදීත් නීති රීති සංශෝධන ගැන තවදුරටත් සංවාද ඇති කර ගනිමින්, අවශ්‍ය සංශෝධන කඩිනමින් කරමින් ඒවා සමාජයට ඵලදායී වන ලෙස ක්‍රියාත්මක කරන්න අවශ්‍ය කටයුතු සකස් කරන්න කියාත් මා ඉල්ලා සිටිනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු ජී.ජී. පොන්නම්බලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[4.06 p.m.]

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)

Hon. Presiding Member, I thank you for giving me some time to make a few comments on these Items taken up for debate today.

I would like to mainly restrict my comments to the OMP - the Office on Missing Persons. Initially, I would also like to welcome the Bills brought in to amend the Code of Criminal Procedure (Special Provisions) Act and the Convention Against Torture and other Cruel, Inhuman or Degrading Treatment or Punishment Act. Those are, no doubt, forward-moving steps. But, as several Members of this House, primarily from the Opposition, have repeatedly stated, I think implementing these laws is a crucial matter, which, I am sure, the Hon. Minister of Justice is fully aware of. This is a country which has a legacy of passing the Seventeenth Amendment to the Constitution, which is the supreme law of the country, and never implementing it when it came to the appointment of the Constitutional Council. At that time, there was a different President and she herself was involved in bringing the law, but eventually, never appointed that Constitutional Council. That was an Amendment brought to the supreme law of this country, supposedly the Constitution. So, I think there is a valid point made by the Opposition Members with regard to implementing these Amendments. The legacy that this country has created, I think, is appalling on that matter and as a result, there is great doubt with regard to the credibility of the entire judicial system.

Apart from those comments, I would like to talk about the Office on Missing Persons. Sir, the Office on Missing Persons and the Office for Reparations were created consequent to Resolution 30/1 passed in the UN Human Rights Council. That was a Resolution which was brought with the consent of the previous Government. Whilst the present Government vehemently criticized Resolution 30/1 and called it a "treacherous act", we, on the other hand - I am someone who goes to the Human Rights Council sessions as often as possible - criticized it as a complete betrayal of the victims. A country-specific Resolution was primarily mooted on the grounds that heinous crimes had taken place and accountability was required.

Instead of accountability being looked at, the previous Government managed to succeed, in my view, in actually getting Sri Lanka out of the clutches of the need for accountability by showing ancillary matters and fringe issues as progress. One of those was the Office on Missing Persons. There is a procedure within the UN Human Rights Council and also within the UN structure itself that whatever decisions taken should be victim-centric, that victims must have confidence in the process because if you do not have the confidence of the victims on board, they are not going to cooperate with whatever steps that are taken. The Office on Missions Persons was created when the victims had given so many recommendations and none of those recommendations were taken by the previous Government, but were ignored in creating the Office on Missing Persons. The victims or the forcibly disappeared people have repeatedly complained that there is no credibility with regard to this Office. Let me just very briefly quote some of those complaints that they have, in fact, put forward in writing.

> "How do you expect OMP to bring justice to us, when OMP Act Section13(2) mentions that the findings of the OMP could not be used in any civil or criminal cases for seeking justice?
>
> There is no transparency adopted in the selection of the Commissioners for the OMP. Selections were made by the Constitutional Council in which Sinhala politicians are also members, who repeatedly said that they will not allow any members of the security forces to face justice. Can OMP guarantee that alleged perpetrators will be brought to justice?
>
> Out of the seven Commissioners is a former senior security force officer. How can we go and seek justice from him? Can OMP take steps to remove him as its Commissioner?"

So, like that, they have listed so many valid doubts. Today, the victims or the forcibly disappeared in the North and the East - the Tamil victims - do not in fact have confidence in the OMP or in the Office for Reparations and are boycotting them. A vast majority of victims refused to go before the OMP. It is in that backdrop that the OMP was approved by the previous Government in this House and it is for that reason of window dressing, just to show the international community "some progress is being made", that these Offices were created and thereby, the previous Government managed to prolong the question of accountability for six years without any progress being made at all. Therefore, Sir, it is not surprising that the only Offices that this Government is willing to hold on to are the OMP and the Office for Reparations, which were created by Resolution 30/1. I think it is tragic, Sir, that we still, 12 years after ending the war, cannot understand that grave crimes had been committed against ordinary people and that it is the duty of the State to protect its people. If, in fact, those crimes had been committed by the armed forced, then those must be prosecuted. Even 12 years after the war, knowing fully well that crimes have been committed - these are responsible members who are holding office today - simply refusing even to go into it, I think, clearly shows how tragic this country is and quite honestly, for as long as this culture continues, we only create a perpetuated system of impunity.

Thank you.

[අ.භා. 4.14]

**ගරු උදයන කිරිඳිගොඩ මහතා**
(மாண்புமிகு உதயன சாமிந்த கிரிந்திகொட)
(The Hon. Udayana Kirindigoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

අධිකරණ ක්ෂේත්‍රයට අදාළ නීති ප්‍රතිසංස්කරණ කීපයක් ඉතා කඩිනමින් සිදු කරමින් සිටිනවා. අධිකරණ අමාත්‍යතුමා ප්‍රමුඛ අධිකරණ නීති සම්පාදක මණ්ඩලය විසින් යුගයට ගැළපෙන ආකාරයට, ජාත්‍යන්තරය සමඟ ගමන් කරමින් මේ රටේ නීතියේ ඇති කරගෙන යන්නා වූ ඒ ප්‍රවර්ධනයේ එක් කොටසක් ලෙස අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති නීති ප්‍රතිසංස්කරණ කටයුතු කීපයක් පිළිබඳව අප අද උදෑසන සිට විවාද කරනු ලබනවා.

[ගරු උදයන කිරිඳිගොඩ මහතා]

විශේෂයෙන්ම අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත සහ වධදීමට සහ අනිකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැළකීමට හෝ දඬුවම්වලට එරෙහිව වූ සම්මුතිය (සංශෝධන) පනත් කෙටුම්පත විවාදයට ගැනීමත් අප අද දින සිදු කරනවා. ඒ වාගේම 2013 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය සහ 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සාමාජිකයන්ගේ වැටුප් හා දීමනා ප්‍රතිශෝධනය කිරීම පිළිබඳවත් අද මෙම උත්තරීතර සභාව තුළ විවාදයට ලක් වනවා.

ඇත්තටම යම් යම් විරෝධතා සහ විවේචනවලට ලක් වුවත්, උත්තරීතර සභාවක් විධියට සියලුදෙනාම මෙම සංශෝධනවලට සිය එකඟතාව සහ කැමැත්ත ප්‍රකාශ කරනු ලබන බව සක්සුදක් සේ පැහැදිලි සහ දන්නා කාරණයක්. අධිකරණ ක්ෂේත්‍රයේ වසර ගණනාවක සේවය කළ පළපුරුද්ද තුළ අපි දන්නවා, බ්‍රිතාන්‍යයන්ගෙන් අපට උරුම වුණු රෝම - ලන්දේසි නීතිය අනුව නිර්මාණය වුණු මේ රටේ නීති ක්ෂේත්‍රය තුළ අලුත් යුගයට ගැළපෙන්නා වූ නව නීති සම්පාදනය කිරීමේ වගකීමක් තිබෙන බව. ඒ අනුව තමයි 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතට 43ආ වශයෙන් අලුත් වගන්තියක් එකතු කරන්න සිදු වෙලා තිබෙන්නේ. ඒ අනුව, පොලිස් ස්ථානවල අත්අඩංගුවේ පසුවන සැකකරුවන්ගේ සුබසාධනය සහ ඔවුන්ට එරෙහිව යම්කිසි ක්‍රියාවක් එම ස්ථානවලදී සිදු වෙනවාද නැද්ද යන්න, අවම වශයෙන් මාසයකට වතාවක්වත් පරීක්ෂා කර බැලීමට ගරු මහෙස්ත්‍රාත්වරුන්ට ලබා දීමට ඒ අවශ්‍ය පියවර ගැනීම සඳහා වන සංශෝධන පිළිබඳව අද මෙම පාර්ලිමේන්තුව තුළ විවාදයට ලක් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පසුගිය කාල සීමාව තුළ අත්විඳින ලද අත්අඩංගුවේ පසුවන්නන්ගේ ආරක්ෂාව සම්බන්ධ යම් යම් ගැටලුසහගත තත්ත්වය සම්බන්ධයෙන් ඉතාම වර්ධනීය, ප්‍රගතිදායක තීන්දුවක් විධියටයි මේ සංශෝධනය මා දකින්නේ. රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව, ඒ වාගේම අධිකරණයේ පූර්ව නිගමනය අනුව, යම්කිසි තැනැත්තෙක් අධිකරණය තුළින් වරදකරුවෙකු කරන තුරු ඔහු පිළිබඳව නිර්දෝෂීත්වයේ පූර්ව නිගමනය ක්‍රියාත්මක වෙනවා. ඔහු කුමන ආකාරයක චෝදනාවකට අත්අඩංගුවට පත් වුවත් ඔහු ආරක්ෂා කිරීමේ වගකීම රජය සහ ආරක්ෂක අංශ සතු යුතුකමක් බව සියලුදෙනාම පිළිගන්නා කාරණයක්. ආරක්ෂක අංශයේ ක්‍රියාකාරීත්වය නිසා යම් ආකාරයකින් චූදිතයන්ට හානියක් සිදු වුණා නම්, ඔවුන්ට වධ හිංසන ලබා දීමක් සිදු වුණා නම්, අප විසින් අත්සන් කර ඇති අන්තර්ජාතික ප්‍රඥප්තිවලින් ඔවුන් ආරක්ෂා කරගන්නා වූ ක්‍රමවේදය තවදුරටත් ඉදිරියට ගෙන යාමක් අද ගෙන එන ලද සංශෝධන සම්මත කිරීම හරහා ක්‍රියාත්මක කරනවා.

මා හිත මිත්‍ර ගජේන්ද්‍ර කුමාර් පොන්නම්බලම් මැතිතුමා ප්‍රකාශ කළා, වර්තමාන ආණ්ඩුව වෙන කළ යුත්තක් නැති තැන යම් කිසි සාධනීය ක්‍රියාමාර්ගයක් ගන්නා බව අන්තර්ජාතිකයට පෙන්වීමේ හුදු අභිලාෂයෙන් පමණක්, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සාමාජිකයන්ගේ වැටුප් හා දීමනා ප්‍රතිශෝධනය කිරීම පිළිබඳ මෙම යෝජනාව ගෙනැවිත් තිබෙනවා කියලා. මම හිතන විධියට කියන්නට දෙයක් නැතිකමට වාගේම, මේ රටේ අනාගත ආරක්ෂාවට ගෙන එන්නා වූ ක්‍රියාමාර්ග තුළ එතුමන්ලාගේ දේශපාලන දර්ශනයට හානියක් සිදුවන නිසා, ඒකට විරුද්ධව කටයුතු කිරීම තමයි අපි පසුගිය කාල සීමාව පුරාවටම දැක්කේ. අවුරුදු ගණනාවක් නඩු පැවරීමකින් තොරව රඳවා තබාගෙන සිටින සැකකරුවන් නිදහස් කිරීම සම්බන්ධයෙන් පසුගිය පාර්ලිමේන්තු වාරය තුළ කථා කරන කොටත්, "කුමන ස්ථාවර නියෝග යටතේද ඒ ප්‍රකාශය කරන්නේ" කියලා අහන්නට තරම් සැහැසි වෙන්නට විපක්ෂයේ මන්ත්‍රීවරුන් ක්‍රියා කළා. එය, මේ රටේ අධිකරණ ක්ෂේත්‍රයේත්, මානව අයිතිවාසිකම් සම්බන්ධයෙන් දැඩි උනන්දුවක් දක්වන්නන්ගේත් විවේචනයට ලක් වෙනවාය කියන එක නියත කාරණයක්.

වර්තමානයේ පවතින කොරෝනා වසංගතයත් එක්ක ඇති වී තිබෙන ජාතික සහ අන්තර්ජාතික තත්ත්වය තුළ, අධිකරණ ක්ෂේත්‍රයේ ගමන් මාර්ගය සම්බන්ධයෙනුත් අපි වඩාත් අවධානය යොමු කළ යුතු වෙනවා, ගරු අධිකරණ ඇමතිතුමනි. 2020 වසරේ මාස තුනකට අධික කාලයක් අධිකරණ කටයුතු ප්‍රමාද වුණා. ඒ වාගේම 2021 වසරේ අපේ සිංහල අලුත් අවුරුද්දෙන් පසුව මාස දෙකකට අධික කාලයක් තිස්සේ අධිකරණ කටයුතු නිසි ආකාරයෙන් පවත්වාගෙන යන්නේ නැහැ. මේ තත්ත්වය තුළ අධිකරණයේ සහනය පතන්නන්ට, මේ කාලය තුළ අධිකරණය තුළින් තමන්ගේ ප්‍රශ්නවලට විසඳුම් හොයන්නන්ට විශාල අගතියක් සිදු වෙලා තිබෙනවා.

ශ්‍රී ලංකා නීතිඥ සංගමය තුළ නීතිඥවරුන් වශයෙන් ලියාපදිංචි වූ 21,000ක් පමණ මේ වනවිට නීතිඥ වෘත්තියේ නියැළී සිටින බව අපි දන්නවා. මගේ දැනුම අනුව ඔවුන්ගෙන් 16,000ක් හෝ 17,000ක් පමණ අධිකරණ ක්‍රියාවලියට සක්‍රිය දායකත්වයක් ලබා දෙනවා. මේ සියලුදෙනාම රටට බරක් නැති, තමන්ගේ හැකියාව අනුව රටට ආදායම් බදු ගෙවමින් රටේ ආර්ථිකය ශක්තිමත් කරන පුරවැසියන් පිරිසක්; රැකියා සම්බන්ධව උද්ඝෝෂණය නොකරන පිරිසක්; ඔවුන්ගේ වෘත්තීය පරිසරය තුළින් තවත් සේවකයන් රැසක් -තවත් පවුල් රැසක්- නඩත්තු කරන පිරිසක්. ඒ නිසා ඉතා ආරක්ෂාකාරීව අධිකරණ කටයුතුවල නියැළීම සඳහා නීතිඥවරුන් එන්නත් කිරීම ඉක්මනින්, ක්‍රමානුකූලව සිදු කළ යුතු බව මම මේ අවස්ථාවේදී ගරු අධිකරණ ඇමතිතුමාට මතක් කරන්න කැමැතියි. අධිකරණ කටයුතුවල නියැළීමේදී අවශ්‍ය දුරස්ථභාවය පවත්වා ගනිමින් සෞඛ්‍ය ආරක්ෂිත ලෙස තමන්ගේ වෘත්තීය කටයුතු කරන්නට නොහැකි බව අපි දන්නවා. අධිකරණයට පැමිණෙන පුද්ගලයන් රටේ කුමන දිසාවෙන්, කුමන ආකාරයට පැමිණෙනවාද කියා හඳුනා ගැනීමේ අපහසුතාවක් අපට තිබෙනවා. එම නිසා සෞඛ්‍ය අංශ සහ කොරෝනා වසංගතය සම්බන්ධව පිහිටුවා තිබෙන කොරෝනා මර්දන ජනාධිපති කාර්යසාධක බලකාය දැනුවත් කරලා, එන්නත්කරණ වැඩ පිළිවෙළ හැකි ඉක්මනින් ක්‍රියාත්මක කර, අධිකරණ කටයුතු නිසි පරිදි ආරම්භ කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මා දන්නා විධියට ලංකාවේ නීතිඥවරුන් 500ක්වත් එන්නත්කරණයට ලක් වෙලා නැහැ. එම නිසා මේ කාරණයට අවධානය යොමු කරලා, රටේ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට දායක වන නීතිඥවරුන් එන්නත්කරණය කර, හෙට දවසේ රටේ ජනතාවගේ මානව අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ ව්‍යාපෘතිය ගෙන යාමට ඔවුන්ට අවශ්‍ය ශක්තිය ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

*අනතුරුව ගරු සමන්ප්‍රිය හේරත් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.*

*அதன்படி, மாண்புமிகு சமன்பிரிய ஹேரத் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SAMANPRIYA HERATH *left the Chair, and* THE HON. SPEAKER *took the Chair.*

**ගරු උදයන කිරිදිගොඩ මහතා**
(மாண்புமிகுஉதயனசாமிந்தகிரிந்திகொட)
(The Hon. UdayanaKirindigoda)

ගරු කථානායකතුමනි, ළමා අපයෝජන සහ කාන්තා හිංසන සම්බන්ධයෙන් ඊයේ - පෙරේදා අපට අහන්නට ලැබුණා. ඒ සම්බන්ධයෙන් පනවන නීති තදින් ක්‍රියාත්මක කළ යුතු බවත්, ඒ සඳහා ලබා දෙන දඬුවම් සම්බන්ධයෙන් මීට වඩා වැඩි අවධානයක් යොමු කළ යුතු බවත් අධිකරණ කටයුතු පිළිබඳ සාකච්ඡා කරන මේ මොහොතේදී මා අවධාරණය කරන්න කැමතියි. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම සම්බන්ධයෙන් ගරු ජී.ජී. පොන්නම්බලම් මැතිතුමා එතුමාගේ කථාවේදී ප්‍රකාශ කළා. එතුමා කථාව අවසන් කරන්නේ පසුගිය යුද වාතාවරණය අවසන් වෙලා වසර 12ක් ගත වුණත් තමන් මේ රටින් බලාපොරොත්තු වුණු සහනය නොලැබුණු බව ප්‍රකාශ කරමින්. හැබැයි, මේ රටේ අවුරුදු 30ක් තිස්සේ පැවති කුරිරු යුද්ධය නිසා සිවිල් පුරවැසියන් කොතරම් සංඛ්‍යාවක් විනාශ වුණාද කියන කාරණය එතුමාට කියන්න අමතක වුණා. පුදුමාතලන්හි පැවති අවසන් සටනේදී 350,000ක පමණ අහිංසක ද්‍රවිඩ පුරවැසියන් ශ්‍රී ලංකා හමුදාව විසින් රැක ගත්තේ කොහොමද, අත්අඩංගුවට ගත් 12,000කට අධික එල්ටීටීඊ සැකකරුවන් -එල්ටීටීඊ ක්‍රියාකාරින්- පුනරුත්ථාපනය කළේ කෙසේද, 3,500කට අධික පිරිසක් ආරක්ෂක සේවයට බඳවා ගත්තේ කොහොමද කියා අන්තර්ජාතික ප්‍රජාව දැනුවත් කිරීමට තරම් එතුමන්ලා කෘතඥ නොවීම ගැන අපි කනගාටු විය යුතුයි. 1985දී අනුරාධපුර පූජා භූමියට එල්ල වුණු ප්‍රහාරයෙන් 146 දෙනෙකුට ජීවිත අහිමි වුණා. මහනුවර ශ්‍රී දළ දා මාළිගාවට එල්ල වුණු බෝම්බ ප්‍රහාරය ගැන වාගේම, දේශපාලන ක්ෂේත්‍රයේ ක්‍රියාකාරින් වුණු ලක්ෂ්මන් කදිර්ගාමර් මැතිතුමා, ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ මැතිතුමා, නීලන් තිරුචෙල්වම් මැතිතුමා වැනි අයගේ ජීවිත මේ කුරිරු ත්‍රස්තවාදයත් සමඟ විනාශ වීම ගැන කථා කරන්නට එතුමන්ලාගේ දිව නොනැමෙන්නේ මක් නිසාද කියන කාරණය මට නම් හිතා ගන්නට බැහැ. ඒ නිසා මේ රටේ ඉතිහාසයේ සිදු වුණු වැරැද්ද නැවත සිදු වෙන්නට ඉඩ තබනවාද කියන කාරණය කෙරෙහි මේ උත්තරීතර සභාව අවධානය යොමු කරන්න ඕනෑ. පසුගිය කාලයේ සිදු වූ වැරැදි දේවල් මොනවාද කියා අවබෝධ කරගෙන, එකාවන්ව ඉදිරියට යන්න පුළුවන් නම් තමයි මේ රටේ අනාගතය ගොඩ නඟන්නට අපට පුළුවන් වන්නේ. එහෙම වුණොත් තමයි රටක්, ජාතියක් විධියට "ශ්‍රී ලංකාව" කියන නාමය ලෝකය ඉදිරියේ රඳවන්නට අපට පුළුවන් වෙන්නේ.

ලෝක ආර්ථික අර්බුදයට වාගේම කොරෝනා වසංගතයට ආණ්ඩුව මේ වනවිට සාර්ථකව මුහුණ දෙනවා. නමුත්, ආණ්ඩුව කරන මේ කටයුතු විවේචනය කරනවාට වඩා, ඒ සඳහා සහයෝගය ලබා දීමයි විපක්ෂයක යුතුකම විය යුත්තේ.

කාබනික විප්ලවය අපි ආරම්භ කළේ වෙන විකල්පයක් නැති නිසායි. එම විප්ලවයට කොච්චර ශක්තියක් ජනතාවගෙන් ලැබෙනවාද කියන කාරණය අපි අත්දැකීමෙන් දන්නවා. ඊයේ පමණක් කාබනික පොහොර නිෂ්පාදනය පිළිබඳව වාගේම, ජීව පොහොර නිෂ්පාදනය පිළිබඳව තරුණයන් පස්දෙනෙක් ඇවිල්ලා මාත් එක්ක සාකච්ඡා කළා. ඔවුන් කියනවා, "අපට අවශ්‍ය දැනුම දෙන්න. අපට හැකියාව තිබෙනවා. ඒ කටයුත්ත කරන්න අපි සූදානම්" කියලා. මේ අභියෝගය ඉදිරියේදී ජය ගන්න පුළුවන් තරුණ හඬක්, තරුණ ජවයක් තිබෙන මිනිසුන් ඉන්නා රටක් තමයි අපේ රට. අභියෝගවලට භය වෙලා, පලා යන්නේ නැතිව, අභියෝග විවේචනය කරමින් එකම කොඩිය රට වටේ ගෙනිහිල්ලා, එකම විරෝධතා පුවරුව රට වටේ ගෙනිහිල්ලා, ආණ්ඩුවට විරුද්ධව කටයුතු කරන එක නොවෙයි, වගකිව යුතු විපක්ෂයක වගකීම විය යුත්තේ කියා මම හිතනවා. විපක්ෂයක් විධියට මේ සටනට උර දෙන්න; ජනතාවගේ හදවත්වලට කථා කරන්න.

රසායනික පොහොර භාවිතය නිසා මේ රටේ පොළොව නිසරු වෙලා තිබෙන බව අපි දන්නවා. රසායනික පොහොර නැති වුණාම දවස් දෙකක් තුනක් යනකොට ගොයම හෝ වගාව විනාශ වෙනවා නම්, කහ පාට වෙනවා නම්, පසට අපි කරලා තිබෙන හානිය කොච්චරද කියලා අපට තේරුම් ගන්න පුළුවන්. හැබැයි, අපට පස විතරක් නොවෙයි වෙනස් කරන්න සිදු වෙන්නේ. මිනිසුන්ගේ ඔළුවත් වෙනස් කරන්න වෙනවා. අවුරුදු 70ක් මුළුල්ලේ රසායනික කෘෂිකර්මයට පුහුණු වෙච්ච මිනිසුන්ගේ ඔළුව වෙනස් කිරීම ආණ්ඩු පක්ෂයට විතරක් තනිව කරන්න අමාරුයි. ඒ නිසා විපක්ෂයත් අපිත් එක්ක අත්වැල් බැඳ ගත්තොත් ඉතා සුරක්ෂිත රටක්, සුරක්ෂිත ජනතාවක් බිහි කරලා, මේ රටේ ජීවත් වන ජනතාවගේ මානව හිමිකම් ආරක්ෂා කරන්න හැකියාව ලැබෙනවාය කියන කාරණය මම කිව යුතුයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසාන වී ගෙනයි යන්නේ. දැන් කථාව අවසන් කරන්න.

**ගරු උදයන කිරිදිගොඩ මහතා**
(மாண்புமிகு உதயன சாமிந்த கிரிந்திகொட)
(The Hon. Udayana Kirindigoda)

හොඳයි.

අද ගරු අධිකරණ අමාත්‍යතුමා විසින් ගෙන එන ලද සියලු යෝජනා නීතියේ ප්‍රගතියටත්, මානව අයිතිවාසිකම්වල ප්‍රගමනයටත් හේතු වන්නා වූ යෝජනා හෙයින් මේ සම්බන්ධයෙන් ඔබතුමාටත්, අධිකරණ අමාත්‍යාංශයේ නිලධාරින්ටත් අපේ ස්තුතිය පුද කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අද දින වැඩ කටයුතු අවසාන වනතෙක් කාලය ලබා දෙන ලෙස සභාවෙන් ඉල්ලා සිටිනවා. සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත - දෙවන වර කියවීම, සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

*මතු පළවන යෝජනාව සභා සම්මත විය.:*
*''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය.'' - [ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා]*

*தீர்மானிக்கப்பட்டது:*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [ மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. M.U.M. Ali Sabry]*

*කාරක සභාවෙහිදී සලකා බලන ලදී.*
*[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]*

*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[THE HON. SPEAKER in the Chair.]*

***1 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 1, ordered to stand part of the Bill.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

2 වන වගන්තියට සංශෝධන ඉදිරිපත් කිරීම, ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "1 වන පිටුවේ, 9 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

> '43(ආ). (1) පොලිස් ස්ථානවල, ත්‍රස්තවාදී විමර්ශන අංශය, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ අනෙකුත් රැඳවුම් මධ්‍යස්ථානවල අත්අඩංගුවේ' "

(2) "1 වන පිටුවේ, 17 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

> 'පිහිටා ඇති සෑම පොලිස් ස්ථානයකටම, ත්‍රස්තවාදී විමර්ශන අංශයේ, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හෝ අනෙකුත් රැඳවුම් මධ්‍යස්ථානයකට ම යටත්' "

(3) "1 වන පිටුවේ, 20 සහ 21 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

> '(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා, පොලිස් ස්ථානය හෝ රැඳවුම් මධ්‍යස්ථානය වෙත පැමිණෙන මහෙස්ත්‍රාත්වරයා විසින්-' "

(4) "1 වන පිටුවේ, 24 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

> 'එම සැකකරු එම පොලිස් ස්ථානයේ හෝ රැඳවුම් මධ්‍යස්ථානයේ' "

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු අමාත්‍යතුමා, එම සංශෝධන පිළිගන්නවාද?

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)

පිළිගන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

2 වන වගන්තිය ඇති සැටියෙන් සම්මතයි.

***2 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*2ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 2, ordered to stand part of the Bill.*

***3 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*3ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 3, ordered to stand part of the Bill.*

*ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.*

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported without Amendment.*

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)

Sir, I move,

"That the Bill be now read the Third time."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.*
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read the Third time, and passed.*

# වධදීමට සහ අනිකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැළකීමට හෝ දඬුවම්වලට එරෙහිව වූ සම්මුතිය (සංශෝධන) පනත් කෙටුම්පත
## சித்திரவதை மற்றும் வேறு கொடூரமான, மனிதாபிமானமற்ற அல்லது கீழ்த்தரமாக நடத்துதல் அல்லது தண்டித்தல் என்பவற்றுக்கெதிரான சமவாயம் (திருத்தம்) சட்டமூலம்
## CONVENTION AGAINST TORTURE AND OTHER CRUEL, INHUMAN OR DEGRADING TREATMENT OR PUNISHMENT (AMENDMENT) BILL

*දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***
***''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය.'' -[ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා ]***

*தீர்மானிக்கப்பட்டது:*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக."- [மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. M.U.M. Ali Sabry]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*
*[*THE HON. SPEAKER *in the Chair.]*

***1 සිට 3 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகத்திலிருந்து 3ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 1 to 3 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.***
*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported without Amendment..*

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the Third time, and passed.*

## අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත: නියමය
## குற்றவியல் நடவடிக்கைமுறை சட்டக்கோவை (விசேட ஏற்பாடுகள்) சட்டம்: கட்டளை
## CODE OF CRIMINAL PROCEDURE (SPECIAL PROVISIONS) ACT: ORDER

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2013 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7(2) වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2020 දෙසැම්බර් 23 දිනැති අංක 2207/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.03.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සාමාජිකයන්: වැටුප් හා දීමනා
## காணாமற்போன ஆட்கள் பற்றிய அலுவலகத்தின் உறுப்பினர்கள்: சம்பளம் மற்றும் கொடுப்பனவுகள்
## MEMBERS OF OFFICE ON MISSING PERSONS: SALARIES AND ALLOWANCES

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනතෙහි II කොටසේ 10(1) වගන්තිය මඟින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙත පැවරී ඇති බලතල හා කාර්යයන් ඉටු කරලීම පිණිස උක්ත පනතේ 4(1) හා 6 වගන්ති ප්‍රකාරව සාමාජිකයන් 07 දෙනෙකු පත් කර ඇති අතර ඉන් එක් සාමාජිකයෙකු එම කාර්යාලයේ සභාපතිවරයා වශයෙන් පත් කර ඇති හෙයින් ද;

එම නිලධාරින් හට 2016 අංක 14 දරන පනතේ 20 වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන වැටුපක් ගෙවීමට හා එය ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු බවට සඳහන් වී ඇති හෙයින් ද;

අංක 18/0689/705/001 හා 2018.06.05 දිනැති සංශෝධිත අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් ලබා දුන් අනුමතිය හා 2018.09.04 දිනැතිව පාර්ලිමේන්තුවේ සම්මත වූ යෝජනාව අනුව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සභාපතිවරයා හට රු.100,000/-ක මාසිකව දීමනාවක්ද, රු.10,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, මාසිකව ඉන්ධන ලීටර් 225ක් ද, එම කාර්යාලයේ සාමාජීයන් හට රු.75,000/- ක මාසික දීමනාවක් ද, රු.8,000/-ක මාසික දුරකථන දීමනාවක් ද හා නිවසේ සිට කාර්යාලය වෙත ඇති දුර ප්‍රමාණය මත පදනම්ව කි.මී.350ක සීමාවක් දක්වා රු.25,000/- හෝ කි.මී.350ක් හෝ ඊට වැඩි දුර ප්‍රමාණයක් සඳහා රු.50,000/-ක ප්‍රවාහන දීමනාවක් ද සඳහා හිමිකම් ලබන හෙයින් ද;

[ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා ]

අධිකරණ අමාත්‍යාංශය යටතේ ඇති හානි පූර්ණ කාර්යාලයේ සාමාජිකයන් සඳහා වැටුප් තීරණය කරනු ලබන්නේ ද පාර්ලිමේන්තුව විසින් වන අතර 2019.09.20 දිනැතිව සම්මත කරන ලද යෝජනාව අනුව එම නිලධාරීන්ගේ වැටුප් සංශෝධනය කර ඉහළ අගයක් ලබා දී ඇති හෙයින් ද;

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සභාපති ඇතුළු සාමාජියන් හට ද 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනතෙහි 20 වගන්තිය ප්‍රකාරව 2020.11.30 දින සිට වේතන හා දීමනා පහත පරිදි ගෙවීමට තීරණය කිරීම සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අංක අමප/21/0362/330/022 හා 2021.03.08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමතිය ලබා දී ඇති හෙයින් ද:-

(අ) අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සභාපතිවරයා හට මාසික දීමනාව, දැනට ලබා දෙන ඉන්ධන හා දුරකථන දීමනාවට අමතරව රු.100,000/- සිට රු.135,000/- දක්වා වැඩි කිරීම;

(ආ) සභාපතිවරයාගේ භාවිතය සඳහා නිල වාහනයක් ලබා නොදෙන අවස්ථාවල අංක PED 1/2015(i) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ සඳහන් වන පරිදි සභාපතිවරයාගේ පෞද්ගලික වාහනය රාජකාරි සඳහා භාවිතා කිරීම වෙනුවෙන් රු.50,000/-ක මාසික දීමනාවක් ලබා දීම; සහ

(ඇ) අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සාමාජිකයන් හට මාසික දීමනාව, දැනට ලබා දෙන ඉන්ධන හා දුරකථන දීමනාවට අමතරව රු.75,000/- සිට රු.90,000/- දක්වා වැඩිකර ගෙවීම.

ඊට අනුකූලව, 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනතෙහි 20 වගන්තිය ප්‍රකාරව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සභාපති ඇතුළු සාමාජිකයන් හට රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් මාසික වැටුප් හා දීමනා ගෙවීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්න.

## කල්තැබීමේ ප්‍රශ්න
## ஒத்திவைப்பு வினாக்கள்
## ADJOURNMENT QUESTIONS

**ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා**
(மாண்புமிகு இசுரு தொடன்கொட)
(The Hon. Isuru Dodangoda)

ගරු කථානායකතුමනි, මෙම අවස්ථාව මාහට ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු කථානායකතුමනි, සභාව කල් තබන අවස්ථාවේ මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ ගරු වැවිලි අමාත්‍යතුමා වෙතයි.

විශේෂයෙන්ම තේ වගාව ආශ්‍රිතව විශාල පිරිසක් මා නියෝජනය කරන ආසනයේත්, ඒ වාගේම අපේ දිස්ත්‍රික්කය තුළත්, තවත් දිස්ත්‍රික්ක ගණනාවකත් ජීවත් වෙනවා. අපේ රටේ ආර්ථිකයට සුවිශාල මුදලක් ලබා දෙන්න තේ කර්මාන්තය දායක වෙනවා. වර්තමානයේ දී රසායනික පොහොර භාවිතය තහනම් කිරීමත් සමඟ අනාගතයේ දී කාබනික පොහොර යොදා ගනිමින් වැඩ කටයුතු සිදු කරන්න බලාපොරොත්තු වන ආකාරය ගැන ප්‍රශ්නයක් අපේ ගරු ඇමතිතුමාගෙන් විමසන්නට මම කැමතියි.

මේ වන විට ශ්‍රී ලංකාව තුළ රසායනික පොහොර භාවිතය සම්පූර්ණයෙන්ම ඉවත් කර, කාබනික පොහොර භාවිතයට ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කරමින් පවතී. නමුත්, තමන්ගේ වගාව සඳහා රසායනික පොහොර භාවිතයේ අවශ්‍යතාව දැඩිව පවතින බව තේ කර්මාන්තයේ නියැලෙන තේ වගාකරුවන් පවසා සිටී. මේ වන විට පවතින පොහොර හිඟය නිසා තේ කර්මාන්තයේ බිඳ වැටීමක් ඇති වුවහොත්, ඒ නිසා ශ්‍රී ලංකාවේ තේ අපනයනය පහළ වැටී එමඟින් රටේ ආර්ථිකයට ද විශාල බලපෑම් එල්ලවන බව ඔවුන් පවසයි. මෙම තත්ත්වය මත,

I. තේ වගාකරුවන්හට අවශ්‍ය රසායනික පොහොර ලබා දීමට කටයුතු කරන්නේ ද?
II. විශේෂයෙන් තේ පැළ වගා කිරීමට අවශ්‍ය පොහොර ලබා දෙන්නේ ද?
III. එසේ නම් ඒ සඳහා සුදුසු වැඩ පිළිවෙළක් තිබේ ද?
IV. රසායනික පොහොර භාවිතයෙන් ඉවත් වී ඉදිරියේ දී කාබනික පොහොර තේ වගාව සඳහා යොදා ගැනීමට මේ වන විට වැඩ පිළිවෙළක් සකස් කර තිබේද?

යන්න මෙම ගරු සභාවට දන්වන මෙන් ඉල්ලා සිටිමි.

**ගරු කනක හේරත් මහතා (සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கனக ஹேரத் - கம்பனித் தோட்டங்களை மறுசீரமைத்தல், தேயிலை மற்றும் இறப்பர் தோட்டங்கள் சார்ந்த பயிர்ச்செய்கை, தொழிற்சாலைகளை நவீனமயப்படுத்தல் மற்றும் தேயிலை மற்றும் இறப்பர் ஏற்றுமதி மேம்பாட்டு இராஜாங்க அமைச்சர்)
(The Hon. Kanaka Herath - State Minister of Company Estate Reforms, Tea and Rubber Estates Related Crops Cultivation and Factories Modernization and Tea and Rubber Export Promotion)

ගරු කථානායකතුමනි, ගරු වැවිලි අමාත්‍යතුමා වෙනුවෙන් මා මෙම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා. ගරු ඉසුරු දොඩන්ගොඩ මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

I. ඔව්.

මේ වන විට රට පුරා පවතින රසායනික පොහොර තොගයෙන් තේ ක්ෂේත්‍රය සඳහා දැනටමත් වෙන්කර ඇති මෙට්‍රික්ටොන් 5,2000ක පොහොර ප්‍රමාණයක් තේ වගාකරුවන්

වෙත බෙදා හැරීමට දැනටමත් ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකසා ඇති අතර, එම ප්‍රමාණය මෙම වසරේ ඉදිරි කාලය සඳහා ප්‍රමාණවත් වේ.

තේ වගාකරුවන් විසින් පසුගිය මාස 4ක කාලය තුළ තේ කර්මාන්තශාලා වෙත සපයන ලද අමු තේ දලු ප්‍රමාණ පදනම් කරගෙන ඔවුන් වෙත නිකුත් කළ යුතු රසායනික පොහොර ප්‍රමාණය ගණනය කිරීම සිදු කරන ලද අතර, එම ප්‍රමාණ විධිමත්ව අදාළ තේ කර්මාන්තශාලා හරහා තේ වගාකරුවන් වෙත ලබාදීමට මේ වන විටත් කටයුතු කර ඇත. ඒ අනුව, දැනටමත් ජාතික පොහොර ලේකම් කාර්යාලය මඟින් නිකුත් කරන ලද රසායනික පොහොර තොග සහකාර තේ කොමසාරිස්වරුන්ගේ නිර්දේශ මත වගාකරුවන් විසින් සපයන ලද අමු දලුවලට අනුපාතිකව තේ කර්මාන්තශාලා මඟින් නිකුත් කරමින් පවතී.

මේ ප්‍රශ්නයෙහි පිළිතුර ගරු මන්ත්‍රීතුමාට මා ලබා දෙන්නම්. එය පහත වගුවේ අඩංගු වෙනවා.

පොහොර සමාගම් විසින් තේ කර්මාන්තශාලා වෙත නිකුත් කර ඇති පොහොර ප්‍රමාණය:

| දිස්ත්‍රික්කය | කර්මාන්තශාලා ගණන | නිර්දේශිත පොහොර ප්‍රමාණය (Mt) | 2021.07.05 දිනට පොහොර සමාගම් විසින් නිකුත් කර ඇති පොහොර ප්‍රමාණය මෙ.ටො. |
|---|---|---|---|
| බදුල්ල | 54 | 4,168 | 272 |
| ගාල්ල | 103 | 7,104 | 2926 |
| කළුතර | 27 | 3,047 | 995 |
| කෑගල්ල | 19 | 1,864 | 585 |
| නුවර | 74 | 5,051 | 856 |
| මාතලේ | 6 | 336 | 45 |
| මාතර | 84 | 5,884 | 2820 |
| නුවරඑළිය | 117 | 10,512 | 657 |
| රත්නපුර | 91 | 11,161 | 3479 |
| එකතුව | 575 | 49,132 | 12,636 |

ඉහත වගුවට අනුව දැනට කුඩා තේ වතු හිමිකරුවන් සියලුදෙනා සහ අපේ සමාගම්වල සියලුදෙනා ඉල්ලීම කරලා තිබෙන්නේ මෙට්‍රික්ටොන් 49,132ක ප්‍රමාණයක්. එයින් දැනට මෙට්‍රික්ටොන් 12,636ක් ලබා දීලා තිබෙනවා. කුඩා තේ වතු හිමියන්ගේ ඉල්ලීම තිබෙන්නේ මෙට්‍රික්ටොන් 39,000යි. ඒකෙන් මෙට්‍රික්ටොන් 12,636ක් ලබා දීලා තිබෙනවා. උදාහරණයක් ගත්තාම, අපේ ගරු මන්ත්‍රීතුමා නියෝජනය කරන ගාල්ල දිස්ත්‍රික්කයට නිර්දේශ ප්‍රමාණය මෙට්‍රික්ටොන් 7,104යි. ඒකෙන් මෙට්‍රික්ටොන් 2,926ක් ලබා දී තිබෙනවා. දැනටම සියයට 40ක් පමණ ලබාදී තිබෙනවා.

II. ඔව්. තේ ක්ෂේත්‍රය සඳහා දැනට වෙන් කර ඇති රසායනික පොහොර ප්‍රමාණයෙන් තේ පැළ වගා කිරීම සඳහා ද පොහොර ලබා දෙනු ලැබේ. දැනටමත් T-200 කියන පොහොර වර්ගයේ යම් ප්‍රමාණයක් ලබා දෙන්න කටයුතු කර තිබෙනවා. එහි අවශ්‍ය ප්‍රමාණය හැටියට හඳුනාගෙන තිබෙන්නේ මෙට්‍රික්ටොන් 1,800යි. ඊළඟට, T- 65 කියන පොහොර වර්ගය ඊයේ සිට කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මඟින්ම ඇණවුම් කරලා, එම අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල මඟින් ඒවා ලබාදීමට කටයුතු කර තිබෙනවා. මෙහි යම් අඩු පාඩු තිබෙන්න පුළුවන්. ඒ නිසා යම්කිසි ගැටලුවක් තිබෙනවා නම්, තමන්ගේ කොට්ඨාසයේ සිටින නිලධාරියා දැනුවත් කරන්න කියලාත් අපි ඉල්ලා සිටිනවා.

III. ඔව්. දැනටමත් ඒ වැඩ පිළිවෙළ ආරම්භ කර තිබෙනවා. තේ පැළ වගාව සඳහා වන පොහොර අවශ්‍යතාව කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නිර්දේශ සමඟ අදාළ ප්‍රදේශයේ තේ කර්මාන්තශාලා වෙත ඉදිරිපත් කිරීමෙන් අවශ්‍ය පොහොර ප්‍රමාණය වගාකරුවාට ලබාගත හැකි වන පරිදි වැඩ පිළිවෙළක් සකස් කර ඇත.

ඒවා නිෂ්පාදනය කරන සමාගම්වලින් නිෂ්පාදනය කළාට පස්සේ තමයි අපට ලැබෙන්නේ. ඒ නිසා තමයි යම් අඩු පාඩු තිබෙන්නේ. නමුත්, සති දෙකක් තුනක් ඇතුළතදී සියයට සියයක්ම ඒ ප්‍රමාණය ලබාදීමට අපට හැකියාවක් ලැබෙනවා.

IV. ඔව්.

i. තේ පර්යේෂණ ආයතනය විසින් දැනටමත් තේ වගාවට අවශ්‍ය කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය සඳහා නියමිත පිරිවිතර සහ මාර්ගෝපදේශ සකස් කර ඇත.

ii. 2021 අය වැය මඟින් වෙන් කරන ලද රුපියල් මිලියන 20ක ප්‍රතිපාදන යටතේ, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් කාබනික පොහොර නිෂ්පාදන මධ්‍යස්ථාන 8ක් පිහිටුවීමට කටයුතු කරමින් පවතින අතර, එහි කාබනික පොහොර නිෂ්පාදන ධාරිතාව මාසිකව මෙට්‍රික්ටොන් 40ක් පමණ වනු ඇත. මේ යටතේ පළමු මධ්‍යස්ථානය හිඟුල දී 2021.07.04 දින ආරම්භ කරන ලදී.

2021 අගෝස්තු මස වන විට ප්‍රධාන දිස්ත්‍රික්ක අටෙහි අනෙක් සියල්ලම ආරම්භ කරන්නත් බලාපොරොත්තු වනවා. විශේෂයෙන්ම අපේ නිෂ්පාදන ගොවියාට ලබා දෙන්න වාගේම, ආදර්ශ නිෂ්පාදනාගාරයක් හැටියට ගොවියා දැනුවත් කිරීමත් මේ තුළින් බලාපොරොත්තු වෙනවා.

iii. ඊට සමගාමීව, සෑම තේ පර්යේෂණ කොට්ඨාසයකම කාබනික පොහොර නිෂ්පාදනය සඳහා මධ්‍යම පරිමාණයේ නව ව්‍යවසායකයන් පස්දෙනෙකු හඳුනාගෙන වගාකරුවන් දැනුවත් කිරීම සඳහා පුහුණු වැඩමුළුවක් සිදු කිරීමටත් කටයුතු සම්පාදනය කර ඇති අතර, මේ යටතේ අවම වශයෙන් කාබනික පොහොර නිපැයුම් මධ්‍යස්ථාන 500ක් මුළු රටේම ස්ථාපිත කිරීම සඳහා දැනටමත් වැඩ ආරම්භ කර තිබෙනවා.

iv. ශ්‍රී ලංකා තේ මණ්ඩලය මඟින් මහා පරිමාණයේ පුද්ගලික ව්‍යවසායකයන් දිරිමත් කිරීම සහ නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීම සඳහා ලක්ෂ තුනේ සිට ලක්ෂ පහක සහනාධාරයක් ඇතිව වැඩ පිළිවෙළක් ආරම්භ කර තිබෙනවා. ඒ වැඩසටහන ක්‍රියාත්මක වෙමින් පවතිනවා.

v. අක්කර භාගයට අඩු තේ වගා ගොවීන් අවම වශයෙන් 4,000ක් පමණ -ඒ කියන්නේ, කුඩා පරිමාණ ගොවීන් තමන්ගේම වගාව සඳහා නිෂ්පාදනය කරන පොහොර ප්‍රමාණය- ස්වකීය කාබනික පොහොර අවශ්‍යතාව සපයා ගත හැකි වන පරිදි කුඩා පරිමාණයේ කාබනික පොහොර නිපදවන්නන් බවට පත් කිරීම සඳහා වැඩ

[ගරු කනක හේරත් මහතා ]

පිළිවෙළක් ක්‍රියාත්මක කර තිබෙනවා. මේ සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් එක් ගොවියෙකුට රුපියල් 12,500ක් ලබා දෙන වැඩ පිළිවෙළක් යෝජනා කර තිබෙනවා. අපි කෘෂිකර්ම අමාත්‍යාංශය සමඟ සම්බන්ධ වෙලා ඒ ගැන කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. මේ යටතේ අක්කර භාගයකට අවශ්‍ය කාබනික පොහොර කිලෝග්‍රෑම් 800ක්, 1,000ක් පමණ ප්‍රමාණයක් නිපදවා ගැනීමට අවශ්‍ය තාක්ෂණ සහාය අපේ තේ පර්යේෂණ ආයතනය මඟින්, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මඟින්, තේ පරීක්ෂක නිලධාරින් මාර්ගයෙන් ඒ 4,000ට ලබා දෙන්නත් බලාපොරොත්තු වෙනවා.

vi. සමාගම් වතු ආශ්‍රිත කාබනික පොහොර සපයා ගැනීම දිරිමත් කිරීම.

මේ යටතේ ප්‍රථමයෙන්ම රජයට අයත් ඇල්කඩුව වැවිලි සමාගම මඟින් මේ වන විටත් හෙක්ටෙයාර 100ක කාබනික තේ වගාවක් ස්ථාපිතකොට ඇති අතර, මාසයකට ලීටර් 60,000ක නිෂ්පාදන ධාරිතාවක් සමඟ දියර පොහොර නිෂ්පාදන මධ්‍යස්ථානයක් ද ස්ථාපිතකොට ඇත. ඒක අපි අනෙක් සමාගම් වතුවලට ආදර්ශ නිෂ්පාදනයක් හැටියට, ඒ සියලුදෙනාට දැනුම ලබා දීමේ වැඩසටහනක් හැටියට, අපේ රජයේ තිබෙන වතු සමාගමක් තුළ කටයුතු කරමින් පවතිනවා.

vii. දේශීය කාබනික පොහොර නිපදවන්නන් දිරිමත් කිරීම.

මේ යටතේ දැනට ශ්‍රී ලංකාව තුළ කාබනික පොහොර නිෂ්පාදනය කරන්නන් සමඟ සාකච්ඡා අරඹා ඇති අතර, නිෂ්පාදකයන් 30ක් පමණ හඳුනාගෙන ඔවුන්ගේ නිෂ්පාදන ධාරිතාව වැඩි දියුණු කිරීමේ අවස්ථා, නිෂ්පාදන ගැටලු ආදිය සොයා බැලීම සහ තේ පර්යේෂණ ආයතනය මඟින් අදාළ නිෂ්පාදන පිරිවිතර සැපයීම හා ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම ආදී කටයුතු ආරම්භ කර ඇත.

viii. තේ වගා භූමිවල විද්‍යානුකූල පාංශු පරීක්ෂාවෙන් පසුව වඩාත් යෝග්‍ය පෝෂක සංසටක සහිත කාබනික පොහොර ප්‍රමාණයක් යෙදීම සඳහා වගාකරුවන් උනන්දු කිරීම.

මේ යටතේ කුඩා තේ වතු අංශයේ සියලු තේ වගාකරුවන්ට පාංශු පරීක්ෂණ කඩිනම් කිරීම සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය පාංශු පරීක්ෂාවක් සඳහා වූ ඩිජිටල් මාපක ලබා දීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු නිම කර ඇත. ඒ පස්වල pH අගය මනින්නයි. ඒ අනුව, රසායනික පොහොර භාවිතයෙන් ඉවත් වී ඉදිරියේදී ඒ වෙනුවට කාබනික පොහොර අදාළ පරිදි භාවිත කිරීම දේශීය තේ කර්මාන්තය සාර්ථකව පවත්වා ගැනීමටත්, එතුළින් තේ අපනයන ආදායම ඉහළ නංවා ගනිමින් තේ ක්ෂේත්‍රය මඟින් රටේ ආර්ථිකයට ලබා දෙන දායකත්වය ඉහළ නැංවීම සඳහා වැවිලි අමාත්‍යාංශය, සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය හා අනෙකුත් රාජ්‍ය ආයතන මේ වන විටත් කටයුතු සිදු කරමින් පවතී.

ගරු කථානායකතුමනි, අපි විශ්වාසයෙන් කියනවා, මේ කාබනික පොහොරවලට යොමු වෙන්න කලින් අපි අවශ්‍ය තරම් ඒ රසායනික පොහොර ටික ලබා දෙන්න කටයුතු කරන බව. ඒ වාගේම, ඒ අවශ්‍යතාව ඉටුවන තෙක් අපි මේ ගොවියා රැකගන්න කටයුතු කරනවාය කියන එකත් මා සඳහන් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟ ප්‍රශ්නය, ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු කථානායකතුමනි, බන්දුල ගුණවර්ධන ඇමතිතුමාගේ අමාත්‍යාංශයෙන් ඉදිරිපත් කරලා තිබුණා, කැබිනට් අනුකමිටුවකට ද්‍රවශීලතා ඛනිජ තෙල් වායු ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහනක් පිළිබඳව. ඒ පිළිබඳවයි මගේ ප්‍රශ්නය අහන්නේ. ශ්‍රී ලංකාවේ LPG ක්ෂේත්‍රය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අනුකමිටුවක් පත් කරලා තිබුණා. එයින් වාර්තාවක් ඉදිරිපත් කරලා තිබුණා. ඒ වාර්තාවට අනුව නිර්දේශ කිහිපයක් දීලා තිබුණා. මගේ ප්‍රශ්නයෙන් ඒ නිර්දේශ පිළිබඳව සඳහන් කරලා කරුණාවෙන් අහනවා. මේ වෙනකොට ඒ වාර්තාවේ පිටපතක් පාරිභෝගික කටයුතු අධිකාරියට භාරදීලා තිබෙනවාද? ඒ වාගේම COPE එකට. මොකද, ලිට්‍රෝ සමාගම COPE එක යටතට එන ආයතනයක් නිසා ඒක mandatory. ඒ නිසා COPE එකට ඒ වාර්තාව ලබා දෙන්න ඕනෑ. ඊළඟට, මේ පාර්ලිමේන්තුවේ ඒ වාර්තාව සභාගත කරලා තිබෙනවාද, නැත්නම් සභාගත කරනවාද, ඒ කැබිනට් අනුකමිටු වාර්තාවේ මොකක්ද තිබෙන්නේ කියන විස්තර පිළිබඳ මම විශේෂයෙන් අහන්න කැමැතියි.

ඒ වාර්තාවෙන් ලබා ගන්නා තොරතුරු අනුව මම කියන්න කැමැතියි, විශේෂයෙන්ම වායු, නැත්නම් LPG ගෑස් ගන්නේ ජාත්‍යන්තර වෙළෙඳ පොළේ ජාත්‍යන්තර මිල අනුව බව. ඒවා තීරණය වන්නේ මැද පෙරදිග, සිංගප්පූරුව වාගේ වෙළෙඳ පොළවල තිබෙන ජාත්‍යන්තර මිල මට්ටම් අනුවයි. එතැනදී තිබෙන්නේ CP කියන Contract Price එක. දැන් ලිට්‍රෝ සමාගම තෙල් ගන්නේ ඕමාන් රජයෙන්මයි. ඕමාන් කියන්නේ ලෝකයේ විශාලතම ස්වාභාවික ගෑස් නිෂ්පාදනය කරන රටක්. ඕමාන්වලින් තමයි ඒවා ගන්නේ.

එතකොට, ලාෆ් සමාගමත් එක්ක ඒකාබද්ධ ප්‍රසම්පාදන කටයුතුවලට යන්න කියලා මේ අනුකමිටු වාර්තාවේ තිබෙන බවට මට තොරතුරු ලැබී තිබෙනවා. එතකොට, ඒකාබද්ධ ප්‍රසම්පාදන කටයුතුවලට යන්නේ ලිට්‍රෝ සමාගම -අපේ රජයේ ආයතනයක්- අපේ තරගකාරි සමාගමක් එක්ක. ඒක, අපට සියයට අසූවක වෙළෙඳ පොළක් තිබියදී, සියයට විස්සක් තිබෙන සමාගමකට අපේ හයිය, ශක්තිය පාවා දෙනවා හා සමානයි කියලා මා හිතනවා. මම අහන්නේ, කොහොමද ලාෆ් සමාගමට ලිට්‍රෝ සමාගමට වඩා අඩු මිලකට ගෑස් දෙන්නේ? සාමාන්‍යයෙන් Contract Price එක ලෝක වෙළෙඳ පොළේ එක මට්ටමක තිබෙන්නේ. ඉතින් කොහොමද, ඊට වඩා අඩුවට සපයන්නේ? ඒ සමාගමත් එක්ක ඒකාබද්ධ ප්‍රසම්පාදන කටයුතුවලට යන්නේ මොන නිර්ණායක මතද කියලා මම අහන්න කැමැතියි. ඒකට උත්තරයක් හැටියට ඔබතුමාට කියන්න පුළුවන්, "තොග පිටින් ප්‍රසම්පාදන කටයුතු කළාම, - VLGCs, Very Large Gas Carriers, කියන ලොකු නැව් තිබෙනවා - ඒ ලොකු නැව්වල ඒවා ගෙනාවා නම්, විශාල වශයෙන් නැව් ගාස්තුවල, ප්‍රවාහන ගාස්තුවල මිල අඩු කරගන්න පුළුවන්." කියලා. මේ ගෑස්වල මිල

චලනය වෙන්නේ ඒ ප්‍රවාහන ගාස්තු මතයි. හැබැයි, මේ විශාල තොග ප්‍රසම්පාදන සඳහා ලොකු නැව්වල, ඒ කියන්නේ VLG Carriersවල මෙට්‍රික්ටොන් 40,000කට වැඩි ප්‍රමාණයක් load කරන්නට ඕනෑ. හැබැයි, ලාෆ්ස් සමාගමේ හම්බන්තොට තිබෙන පර්යන්තයේ - terminal එකේ - ටැංකිවල තිබෙන ධාරිතාව මෙට්‍රික්ටොන් 30,000ක් පමණයි. එතකොට 40,000ක උපරිම ප්‍රමාණය ප්‍රසම්පාදන කරන්න හැකියාවක් නැහැ. මොකද, ගබඩා කරන්න ඔබතුමන්ලාට ඉඩ නැති නිසා.

එපමණක් නොවෙයි, සාමාන්‍යයෙන් ටැංකියකට තෙල් ගෙනෙන කොට, ගෑස් ගෙනෙන කොට අඩු තරමින් මෙට්‍රික්ටොන් 5,000ක්, 10,000ක් ඉතුරු වෙලා තියේවි. බින්දුව වෙනකම් හිස් කරන්න දෙන්නේ නැහැ නේ. එතකොට මෙට්‍රික්ටොන් 20,000ක්, 25,000ක් තමයි ගන්න වෙන්නේ. ප්‍රවාහන ගාස්තුවලට විශේෂ මිලක් ලබා ගන්න බැරි බව ඒකෙන් සහතික වෙනවා. එතකොට මෙට්‍රික්ටොන් 40,000කට වැඩි ප්‍රමාණයක් ලොකු නැවකින් ගෙනැල්ලා අඩු මිලකට ලාෆ් සමාගම සමඟ ඔබතුමන්ලා ගන්නේ කොහොමද? එතකොට ඒ තර්කයත් හරියන්නේ නැහැ.

දෙවනුව මම අහන ප්‍රශ්නය මේකයි. ගෑස් මිල තීරණය කරන්නේ ජාත්‍යන්තර මිල මට්ටමින්. මම දන්නා තරමට අද ලිට්‍රෝ සමාගම මෙට්‍රික්ටොන් එකක් ගන්නේ ඩොලර් 590කට. හැබැයි, ලිට්‍රෝ සමාගම Contract Price එක සහ ඩොලර් 105ක් නැව් ගාස්තුවලට අයවීමට දමා තිබෙනවා කියන එක තමයි මම දන්නා විස්තරය. නමුත් ඔබතුමාගේ කැබිනට් අනුකමිටු වාර්තාවේ කියා තිබෙනවා, CP - Contract Price - එක සහ ඩොලර් 83ට මේ ගෑස් ටික ප්‍රවාහනය කර දෙන්න පුළුවන් කියලා ලාෆ් සමාගම ඔබතුමන්ලාට කියා තිබෙනවා කියලා. ඒ breakdown එක දීලා තිබෙන හැටියට, මට තිබෙන විස්තර අනුව, මැද පෙරදිග සිට හම්බන්තොටට නැව් ගාස්තු ඩොලර් 35යි. ඊළඟට, ඒගොල්ලන්ගේම පර්යන්තයේ handling charges ඩොලර් 18යි. ඒකත් යන්නේ ලාෆ් එකට. ලිට්‍රෝ සමාගමේ ගබඩා කිරීමේ ස්ථානය තිබෙන්නේ කෙරවලපිටියේ. හම්බන්තොට සිට කෙරවලපිටියට නැව් ගාස්තුව ඩොලර් 30යි. ඒකත් එකතු කළාම තමයි ඩොලර් 83 එන්නේ. නැව් ගාස්තුව ලෙස ඩොලර් 35ට ප්‍රායෝගිකව මැද පෙරදිග සිට මේ රටට ගෑස් ගෙනෙන්න පුළුවන්ද? ලාෆ් සමාගම ඔබතුමන්ලාට කියනවා, ඩොලර් 35ක නැව් ගාස්තුවක් ගෙවලා අඩුවට ගෑස් ගෙනෙන්න පුළුවන් කියලා. හැබැයි, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට ඒගොල්ලන් දීලා තිබෙන තොරතුරු අනුව කියා තිබෙනවා, නැව් ගාස්තුව ඩොලර් 99යි, ඒ නිසා මිල වැඩි කරලා දෙන්න කියලා. එතකොට ඒ සමාගම ඔබතුමන්ලාට බොරු කියනවාද, නැත්නම් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය බොරු කියනවාද කියලා මම අහන්න කැමැතියි.

ඊළඟට මම අහන ප්‍රශ්නය මේකයි. මම අද තමයි දන්නේ ඕමානයේ සිට හම්බන්තොට දක්වා සහ හම්බන්තොට සිට කෙරවලපිටිය දක්වා තිබෙන්නේ එකම දුරයි කියලා. මොකද, ලාෆ්ස් සමාගමෙන් කියා තිබෙනවා, මෙට්‍රික්ටොන් එකක නැව් ගාස්තුවට ඩොලර් 35ක් යනවා කියලා. හැබැයි, හම්බන්තොට සිට කෙරවලපිටියටත් ඩොලර් 30ක් අය කරනවා. මේක පුදුම වැඩක්. ලිට්රෝ සමාගම තමයි අපේ රාජ්‍ය ආයතනවලින් වැඩිම ලාභය උපයන ආයතනයක් බවට පත් වෙන්නේ. ඔබතුමන්ලා මෙම ආයතනය පාවා දෙන්නටද යන්නේ කියලා මම අහන්න කැමැතියි. ඔබතුමන්ලා හිතනවාද, ඩොලර් 99ක් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට පෙන්වලා, ඒක ඩොලර් 35ක් කියලා ඔබතුමන්ලාගේ වාර්තාවේ ඇතුළත් කළාට, ඔබතුමන්ලා මේ සමාගම එක්ක ඒකාබද්ධ ප්‍රසම්පාදනයකට ගියාම ප්‍රශ්නයක් නොවෙයි කියලා?

ගරු රාජ්‍ය ඇමතිතුමනි, අපි 2019 වෙනකොට කෝටි 700ක් ලාභ ඉපැයූ ලිට්රෝ සමාගම අද වනවිට කෝටි 400ක් පාඩු ලබා තිබෙනවා. මේ ගැන බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා මේ ගැන කෝප් එකට සහ පාර්ලිමේන්තුවට කරුණු ඉදිරිපත් කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!

මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු ඉසුරු දොඩන්ගොඩ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා (මහජන ආරක්ෂක අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர - பொதுமக்கள் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Sarath Weerasekera - Minister of Public Security)
ගරු කථානායකතුමනි, "ගරු ඉසුරු දොඩන්ගොඩ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு இசுரு தொடன்கொட அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and THE HON. ISURU DODANGODA took the Chair.*

**ගරු ලසන්ත අලගියවන්න මහතා (සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லசந்த அலகியவன்ன - கூட்டுறவுச் சேவைகள், சந்தைப்படுத்தல் அபிவிருத்தி மற்றும் நுகர்வோர் பாதுகாப்பு இராஜாங்க அமைச்சர்)
(The Hon. Lasantha Alagiyawanna - State Minister of Co-operative Services, Marketing Development and Consumer Protection)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නය ඇසීම පිළිබඳව මම මුලින්ම ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහපු ප්‍රශ්න සහ ඔබතුමාගේ පැහැදිලි කිරීම සම්බන්ධයෙන් කිව යුතු දෙයක් තිබෙනවා. මහජන නියෝජිතයන් විධියට අපට පැවරෙන වගකීම්වලින් එකක් තමයි, ගෑස් මිල වැඩි කිරීමකින් තොරව පවත්වා ගෙන යෑම. ඒක තමයි අපේ බලාපොරොත්තුව. දැන් ඒක සිද්ධ වෙනවා. මා ඉතාම වගකීමෙන් යුතුව කියන්න ඕනෑ, ගෑස් මිල වැඩි කරන්නේ නැහැ කියා රජය ප්‍රතිපත්තිමය තීන්දුවක් ගත් බව. ඒ නිසා ගෑස් මිල වැඩි කරන්නේ නැහැ. මම හිතනවා, ඒකට විපක්ෂයත් කැමැති වෙන්න ඕනෑ කියා. කාලකණ්ණි සතුටක් ලබන්නේ නැත්නම්, ජනතාවට සැබෑ ලෙස ආදරය කරනවා නම් අපි ඒ ගැන සතුටු වෙන්න ඕනෑ. ඒ හින්දා ඒ කාරණය ගැන දැන් කලබල වෙන්න දෙයක් නැහැ. මොකද, රජය ගෑස් මිල වැඩි කරන්නේ නැහැ.

[ගරු ලසන්ත අලගියවන්න මහතා ]

දෙවැනි කාරණය මේකයි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ ප්‍රශ්නය ඇසීම ගැන අපට ප්‍රශ්නයක් නැහැ. ඔබතුමන්ලාට ප්‍රශ්න අහන්න පුළුවන්. ඔබතුමන්ලා එසේ ප්‍රශ්න ඇසිය යුතුයි. නමුත්, මෙහිදී ජනතාවගේ මුදල්, රජයේ මුදල් සම්බන්ධයෙන් කුමන ආකාරයකින්වත් පාඩුවක් සිද්ධ වන්නේ නැහැ. මා ඒ කරුණු දෙක මුලින්ම කියන්න ඕනෑ.

ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමනි, ඔබතුමාත් කැබිනට් අමාත්‍යවරයකු විධියට කටයුතු කර තිබෙනවා. පාර්ලිමේන්තුවේ අපේ කාර්ය භාරය මොකක්ද; "කෝපා" එකේ කාර්ය භාරය මොකක්ද, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්ය භාරය මොකක්ද කියා අපි හරියාකාරව අවබෝධ කර ගත යුතුයි. විශේෂයෙන්ම කැබිනට් මණ්ඩලයට ඕනෑම කරුණක් පිළිබඳ අනුකමිටුවක් පත් කරන්න පුළුවන්. ඒ අනුකමිටුවේ වගකීම තමයි, ඒ කරුණ පිළිබඳව වැඩිදුර අධ්‍යයනය කරලා කැබිනට් මණ්ඩලයට වාර්තාවක් දෙන එක. ගෑස් මිල පිළිබඳව ඇති වෙලා තිබෙන තත්ත්වය සම්බන්ධයෙන් ද ඒ විදියට සොයා බැලීමට තීරණය වුණා. ඒ අනුව අමාත්‍ය මණ්ඩලය අනුකමිටුවක් පත් කළා. එම වාර්තාව කැබිනට් මණ්ඩලයට ලබා දුන්නා. කැබිනට් මණ්ඩලය ඒ වාර්තාව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත ලබා දී තිබෙනවා ද කියලා ඔබතුමා ඇහුවා. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්යභාරය මේ සමාගම් එක්කාසු කිරීමවත්, ගෑස් මිලදී ගැනීමවත් නොවෙයි. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්ය භාරය, ඒ කිසිවක් නොවෙයි. අපට ඒ මොකවත් අදාළ නැහැ. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සොයා බලන්නේ පාරිභෝගික භාණ්ඩවල මිල පිළිබඳවයි. ඒ අනුව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ගෑස් මිල වැඩි කිරීම සම්බන්ධයෙන් ගෑස් සමාගම් කරන ඉල්ලීම් පිළිබඳව දීර්ඝ වශයෙන් අධ්‍යයනයක් කර අර කියපු කැබිනට් අනුකමිටුවට වාර්තාවක් ලබා දුන්නා. ඒක තමයි එහිදී පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ වගකීම බවට පත් වෙලා තිබුණේ. ඒ වගකීම දැන් ඉටු කර තිබෙනවා. ඒ වාර්තාව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට අනිවාර්යෙන් ලබා දිය යුතු ද, නැද්ද කියන එක කැබිනට් මණ්ඩලයට තීරණය කරන්න පුළුවන්. ඒ වාර්තාව ලබා දුන්නත්, ඇත්තටම ඒ වාර්තාවෙන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට වැඩක් වෙන්නේ නැහැ. අපි ඒකත් විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ.

මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා නීතිපතිතුමාගෙන් විමසුවා, විගණකාධිපතිට ලිට්‍රෝ ගෑස් සමාගමේ ගිණුම් පරීක්ෂා කරන්න පුළුවන් ද, බැරි ද කියලා. නීතිපතිතුමා දන්වා සිටියා, ඒ ගිණුම් පරීක්ෂා කරන්න පුළුවන් කියලා. නමුත්, ලිට්‍රෝ ගෑස් සමාගම ඒකට විරුද්ධව මේ වන විටත් අධිකරණමය ක්‍රියා මාර්ගයක් ගෙන තිබෙනවා. විශේෂයෙන්ම හෙට පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව කැඳවා තිබෙනවා. ලිට්‍රෝ ගෑස් සමාගමේ සභාපතිතුමාත් එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු හැටියට ඉන්නවා. හෙට ඒ සභාපතිතුමාත් ඒවි. අපි පෙනී සිටින්නේ එම සමාගම පාර්ලිමේන්තුවට කැඳවිය යුතුයි කියන මතය වෙනුවෙන්. ඒ සමාගම පාර්ලිමේන්තුවට වග කිව යුතුයි කියන තැනයි අප අනිවාර්යයෙන්ම ඉන්නේ. එම නිසා අමාත්‍ය මණ්ඩලය මේ පිළිබඳ කරුණු මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කළාට පසුව, මුදල් අමාත්‍යාංශය ඒ සම්බන්ධයෙන් නීති උපදෙස් අරගෙන තිබෙනවා. විශේෂයෙන්ම ඒ තත්ත්වය තමයි දැනට තිබෙන්නේ.

ගරු මන්ත්‍රීතුමනි, මේ කරුණ සම්බන්ධව කථා කරමින් ඔබතුමා සංඛ්‍යාලේඛන ගණනාවක් ගැන කිව්වා; ඕමාන්වලින් තමයි ගෑස් ගෙන්වන්නේ කිව්වා. විශේෂයෙන්ම නැව් ගාස්තු පිළිබඳවත් ඔබතුමා කරුණු සඳහන් කළා. අද ලෝක වෙළෙඳ පොළේ ගෑස් මිල වැඩි වෙලා තිබෙනවා. අපි ඒක පිළිගන්න ඕනෑ. නමුත් අපේ රටේ ගෑස් මිල වැඩි වීමට හේතුව වෙලා තිබෙන්නේ මොකක්ද? අපි අදාළ නැව් ගාස්තු හා රක්ෂණ ගාස්තු වෙනුවෙන් වැඩි මුදලක් ගෙවනවා.

කැබිනට් මණ්ඩලය විසින් මේ පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා. යම් අනුකාරක සභා වාර්තාවක් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළාට පසුව කැබිනට් මණ්ඩලය ඒ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුයි කියා සම්ප්‍රදායක් නැහැ; නීතියක් නැහැ. එම නිසායි එය ඉදිරිපත් කරන්න බැරි වුණේ. නමුත් මම දැන් එය ඉදිරිපත් කරනවා. ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ඉල්ලීම පරිදි ඒ කැබිනට් මණ්ඩල අනුකාරක සභාවේ වාර්තාව මම **සභාගත*** කරනවා.

එය මේ දක්වා සභාගත කළේ නැත්තේ කැබිනට් මණ්ඩලයේ අනුකමිටු වාර්තා හැම එකක්ම පාර්ලිමේන්තුවට අනිවාර්යයෙන්ම ඉදිරිපත් කිරීම සම්ප්‍රදායයක් විධියට සිදු කර නැති නිසායි. නමුත්, ඕනෑම මන්ත්‍රීවරයෙකුට පුළුවන් වාර්තා ඉල්ලා සිටින්න. ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ඉල්ලීම අනුව අපි අද ඒ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා.

ලෝක වෙළෙඳ පොළේ ගෑස් මිල වැඩි වෙනවා. අපේ රටේ ගෑස් නිෂ්පාදනය කරන්නේ නැති නිසා අපි අනිවාර්යයෙන්ම ගෑස් පිට රටින් ගෙනෙන්න ඕනෑ. ඒ අනුව ජනතාවගේ පැත්තෙන් බලා ගෑස් මිල වැඩි කිරීමට ඉඩ නොදීම සහ ගෑස් මිල වැඩි කිරීමට නොහැකි වීම නිසා ගෑස් සමාගම්වලට වන පාඩුව අවම කිරීම වෙනුවෙන් කරන්න පුළුවන් මොකක්ද කියන එක පිළිබඳව සොයා බලන්න තීරණය කළා. ඒකට විශේෂ විසඳුම් යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ලාෆ් ගෑස් සමාගම සහ ලිට්‍රෝ ගෑස් සමාගම ගෑස් වෙන් වෙන් වශයෙන් මිලදී ගැනීමක් සිද්ධ කරනවා. දැනට ලිට්‍රෝ ගෑස් සමාගමට ගෑස් ගබඩා කරන්න හැකියාව තිබෙන්නේ දින 6කට සෑහෙන -ලීටර් 8,000ක් පමණ වන- ගෑස් ප්‍රමාණයක් විතරයි. මේ සමාගම් දෙකම ඒකාබද්ධ මිලදී ගැනීමක් කරලා ගෑස් වැඩි ප්‍රමාණයක් මිලදී ගත් විට රක්ෂණ ගාස්තු සහ නැව් ගාස්තුවලින් ඇමෙරිකානු ඩොලර් 90ක් විතර අඩු කරගන්න පුළුවන්කම ලැබෙනවා. එම අඩුවීම තුළින් තමයි, මිල වැඩි නොවීමෙන් වන පාඩුව අදාළ සමාගම්වලට පියවා ගැනීම සඳහා කටයුතු සලස්වා තිබෙන්නේ.

මම පෞද්ගලිකව දකින විධියට මෙම ක්‍රියාවලිය තුළ ලිට්‍රෝ ගෑස් සමාගම පෞද්ගලික සමාගමකට පාවා දීමක් හෝ එවැනි කිසිවක් හෝ නොවෙයි සිද්ධ වන්නේ. ඒ අදාළ සමාගමේ කොටස් ලිට්‍රෝ ගෑස් සමාගම මිලදී ගන්නවා. එනම්, ලාෆ් ගෑස් සමාගමේ කොටස් ලිට්‍රෝ ගෑස් සමාගම මිලදී ගන්නවා. එතකොට ලිට්‍රෝ ගෑස් සමාගමේ වත්කමක් වැඩි වෙනවා. එම සමාගම මුදල් ආයෝජනයක් සිදු කර තිබෙනවා. ඒක දෙවැනි අදියරේදීයි සිද්ධ වන්නේ. නමුත් මේ ඒකාබද්ධ වැඩ පිළිවෙළ මාස 6ක කාලයක් තුළ අත්හදා බැලීම සඳහා යෝජනා කර තිබෙනවා. මේ ඒකාබද්ධ වැඩ පිළිවෙළ මඟින් හරියාකාර ලාභයක් ලැබෙනවාද කියා සොයා බැලීමට තමයි අමාත්‍ය මණ්ඩලය මේ වන විට තීරණය කර තිබෙන්නේ. එහෙම නැතිව, මේ සමාගම් දෙක ඒකාබද්ධ විය යුතුයි, මේ සමාගමේ කොටස් ලිට්රෝ ගෑස් සමාගම ලබා ගත යුතුයි, ඒ වාගේම ලිට්‍රෝ ගෑස් සමාගම සමඟ මේ ඒකාබද්ධ වැඩ පිළිවෙළ දිගටම කරගෙන යා යුතුයි කියන තීන්දුවක් -තීරණයක්- කැබිනට් මණ්ඩලය මේ වන විට ගෙන නැහැ. දීර්ඝ කාලීනව ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වන මෙම යෝජනාව මාස

***** *පුස්තකාලයේ තබා ඇත.*

* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

* *Placed in the Library.*

6ක කාලයක් තුළ අත්හදා බැලීමක් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රසම්පාදන කමිටුවක් පත් කර තිබෙනවා. එම කමිටුවට ඇතුළත් වනවා, භාණ්ඩාගාර ලේකම්තුමාගේ නියෝජිතයෙක්, ආයෝජන මණ්ඩලයේ සභාපති, ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන් එක්කෙනා බැගින්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ නියෝජිතයින්, ගෑස් ප්‍රමිති හා වෙළෙඳ පොළ පිළිබඳව විශේෂඥ දැනුමක් ඇති නිලධාරීන්, ලිට්රෝ සමාගමේ සහ ලාෆ් සමාගමේ නියෝජිතයන්. මෙම ප්‍රසම්පාදන කමිටුව විසින් තමයි, දීර්ඝ වශයෙන් අධ්‍යයනය කරලා, මේ සමාගම් දෙකම ඒකාබද්ධව ගෑස් මිලදී ගැනීමේ ක්‍රියාවලිය අනිවාර්යයෙන් සිද්ධ කරනවාද යන්න තීරණය කරනු ලබන්නේ. ගෑස් කොම්පැනිවල කටයුතුවලට මැදිහත් වන එක අපේ අමාත්‍යාංශයට අයිති වැඩක් නොවෙයි. නමුත් අපි කරුණු අධ්‍යයනය කරලා ලැබුණු තොරතුරු අනුව යෝජනා කළ පරිදි ඒකාබද්ධ මිලදී ගැනීමෙන් පසුව ලිට්‍රෝ ගෑස් සමාගමේ ගෑස්වලට ලිට්‍රෝ ගෑස් සමාගම මුදල් ගෙවයි; ලාෆ් ගෑස් සමාගමේ ගෑස්වලට ලාෆ් ගෑස් සමාගම මුදල් ගෙවයි. නමුත් රජයේ මෙම ප්‍රසම්පාදන කමිටුව විසින් තමයි, මේ මිලදී ගැනීමේ ක්‍රියාවලිය සිද්ධ කරනු ලබන්නේ. ඒ අනුව, මෙම අනුකාරක සභාව විසින් නිර්දේශ 7ක් ඉදිරිපත් කර තිබෙනවා. මා ඒවා එකින් එක කියවන්නම්.

i. කිලෝග්‍රෑම් 12.5ක ගෑස් සිලින්ඩරයක් සඳහා දැනට නියම කර ඇති රුපියල් 1,493 මිලට සමාගම් දෙකම ගෘහස්ථ ගෑස් අලෙවිය දිගටම සිදු කිරීම.

ii. ගෑස් මිලදී ගැනීම, ප්‍රවාහනය සහ ගබඩා කිරීම ගෑස් සමාගම් දෙක විසින්ම ඒකාබද්ධව කළ යුතු අතර, ඒ සඳහා හම්බන්තොට ගෑස් පර්යන්තය යොදා ගැනීමට කටයුතු කළ යුතුයි.

iii. ප්‍රසම්පාදන කමිටුව ගැන මම කලින් සඳහන් කළා.

iv. දැනට ගෑස් ප්‍රවාහනය, රක්ෂණය, ගබඩා වියදම් හා පර්යන්ත ගාස්තු සහ අනෙකුත් වියදම් අවම මට්ටමකට ගෙන ඒමට ඉහත කමිටුව මඟින් ක්‍රියාත්මක වීම.

v. හම්බන්තොට ගෑස් පර්යන්තය තාක්ෂණික වශයෙන් හොඳයිද, මෙහි මූල්‍යමය වටිනාකම කුමක්ද කියන එක පිළිබඳව විගණනයක් කරන්න කියලා තිබෙනවා.

vi. ගෑස් කර්මාන්තයේ නියැළෙන සමාගම් දෙකේ ඉදිරි මාස හය තුළ ක්‍රියාකාරිත්වය ඇගයීමකට ලක්කර මධ්‍යකාලීනව ජාතික අවශ්‍යතාව සඳහා සුදුසු විසඳුමක් අමාත්‍ය මණ්ඩලය වෙත යෝජනා කිරීම.

vii. මෙම ආයතනවල ප්‍රාග්ධනයෙන් කොටසක් රාජ්‍ය ආයතන සතු හෙයින් විශේෂයෙන්ම රාජ්‍ය මැදිහත්වීමක් තුළින් අපේ රටේ ගෑස් කර්මාන්තය ඉදිරියට ගෙන යෑම යෝග්‍ය යැයි අමාත්‍ය මණ්ඩල අනුකමිටුව විසින් නිරීක්ෂණය කරන ලදී.

මෙම නිර්දේශ හත තමයි විශේෂයෙන්ම අමාත්‍ය මණ්ඩල අනුකමිටුව විසින් යෝජනා කර තිබෙන්නේ. අද විවිධ පාර්ශ්ව මේ පිළිබඳව උනන්දුවක් දක්වනවා. ඇත්ත කථාව ඒකයි. නමුත්, අපි අවසානයේ බැලිය යුතු වන්නේ සමාගම්වල අවශ්‍යතාව නොවෙයි. අපි ඉන්නේ සමාගම්වල අවශ්‍යතාව වෙනුවෙන් පෙනී සිටීමට නොවෙයි. අපි බැලිය යුතු වන්නේ ජනතාවට අඩු මිලට ගෑස් ලබා දෙන්න පුළුවන්ද කියලායි. ඒ අනුව, අපි අඩු මිලට ගෑස් ලබා දෙනවා. ගෑස් මිල වැඩි කරන්නේ නැහැ. අපි දෙවනුව බලන්නේ රටට හානියක් වනවාද කියලායි. රටේ ජනතාවගේ මුදල් දූෂණයට ලක්වනවාද, රටේ ජනතාවගේ මුදල් නාස්ති වනවාද කියලා අපි බලනවා. මේ ක්‍රියාවලිය තුළින් එහෙම එකක් වෙන්නේත් නැහැ. එම නිසා මේ ව්‍යාපෘතිය හොඳ ව්‍යාපෘතියක්. මේ ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට සහයෝගය ලබා දීම තමයි පක්ෂ විපක්ෂ අප සියලුදෙනා කළ යුතු කාර්ය භාරය වන්නේ. එහෙම නැතිව, සමාගම්වල අවශ්‍යතාව වෙනුවෙන් කරුණු ඉදිරිපත් කිරීම නොවෙයි අපි කළ යුත්තේ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු මධුර විතානගේ මහතා.

## පොලිස් නිලධාරින්ගේ විනය හා යහපැවැත්ම
## பொலிஸ் உத்தியோகத்தர்களின் ஒழுக்கம் மற்றும் நடத்தை
## DISCIPLINE AND PROPER CONDUCT OF POLICE OFFICERS

[අ.භා. 5.02]

**ගරු මධුර විතානගේ මහතා**
(மாண்புமிகு மதுர விதானகே)
(The Hon. Madhura Withanage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේදී මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පසුගිය කාලය පුරාවට ශ්‍රී ලංකා පොලිසියේ ඉහළ හා පහළ නිලධාරින්ගේ ක්‍රියාකාරකම් දෙස බැලීමේදී ඔවුන්ගේ විනය පිරිහී ඇති බව දක්නට ඇත. මෙම තත්ත්වය තුළ ශ්‍රී ලංකා පොලිසිය කෙරෙහි සමාජය තුළ ඇත්තේ මහත් කලකිරීමකි. ඉතා සුළු මුදල් වංචාවල් පවා සිදු කරන පොලිස් නිලධාරින් සිටින අතර, අවසානයේ කෝටි ගණන් වූ මත් ද්‍රව්‍ය ජාවාරමේ යෙදෙන පොලිස් නිලධාරින් ද සිටින බව මේ වන විට හෙළිදරව් වී ඇත.
>
> එමෙන්ම ස්ත්‍රී හා ළමා අපචාරවලට සම්බන්ධ වූ පොලිස් නිලධාරින්ද සිටින බව සමාජ මාධ්‍ය තුළ මේ දිනවල වැඩි වශයෙන් කථා බහට ලක් වේ. මෙවැනි තත්ත්වයන් මීට පෙර ඉතා සුළු වශයෙන් සිදු වුවද මේ වන විට දිනපතාම පාහේ මෙවැනි සිද්ධීන් අසන්නට ඇත.
>
> පොලිස් නිලධාරින්ගේ මෙම හැසිරීම මත සමාජය තුළ පොලිස් දෙපාර්තමේන්තුව අප්‍රසාදයට ලක්වී ඇත. නීතිය කෙරෙහි සමාජයේ ඇති විශ්වාසය බිඳ වැටී ඇති අතර, නීතිය ක්‍රියාවේ යොදවන නිලධාරින් විනය විරෝධී ලෙස හැසිරෙන අවස්ථාවක සාමාන්‍ය ජනතාව තුළ විනය පවත්වාගෙන යාම බරපතළ ගැටලුවක් වී ඇත. විශේෂයෙන් පාසල් ළමුන් ඇතුළු තරුණ පරපුර විනයානුකූල පිරිසක් ලෙස සමාජගත කිරීම මෙම තත්ත්වය තුළ කෙසේ සිදු කරන්නේද?
>
> පොලිස් දෙපාර්තමේන්තුවේ මෙම තත්ත්වයට හේතු වී ඇත්තේ කුමන කරුණුද යන්න මෙතෙක් විමර්ශනයක් කර තිබේද යන්නත්, එසේ නම් ඒ පිළිබඳ මෙම ගරු සභාව දැනුවත් කරන ලෙසත්, මෙවන් තත්ත්වයක් තුළ එසේ පුළුල් විමර්ශනයක් සිදු නොකළේ නම් ඒ මන්ද යන්නත් මේ ගරු සභාව වෙත හෙළි කරන ලෙසත් මා ඉල්ලා සිටිමි. එමෙන්ම සමස්ත රටවැසියාගේ විනය පවත්වාගෙන යාමටත්, අනාගත පරපුර විනයානුකූල පිරිසක් ලෙස සමාජගත කිරීමටත් බලපාන මෙම කරුණු පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කර සියලුම පොලිස් නිලධාරින්ගේ විනය හා යහ පැවැත්ම නිසි පරිදි පවත්වාගෙන යාම සඳහා සුදුසු වැඩ පිළිවෙළක් කඩිනමින් සකස් කරන ලෙසත් මෙම ගරු සභාවට මම යෝජනා කර සිටිමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද සභාව කල් තබන අවස්ථාවේදී මෙම යෝජනාව ඉදිරිපත් කරන්නට හේතු වූ කාරණාව වුයේ, පසුගිය කාලය පුරාවටම පොලීසිය සම්බන්ධයෙන් විවිධ චෝදනා, පැමිණිලි ඉදිරිපත් වීමයි. ඒ දේවල් අපි මාධ්‍යයෙන් දැක්කා. ඒ වාගේම සමාජය තුළිනුත් ඒ දේවල් මතු වුණා. ඇත්තටම පොලීසිය නව ලොවට ගැළපෙන විධියට අලුත් දැනුමක් එක්ක, ඉදිරි අභියෝග ජයගෙන කටයුතු කරන්නේ කොහොමද කියන එක ගැන පුළුල් සමාජ කතිකාවක් අද වනකොට නිර්මාණය වෙලා තිබෙනවා.

[ගරු මධුර විතානගේ මහතා]

අද පොලීසිය මහජනතාවට ප්‍රසන්න තැනක් වෙනවා වෙනුවට ඉතා අප්‍රසන්න තැනක් බවට පත් වෙලා තිබෙනවා. මේක අපේ ගරු ඇමතිතුමාගේ හෝ අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලාගේ ප්‍රශ්නයක් නොවෙයි. වසර ගණනාවක් තිස්සේ පොලීසියේ ක්‍රියාදාම තුළ ගැටලු ඇති වෙලා තිබෙනවා. පොලීසිය මහජනතාවට හිතකර නොවන තැනක් බවට පත්වීමට අපි දැකපු එක් හේතුවක් තමයි පොලීසියෙන් වැඩ කටයුතු කර ගැනීමට යන ජනතාවට පැය ගණන්, වරු ගණන්, දවස් ගණන් පුටු උඩ වාඩිවී සිටීමට සිදුවීම. ඒ වාගේම අවශ්‍ය පහසුකම් නැහැ, නිලධාරින් නැහැ, අවශ්‍ය ගුණාත්මක දැනුම, පුහුණුව ලබා දීමට ක්‍රමවේදයක් නැහැ කියන කාරණා පොලීසිය පැත්තෙන් ඇවිත් තිබෙනවා. මේ අඩෝනාව විසඳා ගැනීමට නම් අපි කඩිනම් සංශෝධන ඇති කළ යුතුයි. අද පොලීසිය ප්‍රශ්න විසඳන තැනක් වෙනවා වෙනුවට සමාජයේ බරපතළ ප්‍රශ්න නිර්මාණය කරන තැනක් බවට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම සමාජයේ විනය හැදීමට සිටින්නේ පොලීසිය වුවත්, අද පොලීසියේ විනය හැදීමට සමාජයට සිදු වී තිබෙනවා. ඒ වාගේම සමාජයේ වැරැදිවලට දඬුවම් දීමට සිටින්නේ පොලීසිය වුවත්, අද පොලීසියේ වැරැදිවලට දඬුවම් කිරීමට සමාජයට සිදු වී තිබෙනවා. අද ජනතාව නීතිය අතට ගැනීමට ප්‍රධාන හේතුවක් වෙලා තිබෙනවා, මේ ගුණාත්මක තත්ත්වය පිරිහීම. මම හිතන විධියට අපි ඒ ගුණාත්මක තත්ත්වය වහා ඇති කළ යුතුයි. අපි ඒ පිළිබඳව දැනටමත් ප්‍රමාද වැඩියි. ගරු ඇමතිතුමනි, ඒ සඳහා පොලීසියට පර්යේෂණ හා පුහුණු අංශයක අවශ්‍යතාව තිබෙනවා. අද පොලීසියේ ගුණාත්මක බව නිර්මාණය කිරීමේ අවශ්‍යතාව තිබෙනවා. පොලිස් නිලධාරින් එක් පොලිස් ස්ථානයක අවුරුදු 5, අවුරුදු 10 වැනි කාල සීමාවන් සේවයේ යොදවන්නේ නැතිව එම නිලධාරින්ගේ සේවා කාලය එක් පොලිස් ස්ථානයක අවුරුදු දෙකකට හෝ තුනකට සීමා කරන්නය කියා මගේ අත්දැකීම අනුව මම ඉල්ලා සිටිනවා. ඒ වාගේම භෞතිකව ගොඩනැඟිලි හදන එකට වඩා, වෙනත් භෞතික දියුණුවට වඩා නිලධාරින්ගේ ගුණාත්මක වර්ධනය අත්‍යවශ්‍ය වෙනවා.

ඒ වාගේම තාක්ෂණය ඉතාම දුර්වල තැනක තිබෙනවා. අදත් අපේ බොහෝ පොලිස් ස්ථානවල, "A" Grade එකේ ප්‍රධාන පොලීසියක පවා පැමිණිල්ලක් යතුරු ලියනය කිරීමට, එහෙම නැත්නම් පිටපතක් ලබා ගැනීමට පරිගණකයක් නැති තත්ත්වයක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, තවත් වැදගත් කාරණාවක් තිබෙනවා. වැරැදි කරන පොලිස් නිලධාරින්ට එරෙහිව අපි පැමිණිල්ලක් ඉදිරිපත් කළාම, ඒ පැමිණිල්ල පිළිබඳව වහාම විමර්ශනය කර වැරැදි කළ නිලධාරින්ට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වෙනවා. මෙන්න මේ කාරණා පිළිබඳව කඩිනමින් සලකා බලා අපට ප්‍රතිඵලයක් ලබා දෙන්න කියා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, යෝජනාව ස්ථිර කිරීම ගරු මංජුලා දිසානායක මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි තුනක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.08]

**ගරු මංජුලා දිසානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) மஞ்சுலா திசாநாயக்க)
(The Hon.(Mrs.) Manjula Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු මධුර විතානගේ මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව මා ස්ථිර කරනවා.

වසර 155කට ආසන්න ඉතිහාසයක් තිබෙන අපේ රටේ පැරණිම රාජ්‍ය ආයතනය තමයි ශ්‍රී ලංකා පොලීසිය කියන්නේ. පොල්අතු පැලේ සිට මහ මැදුර දක්වා මේ රටේ ජනතාව වෙනුවෙන් නීතිය හා සාමය පවත්වා ගෙන යෑමටත්, ඔවුන්ගේ ජන ජීවිතය තුළ පැන නැඟෙන්නා වූ ගැටලු, ප්‍රශ්න නිරාකරණය කර දීම සඳහාත් පිහිටුවා තිබෙන මේ ආයතනය "ධර්මයේ හැසිරෙන්නා ධර්මය විසින්ම රකී" කියන තේමා පාඨය මුල් කරගෙන තිබුණත්, වර්තමානය වන විට අපි අහන දකින දේවල් එක්ක අපේ පොලිස් දෙපාර්තමේන්තුව පිළිබඳව සමාජය තුළ තිබෙන්නේ සුබදායි තත්ත්වයක් නොවන බව අපි සියලුදෙනාම දන්නවා. විශේෂයෙන් වර්තමාන රජයේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මේ තත්ත්වය හඳුනාගෙන පොලීසිවලට තිබෙන වැඩ කටයුතු ප්‍රමාණය අඩු කරන්නට අලුත් පොලිස් ස්ථාන ඇති කර ජනතාවගේ ප්‍රශ්න, ගැටලු විසඳීමට සුදුසු ක්‍රමවේදයක් සකස් කරලා තිබුණත්, සමාජය තුළ පොලිස් දෙපාර්තමේන්තුවේ - සමස්ත නිලධාරින් නොවෙයි- සුළු පිරිසක් විසින් කරනු ලබන වැරැදි ක්‍රියා නිසා සමස්ත පොලිස් දෙපාර්තමේන්තුවටම අද නරක නාමය විඳින්නට සිදු වී තිබෙනවා.

මෙම සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කළ ගරු මධුර විතානගේ මැතිතුමා කිව්වා වාගේ, වර්තමානයට ගැළපෙන - 21වන සියවසට ගැළපෙන - පොලිස් දෙපාර්තමේන්තුවක් නිර්මාණය කිරීමේ වගකීම අපට තිබෙනවා. විශේෂයෙන්ම පොලිස් දෙපාර්තමේන්තුව තුළින් රටේ ජනතාවට සිදු විය යුතු කාර්ය භාරය පිළිබඳව සාකච්ඡා කරන්න සම්බන්ධීකරණ කමිටුවට ගිහිල්ලා වාඩි වුණාම, සමහර වෙලාවට අපට අහන්න දකින්න ලැබෙන්නේ ජනතාවගේ මැසිවිලි. යම් ගැටලුවක් - ප්‍රශ්නයක්- විසඳා ගන්න පොලීසියකට ගියාම එහි සිටින අතළොස්සක් නිලධාරින්ගේ වැරදි හැසිරීම් නිසා අකටයුතුකම් සිදු වනවා. ගරු අමාත්‍යතුමනි, ගරු මධුර විතානගේ මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ සභාව කල් තැබීමේ යෝජනාවට පොඩි ඌන පූරණයක් කරමින් මගේ කථාව අවසන් කරන්න මම බලාපොරොත්තු වනවා.

වර්තමානය වනවිට පොලිස් දෙපාර්තමේන්තුවේ 85,000කට ආසන්න නිලධාරින් පිරිසක් ඉන්නවා. ඒ අය අතරේ මේ රටේ සියයට 52ක් වන කාන්තාවන් නියෝජනය කරන්න ඉන්නේ 10,000කට අඩු කාන්තා නිලධාරින් පිරිසක්. ගරු ඇමතිතුමනි, පොලිස් දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීමේදී පොලිස් දෙපාර්තමේන්තුවේ ඉන්න නිලධාරින්ගේ විනය සකස් කරනවා වාගේම කාන්තා නියෝජනය වැඩි කරන්නටත් අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කරන්න කියන ඉල්ලීම මා කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතරක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.11]

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වනවා. මෙම සභාව කල් තැබීමේ යෝජනාව ඉතා වැදගත් යෝජනාවක්. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක්ම මෙම කාරණාව සභාව කල් තැබීමේ

යෝජනාවක් ලෙස ඉදිරිපත් කිරීම ගැන මම ඇත්තටම සතුටු වනවා. මොකද, මේ කාරණය සම්බන්ධයෙන් ගොඩක් ප්‍රශ්න තිබෙන නිසා.

පොලිසිය ගැන කථා කරනකොට මා මුලින්ම කිව යුතුයි, පොලිස් මාධ්‍ය ප්‍රකාශකතුමා කියා තිබුණු ආකාරයට පොලිස් සේවයේ 87,000ක් විතර නිලධාරින් ඉන්න බව. ඇත්තටම ඒ 87,000න් මම හිතන විධියට 85,000ක් විතර ඉතා අසරණව ඉන්නවා. Police constablesලාගේ ඉඳලා senior නොවන පහළ මට්ටමේ සිටින පොලිස් නිලධාරින් හරිම පව්. මොකද, ඒගොල්ලන්ට මේ ආණ්ඩුවෙන් දෙනවාය කිව්ව ආහාර දීමනාවවත් තවම ලැබිලා නැහැ කියන කාරණය ඒගොල්ලන් අපට දැන්වූවා. හමුදා සේවයත් එක්ක බලනකොට පොලිස් නිලධාරින්ගේ වැටුප අඩුයි. PC කෙනෙකු මසකට ලබන රුපියල් 60,000ක වැටුපෙන් ඔහුට ගෙදර ගෙන යන්න ලැබෙන්නේ රුපියල් 45,000ක් විතර. හමුදා සේවයේ ඒ මට්ටමේ ඉන්න නිලධාරියෙකු ඊට වඩා වැඩි වැටුපක් ලබනවා. සමහර පොලිස් නිලධාරින්ට මසකට දින හතරයි නිවාඩු ලැබෙන්නේ. මෙවැනි තත්ත්වයක් තිබියදී, යම් සිද්ධියක් වුණාම අපි සියලු පොලිස් නිලධාරින්ට දොස් පවරන එක වැරදියි කියා මා හිතනවා. ඒ නිසා සමහර පොලිස් නිලධාරින් ඇත්තටම පව්. පොලිස් සේවයේ ඉන්න බලය තිබෙන senior නිලධාරින් එක්ක තමයි අපට මේ ගැටලුව තිබෙන්නේ කියන කාරණය කියන්න ඕනෑ.

විශේෂයෙන්ම මඩකලපුව දිස්ත්‍රික්කය ගත්තාම, මඩකලපුව දිස්ත්‍රික්කයේ සමහර පොලිස් නිලධාරින් phones answer කරන්නේ නැහැ. මම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්. මම ඒ අයගේ නම්, ගම් මේ ගරු සභාවේදී කියලා එතුමන්ලා අපහසුතාවට පත් කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. හොඳ නිලධාරිනුත් ඉන්නවා. හැබැයි, පොදුවේ ගත්තාම සමහර පොලිස් නිලධාරින් පොලීසියේ තිබෙන phones answer කරන්නේ නැහැ. මම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්. අඩුම ගණනේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ number එකක්වත් phone එකේ save කර ගන්න දන්නේ නැත්නම් වැඩක් නැහැ. අපි කවදාවත් පෞද්ගලික උදවු ඉල්ලා පොලීසියට කථා කරලා නැහැ. මගේ කවුරුවත් මත් කුඩු නිසා arrest කරලා නැහැ. ඇත්තටම වැදගත් ප්‍රශ්නයක් ගැන තමයි අපි පොලීසියට කථා කරන්නේ.

දැන් තව culture එකක් ඇති වෙලා තිබෙනවා. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත - PTA එක - යටතේ මිනිසුන්ගෙන් ප්‍රශ්න කරන්න පටන් ගත්ත දවසේ ඉඳන් දිගින් දිගටම තරුණයෝ භය කරලා තිබෙන තත්ත්වයක් තමයි තිබෙන්නේ. Investigation එකක් කියලා හැම දාම උදේ 9ට එන්න කියනවා; අර ගහ යටට එන්න කියනවා; අර කෝවිලට එන්න කියනවා. ඒ දරුවෝ දන්නේ නැහැ, ඇත්තටම ඒ අය පොලීසියේද කියලා. මොකද, ඔවුන් civvies පිට එන්නේ. මෙය ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. පෙරේදා ෂන්මුගරාජා විදූලක්ෂන් කියන සහෝදරයෙක් ත්‍රිකුණාමලයේදී arrest කරලා තිබෙනවා. PTA එක යටතේ තමයි ඔහු arrest කරලා තිබෙන්නේ. ඔහු ගෙදර ඉන්නකොට තුන්වන වතාවට investigation එකකට එන්න කියලා, arrest කර තිබෙනවා. PTA එක යටතේ තමයි ඔහු arrest කර තිබෙන්නේ. දැන් මිනිසුන් භයෙන් ඉන්නේ. ඒ කියන්නේ, arrest කරන්නේ පොලීසියෙන්ද කියලා ඔවුන් දන්නේ නැහැ. මෙලෙස මිනිසුන් භය කිරීම් තුළින් මොකද වෙන්නේ? අපි corruptionවලට තව තව ඉඩ දෙනවා කියන කාරණය තමයි කියන්න තිබෙන්නේ.

ගරු දිලුම් අමුණුගම රාජ්‍ය අමාත්‍යතුමා, අපේ ඉස්කෝලේ ඉගෙන ගත් අයියා කෙනෙක්. එතුමා මේ කාරණා ගැන සොයා බලයි කියා මා හිතනවා. ගරු සරත් වීරසේකර ඇමතිතුමාට අපි දුරකථනයෙන් කථා කරලා උදව්වක් ඉල්ලුවාම එතුමා ඕනෑම වෙලාවක අපට උදව් කරනවා. හැබැයි, අපි හොඳින් දන්නා දේවල්වලට පමණයි අපට එතුමන්ලාගෙන් උදව් ඉල්ලන්න පුළුවන් වන්නේ. අපට හැම දෙයකටම උදව් ඉල්ලා කථා කරන්න බැහැ. මොකද, ඇමතිතුමාත් busy.

මඩකලපුව දිස්ත්‍රික්කයේ ගොඩක් issues තිබෙනවා. උදාහරණයක් හැටියට වැලි මාෆියාව - sand mafia - ගනිමු. සමහර වෙලාවට මඩකලපුව මාර්ගයේ වැලි ලොරි 1,000ක් විතර යන බව අපි දන්නවා. ඒ මාර්ගයේ check කරන්න ඉන්නේ පොලිස් නිලධාරින් දෙදෙනායි. ඒ නිලධාරින් දෙදෙනා එච්චර ලොරි ප්‍රමාණයක් check කරන්නේ කොහොමද? ගරු ඇමතිතුමනි, එම ප්‍රදේශයේ වැලි ගෙන යෑම සම්බන්ධ ප්‍රශ්නයක් තිබෙනවා. වෙල්ලාවෙලි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිවරයා කියනවා, "Permits දීලා නැති තැන්වලින් වැලි ගොඩ දානවා. නමුත්, පොලීසියත් එක්ක කථා කරලා වැඩක් නැහැ" කියලා. මේ වාගේ දේවල් සිදු වනවා.

ඊළඟ ප්‍රශ්නය තමයි, මත් කුඩු ප්‍රශ්නය. මෙයට සම්බන්ධ OIC කවුද කියලා මම කියන්නේ නැහැ. මම OIC කෙනෙක්ට කථා කරලා කිව්වා, "මේ ගෙදර, මේ පුද්ගලයා ළඟ ගංජා තිබෙනවා. පුළුවන් නම් ගිහිල්ලා අල්ලන්න" කියලා. අන්තිමට මොකද වුණේ? ඒ ගංජා ගැන වැඩිපුර කථා කරන ඒ ගෙවල් අසල සිටින මනුස්සයකුගේ ගෙදරට ගිහින් බැණලා තිබුණා, "ඔයගොල්ලෝ මොකද පොලීසියට කිව්වේ" කියලා. මේ වාගේ තත්ත්වයක් තමයි මඩකලපුව දිස්ත්‍රික්කයේ තිබෙන්නේ.

ඊට අමතරව මාළු හොරකමත් සිදු වනවා. බෝට්ටුවේ ගිහිල්ලා මාළු හොරකම් කරන පුරුද්දක් තිබෙනවා. පොඩි බෝට්ටුවලින් ගිහිල්ලා, ලොකු බෝට්ටුවල මාළු හොරකම් කරගෙන එනවා. එහෙම කරන මනුස්සයා කවුද කියලා මම දන්නවා; පොලිසිය දන්නවා. නමුත් පොලීසියෙන් තවම ඒ මනුස්සයා අල්ලා ගෙන නැහැ. මේ කටයුතු කරන්නේ නැත්තේ ඇයි කියායි මම අහන්නේ. පොලීසියේ හැමෝම ගැන නොවෙයි අපි කියන්නේ.

පසුගිය දවස්වල මඩකලපුව දිස්ත්‍රික්කයේ MSD එකේ කෙනෙකුගේ අතින් මනුස්සයෙක් ඝාතනය වුණා. ඒ ගැන විධිමත් පරීක්ෂණයක් කළාද කියලා අහන්න මම call කළාම මඩකලපුවේ HQI කියනවා, ඔහු quarantine වෙනවා කියලා. ඔහුගේ දෙවැනියාගේ නොම්මරය දුන්නත් දෙවැනියාත් අද වනතුරු phone එක answer කළේත් නැහැ; call back කළේත් නැහැ; මම SMS එකකුත් දැම්මා.

ගරු ඇමතිතුමනි, මේ වාගේ අවස්ථාවක අපට වෙන කරන්න දෙයක් නැහැ. අපට මේ පාර්ලිමේන්තුවේත්, මාධ්‍ය ඉස්සරහටත් ඇවිල්ලා කෑ ගහන්න විතරයි තිබෙන්නේ. අපට වෙන කරන්න දෙයක් නැහැ. ගිය අවුරුද්දේ වාලච්චේන පොලීසියේදි සිදුවීමක් වුණා. අනිවාර්යයෙන්ම ඒ සිදුවීම ගැන මම කියන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලැබී ඇති කාලය අවසන්.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මේ සිදුවීම පිළිබඳව කියලා මගේ කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

වාලච්චේන ප්‍රාදේශීය සභාවේ Budget එකට ඡන්දය ප්‍රකාශ කරන දවසේ, - TMVP Leader පිල්ලෙයාන්ගේ අයට ඡන්දය මදි වෙලා තිබුණු දවසේ - TNA එකට සපෝර්ට් කරන මන්ත්‍රීවරු දෙදෙනෙක් arrest කරලා රිමාන්ඩ් එකේ තියලා ඡන්දය පාස් කර ගත්තා. ඒ අවස්ථාවේ ආරාවුලක් ඇති වුණා. ආරාවුලක් ඇති වුණාම දෙපාර්ශ්වයම arrest කරන්න ඕනෑ නේ. පැය 72ක් ගත වුණත් පිල්ලෙයාන්ගේ පැත්තේ කට්ටිය arrest කළේ නැහැ.

මාධ්‍යවේදීන් දෙදෙනෙකු ගැනත් කියලා මම මගේ කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ෂශී පුන්‍යාමූර්ති කියන මාධ්‍යවේදියෙකුයි, නිලාන්දන් කියන මාධ්‍යවේදියකුයි දිගින් දිගටම ප්‍රශ්න කරනවා. ඒ වාගේම 'ජනනායහ පෝරාලිහල් ඩිමොක්‍රසි' පක්ෂයේ අයත් දිගින් දිගටම ප්‍රශ්න කරනවා. ඒ ගොල්ලන් දේශපාලන පක්ෂයක සාමාජිකයන්. ඒ නිසා ඒ කාරණය ගැනත් පොඩ්ඩක් සොයා බලන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ස්තුතියි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුව කල් තබන අවස්ථාවේ විවාදයට වෙන් කරපු කාලය විනාඩි 40යි. අපි පක්ෂ නායක රැස්වීමේදී තීරණය කළේ ඒ කාලය දෙකට බෙදා ගන්නයි. නමුත් අපට ලැබෙන්නේ ඒ වෙලාවෙන් කාලක් විතර. අද අපට විනාඩි 12යි වෙන් කරලා තිබෙන්නේ. විනාඩි 40න් විනාඩි 12යි අපට ලැබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අපි කථානායකතුමා සමඟ ඒ ගැන සාකච්ඡා කරන්නම්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේ තත්ත්වය පසුගිය රැස්වීම් සතියේදීත් සිදු වුණා. අපි ඒ ගැන දැන්වූවා. හැබැයි, මේ වාගේ පාර්ලිමේන්තුවේ නැඟිටලා අපි ප්‍රශ්න කළේ නැහැ. අද විනාඩි 40ක් තිබෙනවා. විනාඩි 20ක් අපට ලැබෙන්න ඕනෑ. විනාඩි 20ක් ආණ්ඩු පක්ෂයට ලැබෙන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අපි ඒ සම්බන්ධයෙන් කථානායකතුමා දැනුවත් කරන්නම්. ගරු මන්ත්‍රීතුමනි, අද බොහොම සීමිත කාලයක් තිබෙන්නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
විනාඩි 40න් විනාඩි 12යි අද අපට දීලා තිබෙන්නේ. අපි කථා කරන්න මන්ත්‍රීවරුන් තුන්දෙනෙකු දැම්මා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, මට ලබා දීලා තිබෙන සටහන අනුව තමයි කාලය වෙන් කරන්න වෙන්නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
කාලය සම සමව බෙදෙන්න ඕනෑනේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා පක්ෂ නායක රැස්වීමේදී මේ ගැන සාකච්ඡා කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
පක්ෂ නායක රැස්වීමේදී තමයි මේ එකඟතාවට ආවේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මට ලබා දීලා තිබෙන සටහන අනුව තමයි කාලය වෙන් කරන්නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
කවුද, මේ කාලය ලබා දුන්නේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ලේකම්තුමා විසින් තමයි කාලය ලබා දෙන්නේ?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
කාලය වෙන් කළේ කවුද? කාලය සම සමව බෙදෙන්න එපා යැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒ ගැන කථානායකතුමා දැනුවත් කරන්නම්, ගරු හිටපු ඇමතිතුමනි.

ගරු ශාන්ත බණ්ඩාර මැතිතුමා. ඔබතුමාට විනාඩි තුනක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.18]

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මධුර විතානගේ මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු සභාව කල් තැබීමේ යෝජනාව සම්බන්ධයෙන් අදහස් කිහිපයක් දක්වන්නට අවස්ථාව ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. අපේ රටේ සාමය ආරක්ෂා කිරීම වෙනුවෙන් ප්‍රධාන කැප කිරීම කරන්නේ පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරින්. එතුමාත් සඳහන් කරපු ආකාරයට පසුගිය කාලය තුළදී පොලිස් නිලධාරින්ට යම් යම් චෝදනා එල්ල වනවා වාගේම, යම් යම් වැරැදිවලට ඔවුන් හසු වෙන බවත් අපි දැක්කා. ඒ කාලය තුළදී ඒ තත්ත්වයේ යම් ප්‍රමාණයක වැඩි වීමක් සිදු වන බවක් අපි දැක්කා. හැබැයි, ඉතා සුළු පිරිසක් කරන ඒ

ක්‍රියාදාමය නිසා විශාල කැප කිරීමක් කරන පොලිස් දෙපාර්තමේන්තුවේ සිටින සියලු පොලිස් නිලධාරින්ගේ කීර්ති නාමයට හානියක් වන බවත් අපි දැක්කා. ඒ නිසා හමුදාවේ හිටපු ප්‍රධානියකු හැටියට ගරු සරත් වීරසේකර ඇමතිතුමා පොලිස් නිලධාරින්ගේ විනය සම්බන්ධව විධිමත් වැඩ පිළිවෙළක් සකස් කරයි කියන විශ්වාසය අප තුළ තිබෙනවා.

පොලිසියේ රාජකාරි පිළිබඳව කථා කරනවා නම්, සමහර පොලිස් ස්ථානවලට විශාල පොලිස් බල ප්‍රදේශයක් තිබෙනවා. ඔවුන්ට තිබෙන ඒ පහසුකම් අනුව එක ස්ථානයක ඉඳලා හදිසියේ තව ස්ථානයකට යන්න තිබෙන අපහසුතාව සහ එය සම්බන්ධීකරණය කර ගන්න තිබෙන අපහසුතාව මත ජනතාවට -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා කථා කරපු කාලය මගෙන් ගන්න එපා. මට නියමිත විනාඩි තුන දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අපි 5.30 වෙන කොට සභාවේ කටයුතු අවසන් කරන්න ඕනෑ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා කථා කරපු කාලය මගෙන් අඩු කරන්න එපා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ග්‍රාම නිලධාරි වසම් පදනම් කරගෙන පොලිස් ස්ථාන බිහි කරන්න අතිගරු ජනාධිපතිතුමා විශේෂ තීරණයක් අරගෙන තිබෙනවා. අපි ඒ පිළිබඳව සතුටු වෙනවා. අපේ ප්‍රදේශවලත් ඒ වාගේ කුඩා පොලිස් ස්ථාන මේ වනකොට ඉදි කරමින් පවතිනවා.

අපේ ගරු සරත් වීරසේකර ඇමතිතුමා පිළිතුරු කථාව කරන නිසා එතුමාගේ අවධානයට මේ කාරණයත් යොමු කරන්න කැමැතියි. මීට මාස හයකට විතර කලින් මේ උත්තරීතර සභාවේදී මම ඒ ප්‍රශ්නය පැන නැඟුවා. පොලිස් නිලධාරින් විශාල කැප කිරීමක් කරනවා වාගේම ඔවුන්ගේ රාජකාරි කාලය තුළදී ඔවුන් විශාල වශයෙන් දුෂ්කරතා රාශියකට මුහුණ දෙනවා. ඔවුන්ගේ රාජකාරි කාලය තුළදී ඇති වන දුෂ්කරතා වෙනුවෙන් රජයක් හැටියට ගත යුතු ක්‍රියාමාර්ග කිහිපයක්ම තිබෙනවා. එක ක්‍රියාමාර්ගයක් තමයි ඔවුන්ට සංයුක්ත දීමනාව ලබාදීම. එදා අපට ගරු ඇමතිතුමා කිව්වා, "ඔවුන්ගේ සංයුක්ත දීමනාව සම්බන්ධයෙන් කැබිනට් අනුකාරක සභාවක් පත් කරලා තිබෙනවා. ඒ සම්බන්ධව කටයුතු කරනවා" කියලා. පොලිස් නිලධාරින්ගේ සංයුක්ත දීමනාව සහ ආහාර දීමනාව සම්බන්ධව නැවතත් මා මේ ගරු සභාවට මතක් කරනවා. ගරු අමාත්‍යතුමනි, දීර්ඝ කාලයක් ගතවෙලා තිබෙනවා. පොලිස් නිලධාරින්ගේ කැප කිරීම අගය කිරීම, ඔවුන්ගේ විනය පවත්වාගෙන යෑම වාගේම, ඔවුන් වෙනුවෙන් ලබා දෙන සුබසාධනය ශක්තිමත් කරන්න කියලා මා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.21]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොලීසිය සම්බන්ධයෙන් වැදගත් යෝජනාවක් සභාවට ඉදිරිපත් කරලා තිබෙනවා. අද අපේ සමාජයේ එක පැතිකඩක් තමයි පොලීසියේ රාජකාරි කටයුතු කියන්නේ. අද සමාජමය වශයෙන් විනය පිරිහීමේ තත්ත්වය පොලිසියේ යම් යම් නිලධාරින් -හැම කෙනාම නොවෙයි- තුළ අපි දකිනවා. විශේෂයෙන්ම රටේ නීතිය හා සාමය ක්‍රියාත්මක කරන්න සිටින කණ්ඩායමක් වන පොලිස් නිලධාරින්ට ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. විශේෂයෙන්ම සෑම නිලයකම - කොස්තාපල්වරයාගේ ඉඳලා නියෝජ්‍ය පොලිස්පතිවරයා දක්වාම- උසස්වීම් ලබාදීමේදී නිසි ක්‍රමවේදයකටද සිද්ධ වෙන්නේ? අපි දකිනවා යම් යම් දේශපාලන වුවමනා අනුව වර්තමානයේ බොහෝ වෙලාවට පොලීසියේ උසස්වීම් ලබා දෙන බව. එහිදී සේවාව කොයි ආකාරයෙන් ඉෂ්ට කළත්, තමන්ගේ රාජකාරිය කොයි ආකාරයෙන් ඉෂ්ට කළත් සමහර පොලිස් නිලධාරින්ට අසාධාරණකම් ගණනාවක් සිද්ධවෙලා තිබෙනවා. අපි දකිනවා විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළ පොලිස් කොමිසමේ ස්වාධීනත්වය අඩුවෙලා, ඒ ස්වාධීනත්වය විධායකයට ගොනුවෙලා තිබෙන ආකාරය. පොලිස් දෙපාර්තමේන්තුවේ ස්වාධීනත්වයක් නැති නිසා, පොලිස්පතිවරයා පත් කිරීමේ ඉඳලාම ඉතා අවාසනාවන්ත ලෙස දේශපාලන බලපෑම් තුළ අද පොලිසියේ යම් යම් කටයුතු සිද්ධ වෙනවා.

විශේෂයෙන්ම පොලිස් ස්ථානාධිපතිවරුන් පත් කිරීමේදී දක්ෂකම්, සුදුසුකම් අනුව, තමන් කළ වැඩ කටයුතු අනුව ඒ අවස්ථා දෙනවාද එහෙම නැත්නම් ඒ ප්‍රදේශවල ඉන්න දේශපාලනඥයන්ගේ වුවමනා අනුව මේ කටයුතු සිදු වෙනවාද? අපි දන්නවා දේශපාලනඥයාගේ වුවමනාවට පත්වෙන පොලිස් ස්ථානාධිපතිවරයාට කටයුතු කරන්නට සිද්ධවෙලා තිබෙන්නේ ඒ ආකාරයට බව. ජනතාව වෙනුවෙන් නියමාකාරයෙන් නීතිය හා සාමය පවත්වාගෙන යෑමට අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න නම්, දේශපාලන අතපෙවීම් අඩු කරමින්, විනයානුකූලව, දක්ෂකම් අනුව, සුදුසුකම් අනුව පොලිස් නිලධාරින්ට ඒ අවස්ථා ලබා දෙන්නට ඕනෑ. පොලිස් ස්ථානාධිපති කියන්නේ අදාළ ප්‍රදේශයට විශාල බලපෑමක් කළ හැකි තනතුරක් දරන පුද්ගලයෙක්. අපි පසු ගිය කාලයේ දැක්කා මත් ද්‍රව්‍ය ඇතුළු අනෙකුත් අපරාධ සම්බන්ධයෙන් ඉතා හොඳින් රාජකාරි කළ පුත්තලම දිස්ත්‍රික්කයේ සහකාර පොලිස් අධිකාරිවරයා දේශපාලනඥයන්ගේ ඉල්ලීම මත මාරු කරලා තිබෙන ආකාරය. එම නිසා එවැනි තත්ත්වයක් ඇති නොවන විධියට කටයුතු කරන්නට ඕනෑ. මේ ගරු සභාවේ ඇමතිවරයා සිටින නිසා මා මේ කාරණයත් කියනවා. ඇමතිතුමා හමුදා සේවයේ හිටපු නිලධාරියකු හැටියට දන්නවා පොලීසිය තුළ විනයක් ඇති කරන්න නම් රජයක් හැටියට ස්වාධීනව, දක්ෂකම් සහ සුදුසුකම් අනුව ඒ අයට උසස්වීම් ලබා දිය යුතු බව. ඒ වාගේම, ඒ අයගේ දීමනා නිසියාකාරයෙන් ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළොත් තමයි පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගෙන් අපට උසස් සේවාවක් ලබා ගන්නට අවස්ථාව උදා වෙන්නේ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගුණතිලක රාජපක්ෂ මැතිතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.25]

**ගරු ගුණතිලක රාජපක්ෂ මහතා**
(மாண்புமிகு குணதிலக ராஜபக்ஷ)
(The Hon. Gunathilaka Rajapaksha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ධම්මෝ හවේ රක්ඛති ධම්මචාරි". "ධර්මයෙහි හැසිරෙන්නා ධර්මය විසින් රකී" කියන එක තමයි එහි තේරුම. මෙය අද කොතෙක් දුරට ක්‍රියාත්මක වෙනවාද කියලා වර්තමාන තත්ත්වය දිහා බලපුවාම අපට හිතා ගන්නට අමාරුයි. පසුගිය යහ පාලන කාලයේ මම පොලිස් ස්ථානාධිපතිවරයකුගේ දියණියකගේ wedding එකකට ගියා. මංගල උත්සවයේදී ඒ ප්‍රදේශයේ මෝල් හිමියෙක් තෑග්ගක් විදියට කාර් එකක් දුන්නා. මෙහෙම කළේ ඇයි කියන එක ජනතාවට ප්‍රශ්නයක්. ඒ කාලයේ පොලීසියෙන් යම් යම් ප්‍රයෝජන ගන්න තමයි එහෙම කළේ. 2002 ආණ්ඩු කාලයේ මම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා. ඒ මැතිවරණය වෙලාවේ මගේ නිවසට ප්‍රදේශයේ දේශපාලනඥයාගේ ආරක්ෂක නිලධාරින් යොදවා වෙඩි පිට වෙඩි තැබුවා. පසුව දා ඒ බුලට් 17ක් අරගෙන මම කටුගස්තොට පොලීසියට ගියා. හැබැයි, අද වනතුරු ඒ පිළිබඳ විමර්ශනයක් කළේ නැහැ. ඒ බුලට් එකක අංකයත් තිබෙනවා. ඕනෑ නම් තොරතුරු සොයා ගන්න තිබුණා. නමුත් ඒක පසුගිය යහ පාලන කාලයේ කළේ නැහැ. අපි දැක්කා, යහ පාලන ආණ්ඩුව කාලයේ පොලිස්පතිවරයා මහනුවර පෙරහැරේ නැටෙව්වා; නටනවා අපි දැක්කා. ඒ විධියට විනය පිරිහුණු කාලයක් පසුගිය දවස්වල අපි දැක්කා. ප්‍රජා පාලනය, සංවර බව රැකීම, සිවිල් පරිපාලනය, නීතිය ක්‍රියාත්මක කිරීම, මහජන සාමය රැකීම වැදගත්. මෙහිදී සංවර බව රැකීම ප්‍රධාන තැනක් ගන්නවා. මම හිතන්නේ පසුගිය කාලයේ ඒක කළේ නැහැ. වැරැදිකරුවන්ට දඬුවම්දීම අධිකරණය මඟින් මිස පොලීසියෙන් නොවෙයි කරන්නට අවශ්‍ය වන්නේ. අපේ වර්තමාන මහජන ආරක්ෂක අමාත්‍ය ගරු සරත් වීරසේකර මැතිතුමා සහ අපේ කන්ද උඩරට නියෝජනය කරන තරුණ රාජ්‍ය අමාත්‍ය දිළුම් අමුණුගම මැතිතුමා -අද මේ සුසංයෝගය එකතු වෙලා තිබෙනවා- එකතු වෙලා අදට ඔබින නීති පද්ධතියක් සකස් කර ජනතාව වෙනුවෙන් පොලීසියේ සංවර බව, විනයගරුක බව ආරක්ෂා කිරීමට කටයුතු කරන්න කියා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.27]

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලෝචිත මාතෘකාවක් යටතේ අද කථා කරන්න ලැබීම ගැන මම සතුටු වෙනවා. 15 හැවිරිදි දැරියක් අන්තර්ජාලය තුළ විකිණීමට සම්බන්ධ සිදුවීමේදී 33දෙනෙකු අත්අඩංගුවට ගැනීම පිළිබඳ ජාතික ළමා ආරක්ෂණ අධිකාරියටත් ඒ වාගේම ශ්‍රී ලංකා පොලීසියටත් දියණියකගේ මවක් හැටියට වාගේම ගුරුවරියක් හැටියට මාගේ ස්තුතිය පුද කරනවා. ඒ අයට නිසි දඬුවම් ලබා දෙන්න කටයුතු කරන්න කියලා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. හැබැයි, ගරු ඇමතිතුමනි, ඒ අය නිදොස්කොට නිදහස් කරන්න එපා කියන එක මම මේ වෙලාවේ කියනවා. පොලීසිය කියන්නේ බොහොම ගරු කටයුතු තැනක්, නීතිය හා සාමය රකින තැනක්. නමුත් අද ඇතැම් නිලධාරි සුළුතරය නිසා සමස්ත පොලිස් සේවයම අපකීර්තියට පත් වෙලා තිබෙනවාය කියන එක මේ වෙලාවේ මතක් කරන්න සිද්ධ වෙනවා. අපි අතීතයේ අහලා තිබෙනවා, පොලීසියට 'ගොරකා දඩමස් කරන්න පුළුවන්" කියලා. ඒක තමයි අතීතයේ මතය වුණේ. නමුත් එහෙම විය යුතු නැහැ. විශේෂයෙන්ම ජනතාව හා ගැටෙන තැන්වල සිටින නිලධාරින් මෙම සමාජ විරෝධි හා නීති විරෝධී කටයුතුවල යෙදෙන ප්‍රවණතාව වැඩියි, ගරු ඇමතිතුමනි.

මම අද විශේෂයෙන් කාන්තාවන් හා සම්බන්ධව ඇති වෙලා තිබෙන තත්ත්වය පිළිබඳව කථා කරන්න හිතුවා.

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා (මහජන ආරක්ෂක අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர - பொதுமக்கள் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Sarath Weerasekera - Minister of Public Security)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉතා වැදගත් කාරණාවක් සාකච්ඡා වන නිසා සභාවේ කටයුතු සඳහා කාලය තව විනාඩි කිහිපයකින් දීර්ඝ කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව එකඟ ද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු ඇමතිතුමනි, සමාජ මාධ්‍ය ජාල මොනවා කිව්වත්, නිරෝධායනයට ගිය කාන්තාවන්ට ඇඳුම් ලැබෙන්න සලස්වා ඒ අයට ඔබතුමා දක්වපු දයාව කරුණාව ගැන මම ස්තුතිවන්ත වෙනවා. හැබැයි, ඒ කරුණාව පොලීසියට එන කාන්තාවන්ට හා දරුවන්ට නැහැ කියන එක මේ වෙලාවේ ඇමතිතුමාට කියන්න සිද්ධ වෙනවා. මධ්‍යම පළාතේ නිරෝධායනය වෙමින් සිටි කාන්තාවක් පිළිබඳව තොරතුරු ගැනීමට ගිය නිලධාරියෙක් එම කාන්තාව දූෂණය කළාය කියලා ප්‍රවෘත්තියක් තිබෙනවා. ඊළඟට, නෙළුව සිද්ධිය සැලකිල්ලට ගත්තාම, පොලීසියට සහන ඉල්ලා පැමිණි මව සහ දියණියගේ සිද්ධිය බලන්න. නීතිය පසිඳලන තැනම එම දරුවා අපයෝජනයට ලක් කිරීම නින්දා සහගතයි. ඒ වාගේමයි පාදුක්ක පොලීසිය තුළදී කාන්තාවකට සිදුවූ අතවරයත්. තම දරුවාට සිදුවූ අතවරය පැමිණිලි කරන්න පැමිණි පියා සිරකුඩුවක දාලා මවට අතවර කර පහරදීම කියන සිද්ධිය ගත්තාම, ඇත්තටම මෙවැනි සිද්ධි හරිම ලජ්ජා සහගතයි. ඒ වාගේම, එය පොලිස් සේවයටම නින්දිත තත්ත්වයක් ගෙනෙත් දෙනවා. ගරු ඇමතිතුමනි, 2020 ජූනි මාසයේ ශ්‍රී ලංකා පොලීසිය ප්‍රකාශයක් කරලා තිබුණා, සෑම පැය දෙකකට වරක්ම දරුවෙක් අපයෝජනයට ලක් වෙනවා කියලා. පසු ගිය සතියේ නිල වාර්තාව අනුව, 2020 ලැබූ ළමා පැමිණිලි 2,055න් එකක්වත් මේ වෙනකොට විසඳා නැහැ. එයින් 1,953ක්ම rape cases, 76ක් ළමා කෘරත්වය පිළිබඳ පැමිණිලි, 26ක් ලිංගික සූරාකෑම පිළිබඳ

පැමිණිලි. Rape cases වලින් 22ක් ඉවත් කරලා තිබුණා; 1,565ක් තවමත් විමර්ශනය වෙනවා. 2019 සිද්ධි ගත්තාම rape cases 1,779ක්, ළමා කෲරත්වය පිළිබඳ පැමිණිලි 80ක්, ලිංගික සූරාකෑම් පිළිබඳ පැමිණිලි 34ක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, කොවිඩ් තත්ත්වය නිසා මේ තත්ත්වය තවත් වැඩි වෙලා තිබෙනවා. එහෙත් ගරු ඇමතිතුමනි, තිබෙන ප්‍රශ්නය තමයි ඒවා සම්බන්ධයෙන් පැමිණිලි කරන්න ඔබතුමා යටතේ තිබෙන පොලීසියට බයක් නැතිව එන්නේ කොහොමද කියන එක. මොකද, කාන්තාවන් පොලීසිය ඇතුළේදී ම දූෂණය වන නිසා.

මෙවැනි දේවල් අවම කර ගැනීම වෙනුවෙන්, පොලීසිය තුළ පිහිටුවා තිබෙන කාන්තා හා ළමා ඒකක සඳහා මම පහත සඳහන් යෝජනා ඉදිරිපත් කරන්න කැමතියි.

1. ළමා හා කාන්තා ඒකක සඳහා කාන්තා නිලධාරින් අනුයුක්ත කිරීම හා නිසි අධීක්ෂණයට ලක් කිරීම.
2. කාන්තා කාර්යාංශය සඳහා අනුයුක්ත නිලධාරින් වෙනත් රාජකාරි සඳහා අනුයුක්ත කිරීම හේතුවෙන් එම රාජකාරි අතපසු වන බැවින්, එසේ වෙනත් රාජකාරි සඳහා අනුයුක්ත නොකිරීමට කටයුතු කිරීම.
3. ළමා හා කාන්තා කාර්යාංශය වෙනම දිශාවක් ලෙස ස්ථාපිත කර පරිපාලනය නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු යටතට පත් කිරීම.
4. කාන්තා නිලධාරින්ට විධිමත්ව පුහුණුවක් ලබා දීම.
5. පොලිස් ස්ථාන වෙත රැගෙන එන වින්දිත දරුවන් හා කාන්තාවන් රඳවා තබා ගත හැකි ආරක්ෂිත කාමරයක් හෝ නිවස්නයක් අදාළ පොලිස්බල ප්‍රදේශය තුළ ඇති කළ යුතු වීම.
6. කාන්තා හිංසනය සම්බන්ධයෙන් දැඩි ක්‍රියා මාර්ග ගැනීම.
7. පොලිස් නිලධාරින්ගේ විනය පරිපාලනය සම්බන්ධයෙන් වඩාත් දැඩි සුපරීක්ෂණයකින් ක්‍රියා කිරීම.
8. වින්දිතයන් අධිකරණ වෛද්‍ය නිලධාරියා වෙත හා අනෙකුත් සම්බන්ධ වන ආයතන සඳහා රැගෙන යෑම සඳහා ස්ථිර සුදුසු වාහන කාර්යාංශය වෙත ලබා දීම.
9. පොලිස් ස්ථානය ජනතාවට මිත්‍රශීලී ආරක්ෂිත ස්ථානයක් බවට පත් කිරීම සහ විශ්වාසය ඇති වන ලෙස කටයුතු කිරීම.
10. දිස්ත්‍රික්ක මට්ටමින් මෙම විෂය සඳහා සහකාර පොලිස් අධිකාරිවරු අධීක්ෂණ නිලධාරින් ලෙස පත් කිරීම හා ඔවුන් නිරන්තරයෙන් අධීක්ෂණය කිරීම.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
තව සුළු වෙලාවකින් මම කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පස් හැවිරිදි සේයා දැරිය දූෂණය කර මරලා දැම්මාට පස්සේ රට පුරා ඇති වූ ආන්දෝලනයත් එක්ක තමයි ශ්‍රී ලංකාවේ සෑම පොලීසියකම විශේෂ ළමා ආරක්ෂක කමිටු පිහිටුවීමට කටයුතු කළේ. අතීතයේ ඉඳලා දරුවන්ට හා කාන්තාවන්ට ඇති වූ බරපතළ හිංසන හමුවේ නීතිය නිසි ලෙස ක්‍රියාත්මක නොවූ නිසා අද වන විට මෙය තවදුරටත් වර්ධනය වෙලා තිබෙනවා කියන එක මම මතක් කරන්න කැමතියි.

ගරු අමාත්‍යතුමනි, මම අවසාන වශයෙන් තවත් කාරණය කියන්න කැමතියි. "එක රටක්, එක නීතියක්" කියලා අද ඔබතුමන්ලා කථා කරනවා. නමුත්, නීතිය හා සාමය රකින තැනම අද මොනවාද වෙන්නේ? "වැටත් නියරත් ගොයම කා නම් කාට පවසම් ඒ අමාරුව" කියලා කථාවක් තිබෙනවා. කෙසේ වෙතත්, සුළුතරයකගේ හැසිරීම නිසා පොලීසියේ ගෞරවනීය නිලධාරින්ගේ වෘත්තීය ගරුත්වය රැක ගැනීමට ඔබතුමාගේත්, පොලිස් නිලධාරින්ගෙත් වගකීමක් බව මතක් කරමින් මම නිහඬ වනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, පිළිතුරු කථාව සඳහා ගරු සරත් වීරසේකර ඇමතිතුමා.

[අ.භා. 5.33]

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon. (Dr.) Sarath Weerasekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නීතිඥ, ගරු මධුර විතානගේ මැතිතුමා විසින් සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරන ලද යෝජනාවේ ඇතුළත් කරුණුවලට මහජන ආරක්ෂාව පිළිබඳ විෂයභාර අමාත්‍යවරයා සහ ශ්‍රී ලංකා පොලීසිය භාරව කටයුතු කරන අමාත්‍යවරයා වශයෙන් පිළිතුරු දීම මගේ යුතුකමක් වශයෙන් සලකනවා.

එතුමා විසින් විශේෂයෙන් පොලීසියේ විනය පිළිබඳව ප්‍රශ්න කිහිපයක් නඟා තිබෙනවා. මෙහිදී පොලීසියේ විකාශනය සම්බන්ධවත් මම ඉතා කෙටියෙන් සඳහනක් කළ යුතුයි. ශ්‍රී ලංකා පොලීසිය 1866දී බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේ ස්ථාපිතකොට වසර 150කට අධික කාලයක් මහජනතාවට සේවය කරනවා. වර්තමානයේ ශ්‍රී ලංකා පොලීසියේ 90,000කට ආසන්න පිරිසක් රාජකාරි කරනවා. පුද්ගලයෙකුගේ උප්පැන්න සහතිකයේ සිට මරණ සහතිකය දක්වා වූ සෑම කටයුත්තක් සඳහාම ශ්‍රී ලංකා පොලීසිය දායක වෙනවා. ඒ අතර, නීතිය හා සාමය පවත්වාගෙන යෑම, අපරාධ වැළැක්වීම හා අපරාධකරුවන් අත්අඩංගුවට ගැනීම, පාරිසරික වැරදි, මූල්‍ය අපරාධ හා වංචා, ළමා අපචාර, ස්ත්‍රී දූෂණ, රථවාහන හැසිරවීම හා ඒ පිළිබඳ වැරදි, ගෘහස්ථ හිංසනය ඇතුළු සුළු පැමිණිලි, ප්‍රජා පොලිස්කරණය, උසාවි කටයුතු, පොලිස් නිෂ්කාසන වාර්තා ලබා දීම ඇතුළුව තවත් විශාල කාර්ය භාරයක් කරනවා.

රටේ මහජනතාව සමඟ සෘජුවම කටයුතු කරන රාජ්‍ය සේවා අතරින් සාපේක්ෂව ගත් කළ පොලීසියේ සාමාජිකයන් පිරිස වැඩි අගයක් ගන්නවා. ශ්‍රී ලංකාව පුරා පොලිස් ස්ථාන 494ක් පිහිටුවා ඇති අතර, මීට අමතරව ක්‍රියාකාරි කොට්ඨාස 65ක් තිබෙනවා. මෙම ස්ථානවල රාජකාරි කරනු ලබන පොලිස් නිලධාරින් දැඩි වෙහෙසකින් හා කැපකිරීමකින් රාජකාරි කරනවා. රථ වාහන රාජකාරිවල නිරත නිලධාරින් අව්ව, වැස්ස ඒ වාගේම අධික දූම සහිතව මහා මාර්ගයේ දිවා රාත්‍රී දෙකේම රාජකාරි කරනවා. පැය 08ක සේවා මුරයකට එහා ගිය දීර්ඝ රාජකාරි මුරවල මෙම නිලධාරින් යෙදෙනුයේ කිසිදු අමතර දීමනාවක් නොලබමින්. අවම පහසුකම් යටතේ අතිශය වැදගත් රාජකාරි මෙම නිලධාරින් සිදු කරනවා. අතිශය සංකීර්ණ වූ හා බරපතළ අපරාධ සිද්ධි එම ආයතනයේ සිටින නිලධාරින්ගේ කැපවීම හා දක්ෂතාව මත ඉතා ඉක්මනින් විමර්ශනය කොට ඒවාට අදාළ අය නීතියේ රැහැනට ගෙන ගොස් තිබෙනවා.

[ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා ]

90,000ක් පමණ වූ පොලිස් සේවයේ සාමාජිකයන් අතරින් විවිධ තරාතිරම්වල යම් යම් නිලධාරින් විනය විරෝධී කටයුතුවල නිරත වී ඇති බව නිරීක්ෂණය වනවා. මෙම නිලධාරින් ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස ගත් කළ සියයට එකටත් අඩු සංඛ්‍යාවක්. ඉතිරි සියලු නිලධාරින් කීර්තිමත් ලෙස සහ අභිමානයෙන් රාජකාරි කරනවා. ඒ නිසා මුළුමහත් පොලිස් සේවයේම විනය පිරිහී ඇතැයි කවුරුන් හෝ ප්‍රකාශ කරයි නම් එය සාධාරණ නැහැ.

පොලිස් සේවය තුළ විනය පවත්වාගෙන යෑම සඳහා සැලසුම් සහගත ක්‍රමවේදයක් තිබෙනවා. ඒ සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, ආයතන සංග්‍රහය, පොලිස් නියෝග, පොලිස් ආඥා පනත, වෙනත් විවිධ අණපනත්, චක්‍රලේඛන හා ස්ථාවර නියෝග උපයෝගි කර ගන්නවා. සෑම අවස්ථාවකම නිලධාරියකු විනය කඩ කිරීමක් සිදු කළ විට තරාතිරම නොබලා ඊට එරෙහිව කටයුතු කරනවා. විනය කඩ කරන නිලධාරින් ඉන්නවා; අපරාධවලට සම්බන්ධ නිලධාරින් ඉන්නවා. ඒක පොලීසියට පමණක් සීමා වන දෙයක් නොවෙයි. ඕනෑම ආයතනයක එම ආයතනය අපකීර්තියට පත් කරන අතළොස්සක් ඉන්නවා. නමුත්, පොලීසියේ එම අතළොස්ස කරන වැරැදි උලුප්පා පොලීසිය කරන හොඳ දේ යටපත් කරනවා නම්, ඒක සාධාරණ නැහැ.

අපි දන්නවා, පසුගිය වර්ෂයේ මාර්තු මාසයේ 11වන දා ශ්‍රී ලංකාවෙන් පළමුවරට දේශීය කොවිඩ් රෝගියෙකු හඳුනා ගත් බව. එදා සිට අද දක්වා ශ්‍රී ලංකා පොලීසියේ නිලධාරින් නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ කටයුතු ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යමින් කොවිඩ් - 19 රෝගය නිවාරණය කිරීම සඳහා සහ එම රෝගය පැතිරීම වැළැක්වීමට ඉතා විශාල මෙහෙයක් ඉටු කරනවා. එහිදී ශ්‍රී ලංකා පොලීසියේ නිලධාරින් 23,720ක් නිරෝධායනය සඳහා යොමු කිරීමට සිදුවුණු අතර, ඒ නිලධාරින්ගෙන් 6,911ක් පමණ මෙම රෝගයෙන් ආසාදිත තත්ත්වයට පත් වුණා. ඒ වාගේම, පොලිස් පරීක්ෂක ශ්‍රේණියේ නිලධාරින් 05 දෙනෙකු ඇතුළු නිලධාරින් 14 දෙනෙකු මෙම වසංගත රෝගය පාලනය කිරීම සඳහා රාජකාරි කිරීමේදී එම රෝගය ආසාදනය වීමෙන් තම ජීවිතය පරිත්‍යාගකොට තිබෙනවා. මෙවැනි සෞඛ්‍ය තර්ජනයක් හමුවේ වුවද, ශ්‍රී ලංකා පොලීසියේ නිලධාරින්ගේ විනය පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් විනය බලධාරින් සහ ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිවේදිත නිලධරයන් විසින් විශේෂ අවධානයකින් සහ උනන්දුවකින් කටයුතු කළ බව විනය කඩ කිරීම් සම්බන්ධ වාර්තා ඇති සංඛ්‍යාලේඛන අනුව පැහැදිලි වෙනවා.

විනය කඩ කළ නිලධාරින් සඳහා චෝදනා පත්‍ර නිකුත් කිරීම 2018 වර්ෂයේ 166ක් ද, 2019 වර්ෂයේ 274ක් ද, 2020 වර්ෂයේ 333ක් සහ 2021 වර්ෂයේ මේ දක්වා 112ක් ද බව මා සඳහන් කරනවා. ඒ වාගේම, පොලිස් නිලධාරින් අපරාධ නීතිය උල්ලංඝනය කිරීම් සම්බන්ධ දත්ත ද මම මේ සමඟ ඉදිරිපත් කරනවා. එනම්, 2018 වර්ෂයේදී 153ක් ද, 2019 වර්ෂයේදී 158ක් ද, 2020 වර්ෂයේදී 164ක් ද, 2021 වර්ෂයේ මේ දක්වා 92ක් ද වාර්තා වී තිබෙනවා.

පාර්ලිමේන්තු මන්ත්‍රී නීතිඥ, ගරු මධුර විතානගේ මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවේ කොටසක් වන්නේ, පොලිස් නිලධාරින් මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරැදිවලට සම්බන්ධ වී ඇති බවයි. ඒ සම්බන්ධ සංඛ්‍යාලේඛන ඉදිරිපත් කරනවා නම්, 2018 වර්ෂයේදී 18ක් ද, 2019 වර්ෂයේදී 15ක් ද, 2020 වර්ෂයේදී 44ක් සහ 2021 වර්ෂයේ මේ දක්වා 15ක් ද වශයෙන් මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරැදිවලට නීති පියවර අරගෙන තිබෙනවා. හැබැයි, මොවුන් නීතියේ රැහැනට හසු කර ගත්තේත් පොලිස් නිලධාරින් බවත් අපි කිවයුතුයි. මෙම සංඛ්‍යාලේඛන පරීක්ෂා කිරීමේ දී ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කළ පමණට බරපතළ මට්ටමින් ශ්‍රී ලංකා පොලීසිය තුළ මත්ද්‍රව්‍ය වැරැදි කරන නිලධරයන් සිටිනවා ද යන්න මේ උත්තරීතර සභාවේ අවධානය යොමු කරමින් මා විමසා සිටිනවා. මන්දයත්, ශ්‍රී ලංකා පොලීසියේ සහ විශේෂ කාර්ය බලකායේ නිලධාරින් 90,000කට ආසන්න ප්‍රමාණයක් රාජකාරි කරද්දී එක් අවුරුද්දක් තුළ මත්ද්‍රව්‍ය වැරැදිවලට හසු වූ නිලධාරින් 50කටත් අඩු බව නිරීක්ෂණය වන බැවිනි. ඒ කියන්නේ, සියයට දශම බින්දුවයි පහකටත් අඩු සංඛ්‍යාවක්. එසේ වුවද, පසුගිය වසර තුන තුළ ශ්‍රී ලංකා පොලීසිය සිදුකළ මත්ද්‍රව්‍ය වැටලීම් මඟින් හෙරොයින් කිලෝ 1,904ක් ද, ගංජා කිලෝ 18,411ක් ද, වෙනත් මත්ද්‍රව්‍ය කිලෝ 1,288ක් ද පොලිස් භාරයට ගැනීමට හැකි වී තිබෙනවා. ඒ වාගේම, හෙරොයින් සම්බන්ධයෙන් පුද්ගලයන් 64,273ක් ද, ගංජා සම්බන්ධයෙන් පුද්ගලයින් 52,397ක් ද, වෙනත් මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් පුද්ගලයන් 3,640ක් ද අත්අඩංගුවට ගෙන නඩු පැවරීමට කටයුතු කර තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමා අවධානය යොමු කළ ස්ත්‍රී සහ ළමා අපචාර වැරැදි සිදුකළ පොලිස් නිලධාරින් සම්බන්ධයෙන් ද නීතිය ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා පොලීසිය මඟින්ම කටයුතු කර තිබෙනවා. එම සංඛ්‍යාලේඛන ඉදිරිපත් කිරීමේදී 2018 වර්ෂයේදී 21ක් ද, 2019 වර්ෂයේ 17ක් ද, 2020 වර්ෂයේදී 18ක් ද, 2021 වර්ෂයේ මේ දක්වා 9ක් ද පොලිස් නිලධාරින් සිටින බව මේ ගරු සභාවට දන්වා සිටිනවා.

මා මුලින් සඳහන් කළ ආකාරයට 90,000කට අධික නිලධරයන් සංඛ්‍යාවක් රාජකාරි කරනු ලබන ශ්‍රී ලංකා පොලීසියේ එක් වර්ෂයකට ස්ත්‍රී හා ළමා අපචාර සම්බන්ධ චෝදනා ලැබ ඇත්තේ 20කටත් අඩු සංඛ්‍යාවකි. නෙළුව පොලිස් ස්ථානයේ කොස්තාපල් කෙනෙකු කළ ඒ පිළිකුල් සහගත ක්‍රියාවට පොලිස් ස්ථානය භාර ස්ථානාධිපතිටත් අපි දඬුවම් කරනවා.

එසේම, ශ්‍රී ලංකා පොලීසිය ස්ත්‍රී දූෂණ සහ ළමා අපචාර සම්බන්ධයෙන් දැඩිව ක්‍රියා කරනවා. මේ දිනවල පුවත් පත්වල පළ වන එම සිද්ධියේදී ඒ අවුරුදු 15 දැරිය අපයෝජනය කළ තිස්දෙදෙනෙකු -විදේශිකයෙකු ද ඇතුළුව- අපි ඉතා කෙටි කලකින් අත්අඩංගුවට ගෙන තිබෙනවා.

ශ්‍රී ලංකා පොලීසියට නිලධාරින් බඳවාගනු ලබන විට නිලධාරින්ගේ ශාරීරික සුදුසුකම් හා අධ්‍යාපන සුදුසුකම් පරීක්ෂා කර බලනවා. ඒ වාගේම ආධුනිකයන්ගේ සහ පවුලේ සාමාජිකයන්ගේ අපරාධ ඉතිහාසය පිළිබඳවත් අපි පරීක්ෂා කර බලනවා. කෙසේ වෙතත්, සමාජයේ යම් යම් ආකල්ප දරන පුද්ගලයන් කොපමණ ප්‍රමාණයක් සිටිනවා ද, සමාජයෙන් පොලීසියට බඳවා ගන්නා නිලධාරින් අතර ද එවැනිම ප්‍රතිශතයක් සිටින බව අවධාරණය කළ යුතුයි. සමාජයෙන් පොලීසියට බැඳෙන විවිධ ආකල්ප සහිත තැනැත්තන් ඉතා උසස් පුහුණුවක් හා දැඩි විනය සංග්‍රහයක් යටතේ පාලනය කරමින් සමාජය ඒ ආකාරයෙන් ම පොලීසිය තුළින් පිළිබිඹු වීම සීමා කිරීමට කටයුතු කර තිබුණ ද යම් සාපරාධී ආකල්ප සහ වැරැදි පුරුදු ඉස්මතු වීම සාමාන්‍ය තත්ත්වයක්.

ශ්‍රී ලංකා පොලීසියේ සිටින නිලධාරින් සංඛ්‍යාව සලකා බැලීමේදී ඉතා සුළු ප්‍රතිශතයක් විනය විරෝධී කටයුතු සහ සාපරාධී කටයුතු කළ ද ඔවුන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කරමින් ඔවුන් පොලීසියෙන් නෙරපා හැරීම සඳහා ශ්‍රී ලංකා පොලීසියේම ක්‍රමවේදයක් සකස් කර ඇති බවත්, විනය සම්බන්ධවම කටයුතු කිරීම සඳහා නියෝජ්‍ය පොලිස්පතිවරයකු යටතේ විනය හා කල්ක්‍රියා කොට්ඨාසයක් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයකුගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කරමින් අවශ්‍ය විනය පාලන කටයුතු සිදු කරන බවත් මෙම උත්තරීතර සභාව

වෙත දැනුම් දීමට කැමැතියි. දැනට පවතින ක්‍රමය යටතේ කොස්තාපල්වරුන්ගේ සහ සාජන්වරුන්ගේ විනය පිළිබඳව පොලිස් ස්ථානාධිපතිවරයා ද, පොලිස් ස්ථානාධිපතිවරයාගේ විනය පිළිබඳව සහකාර පොලිස් අධිකාරිවරයා ද, ඔහුගේ ක්‍රියා පිළිබඳව කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයා ද වග කිව යුතු වේ. ඊට ඉහළින් නියෝජ්‍ය පොලිස්පති සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා ද වේ. පොලිස් ස්ථානාධිපතිවරුන් පත් කරන විට අපි ඔවුන් හා සම්බන්ධ බුද්ධි තොරතුරු ලබාගෙන හොඳ නිලධාරින් පමණක් පත් කරනවා. නරක වාර්තා තිබෙන අය නිතිපතා අධීක්ෂණයට ලක් කරනවා.

පොලීසිය විසින් නොකරනු ලබන වැරැදි ද පොලීසිය විසින් සිදු කළා යැයි මාධ්‍ය මඟින් ප්‍රචාරය කරන ඇතැම් අවස්ථා ද අභාග්‍යවත් ලෙස දැකිය හැකියි. මෙලෙස සිදු කරනු ලබන ප්‍රචාර ද පොලීසියේ කීර්තිනාමය කෙරෙහි දැඩි ලෙස බලපානවා. පොලීසිය විනය පිරිහී ගිය ආයතනයක් ලෙස ඒවා මඟින් හුවා දක්වනවා. පොලීසියට විරුද්ධව කරන පැමිණිලි පිළිබඳ තොරතුරු කිසිම සෙවිල්ලක් බැලිල්ලක් නැතිව සමහර මාධ්‍ය ආයතන ප්‍රචාරය කරනවා. ඒක මාධ්‍ය සදාචාරයට පටහැනියි. මීට වඩා වගකීමෙන් යුතුව කටයුතු කරන මෙන් මා ඒ මාධ්‍ය ආයතනවලින් ඉල්ලා සිටිනවා. එසේම කිහිපදෙනෙකු විසින් කරනු ලබන වැරැදි හේතු කොට ගෙන සමස්ත පොලීසියටම නිගා දෙන අයුරින්, ද්වේශසහගත අයුරින් කරන ප්‍රචාරණය අපි දැඩි සේ හෙළා දකිනවා.

ජාතික පොලිස් අභ්‍යාස ආයතනය, පොලිස් සේවාස්ථ පුහුණු කොට්ඨාසය, ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලය ආදී ස්ථානවල පොලිස් නිලධාරින්ගේ විනය හා ආකල්ප සම්බන්ධව මෙන්ම මහ ජනතාවගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කරමින් රාජකාරි කිරීම සම්බන්ධව පුහුණු කිරීමට ද අපි පියවර ගෙන තිබෙනවා. ඒ වාගේම පරිගණක තාක්ෂණය ඇතුළු නවීන තාක්ෂණය පිළිබඳ දැනුම ලබා දෙමින්, ඩ්‍රෝන තාක්ෂණික උපකරණ ආදි තාක්ෂණික උපකරණ ලබා දෙමින් අපරාධ හා මත් ද්‍රව්‍ය මැඩලීම සඳහාත්, කොවිඩ්-19 ව්‍යාප්තිය වැළැක්වීම සඳහාත් කටයුතු කරමින් තිබෙනවා.

පොලිස් නිලධාරින් 28,000ක් පමණ යොදවමින් මහ ජනතාවට ඉතා සමීප සේවාවක් ගම තුළදී ම ලබා දීම සඳහා ප්‍රජා පොලිස් සංකල්පය ක්‍රියාත්මක කිරීමට ද මේ වන විට පියවර ගෙන තිබෙනවා. ඒ සඳහා අපි ඉතාම දක්ෂ තරුණ රාජ්‍ය ඇමතිවරයකු ද පත්කරගෙන තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවදුරටත් පොලිස් නිලධාරින්ට ගෞරවනීය සේවයක් සැපයීම සඳහා අවශ්‍ය උසස් පුහුණුවක් ලබා දීම, යටිතල පහසුකම් සංවර්ධනය මෙන්ම කරනු ලබන සේවයට සාධාරණ වූ විශේෂ වැටුප් ක්‍රමයක් ස්ථාපනය කිරීම සඳහා ද මේ උත්තරීතර සභාවේ සිටින ගරු මැති ඇමතිතුමන්ලාගේ සහ මැති ඇමතිතුමියන්ලාගේ සහාය මම අපේක්ෂා කරනවා.

පොලීසිය අනෙක් දෙපාර්තමේන්තු සමඟ සංසන්දනය කරන්න බැහැ. සමහර විට ඔවුන් පැය 12ක් මහ පාරේ අව්වේ වේළෙමින්, වැස්සේ තෙමෙමින් ඉන්නවා. පැය 24ම සේවය කරන්න ඔවුන් බැඳී සිටිනවා. බොහෝ විශේෂ අවස්ථාවලදී ඔවුන්ගේ නිවාඩු නවත්වනවා. වෙනත් දෙපාර්තමේන්තුවක සේවකයන් සමඟ සංසන්දනය කරන විට ඔවුන් කරන්නේ ඉතා දුෂ්කර සේවයක්. රථවාහන හසුරුවන නිලධාරිගේ ශරීර උඩින් ටිපර් රථ යනවා. මහ පාරේ රාජකාරි කරන අපේ නිලධාරින් සියගණනක් අවිනීත රියැදුරන් අතින් මිය ගොස් තිබෙනවා. ඇතැම් පොලිස් නිලධාරින් ධාමරිකයන්ගේ පිහි පහරවලට ලක් වී තිබෙනවා; පාතාල ක්‍රියාකරුවන්ගේ වෙඩි පහරවලට ලක් වී තිබෙනවා. එවන් වූ සේවයක් රටේ ජනතාව අගය කළ යුතුයි.

පොලිස් නිලධාරින්ටත් හමුදාවට වාගේම ආහාර දීමනාවක් ලබා දිය යුතුයි. අතිගරු ජනාධිපතිතුමා ඊට එකඟ වී තිබෙනවා.

අපි වැරැදි කරන නිලධාරින්ට දඬුවම් කරනවා. නමුත්, අතලොස්සක් කරන වැරැදිවලින් 'සමස්ත පොලීසියේම විනය පිරිහී තිබෙනවා' යන ප්‍රකාශයට සහ 'පොලීසිය කෙරෙහි සමාජය තුළ ඇත්තේ මහත් කලකිරීමක්' යන ප්‍රකාශයට මා එකඟ වන්නේ නැහැ. රටේ බුද්ධිමත් විනයගරුක ජනතාව පොලිස් සේවය අගය කරනවා. දින දෙකක් රට පුරා පොලීසිය වසා තැබුවොත් උදාවන තත්ත්වය ඔවුන් දන්නවා. පොලිස් සේවය අගය කිරීම සම්බන්ධයෙන් අපි ජනතාවට ස්තුතිවන්ත වෙනවා. බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.45ට, 2021 ජූලි 07වන බදාදා පූ.භා. 10.00 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால், மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 5.45க்கு பாராளுமன்றம், 2021 யூலை 07, புதன்கிழமை மு.ப. 10.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*And it being past 5.30 p.m.,* THE HON. PRESIDING MEMBER *adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 5.45 p.m. until 10.00 a.m. on Wednesday, 07th July, 2021.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.